සාරත්ථදීපනී

නම්

අංගුත්තර නිකාය ව්‍යාඛ්‍යා

සාරත්ථදීපනී

නම්

අඞ්ගුත්තර නිකාය ව්‍යාඛ්‍යා

පෑලියගොඩ

විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය

උපාධ්‍යාය ධුරන්ධර

රත්මලානේ ධර්මකීර්ති ශ්‍රී ධර්මානන්දාභිධාන

කොළඹ ගලාවත දෙදිශාවේ ප්‍රධාන සඞ්ඝනායක

ස්වාමීන්ද්‍රයන්වහන්සේ විසින්

අවසාන ශොධ්‍යපත්‍රාවලොකනයෙන්

ප්‍රතිගෘහීත යි.

වීරහේනේ විද්‍යාරතන පරිවෙණාචාර්‍ය්‍ය

වම්බටුවැවේ සිරිනිවාස ස්ථවිරයන්

විසින් සම්පාදිත යි.

ඇම්. පී. කොණ්ඩසිංහ

විසින්

පෑලියගොඩ සත්‍යසමුච්චය යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවා ප්‍රකාශිත යි.

බු: ව: **2480**

ක්‍රි: ව: **1937**

සංඥාපනය

ශ්‍රී ශාක්‍යමුනීන්ද්‍ර වූ අප සම්‍යක්සම්බුද්ධ සර්වඥරාජෝත්තමයන් වහන්සේ විසින් සකලසත්ත්වයන් කෙරෙහි පතළ මහා කරුණාවෙන් සාරාසංඛ්‍යකල්පලක්ෂයක් මුළුල්ලෙහි පූරිත පාරමිතානුභාවයෙන් ප්‍රතිලබ්ධ සර්වඥතාඥානයට විෂය වූ ලෞකික ලෝකෝත්තරාර්ථප්‍රකාශක නෛර්‍යාණික ධර්මදේශනා තොමෝ සූත්‍ර අභිධර්ම විනය යන පිටක විසින් ත්‍රිවිධ වේ. ඒ ත්‍රිවිධ පිටකයන් අතුරෙන් ලෞකික ලෝකෝත්තරාර්ථයන් ප්‍රකාශ කරන අර්ථයෙන් සූත්‍ර නම් වූ ද පර්‍යාප්තිය දැරීමට භාජන වන අර්ථයෙන් පිටක නම් වූ ද ධර්මසමූහය තෙම සූත්‍ර පිටක නම්. ඒ සූත්‍රපිටකය වනාහි දීඝ, මජ්ඣිම, සංයුත්ත, අඞ්ගුත්තර, ඛුද්දක යයි නිකාය විසින් පඤ්චවිධ වේ.

එයින් **චිත්තපරියාදාන** සූත්‍රය පටන් **නවදහස් පන්සිය සත් පනසක් සූත්‍ර**යන්ගෙන් සමන්විත ධර්මස්කන්ධය තෙම **අඞ්ගුත්තර නිකාය** නම් වේ. එහි සූත්‍රයන් එකෙකඅඞ්ගාතිරේක වශයෙන් සිටි හෙයින් අඞ්ගුත්තරනිකාය යන නාමය සඞ්ගීතිකාරක මහරහතන්වහන්සේලා විසින් ව්‍යවහෘත ය. මෙය බණවර එකසිය විස්සකින් හා එකක, දුක, තික, චතුක්ක, පඤ්චකාදිවශයෙන් එකාදශනිපාතයකින් ද පරිපූර්ණ වේ.

මේ අඞ්ගුත්තරනිකාය ශීල සමාධි ප්‍රඥා සන්දීපක නානාවිධ දේශනා නයින් විචිත්‍ර පරම ගම්භීර ධර්මසමූහයෙකින් යුත් මහාර්ඝ ධර්මරත්නාවලියකි. මාගධිභාෂෝද්ග්‍රහණාභිලාෂීන්ගේ බුද්ධිප්‍රබෝධය කරන ප්‍රදීපයෙකි. ධර්මදේශකයන්ට දම්රුවන් පිරූ ගබඩාවෙකි. සැදැහැතියන්ට නිවන්පුරයට මහවතෙකි. එහෙයින් මේ උතුම් දහම් පොත ගිහි පැවිදි සියලුදෙනා විසින් සදකල්හි අත්‍යන්තාදෘත ය.

ප්‍රවචන පාලිධර්මය පිළිබඳ යථාර්ථාවබෝධය පර්‍යාප්ති, ප්‍රතිපත්ති, ප්‍රතිවේධ යන ත්‍රිවිධ ශාසනයාගේ චිරස්ථිතියට අසහාය හේතුවකි. පාලිධර්මයාගේ යථාර්ථාවබෝධයට යහපත් අර්ථවාචනා මාර්ගය මහෝපකාරී වේ. එහෙයින් අඞ්ගුත්තරනිකාය නම් වූ ප්‍රවචන පාලිධර්මග්‍රන්ථය පරිශීලනය කරන ආධුනිකයනට එහි යථාර්ථාවබෝධය පිණිස යහපත් අර්ථවාචනාමාර්ගයක් ඇසුරු කළ

ව්‍යාඛ්‍යානයක් අවශ්‍ය බැව් දත් ධර්මාර්ථඥනාභිවෘද්ධිකාමී කීප පලක් විසින් අද්‍යොෂිත වූ අපි ලොකශාසනානුග්‍රහය පරමාර්ථ කොට ගෙන මේ සද්ව්‍යාපරයෙහි යථාවකාශයෙන් ව්‍යාපෘත වූමු.

සාරත්ථදීපනී නම් වූ මේ අඞ්ගුත්තරව්‍යාඛ්‍යානය විද්‍යාජ්ජන ශෙඛරායමාණ පෑලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති වැ වැඩවුසු ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය උපාධ්‍යාය ධුරන්ධර **රත්මලානේ ධර්මකීර්ති ශ්‍රී ධර්මාරාමාභිධාන** කොළඹ හලාවත දෙදිශාවේ ප්‍රධාන සඞ්ඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අර්ථවාචනාමාගීය ඇසුරු කොට අර්ථකථා නය නො ඉක්මවා පදාර්ථ දැක්වීමෙන් ද, සංලක්‍ෂ්‍ය යෙදීමෙන් දුර්බොධස්ථාන විස්තර කිරීමෙන් ද, යථා ස්ථානයෙහි ව්‍යාකරණක්‍රම දැක්වීමෙන් ද නාතිසංක්‍ෂෙපවිස්තාර යෙන් සම්පාදනය කෙළෙමු. **එකක දුක නිපාතමය** පිළිබඳ ව්‍යාඛ්‍යානය ඇතුළත් ප්‍රථම කොටස බොහෝ දෙනකුන්ගේ ඉල්ලීම පරිදි පළමුකොට පිට කෙළෙමු. තිකනිපාත ව්‍යාඛ්‍යා නය ද අප්‍රමාද ව ලබාගත හැකි වේ.

පදාර්ථකථනයෙන් බුද්ධිවිකාශයට බාධා පැමිණේ ය යි මෙකල ඇතැම් විචාරකයෝ සලකති. එහෙත් එය බුද්ධිවිකාශ යට රුකුලක් කොට පුරාතනාචාර්‍ය්‍යවරයෝ සැලකූහ. පදාර්ථකථන යෙහි අගය හෝ අභිප්‍රාය නො දත් ඇතමුන්ගේ අවිචාරය නිසා පසුකාලයෙහි පදාර්ථකථනය පමණක් ඉගෙනීම යයි ශිෂ්‍යයනට වැටහී ගියේ ය. ඔවුහු ගිරවුන් මෙන් පදාර්ථය කටපාඩම් කර ගෙන නැවත නැවත ද කිම මූත් අර්ථය වහල් කොට ගෙන පෙළපදය පිළිබඳ කිසි ද විචාරණයක් නො කොට එයින් ම ඉගෙනීම අවසනැයි සිතා ගත්හ. මෙයින් ම නූතන විචාරකයෝ පදාර්ථකථනය බුද්ධිවිකාශයට බාධාවෙකැයි නිගමනය කෙරෙති යි සිතිය හැකි ය.

අපගේ මේ අඞ්ගුත්තරව්‍යාඛ්‍යානය පළමු කියනලද අර්ථයන් නැවත නැවතත් දැක්වීමෙන් තොර බැවින් ග්‍රන්ථලාඝවයත්, පළමු අර්ථ නො දැක් වූ හැම පදයකට ම මනොඥ අර්ථයන් දක් වනලද බැවින් සම්පූර්ණත්වයත්, විස්තර කළ යුතු ගැඹුරු ධර්මාර්ථ යන් සංලක්‍ෂ්‍යය යොදා විස්තර කළ බැවින් ග්‍රන්ථගෞරවයත් සලසයි.

මෙම කෘත්‍යය සම්පාදනයෙහිදී අපට අඞ්ගුත්තරපාළිය ද කතිපය ස්ථානයෙක්හි ශුද්ධ කරන්නට ලැබීම ප්‍රීතියකි. සියම්, ඉංග්‍රීසි මුද්‍රිත පොත් හා පුස්කොළ පොතක් ද මුද්‍රිත පෙළපොත

හා සසඳා බලා අටුවාව ද උපකාර කොට ගෙන වැදගත් ශුද්ධි කිහිපයක් කර තිබෙන බව මුද්‍රිත පොත හා අපගේ පොත සසඳා බැලීමේදී දක්ක හැකි වේ.

මීට ප්‍රථම මුද්‍රිත අඞ්ගුත්තරව්‍යාඛ්‍යාවන්හි සූත්‍රසංඛ්‍යා දක්වා තිබෙන අයුරු නුසුදුසු ය. ඇතැම් තැනක සූත්‍ර 10 ක් ම එක ම සූත්‍රය හැටියට ද ඇතැම් තන්හි කණ්ඩ සුත්ත වශයෙන් දෙකට බෙදා දෙසූ එක ම සූත්‍රය සූත්‍ර දෙකක් වශයෙන් ද එහි දක්වා තිබේ. අප විසින් අටුවාව හා දෙශාන්තර මුද්‍රිත ග්‍රන්ථයන් ද බලා සුදුසු ක්‍රමයෙන් සූත්‍රසංඛ්‍යා ක්‍රමය යොදා ඇත. වර්ග ක්‍රමය ද එසේ ම සකස් කොට යෙදීමු. අභිනව සිංහල සන්න ලියන භවතුන් අතර ස්වභාෂාරීතිය ගරු කරන්නෝ විරලයහ. එහෙයින් බොහෝ සන්න පොත්හි භාෂාප්‍රයොග දූෂ්‍ය ව පවත්නේ ය. අපි ලිහිල් අර්ථය දෙන ගමන් ම භාෂාප්‍රයොගයන් ද නිවරද ව යෙදීමට වෑයම් කොළෙමු. මේ ග්‍රන්ථය පරිශීලනය කරන්නවුන්හට ඒ පිළිබඳ යථාතත්ත්වය වැටහි යනවා ඇත.

මේ ග්‍රන්ථය අපගේ ධර්මාචාර්යෝත්තම වූ පණ්ඩිත සාර්වභෞම පැලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්ය උපාධ්‍යාය ධුරන්ධර **රත්මලානේ ධර්මකීර්ති ශ්‍රී ධර්මානන්දාභිධාන** කොළඹ හලාවත දෙදිශාවේ ප්‍රධාන සඞ්ඝනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් අවසාන ශොධ්‍යපත්‍රාවලොකනයෙන් සමාදරයෙන් පිළිගත් බව ගෞරව සහිත වැ මෙහි සඳහන් කරම්හ.

එසේ ම මේ සද්ව්‍යාපාරය පිළිබඳ සදුපදෙශ දානයෙන් අපට අනුග්‍රහ කළා වූ විද්‍යාලඞ්කාර පිරුවන්හි උපප්‍රධානාචාර්ය පණ්ඩිත **කිරිවත්තුඩුවේ කීර්ති ශ්‍රී ප්‍රඥාසාරාභිධාන** නායකස්ථවිරපාදයන් වහන්සේට හා අපගේ ආචාර්යෝත්තම තක්කාවත්තේ ශ්‍රී සුදර්ශී නාරාම විහාරාධිවාසී **සද්ධර්මකීර්ති ශ්‍රී සුමඞ්ගල රත්නජ්‍යොතාභිධාන** නායක ස්ථවිරපාදයන්වහන්සේට ද, මෙහි ශොධනපත්‍ර බලා දීමෙන් හා පොත සකස් කිරීමේ සියලු ක්‍රියාවන්හි විශෙෂයෙන් උපස්තම්භක වැ ක්‍රියා කළා වූ අපගේ කල්‍යාණමිත්‍ර විද්‍යාලඞ්කාර පිරුවන්හි උපාචාර්ය **හැඩිපන්නල ප්‍රඥාලොක** ස්ථවිරයන් වහන්සේට ද අපගේ අවඞ්කාදරගෞරවය හිමි වේ.

මෙහි පදැඹී දක්වීමෙහි හෝ මුද්‍රණයෙහි කිසියම් දෙසක් නො වන පරිදි අපි ඉතා සැලකිල්ලෙන් ක්‍රියා කෙළෙමු. එසේ ද වුවත් මේ ග්‍රන්‍ථයෙහි අපගේ අනවධානයෙන් හෝ මුද්‍රණදෙෂයෙකින් හෝ යම් දෙෂස්ථානයක් ඇත හොත් ධර්‍මශාස්ත්‍රාභිවෘද්ධිකාමී සත්පුරුෂයන් විසින් කරුණාපෙරටුව එය අප වෙත දන්වුව මැනවි. ද්විතියමුද්‍රණයේදී එබඳු තැන් සකස් කරන්නට එය මහොපකාරයෙකි.

මේබවට ශාසනසපිතිකාමී

වම්බටුවැවේ සිරිනිවාස ස්ථවිර.

2480

1937. 10. 28

වීරහේනේ

විදූරතන පිරුවන්හිදී ය.

ශුද්ධිපත්‍රය.

පිට.	පෙළ.	අශුද්ධ.	ශුද්ධ.
2	6	වක්ෂ්‍යමාන	වක්ෂ්‍යමාණ
11	30	පහළ නො වූයේ;	පහළ නො වූයේ; –පෙ–
,,	32	වඩනලද්දේ;	වඩනලද්දේ; –පෙ–
16	22	වෛය්‍යාකරණ	වෛයාකරණ
19	9	භික්ඛවෙ–මහණෙති;	
		සථා ඉදං–	සථා+ඉදං–
86	25	සෙ–	–පෙ– . සෙ–
108		පිටේ 6 වෙනි සූත්‍රය මැදට යෙදී තිබෙන සංලක්ෂ්‍යය 5 වෙනි සූත්‍රයේ අගට යෙදිය යුතු යි.	
112	8	මනොසුචරිතං	මනොදුච්චරිතං
122	2	සුනාථ	සුණාථ
125	33	වදාළසේක.	වදාළසේක. –පෙ–.
155	33	දෙක යි.	දෙක යි. –පෙ–.
156	18	පිළිබඳ වේ.	පිළිබඳ වේ. –පෙ–.

සාරත්ථදීපනී

නම්

අඞ්ගුත්තරනිකාය ව්‍යාඛ්‍යා

නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.

1—1-1.

1. එවං මෙ සුතං එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකරූපම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති යථයිදං භික්ඛවෙ ඉත්ථිරූපං. ඉත්ථිරූපං භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨතීති—

වන්දිත්වා සිරසා බුද්ධං ධම්මං තෙන සුදෙසිතං
සෙට්ඨං අරියසඞ්ඝං ච පුඤ්ඤක්ඛෙත්තං නිරඞ්ගණං

සාරත්ථං දීපයං සම්මා වරෙ අඞ්ගුත්තරාගමෙ
තනොමි නිජභාසාය ව්‍යාඛ්‍යං **සාරත්ථදීපනිං.**

1—1-1.

1. **මෙ**– මා විසින්; **එවං සුතං**– (මේ සූත්‍රය) මෙසේ අසන ලදි. නොහොත්:– **මෙ**– මාගේ; **සුතං**– ඇසීම; **එවං**– මෙසේ ය. (කෙසේ ද?) **එකං සමයං**–එක්සමයෙක්හි; **භගවා**– භාග්‍යවතුන් වහන්සේ; **සාවත්ථියං**-සැවැත්නුවර සමීපයෙහි වූ; **ජෙතවනෙ**- ජෙතවන නම් වූ; **අනාථපිණ්ඩිකස්ස ආරාමෙ**– අනේපිඬු මහ සිටුහුගේ ආරාමයෙහි; **විහරති**- වැඩවාසය කරන සේක;

තත්‍ර ඛො- එකල්හි වනාහි; **භගවා**- භාග්‍යවතුන්වහන්සේ; **භික්ඛවො+ඉති**-මහණෙනි කියා; **භික්ඛූ**-භික්ෂූන්ට; **ආමන්තෙසි**- ආමන්ත්‍රණය කළසේක. **තෙ භික්ඛූ**- ඒ භික්ෂූහු; **භදන්ත+ඉති**- පින්වතුන්වහන්සැ යි කියා; **භගවතො**-භාග්‍යවතුන්වහන්සේට; **පති+අස්සොසුං**- පිළිවදන් ඇස්වූහ **භගවා**- භාග්‍යවතුන් වහන්සේ; **එතං**- මේ (වක්ෂ්‍යමාන) සූත්‍රදෙශනාව; **අවොච**- වදාළසේක.

භික්ඛවෙ- මහණෙනි; **යං**- යම් රූපාලම්බනයෙක් තෙම; **එවං**- මෙසේ; **පුරිසස්ස**-(රූපගරුක) පුරුෂයාගේ; **චිත්තං**- (චාතුර්භූමක කුශල)චිත්තය; **පරියාදය**- වැලඳගෙන හෙවත් ක්ෂය කොට ගෙන; **තිට්ඨති**- සිටිනේ ද; (එබඳු වූ) **අඤ්ඤං එක රූපං+අපි**- (මේ මතු කියන රූපාරම්මණය හැර) අන් එකම රූපාරම්මණයකුත්; **අහං**- මම; **න සමනුපස්සාමි**- ඤාණ සමනු පස්සනා වශයෙන් නොදක්නෙමි. (ඒ කෙසේ වූ රූපයක් ද?) **භික්ඛවෙ**- මහණෙනි; **යථා+ඉදං**- යම්බඳු වූ මේ; **ඉත්ථිරූපං**- ස්ත්‍රියගේ (චතුසමුට්ඨානික රූපායතන සඞ්ඛ්‍යාත) වර්ණය වේ. **භික්ඛවෙ**- මහණෙනි; **ඉත්ථිරූපං**- ස්ත්‍රියගේ (චතුසමුට්ඨානික රූපායතන සඞ්ඛ්‍යාත) වර්ණය තෙම; **පුරිසස්ස**- (රූපගරුක) පුරුෂයාගේ; **චිත්තං**- (චාතුර්භූමක කුශල) චිත්තය; **පරියාදය**- වැලඳගෙන හෙවත් ක්ෂය කොට ගෙන; **තිට්ඨති+ඉති**-සිටිනේය යි (වදාළසේක).

1. සංලක්ෂ්‍යය:-

එකං සමයං- යන තන්හි සමයශබ්දයා කෙරෙන් අච්චන්තසංයොගාර්ථයෙහි ද්විතීයා විභක්තියි.

2. සංලක්ෂ්‍යය:-

සමනුපස්සාමි-ඤාණසමනුපස්සනාවය, දිට්ඨිසමනුපස්සනාවය යි සමනු පස්සනාවෝ දෙදෙනෙක් වෙත්. "අනිච්චතො සමනුපස්සති නො නිච්චතො"යි වදාළ හෙයින් සියලු සංස්කාරධර්මයන් නිත්‍යවශයෙන් නොගෙන අනිත්‍ය වශයෙන් දැකීම ඤාණසමනුපස්සනා නමු. "රූපං අත්තතො සමනුපස්සති"යි වදාළ හෙයින් රූපය ආත්මය වශයෙන් නුනුවණින් දැකීම දිට්ඨිසමනුපස්සනා නමු. මොවුන් අතුරෙන් මෙහි ඤාණසමනුපස්සනාව අභිප්‍රෙතයි.

3. සංලක්ෂ්‍යය:-

චිත්තං පරියාදය- මෙහි චිත්තශබ්දයෙන් චාතුර්භූමක කුශල චිත්තය ම දක්වනලදි. කාමාවචරභූමිය, රූපාවචරභූමිය, අරූපාවචරභූමිය, ලොකොත්තරභූමිය යි භූමීහු සතරදෙනෙක් වෙත්. මේ භූමිවිෂයෙහි පැවති එක්විසි කුසලචෙතනාවන් චාතුර්භූමකකුසලචිත්ත නාමයෙන් දැක්වූහ. ස්ත්‍රියගේ රූපය පුරුෂයාගේ සිතෙහි මෙකී කුසලචෙතනාවන්ගේ ඉපදීම වළක්වා සිටින හෙයින් "චිත්තං පරියාදය තිට්ඨති"යි වදාරනලදි.

2. නාහං භික්ඛවෙ අඤ්ඤං එකසද්දම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති යථයිදං භික්ඛවෙ ඉත්ථිසද්දො. ඉත්ථිසද්දො භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨතීති—

3. නාහං භික්ඛවෙ අඤ්ඤං එකගන්ධම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති යථයිදං භික්ඛවෙ ඉත්ථිගන්ධො. ඉත්ථිගන්ධො භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨතීති—

4. නාහං භික්ඛවෙ අඤ්ඤං එකරසම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති යථයිදං භික්ඛවෙ ඉත්ථිරසො. ඉත්ථිරසො භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨතීති—

---

2. **භික්ඛවෙ**-මහණෙනි; **යං**- යම් ශබ්දාරම්මණයෙක් තෙම; **එවං**-මෙසේ; **පුරිසස්ස**-(ශබ්දගරුක)පුරුෂයාගේ; **චිත්තං**-(චාතුර්භූමක කුශල)චිත්තය; **පරියාදාය**-වැලඳගෙන හෙවත් ක්ෂය කොට ගෙන; **තිට්ඨති**- සිටිනේ ද (එබඳු වූ); **අඤ්ඤං එකසද්දං+අපි**- (මේ මතු කියන ශබ්දාරම්මණය හැර) අන් එක්තරා ශබ්දාරම්මණයක් කුත්; **අහං**-මම; **න සමනුපස්සාමි**-ඥානසමනුපස්සනා වශයෙන් නො දක්නෙමි. (ඒ කෙසේ වූ ශබ්දයක් ද?) **භික්ඛවෙ**-මහණෙනි; **යථා+ඉදං**- යම් බඳු වූ මේ; **ඉත්ථිසද්දො**- ස්ත්‍රියගේ (චිත්තසමුට්ඨානික ශබ්දායතනය හා ස්ත්‍රිය විසින් නිපදවනලද වීණා වේණු ආදි) ශබ්දය වේ. **භික්ඛවෙ**- මහණෙනි; **ඉත්ථිසද්දො**- ස්ත්‍රියගේ ශබ්දය තෙම; **පුරිසස්ස**-(ශබ්දගරුක) පුරුෂයාගේ; **චිත්තං**-(චාතුර්භූමක කුශල)චිත්තය; **පරියාදාය**-වැලඳගෙන හෙවත් ක්ෂය කොට ගෙන; **තිට්ඨති+ඉති**- සිටිනේය යි (වදාළසේක).

3. **භික්ඛවෙ**-මහණෙනි; **යං**- යම් ගන්ධාරම්මණයෙක් තෙම; **පුරිසස්ස**- (ගන්ධගරුක) පුරුෂයාගේ; —පෙ— **ඉත්ථිගන්ධො**- ස්ත්‍රියගේ (චතුසමුට්ඨානික ගන්ධායතනය හා අනුලෙපනාදි) ගන්ධය තෙම;—පෙ—**තිට්ඨති+ඉති**-සිටිනේය යි (වදාළසේක).

4. **භික්ඛවෙ**-මහණෙනි; **යං**- යම් රසාලම්බනයෙක් තෙම; **පුරිසස්ස**- (රසගරුක) පුරුෂයාගේ;—පෙ—**ඉත්ථිරසො**-ස්ත්‍රියගේ (චතුසමුට්ඨානික) රසායතනය තෙම; —පෙ— **තිට්ඨති + ඉති**- සිටිනේය යි (වදාළසේක).

5. නාහං භික්ඛවෙ අඤ්ඤං එකඵොට්ඨබ්බම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදය තිට්ඨති යථයිදං භික්ඛවෙ ඉත්ථිඵොට්ඨබ්බො. ඉත්ථිඵොට්ඨබ්බො භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදය තිට්ඨතීති—

6. නාහං භික්ඛවෙ අඤ්ඤං එකරූපම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදය තිට්ඨති යථයිදං භික්ඛවෙ පුරිසරූපං. පුරිසරූපං භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදය තිට්ඨතීති—

7. නාහං භික්ඛවෙ අඤ්ඤං එකසද්දම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදය තිට්ඨති යථයිදං භික්ඛවෙ පුරිසසද්දො. පුරිසසද්දො භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදය තිට්ඨතීති—

8. නාහං භික්ඛවෙ අඤ්ඤං එකගන්ධම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදය තිට්ඨති යථයිදං භික්ඛවෙ පුරිසගන්ධො. පුරිසගන්ධො භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදය තිට්ඨතීති—

9. නාහං භික්ඛවෙ අඤ්ඤං එකරසම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදය තිට්ඨති යථයිදං භික්ඛවෙ පුරිසරසො. පුරිසරසො භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදය තිට්ඨතීති—

---

5. **භික්ඛවෙ**-මහණෙනි; **යං**-යම් ස්පර්ශාලම්බනයෙක් තෙම; **පුරිසස්ස**- (ස්පර්ශගරුක) පුරුෂයාගේ;—පෙ—**ඉත්ථිඵොට්ඨබ්බො**-ස්ත්‍රියගේ කායස්පර්ශය තෙම; —පෙ— **තිට්ඨති+ඉති**-සිටිනේය යි (වදාළසේක).

6. **භික්ඛවෙ**-මහණෙනි; **යං**- යම් රූපාලම්බනයෙක් තෙම; —පෙ—**පුරිසරූපං**- පුරුෂයාගේ (චතුසමුට්ඨානික රූපායතන සඞ්ඛ්‍යාත) වර්ණය තෙම; —පෙ— **තිට්ඨති+ඉති**- සිටිනේය යි (වදාළසේක).

7. **භික්ඛවෙ**-මහණෙනි;—පෙ—**පුරිසසද්දො**- පුරුෂයාගේ (චිත්තසමුට්ඨානික ශබ්දායතනසඞ්ඛ්‍යාත) ශබ්දය තෙම; —පෙ— **තිට්ඨති+ඉති**-සිටිනේය යි (වදාළසේක).

8. **භික්ඛවෙ**-මහණෙනි;—පෙ—**පුරිසගන්ධො**- පුරුෂයාගේ (චතුසමුට්ඨානික ගන්ධායතනය හා අනුලේපනාදි) ගන්ධය තෙම; —පෙ—**තිට්ඨති+ඉති**-සිටිනේය යි (වදාළසේක).

9. **භික්ඛවෙ**- මහණෙනි; —පෙ—**පුරිසරසො**- පුරුෂයාගේ (චතුසමුට්ඨානික) රසායතනය තෙම; —පෙ— **තිට්ඨති + ඉති**- සිටිනේය යි (වදාළසේක).

10. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති යථයිදං භික්ඛවෙ පුරිසඵොට්ඨබ්බො. පුරිසඵොට්ඨබ්බො භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨතීති.

වග්ගො පඨමො.

1—1-2.

1. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නො වා කාමච්ඡන්දො උප්පජ්ජති උප්පන්නො වා කාමච්ඡන්දො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති යථයිදං භික්ඛවෙ සුභනිමිත්තං. සුභනිමිත්තං භික්ඛවෙ අයොනිසො මනසිකරොතො අනුප්පන්නො චෙව කාමච්ඡන්දො උප්පජ්ජති, උප්පන්නො ච කාමච්ඡන්දො භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති.

---

10. **භික්ඛවෙ**-මහණෙනි;—පෙ—**පුරිසඵොට්ඨබ්බො**-පුරුෂයාගේ කායසපර්ශය තෙම; —පෙ— **තිට්ඨති+ඉති**- සිටිනේය යි (වදළසේක).

ප්‍රථම වර්ගය යි.

1—1-2.

1. **භික්ඛවෙ**- මහණෙනි; **යෙන**- යමක් කාරණ කොට ගෙන; **අනුප්පන්නො වා**- නූපන්නා වූ ද; **කාමච්ඡන්දො**- කාමච්ඡන්දනීවරණය තෙම; **උප්පජ්ජති**- උපදී ද; **උප්පන්නො වා**- උපන්නා වූ ද; **කාමච්ඡන්දො**- කාමච්ඡන්දනීවරණය තෙම; **භිය්‍යොභාවාය**- බොහෝ බව පිණිස; **වෙපුල්ලාය**- විපුලබව පිණිස; **සංවත්තති**- පවතී ද (එබඳු වූ); **අඤ්ඤං එකධම්මං+අපි**- (මේ මතු කියන ධර්මය හැර) අන් එක ම ධර්මයකුත්; **අහං**- මම; **න සමනුපස්සාමි**- ඤාණසමනුපස්සනා වශයෙන් නො දක්නෙමි. (ඒ කවරේ ද?) **භික්ඛවෙ**- මහණෙනි; **යථා+ඉදං**- යම්බඳු වූ මේ; **සුභනිමිත්තං**- සුභනිමිත්ත (හෙවත් රාගයට කරුණු වූ අරමුණ) වේ **භික්ඛවෙ**- මහණෙනි; **සුභනිමිත්තං**- සුභනිමිත්ත (හෙවත් රාගයට කරුණු වූ අරමුණ); **අයොනිසො මනසිකරොතො**-

2. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නො වා ව්‍යාපාදො උප්පජ්ජති උප්පන්නො වා ව්‍යාපාදො භියොභාවාය වෙපුල්ලාය සංවත්තති යථයිදං භික්ඛවෙ පටිඝනිමිත්තං. පටිඝනිමිත්තං භික්ඛවෙ අයොනිසො මනසිකරොතො අනුප්පන්නො චෙව ව්‍යාපාදො උප්පජ්ජති, උප්පන්නො ච ව්‍යාපාදො භියොභාවාය වෙපුල්ලාය සංවත්තතීති —

නුනුවණින් මෙනෙහි කරන්නාහට; **අනුප්පන්නො** ච + එව- නූපන්නා වූ ද; **කාමච්ඡන්දො**-කාමච්ඡන්දය තෙම; **භියොභාවාය**- බොහෝ බව පිණිස; **වෙපුල්ලාය**- විපුලබව පිණිස; **සංවත්තති**+ **ඉති**- පවත්නේය යි (වදළසේක).

1. සංලක්ෂ්‍යය:-

කාමච්ඡන්දො- මෙහි "කාම" යනු රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ සංඛ්‍යාත පස්කම්ගුණයයි ඇලීම වේ. ඒ කාමතෘෂ්ණාව අරමුණු කැමති විම් අර්ථයෙන් ම ඡන්ද ද වේනුයි කාමච්ඡන්ද නම් වේ. ඒ කාමච්ඡන්දය ධ්‍යානා දීන්ගේ වශයෙන් උපදනා කුශලචිත්තය වළක්වන හෙයින් ද පැනඇස අවුරන අර්ථයෙන් ද ඊට නිවරණයයි ද කියනුලැබේ.

2. සංලක්ෂ්‍යය:-

"අනුප්පන්නො වා කාමච්ඡන්දො උප්පජ්ජති"- අසමුදචාරවශයෙන් හෝ අනනුභූතාරම්මණවශයෙන් නූපන් කාමච්ඡන්දය තෙම සුභනිමිත්ත හෙතු කොට ගෙන උපදියි. වත් පිරිමෙහි හා ග්‍රන්ථ ධූතාඞ්ග සමාධි විපස්සනා නවකර්ම යන මෙහි නිරතවූවන්ට කෙලෙස් නූපදියි. (කුමක් හෙයින් ද යත්?) කෙලෙසුන්ගේ ඉපදීමට අවකාශයක් නොලැබෙන හෙයිනි. වත්පිරිම් ආදියෙන් වෙන් ව අනුපාය වශයෙන් මෙනෙහි කරන්නාහට අසමුදචාර වශයෙන් නූපන් කාමරාගය උපදියි. පෙර අනුභව නොකළචිරූ මනොඥ රූපාදි අරමුණු ලැබ අනුපාය වශයෙන් මෙනෙහි කරන්නාහට අනනුභූතාරම්මණ වශයෙන් නූපන් කාමරාගය උපදියි.

3. සංලක්ෂ්‍යය:-

"අයොනිසො මනසිකරොතො"- අයොනිසොමනසිකාරය නම් අනුවණින් කල්පනා කිරීමයි. අනිත්‍ය දෑයෙහි නිත්‍යය කියා ද, අසුභ දෑයෙහි සුභය කියා ද සිතන වැරදි කල්පනාව අයොනිසො මනසිකාර නම් වේ.

2. **භික්ඛවෙ**- මහණෙනි; —පෙ— **ව්‍යාපාදො**- ව්‍යාපාද නීවරණය තෙම; —පෙ— **පටිඝනිමිත්තං**- ප්‍රතිඝනිමිත්ත හෙවත් අප්‍රිය අරමුණ; —පෙ— **සංවත්තති** + **ඉති**- පවත්නේය යි (වදළසේක).

3. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නං වා ථිනමිද්ධං උප්පජ්ජති උප්පන්නං වා ථිනමිද්ධං භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති යථයිදං භික්ඛවෙ අරති, තන්දි, විජම්භිකා, භත්තසම්මදො, චෙතසො ච ලීනත්තං. ලීනචිත්තස්ස භික්ඛවෙ අනුප්පන්නං චෙව ථිනමිද්ධං උප්පජ්ජති, උප්පන්නං ච ථිනමිද්ධං භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති—

4. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නං වා උද්ධච්චකුක්කුච්චං උප්පජ්ජති උප්පන්නං වා උද්ධච්චකුක්කුච්චං භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති යථයිදං භික්ඛවෙ චෙතසො අවූපසමො. අවූපසන්තචිත්තස්ස භික්ඛවෙ අනුප්පන්නං චෙව උද්ධච්චකුක්කුච්චං උප්පජ්ජති, උප්පන්නං ච උද්ධච්චකුක්කුච්චං භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති—

---

3. **භික්ඛවෙ**-මහණෙනි;-පෙ-**ථිනමිද්ධං**-ථිනමිද්ධනීවරණය; —පෙ- **අරති**- අධිකුශලධර්මයන්හි නො ඇලීම ද; **තන්දි**- මැලි බව ද; **විජම්භිකා**- ඇඟමැලිකැඩීම ද; **භත්තසම්මදො**- බත් මතය ද; **චෙතසො**-සිත පිළිබඳ වූ; **ලීනත්තං** ච-අකර්මණ්‍ය බව ද වේ. -පෙ-**ලීනචිත්තස්ස**-මැලිසිත් ඇත්තාහට;-පෙ-**සංවත්තති** + **ඉති**-පවත්නේය යි (වදාළසේක).

සංලක්ෂ්‍යයි:-

ථිනමිද්ධං- මෙහි "ථිනය" නම් විඥානස්කන්ධයයි කියනලද චිත්තයාගේ ගිලන් බව හෝ හැකුළුණු බවයි. "මිද්ධය" නම් කායසඞ්ඛ්‍යාත වෙදනා සංඥාසංස්කාරයන්ගේ ගිලන් බව හෝ හැකුළුණු බවයි. මෙය ද ධ්‍යානාදීන්ගේ ඉපැද්ම වළක්වන හෙයින් ථිනමිද්ධ නීවරණයයි දතයුතු.

4. **භික්ඛවෙ**- මහණෙනි;—පෙ—**උද්ධච්චකුක්කුච්චං**- ඖද්ධත්‍යය හා කෞකෘත්‍යය;-පෙ-**චෙතසො**-සිතපිළිබඳ; **අවූපසමො**- ධ්‍යානාදියෙන් නො සන්සිඳීම වේ.—පෙ—**අවූපසන්තචිත්තස්ස**- ධ්‍යානාදියෙන් නො සන්සිඳුණු සිත් ඇත්තාහට-පෙ-**සංවත්තති**+ **ඉති**-පවත්නේය යි (වදාළසේක).

සංලක්ෂ්‍යයි:-

උද්ධච්චකුක්කුච්චං- මෙහි "උද්ධච්චය" නම් චිත්තයාගේ නොසංසුන් බවයි. "කුක්කුච්චය" නම් විපිළිසර බවයි. ඒ වනාහි යහපත් කුශලකර්ම නො කළහුට ද අයහපත් පාපකර්ම කළහුට ද ඇතිවන්නේ ය. මේ ඖද්ධත්‍යය හා කෞකෘත්‍යයන් සිතෙහි නොසංසුන් බව ඇති කරන හෙයින් ධ්‍යාන විදර්ශනාදියක් ඉපදවිය නොහැක්කේ ය. ධ්‍යානාදීන්ගේ ඉපැද්ම වළක්වන හෙයින් මීට නීවරණයයි ද කියනුලැබේ.

5. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා විචිකිච්ඡා උප්පජ්ජති උප්පන්නා වා විචිකිච්ඡා භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තති යථයිදං භික්ඛවෙ අයොනිසො මනසිකාරො. අයොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව විචිකිච්ඡා උප්පජ්ජති, උප්පන්නා ච විචිකිච්ඡා භිය්‍යොභාවාය වෙපුල්ලාය සංවත්තතීති.

6. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නො වා කාමච්ඡන්දො නුප්පජ්ජති උප්පන්නො වා කාමච්ඡන්දො පහීයති යථයිදං භික්ඛවෙ අසුභනිමිත්තං. අසුභනිමිත්තං භික්ඛවෙ යොනිසො මනසිකරොතො අනුප්පන්නො චෙව කාමච්ඡන්දො නුප්පජ්ජති, උප්පන්නො ච කාමච්ඡන්දො පහීයතීති.

---

5. **භික්ඛවෙ**- මහණෙනි; —පෙ— **විචිකිච්ඡා**- විචිකිච්ඡා තොමෝ; —පෙ— **අයොනිසො මනසිකරොතො**- අනුවණින් මෙනෙහි කරන්නාහට; —පෙ— **සංවත්තති+ඉති**- පවත්නේයයි (වදාළසේක).

සංලක්ෂ්‍යය:-

විචිකිච්ඡා- මෙහි "විචිකිච්ඡා" නම් සැක කිරීමයි. ඒ වනාහි බුද්ධ, ධම්ම, සඞ්ඝ, සික්ඛා, පුබ්බන්ත, අපරන්ත, පුබ්බන්තාපරන්ත, පටිච්චසමුප්පන්න ධර්ම යන අටතැන්හි උපදවන සැකය වේ. මොවුන් පිළිබඳ සැකයට අයොනිසො මනසිකාරය මුල් වේ. මෙය ද ධ්‍යානාදි උතුම් ධර්මයන්ගේ ඉපදීම වළක්වන හෙයින් නීවරණයයි කියනුලැබේ.

6. **භික්ඛවෙ**- මහණෙනි; —පෙ— **අසුභනිමිත්තං**- අසුභාරම්මණය හෙවත් (දසඅසුභයෙහි උපන්) අරමුණු සහිත ප්‍රථම ධ්‍යානය; **යොනිසො මනසිකරොතො**- නුවණින් මෙනෙහි කරන්නාහට; —පෙ— **පහීයති+ඉති**-ප්‍රහීණ වේයයි (වදාළසේක).

සංලක්ෂ්‍යය:-

අසුභනිමිත්තං- මෙහි දක්වූ "අසුභනිමිත්ත" නම් දසඅශුභයන්හි උපන් ප්‍රථමධ්‍යානයයි. එහෙයින් අශුභය ද අශුභනිමිත්ත නම් වේ. අසුභාරම්මණ වූ ධර්මය ද අශුභනිමිත්ත වේයයි දතයුතු. මේ අසුභාරම්මණය උද්ධුමාතක ය, විනීලක ය, විපුබ්බක ය, විච්ඡිද්දක ය, වික්ඛායිතක ය, වික්ඛිත්තක ය, හතවික්ඛිත්තක ය, ලොහිතක ය, පුළවක ය, අට්ඨික ය යි දසවැදෑරුම් වේ.

7. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නො වා ව්‍යාපාදො නුප්පජ්ජති උප්පන්නො වා ව්‍යාපාදො පහීයති යථයිදං භික්ඛවෙ මෙත්තා චෙතොවිමුත්ති. මෙත්තං භික්ඛවෙ චෙතොවිමුත්තිං යොනිසො මනසි කරොතො අනුප්පන්නො චෙව ව්‍යාපාදො නුප්පජ්ජති, උප්පන්නො ච ව්‍යාපාදො පහීයතීති.

8. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නං වා ථිනමිද්ධං නුප්පජ්ජති උප්පන්නං වා ථිනමිද්ධං පහීයති යථයිදං භික්ඛවෙ ආරම්භධාතු, නික්කමධාතු, පරක්කමධාතු. ආරද්ධවිරියස්ස භික්ඛවෙ අනුප්පන්නඤ්චෙව ථිනමිද්ධං නුප්පජ්ජති, උප්පන්නං ච ථිනමිද්ධං පහීයතීති.

9. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නං වා උද්ධච්චකුක්කුච්චං නුප්පජ්ජති උප්පන්නං වා උද්ධච්චකුක්කුච්චං පහීයති යථයිදං භික්ඛවෙ චෙතසො වූපසමො. වූපසන්තචිත්තස්ස භික්ඛවෙ අනුප්පන්නං චෙව උද්ධච්චකුක්කුච්චං නුප්පජ්ජති, උප්පන්නං ච උද්ධච්චකුක්කුච්චං පහීයතීති.

---

7. **භික්ඛවෙ**–මහණෙනි; —පෙ— **මෙත්තාචෙතොවිමුත්ති**– (නීවරණාදි ප්‍රතිපක්ෂයන් කෙරෙන් මිදුණු හෙයින් චෙතොවිමුත්ති නම් වූ) මෛත්‍රීසහගතචිත්තය;—පෙ— **පහීයති + ඉති**– ප්‍රහීණ වේයයි (වදාළසේක).

සංලක්ෂ්‍යයෙ:–

"**මෙත්තාචෙතොවිමුත්ති**"– සියලු සත්ත්වයන් කෙරෙහි හිත පැතිර වීම මෛත්‍රී නමි. ඒ මෛත්‍රිය හා සම්ප්‍රයුක්ත වන චිත්තය නීවරණාදි ප්‍රතිපක්ෂ කෙලෙසුන්ගෙන් මිදෙන හෙයින් ඊට "චෙතොවිමුක්තිය" යි කියනුලැබේ. විශෙෂයෙන් ව්‍යාපාදයෙන් මිදුණු හෙයින් මේ සිත චෙතොවිමුත්තියයි දතයුතු.

8. **භික්ඛවෙ**–මහණෙනි; —පෙ— **ආරම්භධාතු**– ප්‍රථමාරම්භ වීර්‍ය්‍යය ද; **නික්කමධාතු**– (කුසීතභාවයෙන් නික්මුණු හෙයින්) ඊට වඩා බලවත් වීර්‍ය්‍යය ද; **පරක්කමධාතු**– (මතු මතු ස්ථානයන් ආක්‍රමණය කරන හෙයින්) ඊටත් වඩා බලවත් වීර්‍ය්‍යය ද වේ; —පෙ— **ආරද්ධවිරියස්ස**– පරිපූර්ණවීර්‍ය්‍ය ඇත්තාහට; —පෙ— **පහීයති+ඉති**–ප්‍රහීණ වේය යි (වදාළසේක).

9. **භික්ඛවෙ**– මහණෙනි;—පෙ—**චෙතසො වූපසමො**– සිත පිළිබඳ ධ්‍යානාදියෙන් සන්සිඳීම වේ;—පෙ— **වූපසන්තචිත්තස්ස**–

10. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා විචිකිච්ඡා නුප්පජ්ජති උප්පන්නා වා විචිකිච්ඡා පහීයති යථයිදං භික්ඛවෙ යොනිසො මනසිකාරො. යොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව විචිකිච්ඡා නුප්පජ්ජති, උප්පන්නා ච විචිකිච්ඡා පහීයතීති.

වග්ගො දුතියො.

1—1-3.

1. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං අභාවිතං අකම්මනියං හොති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අභාවිතං අකම්මනියං හොතීති.

2. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං භාවිතං කම්මනියං හොති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ භාවිතං කම්මනියං හොතීති.

ධ්‍යානාදියෙන් සන්හුන් සිත් ඇත්තාහට; **පහීයති+ඉති**-ප්‍රහීණ වේයයි (වදාළසේක).

10. **භික්ඛවෙ**- මහණෙනි; —පෙ— **විචිකිච්ඡා**- (විචිකිත්සා සඞ්ඛ්‍යාත) බුද්ධාදි අටතැන්හි සැකය;—පෙ—**පහීයති+ඉති**-ප්‍රහීණ වේයයි (වදාළසේක).

දෙවෙනි වර්ගයයි.

1—1-3.

1. **භික්ඛවෙ**-මහණෙනි; **යං**-යම් ධර්මයක්; **අභාවිතං**-භාවනා වශයෙන් නො වඩනාලද්දේ; **එවං**-මෙසේ; **අකම්මනියං හොති**-කර්මයට යොග්‍ය නොවේ ද; (එබඳු වූ) **අඤ්ඤං එකධම්මං+අපි**-(මේ මතු කියන ධර්මය හැර) අන් එකම ධර්මයකුත්; **අහං**- මම; **න සමනුපස්සාමි**-ඥානසමනුපස්සනාවශයෙන් නො දක්නෙමි; (ඒ කවර ධර්මයක් ද යත්?) **යථා+ඉදං**- යම්බඳු වූ මේ; **චිත්තං**-සිත වේ. **භික්ඛවෙ**-මහණෙනි; **චිත්තං**-සිත; **අභාවිතං**- භාවනා වශයෙන් නො පවත්වන ලද්දේ; **අකම්මනියං හොති+ඉති**-කර්මයට අයොග්‍ය වේ (=අකර්මණ්‍ය වේ) යයි (වදාළසේක).

2. **භික්ඛවෙ**- මහණෙනි; **යං**- යම් ධර්මයක්; **භාවිතං**-භාවනා වශයෙන් පවත්වනලද්දේ; **එවං**- මෙසේ; **කම්මනියං**

3. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං අභාවිතං මහතො අනත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අභාවිතං මහතො අනත්ථාය සංවත්තතීති.

4. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං භාවිතං මහතො අත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ භාවිතං මහතො අත්ථාය සංවත්තතීති.

5. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං අභාවිතං අපාතුභූතං මහතො අනත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අභාවිතං අපාතුභූතං මහතො අනත්ථාය සංවත්තතීති.

6. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං භාවිතං පාතුභූතං මහතො අත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ භාවිතං පාතුභූතං මහතො අත්ථාය සංවත්තතීති.

7. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං අභාවිතං අබහුලීකතං මහතො අනත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අභාවිතං අබහුලීකතං මහතො අනත්ථාය සංවත්තතීති.

8. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං භාවිතං බහුලීකතං මහතො අත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ භාවිතං බහුලීකතං මහතො අත්ථාය සංවත්තතීති.

හොති- කර්මයට යොග්‍ය වේ ද; —පෙ--**චිත්තං**- සිත; **භාවිතං**- භාවනා වශයෙන් පවත්වන ලද්දේ; **කම්මනියං හොති+ඉති**- කර්මයට යොග්‍ය වේ ය යි (වදාළසේක).

3. —පෙ— **මහතො අනත්ථාය**-මහත් වූ අනර්ථය පිණිස; **සංවත්තති+ඉති**- පවත්නේය යි (වදාළසේක).

4. —පෙ— **මහතො අත්ථාය**- මහත් වූ අර්ථය පිණිස; **සංවත්තති+ඉති**-පවත්නේය යි (වදාළසේක).

5. —පෙ— **අපාතුභූතං**-(විවට්ටවශයෙන්) පහළ නොවූයේ;

6. —පෙ—**පාතුභූතං**- (විවට්ටවශයෙන්) පහළවූයේ;-පෙ-

7. —පෙ—**අබහුලීකතං**-නැවත නැවත නො වඩනලද්දේ;

8. —පෙ—**බහුලීකතං**- නැවත නැවත වඩනලද්දේ;-පෙ-

9. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං අභාවිතං අබහුලීකතං දුක්ඛාවහං හොති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අභාවිතං අබහුලීකතං දුක්ඛාවහං හොතීති.

10. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං භාවිතං බහුලීකතං සුඛාවහං හොති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ භාවිතං බහුලීකතං සුඛාවහං හොතීති.

වග්ගො තතියො.

1—1-4.

1. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං අදන්තං මහතො අනත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අදන්තං මහතො අනත්ථාය සංවත්තතීති.

2. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං දන්තං මහතො අත්ථාය සංවත්තති යථයිදං චිත්තං චිත්තං භික්ඛවෙ දන්තං මහතො අත්ථාය සංවත්තතීති.

---

9. —පෙ— **දුක්ඛාවහං හොති+ඉති**- දුක් එළවන්නේය යි.

10. —පෙ— **සුඛාවහං හොති+ඉති**- සැප එළවන්නේය යි.

තුන්වෙනි වර්ගයයි.

1—1-4.

1. **භික්ඛවෙ**-මහණෙනි; **යං**-යම් ධර්මයක්; **අදන්තං**-දමනය නො කරනලද්දේ; **එවං**- මෙසේ; **මහතො අනත්ථාය**- මහත් වූ අනර්ථය පිණිස; **සංවත්තති**-පවත්නේ ද; (එබඳු වූ) **අඤ්ඤං එකධම්මං+අපි**- (මේ මතු කියන ධර්මය හැර) අන් එකම ධර්මයකුත්; **අහං** මම; **න සමනුපස්සාමි**- (ඥානසමනුපස්සනා වශයෙන්) නො දක්නෙමි. (ඒ කෙසේ වූ ධර්මයක් ද?) **යථා+ඉදං**- යම් බඳු වූ මේ; **චිත්තං**- සිත වේ. **භික්ඛවෙ**- මහණෙනි; **චිත්තං**- සිත; **අදන්තං**- දමනය නො කරනලද්දේ; **මහතො අනත්ථාය**- මහත් වූ අනර්ථය පිණිස; **සංවත්තති+ඉති**- පවත්නේය යි (වදාළසේක).

2 —පෙ—**දන්තං**-දමනය කරනලද්දේ; -පෙ-**සංවත්තති+ඉති**-පවත්නේය යි (වදාළසේක).

3. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං අගුත්තං මහතො අනත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අගුත්තං මහතො අනත්ථාය සංවත්තතීති...

4. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං ගුත්තං මහතො අත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ ගුත්තං මහතො අත්ථාය සංවත්තතීති...

5. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං අරක්ඛිතං මහතො අනත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අරක්ඛිතං මහතො අනත්ථාය සංවත්තතීති...

6. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං රක්ඛිතං මහතො අත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ රක්ඛිතං මහතො අත්ථාය සංවත්තතීති...

7. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං අසංවුතං මහතො අනත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අසංවුතං මහතො අනත්ථාය සංවත්තතීති...

8. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං සංවුතං මහතො අත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ සංවුතං මහතො අත්ථාය සංවත්තතීති...

9 නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං අදන්තං අගුත්තං අරක්ඛිතං අසංවුතං මහතො අනත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ අදන්තං අගුත්තං අරක්ඛිතං අසංවුතං මහතො අනත්ථාය සංවත්තතීති...

10. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං දන්තං ගුත්තං රක්ඛිතං සංවුතං මහතො අත්ථාය සංවත්තති යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ දන්තං ගුත්තං රක්ඛිතං සංවුතං මහතො අත්ථාය සංවත්තතීති...

වග්ගො චතුත්ථො.

---

3. —පෙ— **අගුත්තං**– ගොපනය නො කරන ලද්දේ; -පෙ-
4. —පෙ—**ගුත්තං**–ගොපනය කරනලද්දේ;– පෙ—
5. —පෙ—**අරක්ඛිතං**–රක්‍ෂා නො කරනලද්දේ;—පෙ—
6. —පෙ— **රක්ඛිතං**– රක්‍ෂාකරනලද්දේ; —පෙ--
7. —පෙ— **අසංවුතං**– සංවරණය නො කරනලද්දේ;–පෙ-
8. — පෙ – **සංවුතං**–සංවරණය කරනලද්දේ;—පෙ --

9—10. (මේ සූත්‍ර දෙකෙහි අර්ථ කී නයින් දතයුතු.)

සතරවෙනි වර්ගයයි.

1—1–5.

1 සෙය්‍යථාපි භික්ඛවෙ සාලිසූකං වා යවසූකං වා මිච්ඡාපණිහිතං හත්ථෙන වා පාදෙන වා අක්කන්තං හත්ථං වා පාදං වා භෙජ්ජති, ලොහිතං වා උප්පාදෙස්සතීති නෙතං ඨානං විජ්ජති. තං කිස්ස හෙතු?. මිච්ඡාපණිහිතත්තා භික්ඛවෙ සූකස්ස. එවමෙව ඛො භික්ඛවෙ සො වත භික්ඛු මිච්ඡාපණිහිතෙන චිත්තෙන අවිජ්ජං භෙජ්ජති, විජ්ජං උප්පාදෙස්සති, නිබ්බාණං සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති. තං කිස්ස හෙතු?. මිච්ඡාපණිහිතත්තා භික්ඛවෙ චිත්තස්සාති—

2. සෙය්‍යථාපි භික්ඛවෙ සාලිසූකං වා යවසූකං වා සම්මාපණිහිතං හත්ථෙන වා පාදෙන වා අක්කන්තං හත්ථං වා පාදං වා භෙජ්ජති, ලොහිතං වා උප්පාදෙස්සතීති ඨානමෙතං විජ්ජති.

1—1–5.

1. **භික්ඛවෙ**- මහණෙනි; **සෙය්‍යථාපි**- යම්සේ වනාහි; **මිච්ඡාපණිහිතං**- වරදවා තබනලද; **සාලිසූකං වා**- හැල්වී නණ්ඩුවක් හෝ; **යවසූකං වා**- යවවී නණ්ඩුවක් හෝ; **හත්ථෙන වා**- අතින් හෝ; **පාදෙන වා**- පයින් හෝ; **අක්කන්තං**- මඩනා ලද්දේ; **හත්ථං වා**- අත හෝ; **පාදං වා**- පය හෝ; **භෙජ්ජති**- බිඳින්නේය; **ලොහිතං වා**- ලේ හෝ; **උප්පාදෙස්සති+ඉති**-උපදවන්නේය යන; **එතං+ඨානං**-මේ කාරණය; **න විජ්ජති**- විද්‍යමාන නො වේ. **තං කිස්ස හෙතු**- ඊට හේතු කවරේ ද?. **භික්ඛවෙ**- මහණෙනි; **සූකස්ස**- නණ්ඩුව තමා; **මිච්ඡාපණිහිතත්තා**- වරදවා තබනලද හෙයිනි; **භික්ඛවෙ**- මහණෙනි; **එවං+එව ඛො**- එපරිද්දෙන් ම; **සො භික්ඛු**- ඒ මහණ තෙම; **වත**- ඒකාන්තයෙන්; **මිච්ඡාපණිහිතෙන**- වරදවා තබනලද්දවූ; **චිත්තෙන**- සිතින්; **අවිජ්ජං**- අවිද්‍යාව; **භෙජ්ජති**- බිඳින්නේය. **විජ්ජං**- (අර්හත්මාර්ගඥානසංඛ්‍යාත) විද්‍යාව; **උප්පාදෙස්සති**-උපදවන්නේය. **නිබ්බාණං**- නිර්වාණය; **සච්ඡිකරිස්සති + ඉති**- ප්‍රත්‍යක්ෂ කරන්නේය යන; **එතං+ඨානං**- මේ කාරණය; **න විජ්ජති**- විද්‍යමාන නො වේ; **තං කිස්ස හෙතු?**- ඊට හේතු කවරේ ද?. **භික්ඛවෙ**- මහණෙනි; **චිත්තස්ස**-චිත්තය තමා; **මිච්ඡාපණිහිතත්තා**- වරදවා තබනලද හෙයිනැයි (වදාළසේක).

2. **භික්ඛවෙ**- මහණෙනි; —පෙ— **සම්මාපණිහිතං**- මනාකොට තබනලද; —පෙ— **එතං+ඨානං**- මේ කාරණය; **විජ්ජති**-

තං කිස්ස හෙතු? සම්මා පණිහිතත්තා භික්ඛවෙ සූකස්ස. එවමෙව ඛො භික්ඛවෙ සො වත භික්ඛු සම්මාපණිහිතෙන චිත්තෙන අවිජ්ජං භෙජ්ජති, විජ්ජං උප්පාදෙස්සති, නිබ්බාණං සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජති. තං කිස්ස හෙතු? සම්මාපණිහිතත්තා භික්ඛවෙ චිත්තස්සාති.

3. ඉධාහං භික්ඛවෙ එකච්චං පුග්ගලං පදුට්ඨචිත්තං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි, ඉමම්හි චෙ අයං සමයෙ පුග්ගලො කාලං කරෙය්‍ය යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. තං කිස්ස හෙතු? චිත්තං හිස්ස භික්ඛවෙ පදුට්ඨං. චෙතොපදොසහෙතු ච පන භික්ඛවෙ එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්තීති.

විද්‍යමාන වේ;—පෙ— **සම්මාපණිහිතත්තා**– මනාකොට පිහිටුවන ලද හෙයිනැයි (වදාළසේක).

සංලක්‍ෂ්‍යය:-

සාලිසූකං වා යවසූකං වා– ඇත්දෙමට කුකුරුමුවන් ආදි මහත් කටු ඇති වනියක් නො ගෙන ඉතා ම සියුම් වූ ද දුබල වූ ද සාලිසූක යවසූක යන් ගෙනහැර දක්වීම සවල්පමාත්‍ර වූ ද කුශලකර්මය නිර්වාණය පිණිස පවත්නා බැව් දක්වීම පිණිසයි. සවල්ප වූ ද මහත් වූ ද පුණ්‍යකර්මයක් කොට භවසම්පත්තිය පමණක් ප්‍රාර්ථනා කෙරේ නම් ඒ **මිච්ඡාපණිහිත** නම්. ඒ වරදවා තැබූ සිතිවිල්ල කාරණ කොට ගෙන නවලොවුතුර දහම් ලැබීම දුෂ්කර වන්නේය. "**ඉමං මෙ දානං ආසවක්ඛයාවහං හොතු**"යි කී නියායෙන් පුණ්‍යකර්ම පිළිබඳ ප්‍රාර්ථනාව **සම්මාපණිහිත** නම්. එයින් නවලොවුතුර දහම් ද ලැබියහැක්කේ ය.

3. **භික්ඛවෙ**– මහණෙනි; **ඉධ**– මේ ලොකයෙහි; **අහං**– මම; **පදුට්ඨචිත්තං**– අතිශයින් දූසිත වූ සිත් ඇති; **එකච්චං පුග්ගලං**– එක්තරා පුද්ගලයකු; **එවං**– මෙසේ; **චෙතසා**- (මාගේ) සිතින්; **චෙතො**– (ඔහුගේ) සිත; **පරිච්ච**- පිරිසිඳ; **පජානාමි**– දනිමි. (කෙසේ ද යත්?) **චෙ**– ඉදින්; **ඉමම්හි සමයෙ**– මේ කාලයෙහි; **අයං පුග්ගලො**– මේ පුද්ගල තෙම; **කාලං කරෙය්‍ය**– කළුරිය කරන්නේ නම්; **ආහතං**– ගෙනඑනලද්දක්; **නික්ඛිත්තො**– බහා තබනලද්දේ; **යථා**–යම්සේ ද; **එවං**–එපරිද්දෙන් ම; **නිරයෙ**-නරක යෙහි (උපදනේ) වේ; **තං කිස්ස හෙතු**?– ඊට හේතු කවරේ ද?. **භික්ඛවෙ**– මහණෙනි; **හි**– යම්හෙයකින්; **අස්ස**– ඔහුගේ; **චිත්තං**– සිත; **පදුට්ඨං**-අතිශයින් දූෂිත ද එහෙයිනි. **භික්ඛවෙ**– මහණෙනි; **චෙතොපදොසහෙතු+ච පන**– සිත අතිශයින් දූෂිතවීම හේතු කොට ගෙන ද වනාහි; **එවං**– මෙසේ; **ඉධ**– මේ ලොකයෙහි;

4. ඉධාහං භික්ඛවෙ එකච්චං පුග්ගලං පසන්නචිත්තං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි, ඉමම්හි චෙ අයං සමයෙ පුග්ගලො කාලං කරෙය්‍ය, යථාභතං නික්ඛිත්තො එවං සග්ගෙ. තං කිස්ස හෙතු? චිත්තං හිස්ස භික්ඛවෙ පසන්නං. චෙතොපසාද හෙතුච්ච පන භික්ඛවෙ එවමිධෙකච්චෙ සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්තීති.—

එකච්චෙ සත්තා- සමහර සත්වයෝ; **කායස්ස භෙදා**- ශරීරයාගේ භෙදයෙන්; **මරණා පරං**- මරණින් මත්තෙහි; **අපායං**- (අය සඞ්ඛ්‍යාත සැපයෙන් පහවූ හෙයින්) අපාය නම් වූ; **දුග්ගතිං**- දුකට පිහිට හෙයින්) දුර්ගති නම් වූ; **විනිපාතං**- (විවශ ව පතිත වන හෙයින්) විනිපාත නම් වූ: **නිරයං**- නරකයට; **උපපජ්ජන්ති+ඉති**- (ඉපදීම් වශයෙන්) පැමිණෙත්ය යි (වදාළසේක).

4. **භික්ඛවෙ**- මහණෙනි; —පෙ— **පසන්නචිත්තං**- පහන් සිත් ඇති; —පෙ— **එවං**- එපරිද්දෙන් ම; **සග්ගෙ**- ස්වර්ගයෙහි උපදනේ වේ.—පෙ—**චෙතොපසාදහෙතු+ච පන**- චිත්තප්‍රසාදය හෙතු කොට ගෙන ද වනාහි;—පෙ— **සුගතිං**- සොභනගති ඇති හෙයින් සුගති නම් වූ; **සග්ගං ලොකං**- ස්වර්ගලොකයට; **උපපජ්ජන්ති+ඉති**- (ඉපදීම් වශයෙන්) පැමිණෙත්ය යි (වදාළසේක)

1. සංලක්ෂ්‍යය:-

ඉධාහං (ඉධ+අහං)- මෙය "ඉදහං"යි මුද්‍රිත පොත්හි ප්‍රමාදපතිත වූවකි. **එකාමිදහං** (එකං+ඉධ+අහං) යන තන්හි එකශබ්දයෙන් පර වූ ඉධශබ්දයාගේ ධකාරයට දකාරාදෙශය වෛයාකරණයන් විසින් සම්මත ය. කෙවල ඉධශබ්දයට නො වේ.

"**ඉධාහං** භික්ඛවෙ භුත්තාවී අස්සං" යනාදි ධම්මදායාද සූත්‍ර වචනය මීට සාධක යි.

2. සංලක්ෂ්‍යය:-

උපපජ්ජන්ති- යනු "උප්පජ්ජන්ති" යි මුද්‍රිතපොත්හි බොහෝසේ පෙනේ. එසේ වුවත්- උපපත්ති අර්ථයෙහි උපපජ්ජන්ති යනු ම මැනවි. **උප** පූර්ව **පද**ධාතුවෙන් සිද්ධ වන හෙයිනි. **උ** පූර්ව **පද** ධාතුවෙන් සිද්ධ වූ උප්පජ්ජන්ති යනු මේ අර්ථයෙහි යොග්‍ය නොවේ.

"අවිහං උපපන්නාසෙ විමුත්තා සත්ත භික්ඛවො" "නිරයං සො උපපජ්ජති" යන තන්හි සෙයින් **උප** පූර්ව **පද** ධාතුනිෂ්පන්න පදයන් යෙදෙන තන්හි ම අවිහං, නිරයං යනාදීන් විතීයාවිභක්ති ද යෙදේ. (විචාරණීයයි.)

5. සෙය්‍යථාපි භික්ඛවෙ උදකරහදො ආවිලො ලුළිතො කලලීභූතො. තත්ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො න පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි. තං කිස්ස හෙතු? ආවිලත්තා භික්ඛවෙ උදකස්ස. එවමෙව ඛො භික්ඛවෙ සො වත භික්ඛු ආවිලෙන චිත්තෙන අත්තත්ථං වා ඤස්සති, පරත්ථං වා ඤස්සති, උභයත්ථං වා ඤස්සති, උත්තරිං වා මනුස්සධම්මා. අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරිස්සතීති නෙතං ඨානං විජ්ජති. තං කිස්ස හෙතු? ආවිලත්තා භික්ඛවෙ චිත්තස්සාති.

6. සෙය්‍යථාපි භික්ඛවෙ උදකරහදො අච්ඡො විප්පසන්නො අනාවිලො. තත්ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො පස්සෙය්‍ය සිප්පිසම්බුකම්පි සක්ඛරකඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි.

---

5. **භික්ඛවෙ**–මහණෙනි; **සෙය්‍යථාපි**–යම්සේ; **උදකරහදො**–දියවිලෙක් තෙම; **ආවිලො**-නොපැහැදුණේ; **ලුළිතො**-කැළඹුණේ; **කලලීභූතො**– මඩ බොර වූයේ වේ ද; **තත්ථ**– එහි; **තීරෙ ඨිතො**– තෙර සිටියා වූ; **චක්ඛුමා පුරිසො**– ඇස් ඇති පුරුෂයෙක් තෙම; **චරන්තං+අපි**–හැසිරෙන්නා වූ ද; **තිට්ඨන්තං+අපි**–සිටින්නා වූ ද; **සිප්පිසම්බුකං+අපි**– සිප්පිබෙල්ලන් හා සක්බෙල්ලන් ද; **සක්ඛරකඨලං+අපි**–කැටකැබිලිති ද; **මච්ඡගුම්බං+අපි**– මත්ස්‍යසමූහයා ද; **න පස්සෙය්‍ය**– නො දක්නේ ද; **තං කිස්ස හෙතු?**– ඊට හේතු කවරේ ද?; **භික්ඛවෙ**– මහණෙනි; **උදකස්ස**– ජලය තමා; **ආවිලත්තා**– නො පැහැදුණු හෙයිනි. **භික්ඛවෙ**– මහණෙනි; **එවං+එව ඛො**– එපරිද්දෙන් ම; **වත**– ඒකාන්තයෙන්; **සො භික්ඛු**– ඒ භික්ෂු තෙම; **ආවිලෙන චිත්තෙන**– (පඤ්චනීවරණයන්ගෙන් වලඳනා ලද හෙයින්) නො පැහැදුණා වූ සිතින්; **අත්තත්ථං වා**– ආත්මාර්ථය හෝ; **ඤස්සති**– දැනගන්නේ ය; **පරත්ථං වා**– පරාර්ථය හෝ; **ඤස්සති**– දැනගන්නේ ය; **උභයත්ථං වා**– උභයාර්ථය හෝ; **ඤස්සති**– දැනගන්නේ ය; **මනුස්සධම්මා**– (දසකුශලකර්මපථ සඞ්ඛ්‍යාත) මනුෂ්‍යධර්මයෙන්; **උත්තරිං**– මත්තෙහි; **අලමරියඤාණදස්සනවිසෙසං වා**– ආර්යභාවය කිරීමට පොහොසත් වූ විශිෂ්ටඥානදර්ශනයක් හෝ; **සච්ඡිකරිස්සති+ඉති**– ප්‍රත්‍යක්ෂ කරන්නේ ය යන; **එතං ඨානං**– මේ කාරණය; **න විජ්ජති**– නො වන්නේය. **තං කිස්ස හෙතු?**– ඊට හේතු කවරේ ද?. **භික්ඛවෙ**– මහණෙනි; **චිත්තස්ස**–චිත්තය තමා; **ආවිලත්තා+ඉති**– නො පැහැදුණු හෙයිනැයි (වදාළසේක).

තං කිස්ස හෙතු? අනාවිලත්තා භික්ඛවෙ උදකස්ස. එවමෙව ඛො භික්ඛවෙ සො වත භික්ඛු අනාවිලෙන චිත්තෙන අත්තත්ථං වා ඤස්සති, පරත්ථං වා ඤස්සති, උභයත්ථං වා ඤස්සති, උත්තරිං වා මනුස්සධම්මා අලමරියඤාණදස්සනවිසෙසං සච්ඡිකරිස්සතීති ඨානමෙතං විජ්ජති. තං කිස්ස හෙතු? අනාවිලත්තා භික්ඛවෙ චිත්තස්සාති.

7. සෙය්‍යථාපි භික්ඛවෙ යානි කානිචි රුක්ඛජාතානං, ඵන්දනො තෙසං අග්ගමක්ඛායති යදිදං මුදුතාය කම්මඤ්ඤතාය. එවමෙව ඛො අහං භික්ඛවෙ න අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං භාවිතං බහුලීකතං මුදුං ච හොති කම්මඤ්ඤං ච යථයිදං චිත්තං. චිත්තං භික්ඛවෙ භාවිතං බහුලීකතං මුදුං ච හොති කම්මඤ්ඤං චාති.

---

6. **භික්ඛවෙ**-මහණෙනි; **සෙය්‍යථාපි**-යම්සේ වනාහි; **උදකරහදො**- දියවිලෙක් තෙම; **අච්ඡො**- පැහැදුණේ; **විප්පසන්නො**- වෙසෙසින් පැහැදුණේ; **අනාවිලො**- නො කැලඹුණේ වේ ද; —පෙ—. **අනාවිලෙන චිත්තෙන**- (පඤ්චනීවරණයන්ගෙන් නො වලදනාලද හෙයින්) පැහැදුණා වූ සිතින්; —පෙ—. **අනාවිලත්තා**- පැහැදුණු හෙයිනැයි (වදාළසේක).

සංලක්ෂ්‍යය:-

උත්තරිං වා මනුස්සධම්මා- මෙහි දක්වෙන මනුෂ්‍යධර්මය නම් දන සිල භාවනාදිවශයෙන් ප්‍රභෙදගත ව පවත්නා දශකුශලකර්මපථය යි. මේ දශකුශලය අබුද්ධොත්පාදකාලවල ද මනුෂ්‍යයන් විසින් ම සමාදන්වන (පුරන) හෙයින් මීට මනුෂ්‍යධර්මය යි කියනුලැබේ. මේ මනුෂ්‍යධර්මයට වඩා උත්තරිතර වූයේ ධ්‍යානවිදර්ශනාමාර්ගඵලයන් බව දතයුතුයි.

7. **භික්ඛවෙ**- මහණෙනි; **සෙය්‍යථාපි**-යම්සේ; **යානි කානිචි රුක්ඛජාතානං**- යම්කිසි වෘක්ෂජාති කෙනෙක් ඇද්ද; **තෙසං**- ඔවුන් අතුරෙන්; **යදිදං**- යම් මේ; **මුදුතාය**- මෘදුභාවයෙන් ද; **කම්මඤ්ඤතාය**- කර්මණ්‍යභාවයෙන් ද; **ඵන්දනො**- කොලොම් වෘක්ෂය තෙම; **අග්ගං+අක්ඛායති**- අග්‍රයයි කියනුලැබේ ද. **භික්ඛවෙ**- මහණෙනි; **එවං+එව ඛො**- එපරිද්දෙන් ම; **යං**- යමක්; **භාවිතං**-(භාවනාවශයෙන්) වඩනලද්දේ; **බහුලීකතං**- නැවත නැවත පුරුදු කරන ලද්දේ; **එවං**- මෙසේ; **මුදුං ච හොති**- මෘදුත් වේ ද; **කම්මඤ්ඤං ච**- කර්මයට යොග්‍යත් වේ ද. (එබඳු වූ) **අඤ්ඤං එකධම්මං+අපි**- (මේ මතු කියන ධර්මය හැර) අන් එක ම ධර්මයකුත්; **අහං**- මම; **න සමනුපස්සාමි**- (ඤාණ සමනුපස්සනාවෙන් නො දක්නෙමි. (ඒ කවර ධර්මයක් ද?)

8. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං ලහුපරිවත්තං යථයිදං චිත්තං. යාවඤ්චිදං භික්ඛවෙ උපමාපි න සුකරා යාව ලහුපරිවත්තං චිත්තන්ති.

9. පභස්සරමිදං භික්ඛවෙ චිත්තං, තඤ්ච ඛො අගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨන්ති.

10. පභස්සරමිදං භික්ඛවෙ චිත්තං, තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි විප්පමුත්තන්ති.

වග්ගො පඤ්චමො.

භික්ඛවෙ- මහණෙනි; **යථා+ඉදං**- යම්බඳු වූ මේ; **චිත්තං**- චිත්තය වේ. **භික්ඛවෙ**- මහණෙනි; **චිත්තං**- සිත; **භාවිතං**- (භාවනා වශයෙන්) වඩනලද්දේ; **බහුලීකතං**- නැවත නැවත පුරුදු කරන ලද්දේ; **මුදුං ච හොති**-මෘදුත් වේ; **කම්මඤ්ඤං ච+ඉති**- කර්මයට යොග්‍යත් වේය යි (වදාළසේක).

සංලක්ෂ්‍යය:-

රුක්ඛජාතානං යනු ප්‍රථමාවයෙහි ෂෂ්ඨිවිභක්තියි. එසේම අපි දක්වනලදි.

8. **භික්ඛවෙ**- මහණෙනි; **යං**- යමක්; **එවං**- මෙසේ; **ලහුපරිවත්තං**- වහා ඉපිද වහා නස්නාසුලු ද (එබඳු වූ); **අඤ්ඤං එකධම්මං+අපි**- (මේ මතු කියන ධර්මය හැර) අන් එක ම ධර්මයකුත්; **අහං**- මම; **න සමනුපස්සාමි**- (ඥාණසමනුපස්සනාවෙන්) නො දක්නෙමි. (ඒ කවර ධර්මයක් ද?) **යථා+ඉදං**- යම්බඳු වූ මේ; **චිත්තං**-චිත්තය වේ. **භික්ඛවෙ**- මහණෙනි; **යාවඤ්චිදං**- යම් මේ; **චිත්තං**- සිත; **යාව**- යම්තාක්; **ලහුපරිවත්තං**- වහා ඉපිද වහා නස්නාසුලු ද (එබඳු වූ); **උපමා+අපි**- උපමාවකුදු; **න සුකරා**- සුකර නො වන්නේය (දක්වන්නට නො හැක්කේයයි වදාළසේක).

9. **භික්ඛවෙ**- මහණෙනි; **ඉදං චිත්තං**- මෙ භවාඞ්ගචිත්තය; **පභස්සරං**- ප්‍රභාස්වරයි හෙවත් පිරිසුදුයි. **තං ච ඛො**- හෙ ද වනාහි; **ආගන්තුකෙහි**- (ජවනක්ෂණයෙහි උපදනා හෙයින්) ආගන්තුක වූ; **උපක්කිලෙසෙහි**- රාගාදි උපක්ලේශයන් කරණ කොට ගෙන; **උප+කිලිට්ඨං+ඉති**- කිලුටු වූයේය යි (වදාළසේක).

10. —පෙ— **විප්පමුත්තං+ඉති**- (රාගාදියෙන්) විශේෂයෙන් මිදුණේය යි (වදාළසේක).

පස්වෙනි වර්ගයයි.

1–6.

1. පභස්සරමිදං භික්ඛවෙ චිත්තං තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨං. තං අස්සුතවා පුථුජ්ජනො යථාභූතං නප්පජානාති. තස්මා අස්සුතවතො පුථුජ්ජනස්ස චිත්තභාවනා නත්ථීති වදාමීති ~

2. පභස්සරමිදං භික්ඛවෙ චිත්තං තඤ්ච ඛො ආගන්තුකෙහි උපක්කිලෙසෙහි විප්පමුත්තං. තං සුතවා අරියසාවකො යථාභූතං පජානාති. තස්මා සුතවතො අරියසාවකස්ස චිත්තභාවනා අත්ථීති වදාමීති ~

3. අච්ඡරාසඞ්ඝාතමත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු මෙත්තං චිත්තං ආසෙවති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරිත්තජ්ඣානො විහරති, සත්ථුසාසනකරො, ඔවාදපතිකරො, අමොඝං රට්ඨපිණ්ඩං භුඤ්ජති. කො පන වාදො යෙ නං බහුලීකරොන්තීති ~

1–6.

1. —පෙ— **තං**–ඒ භවාඞ්ගචිත්තය; **අස්සුතවා**– අශ්‍රැතවත් වූ හෙවත් ආගම අධිගම විරහිත වූ; **පුථුජ්ජනො**– බාල පෘථග්ජන තෙම; **යථාභූතං**–තත් වූ පරිද්දෙන්; **න+පජානාති**–නො දන්නේ වේ. **තස්මා**– එහෙයින්; **අස්සුතවතො**– අශ්‍රැතවත් වූ හෙවත් ආගම අධිගම නැත්තා වූ; **පුථුජ්ජනස්ස**– බාලපෘථග්ජනයාහට; **චිත්තභාවනා**-සිත වැඩිමෙක්; **නත්ථි+ඉති**- නැතැ යි; **වදාමි+ඉති**– කියමි යි (වදාළසේක).

2. —පෙ— **තං**– ඒ භවාඞ්ගචිත්තය; **සුතවා**– ශ්‍රැතවත් වූ හෙවත් ආගම අධිගම දෙකින් යුක්ත වූ; **අරියසාවකො**– ආර්‍ය ශ්‍රාවක තෙම; **යථාභූතං**– තත් වූ පරිද්දෙන්; **පජානාති**–දන්නේ වේ. **තස්මා**– එහෙයින්; **සුතවතො**– ශ්‍රැතවත් වූ හෙවත් ආගම අධිගම දෙකින් යුක්ත වූ; **අරියසාවකස්ස**- ආර්‍යශ්‍රාවකයාහට; **චිත්තභාවනා**– සිත වැඞීම; **අත්ථි+ඉති**- ඇතැ යි; **වදාමි+ඉති**- කියමි යි (වදාළසේක).

සංලක්ෂ්‍යය:-

"**අස්සුතවා පුථුජ්ජනො**"– බොහෝ වූ නානාප්‍රකාර වූ කෙලෙසුන් උපදවන හෙයින් පෘථග්ජන නම් වේ. යමක්හට ස්කන්ධධාතු ආයතන ප්‍රතීත්‍ය සමුත්පාද සතිපට්ඨානාදියෙහි උග්ගහපරිපුච්ඡාවශයෙන් අවබොධයක් නැත්තේ ද, හෙතෙම (ආගම අධිගම දෙකින් විරහිත හෙයින්) අශ්‍රැතවත් පෘථග්ජනය යි කියනලදි.

3. **භික්ඛවෙ**– මහණෙනි; **භික්ඛු**– යොගාවචර මහණ තෙම; **චෙ**– ඉදින්; **අච්ඡරාසඞ්ඝාතමත්තං+අපි**– අසුරුසනක් පමණ

4. අච්ඡරාසඞ්ඝාතමත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු මෙත්තං චිත්තං භාවෙති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරිත්තජ්ඣානො විහරති, සත්ථුසාසනකරො, ඔවාදපතිකරො, අමොඝං රට්ඨපිණ්ඩං භුඤ්ජති. කො පන වාදො, යෙ නං බහුලීකරොන්තීති —

5. අච්ඡරාසඞ්ඝාතමත්තම්පි චෙ භික්ඛවෙ භික්ඛු මෙත්තං චිත්තං මනසි කරොති. අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරිත්තජ්ඣානො විහරති, සත්ථුසාසනකරො, ඔවාදපතිකරො, අමොඝං රට්ඨපිණ්ඩං භුඤ්ජති. කො පන වාදො යෙ නං බහුලීකරොන්තීති —

6. යෙ කෙචි භික්ඛවෙ ධම්මා අකුසලා අකුසලභාගියා අකුසලපක්ඛිකා. සබ්බෙ තෙ මනොපුබ්බඞ්ගමා, මනො තෙසං ධම්මානං පඨමං උප්පජ්ජති, අන්වදෙව අකුසලා ධම්මාති —

කාලයකුදු; **මෙත්තං චිත්තං**– මෙත්සිත; **ආසෙවති**- සේවනය කෙරේ ද; **භික්ඛවෙ**– මහණෙනි; **අයං භික්ඛු**- මේ මහණ තෙම; **අරිත්තජ්ඣානො**– නො සිස් වූ ධ්‍යාන ඇති ව; **විහරති**– වාසය කෙරෙයි; **සත්ථුසාසනකරො**-ශාස්තෘන්වහන්සේගේ අනුශාසනාව කරන්නේ වේ. **ඔවාදපතිකරො**- අවවාදය ගරු කරන්නේ වේ. **අමොඝං**– නො සිස් වූ; **රට්ඨපිණ්ඩං**– රටවැසියා විසින් දෙනලද ආහාරය; **භුඤ්ජති**– වළඳන්නේය යි; **වුච්චති**– කියනු ලැබේ. **යෙ**– යම් කෙනෙක් තුමූ; **නං**– ඒ මෙත්සිත; **බහුලීකරොන්ති**- නැවත නැවත පුරුදු කෙරෙත් නම්; **කො පන වාදො+ඉති**- එහි අනුසස් කියනුම කවරේදැ යි (වදළසේක).

4. —පෙ—**භාවෙති**– වඩා ද;—පෙ—

5. —පෙ—**මනසිකරොති**–මෙනෙහිකෙරේ ද;—පෙ—

සංලක්ෂ්‍යය:–

ආසෙවති, භාවෙති, මනසිකරොති– 3-4-5 යන සූත්‍රත්‍රයෙන් ම කියනලද්දේ එක ම අර්ථයෙකි. යමෙක් මෙත්සිත සෙවුනේ ද, වඩන්නේත් හේ මැ යි. මෙනෙහිකරන්නේත් හේ මැ යි. යම් සිතකින් මෛත්‍රිය සෙවුනේනම් වඩන්නේ ද ඒ සිතින් ම ය, මෙනෙහි කරන්නේත් ඒ සිතින්ම ය මෙසේ මේ එක ම සිත දෙශනාවිලාසකුශලතායෙන් තථාගතයන් වහන්සේ තුන්කොටසක් කොට දෙසූහ.

6. **භික්ඛවෙ**- මහණෙනි; **යෙ කෙචි ධම්මා**– යම්කිසි ධර්ම කෙනෙක්; **අකුසලා**– අකුසල් වෙද් ද; **අකුසලභාගියා**– අකුසල් කොට්ඨාසයෙහි වෙද් ද; **අකුසලපක්ඛිකා**– අකුසල්පක්ෂයෙහි වෙද් ද; **තෙ සබ්බෙ**– ඒ සියල්ලෝ ම; **මනො පුබ්බඞ්ගමා**– සිත

7. යෙ කෙචි භික්ඛවෙ ධම්මා කුසලා කුසලභාගියා කුසලපක්ඛිකා. සබ්බෙ තෙ මනොපුබ්බඞ්ගමා, මනො තෙසං ධම්මානං පඨමං උප්පජ්ජති, අන්වදෙව කුසලා ධම්මාති ....

8. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ පමාදො. පමත්තස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති....

9. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ අප්පමාදො. අප්පමත්තස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති....

10. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ කොසජ්ජං. කුසීතස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති....

වග්ගො ඡට්ඨො.

පෙරදැරි කොට ඇත්තෝ වෙත්. **තෙසං ධම්මානං**- ඒ ධර්‍මයන් සම්බන්ධ ව; **මනො**- සිත; **පඨමං**- පළමුකොට හෙවත් ප්‍රධාන ව; **උප්පජ්ජති**- උපදී; **අකුසලා ධම්මා**- අකුශලධර්‍මයෝ; **අන්වදෙව + ඉති**- ඒ හා සමඟ ම උපදිත් ය යි (වදාළසේක).

7. —පෙ—**කුසලා**- කුසල් වෙද් ද; **කුසලභාගියා**- කුසල් කොටඨාසයෙහි වෙද්ද; **කුසලපක්ඛිකා**- කුසල්පක්‍ෂයෙහි වෙද්ද.

8. —පෙ—**යෙන**- යමක් කාරණ කොට ගෙන; **අනුප්පන්නා වා**- නූපන්නා වූ ද; —පෙ— **භික්ඛවෙ**- මහණෙනි; **යථා+ඉදං**- යම්බඳු වූ මේ; **පමාදො**- ප්‍රමාදය හෙවත් කායදුශ්චරිතාදියෙහි සිත යැවීම වේ. —පෙ— **පරිහායන්ති + ඉති**- පිරිහෙත් ය යි

9. —පෙ— **යථා+ඉදං**–යම්බඳු වූ මේ; **අප්පමාදො**–අප්‍රමාදය හෙවත් කායසුචරිතාදියෙහි සිත යැවීම වේ. –පෙ–

10. —පෙ—**කොසජ්ජං**- කුසීතබව වේ.—පෙ—

සවෙනි වර්ගයයි.

1–7.

1. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ විරියාරම්භො. ආරද්ධවිරියස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති.

2. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ මහිච්ඡතා. මහිච්ඡස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති.

3. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ අප්පිච්ඡතා. අප්පිච්ඡස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති.

4. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ අසන්තුට්ඨිතා. අසන්තුට්ඨස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති.

1–7.

1. -පෙ-**විරියාරම්භො**-වීර්‍ය්‍යාරම්භය-පෙ- **ආරද්ධවිරියස්ස**-පටන්ගත්වීර්‍ය්‍ය ඇත්තාහට;-පෙ-

2. —පෙ— **මහිච්ඡතා**- මහෙච්ඡතාවය හෙවත් මහාලොභි බව —පෙ—**මහිච්ඡස්ස**-මහාලොභියාහට;—පෙ—

3. —පෙ— **අප්පිච්ඡතා**- අල්පෙච්ඡබව හෙවත් අලෝභිබව; -පෙ- **අප්පිච්ඡස්ස**-අල්පෙච්ඡ වූවහුට; -පෙ-

4 —පෙ— **අසන්තුට්ඨිතා**- ලදදෙයින් සතුටු නොවන බව —පෙ—**අසන්තුට්ඨස්ස**-ලදදෙයින් සතුටු නෝවූවහුට; -පෙ-

5. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ සන්තුට්ඨිතා. සන්තුට්ඨස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති.

6. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ අයොනිසො මනසිකාරො. අයොනිසො භික්ඛවෙ මනසි කරොතො අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති.

7. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ යොනිසො මනසිකාරො. යොනිසො භික්ඛවෙ මනසි කරොතො අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති.

8. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ අසම්පජඤ්ඤං. අසම්පජානස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති.

---

5. —පෙ— **සන්තුට්ඨිතා**- අලොභසඞ්ඛ්‍යාත සන්තොෂ ඇති බව—පෙ—**සන්තුට්ඨස්ස**-ලදදෙයින් සතුටුවන්නාහට;-පෙ-

6. -පෙ- **අයොනිසො මනසිකාරො**- නුනුවණින් මෙනෙහි කිරීම—පෙ—**මනසිකරොතො**- මෙනෙහි කරන්නාහට;—පෙ—

7. —පෙ— **යොනිසො මනසිකාරො**- නුවණින් මෙනෙහි කිරීම—පෙ—

8. —පෙ— **අසම්පජඤ්ඤං**- මනා නුවණ නැති බව (=මොහය) වේ. **අසම්පජානස්ස**- අඥනයාහට; —පෙ—

9. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ සම්පජඤ්ඤං. සම්පජානස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති—

10. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ පාපමිත්තතා. පාප මිත්තස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති—

වග්ගො සත්තමො.

1–8.

1. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ කල්‍යාණමිත්තතා. කල්‍යාණමිත්තස්ස භික්ඛවෙ අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති—

2. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා

---

9. —පෙ—**සම්පජඤ්ඤං**- මනා නුවණැති බව (=ප්‍රාඥ බව); —පෙ— **සම්පජානස්ස**- ප්‍රාඥයාහට; —පෙ—

10. —පෙ— **පාපමිත්තතා**- පවිටුමිත්‍රයන් ඇති බව —පෙ— **පාපමිත්තස්ස**- පවිටුමිත්‍රයන් ඇත්තාහට; —පෙ—

සත්වෙනි වර්ගය යි.

1–8.

1. —පෙ—**කල්‍යාණමිත්තතා**- යහපත් මිත්‍රයන් ඇති බව; -පෙ- **කල්‍යාණමිත්තස්ස**- කල්‍යාණමිත්‍රයන් ඇත්තාහට; -පෙ-

2. —පෙ— **අකුසලානං ධම්මානං**- අකුශලධර්මයන්ගේ; **අනුයොගො**- නැවත නැවත යෙදීම ද; **කුසලානං ධම්මානං**-

කුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ අනුයොගො අකුසලානං ධම්මානං අනනුයොගො කුසලානං ධම්මානං. අනුයොගා භික්ඛවෙ අකුසලානං ධම්මානං අනනුයොගා කුසලානං ධම්මානං අනුප්පන්නා චෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච කුසලා ධම්මා පරිහායන්තීති.

3. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති යථයිදං භික්ඛවෙ අනුයොගො කුසලානං ධම්මානං අනනුයොගො අකුසලානං ධම්මානං. අනුයොගා භික්ඛවෙ කුසලානං ධම්මානං අනනුයොගා අකුසලානං ධම්මානං අනුප්පන්නා චෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්තීති.

4. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා බොජ්ඣඞ්ගා නුප්පජ්ජන්ති උප්පන්නා වා බොජ්ඣඞ්ගා න භාවනා පාරිපූරිං ගච්ඡන්ති යථයිදං භික්ඛවෙ අයොනිසො මනසිකාරො. අයොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව බොජ්ඣඞ්ගා නුප්පජ්ජන්ති, උප්පන්නා ච බොජ්ඣඞ්ගා න භාවනා පාරිපූරිං ගච්ඡන්තීති.

5. නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා බොජ්ඣඞ්ගා උප්පජ්ජන්ති උප්පන්නා වා

කුශලධර්මයන්ගේ; **අනනුයොගො**- නැවත නැවත නො යෙදීම ද වේ.—පෙ— **අනුයොගා**- නැවත නැවත යෙදීමෙන්; —පෙ— **අනනුයොගා**- නැවත නැවත නො යෙදීමෙන්—පෙ—

3. —පෙ— **කුසලානං ධම්මානං**- කුශලධර්මයන්ගේ; **අනුයොගො**- නැවත නැවත යෙදීම ද; **අකුසලානං ධම්මානං**- අකුශලධර්මයන්ගේ; **අනනුයොගො**- නැවත නැවත නො යෙදීම ද. —පෙ—

4. —පෙ— **අනුප්පන්නා වා**- නූපන්නා වූ ද; **බොජ්ඣඞ්ගා**- බොධ්‍යඞ්ගධර්මයෝ; **භාවනා**- වැඩීමෙන්; **පාරිපූරිං**- පරිපූර්ණත්වයට; **න ගච්ඡන්ති**-නො පැමිණෙත් ද;-පෙ- **අයොනිසො මනසිකාරො**- නුනුවණින් මෙනෙහි කිරීම වේ. -පෙ- **පාරිපූරිං**- සම්පූර්ණත්වයට; **න ගච්ඡන්ති+ඉති**- නො පැමිණෙත් ය යි (වදාළ සේක).

5. —පෙ— **උප්පන්නා වා**- උපන්නා වූ ද; **බොජ්ඣඞ්ගා**- බොධ්‍යඞ්ගධර්මයෝ; **භාවනා**- වැඩීමෙන්; **පාරිපූරිං**- සම්පූර්

බොජ්ඣඞ්ගා භාවනා පාරිපූරිං ගච්ඡන්ති යථයිදං භික්ඛවෙ යොනිසො මනසිකාරො. යොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නා චෙව බොජ්ඣඞ්ගා උප්පජ්ජන්ති, උප්පන්නා ච බොජ්ඣඞ්ගා භාවනා පාරිපූරිං ගච්ඡන්තීති ....

6 අප්පමත්තිකා එසා භික්ඛවෙ පරිහානි යදිදං ඤාතිපරිහානි, එතං පතිකිට්ඨං භික්ඛවෙ පරිහානීනං යදිදං පඤ්ඤාපරිහානීති ....

7. අප්පමත්තිකා එසා භික්ඛවෙ වුද්ධි යදිදං ඤාතිවුද්ධි. එතදග්ගං භික්ඛවෙ වුද්ධීනං යදිදං පඤ්ඤාවුද්ධි. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: පඤ්ඤාවුද්ධියා වඩ්ඪිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති ....

ත්වයට; **ගච්ඡන්ති**-පැමිණෙත් ද; -පෙ- **යොනිසො මනසිකාරෙ**-නුවණින් මෙනෙහි කිරීම වේ. -පෙ- **පාරිපූරිං**- සම්පූර්ණත්වයට; **ගච්ඡන්ති+ඉති**- පැමිණෙත් යයි (වදාළසේක).

සංලක්ෂ්‍යය:-

"**බොජ්ඣඞ්ගා**" සතරමාර්ගඥනාවබොධය කරන යොගාවචරයාහට අඞ්ග වූ සති, ධම්මවිචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන ධර්මයෝ සත්දෙන බොධ්‍යඞ්ග නම් වෙත්, එසේ ම යොගාවචර තෙම සති ආදි යම් ධර්මසාමග්‍රියක් කාරණ කොට ගෙන සතරමාර්ගඥනාවබොධය කෙරේ ද, ත්‍රෛභූමකාවෘත්තයෙන් හෝ නැගී සිටී ද, චතුරාර්‍ය්‍යසත්‍යධර්මය හෝ ප්‍රත්‍යක්ෂ කෙරේ ද, ඔහුගේ ඒ අවබොධයට අඞ්ග වන හෙයින් ද යථොක්තධර්මයෝ බොධ්‍යඞ්ග නම් වෙත්.

6. **භික්ඛවෙ**- මහණෙනි; **යදිදං**- යම් මේ; **ඤාතිපරිහානි**- නෑයන්ගේ පිරිහීමෙක් ඇද් ද; **එසා**-මෝතොමෝ; **අප්පමත්තිකා**- ස්වල්පමාත්‍ර වූ; **පරිහානි**- පිරිහීමෙක් වේ; **භික්ඛවෙ**- මහණෙනි; **යදිදං**- යම් මේ; **පඤ්ඤාපරිහානි**- ප්‍රඥවගේ පිරිහීමෙක් ඇද්ද; **එතං**- මේ පිරිහීම; **පරිහානීනං**- පිරිහීම් අතුරෙන්; **පතිකිට්ඨං+ඉති**- ලාමක වේ ය යි (අන්තිම පිරිහීමය යි වදාළසේක).

සංලක්ෂ්‍යය:-

යදිදං යනු නිපාතයෙකි. මෙහි පරිහානි ශබ්දයට විශෙෂණත්වයෙන් "**යා එසා පරිහානි**" කියා අර්ථ ගතයුතුයි. අන් තන්හි ද සදෘශ සේ ගලපනු.

7. **භික්ඛවෙ**- මහණෙනි; **යදිදං**- යම් මේ; **ඤාතිවුද්ධි**- නෑයන්ගේ වෘද්ධියක් ඇද්ද; **එසා**- මෝතොමෝ; **අප්පමත්තිකා වුද්ධි**- ස්වල්පමාත්‍ර වූ වෘද්ධියක් වන්නීය. **භික්ඛවෙ**- මහණෙනි;

8. අප්පමත්තිකා එසා භික්ඛවෙ පරිහානි යදිදං භොගපරිහානි. එතං පතිකිට්ඨං භික්ඛවෙ පරිහානීනං යදිදං පඤ්ඤාපරිහානීති.

9. අප්පමත්තිකා එසා භික්ඛවෙ වුඩ්ඪි යදිදං භොගවුඩ්ඪි. එතදග්ගං භික්ඛවෙ වුඩ්ඪීනං යදිදං පඤ්ඤාවුඩ්ඪි. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: පඤ්ඤාවුඩ්ඪියා වඩ්ඪිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

10. අප්පමත්තිකා එසා භික්ඛවෙ පරිහානි යදිදං යසොපරිහානි. එතං පතිකිට්ඨං භික්ඛවෙ පරිහානීනං යදිදං පඤ්ඤාපරිහානීති.

වග්ගො අට්ඨමො.

1–9.

1. අප්පමත්තිකා එසා භික්ඛවෙ වුඩ්ඪි යදිදං යසොවුඩ්ඪි. එතදග්ගං භික්ඛවෙ වුඩ්ඪීනං යදිදං පඤ්ඤාවුඩ්ඪි. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං: පඤ්ඤාවුඩ්ඪියා වඩ්ඪිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

10 -පෙ-**යෙ තෙ භික්ඛූ**-යම් ඒ භික්ෂූ කෙනෙක්; **දුග්ගහීතෙහි**- පිළිවෙළ වරදවා ගන්නා ලද; **බ්‍යඤ්ජනපතිරූපකෙහි**-බ්‍යඤ්ජනමාත්‍රයෙන් සමාන වූ හෙවත් අර්ථයෙන් අසමාන වූ; **සුත්තන්තෙහි**- සූත්‍රාන්තයන් කාරණකොට ගෙන; **අත්ථං+ච**-අර්ථකථාව ද; **ධම්මං+ච**- පාළිධර්මය ද; **පටිබාහන්ති**- ප්‍රතිබාහනය කෙරෙද් ද;-පෙ-

යෙ තෙ භික්ඛවෙ භික්ඛූ සුග්ගහිතෙහි සුත්තන්තෙහි න බ්‍යඤ්ජනපතිරූපකෙහි අත්ථඤ්ච ධම්මඤ්ච අනුලොමෙන්ති, තෙ භික්ඛවෙ භික්ඛූ බහුජනහිතාය පටිපන්නා බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය, හිතාය සුඛාය දෙවමනුස්සානං. බහුඤ්ච තෙ භික්ඛවෙ භික්ඛූ පුඤ්ඤං පසවන්ති, තෙ චිමං සද්ධම්මං ඨපෙන්තීති.

සමචිත්තවග්ගො චතුත්ථො

2-1-5

1 ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ? උත්තානා ච පරිසා ගම්භීරා ච පරිසා. කතමා ච භික්ඛවෙ උත්තානා පරිසා? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ උද්ධතා හොන්ති උන්නළා චපලා මුඛරා විකිණ්ණවාචා මුට්ඨස්සතී අසම්පජානා අසමාහිතා

-පෙ- **යෙ තෙ භික්ඛූ**- යම් ඒ භික්ෂු කෙනෙක්; **සුග්ගහිතෙහි**-පිළිවෙළ නො වරදවා ගන්නා ලද; **න බ්‍යඤ්ජනපතිරූපකෙහි**-බ්‍යඤ්ජනමාත්‍රයෙන් සමාන නො වූ හෙවත් අර්ථයෙන් සමාන වූ; **සුත්තන්තෙහි**- සූත්‍රාන්තයන් කාරණකොට ගෙන; **අත්ථං+ච**- අර්ථකථාව ද; **ධම්මං+ච**- පාළිධර්මය ද; **අනුලොමෙන්ති**-අනුලොම් කෙරෙද් ද (හෙවත් සංසන්දනය කෙරෙද් ද) -පෙ- **ඨපෙන්ති+ඉති**-චිරස්ථායී කෙරෙත් යයි වදාළසේක.

සතරවෙනි සමචිත්ත වර්ග යි.

2-1-5.

1 -පෙ-**පරිසා**-පිරිස්හු; **ඉමා** වෙ-මොහු දෙදෙනෙක් වෙත්; **කතමා** වෙ-කවර දෙදෙනෙක් ද යත්? **උත්තානා ච පරිසා**- නො ගැඹුරු වූ හෙවත් ප්‍රකාශ වූ පිරිස ද; **ගම්භීරා ච පරිසා**- ගැඹුරු වූ හෙවත් ප්‍රතිච්ඡන්න වූ පිරිස ද යන දෙක යි; -පෙ- **උත්තානා පරිසා**-නො ගැඹුරු වූ හෙවත් ප්‍රකාශ වූ පිරිස: **කතමා ච**-කවරක් ද?;-පෙ- **ඉධ**-මේ ශාසනයෙහි; **යස්සං පරිසායං**-යම් පිරිසෙක්හි; **භික්ඛූ**- භික්ෂූහු; **උද්ධතා හොන්ති**- උඩඟුවෙද් ද; **උන්නළා**-උස් වූ හිස්මාන ඇත්තාහු ද; **චපලා**-පාසිවුරු සැරසුම් ආදි චාපල්‍යයෙන් යුක්ත වූවාහු ද; **මුඛරා**-රළු වූ වචන ඇත්තාහු ද; **විකිණ්ණවාචා**- නොසන්හුන් (ප්‍රලාප) වචන ඇත්තාහු ද; **මුට්ඨස්සති**- මුළා වූ සිහි ඇත්තාහු ද; **අසම්පජානා**- අඥාන

විබ්භන්තචිත්තා පාකතින්ද්‍රියා. අයං වුච්චති භික්ඛවෙ උත්තානා පරිසා. කතමා ච භික්ඛවෙ ගම්භීරා පරිසා? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ අනුද්ධතා හොන්ති අනුන්නළා අචපලා අමුඛරා අවිකිණ්ණවාචා උපට්ඨිතසතී සම්පජානා සමාහිතා එකග්ගචිත්තා සංවුතින්ද්‍රියා. අයං වුච්චති භික්ඛවෙ ගම්භීරා පරිසා ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං ගම්භීරා පරිසාති.

2 ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ? වග්ගා ච පරිසා සමග්ගා ච පරිසා. කතමා ච භික්ඛවෙ වග්ගා පරිසා? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ භණ්ඩනජාතා කලහජාතා විවාදාපන්නා

වූවාහු ද; අසමාහිතා-චිත්තෛකාග්‍රතා මාත්‍රයකුදු නැත්තාහු ද; විබ්භන්තචිත්තා- භ්‍රාන්ත වූ (චපල) සිත් ඇත්තාහු ද; පාකතින්ද්‍රියා-ස්වභාව ඉඳුරන් ඇත්තාහු ද (හෙවත් සංවරණය නො කළ ඉඳුරන් ඇත්තාහු ද)-පෙ-අයං-මෝ තොමෝ; උත්තානා පරිසා-නො ගැඹුරු වූ හෙවත් ප්‍රකාශ වූ පිරිස යයි; වුච්චති- කියනු ලැබේ; -පෙ- ගම්භීරා පරිසා- ගැඹුරු වූ හෙවත් ප්‍රතිච්ඡන්න වූ පිරිස; කතමා ච- කවරී ද? -පෙ- භික්ඛූ- භික්ෂූහු; අනුද්ධතා හොන්ති-උඩඟු නො වෙද් ද; අනුන්නළා-උස් වූ හිස් මාන නැත්තාහු ද; අචපලා-පාත්‍රාචීවර මණ්ඩනාදි චාපල්‍යයෙන් යුක්ත නො වූවාහු ද; අමුඛරා-රළු වූ වචන නැත්තාහු ද; අවිකිණ්ණවාචා-සන්හුන් වචන ඇත්තාහු ද; උපට්ඨිතසති- එළඹ සිටි සිහි ඇත් තාහු ද; සම්පජානා-ඥානානුවර්ණැත්තාහු ද; සමාහිතා-උපචාර අර්පණා සමාධින්හි මනා ව පිහිටි සිත් ඇත්තාහු ද; එකග්ගචිත්තා-එකඟ සිත් ඇත්තාහු ද; සංවුතින්ද්‍රියා- සංවරණය කළ ඉඳුරන් ඇත්තාහු ද;-පෙ- අයං-මෝ තොමෝ; ගම්භීරා පරිසා-ගැඹුරු පිරිස යයි; වුච්චති- කියනු ලැබේ; -පෙ- ඉමා ඛො මෙ-මොහු දෙදෙන වනාහි; පරිසා- පිරිස්හු වෙත්; -පෙ- ඉමාසං ද්වින්නං පරිසානං- මේ දෙපිරිස් අතුරෙන්; යදිදං- යම් මේ; ගම්භීරා පරිසා-ගැඹුරු වූ හෙවත් ප්‍රතිච්ඡන්න වූ පිරිසක් වේ ද; එතං-මෙය; අග්ගං+ඉති-අග්‍ර වේ යයි වදාළසේක.

සංලක්ෂ්‍යය:-

එතදග්ගං යදිදං යන පද ගැන 52 පිටේ සංලක්ෂ්‍ය බලනු.

2 -පෙ- වග්ගා ච පරිසා- වගී වූ පිරිස ද; සමග්ගා ච පරිසා-සමගි වූ පිරිස ද (යන දෙකයි); —පෙ— ඉධ-මේ ශාසන යෙහි; යස්සං පරිසායං-යම් පිරිසෙක්හි; භික්ඛූ-භික්ෂූහු; භණ්ඩන

අඤ්ඤමඤ්ඤං මුඛසත්‍තීහි විතුදන්‍තා විහරන්‍ති. අයං වුච්චති භික්ඛවෙ වග්ගා පරිසා. කතමා ච භික්ඛවෙ සමග්ගා පරිසා? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ සමග්ගා සම්මොදමානා අවිවද මානා ඛීරොදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සන්‍තා විහරන්‍ති, අයං වුච්චති භික්ඛවෙ සමග්ගා පරිසා. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා, එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්‍නං පරිසානං යදිදං සමග්ගා පරිසාති.

3 ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ? අග්ගවතී ච පරිසා. අනග්ගවතී ච පරිසා. කතමා ච භික්ඛවෙ අනග්ගවතී පරිසා? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං ථෙරා භික්ඛූ බාහුලිකා හොන්‍ති සාථ ලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්‍තධුරා න විරියං ආරභන්‍ති අප්පත්‍තස්ස පත්‍තියා, අනධිගතස්ස අධිගමාය, අසච්ඡි කතස්ස සච්ඡිකිරියාය. තෙසං පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං

ජාතා-හටගත් පූර්‍වභාග ඩබර ඇත්තාහු; **සාලහජාතා**-හටගත් සම්පූර්‍ණ ඩබර ඇත්තාහු; **විවාදපන්‍නා**-විරුද්ධ වාදයට පැමිණි යාහු; **අඤ්ඤමඤ්ඤං**-ඔවුනොවුන්; **මුඛසත්තීහි**- වචන නමැති අඩයටියෙන්; **විතුදන්‍තා**-පෙළමින්; **විහරන්‍ති**-වාසය කෙරෙත් ද;—පෙ—**අයං**-මේ තොමෝ; **වග්ගා පරිසා**- වගී වූ පිරිස යයි; **වුච්චති**-කියනු ලැබේ; —පෙ— **භික්ඛූ**- භික්‍ෂූහු; **සමග්ගා**- සමගි වූවාහු; **සම්මොදමානා**- සතුටු වන්නාහු; **අවිවදමානා**- විවාද නො කරන්නාහු; **ඛීරොදකීභූතා**- කිරි හා ජලය මෙන් එක් වූවාහු; **අඤ්ඤමඤ්ඤං**-ඔවුනොවුන්; **පියචක්ඛූහි**-ප්‍රිය ඇස්වලින්; **සම්පස්සන්‍තා**- බලමින්; **විහරන්‍ති**- වාසය කෙරෙද් ද; —පෙ— **අයං**- මේ තොමෝ; **සමග්ගා පරිසා**- සමගි වූ පිරිස යයි; **වුච්චති**-කියනු ලැබේ. —පෙ—.

3 —පෙ—**අග්ගවතී ච පරිසා**-අග්‍ර පුද්ගලයන් ඇති පිරිස ද; **අනග්ගවතී ච පරිසා**- අග්‍ර පුද්ගලයන් නැති පිරිස ද (යන දෙක යි); —පෙ – **ඉධ**-මේ ශාසනයෙහි; **යස්සං පරිසායං**- යම් පිරිසෙක්හි; **ථෙරා භික්ඛූ**-ස්ථවිර භික්‍ෂූහු; **බාහුලිකා හොන්‍ති**- ප්‍රත්‍යය බාහුල්‍යය පිණිස පිළිපන්නාහු වෙද් ද; **සාථලිකා**- ශික්‍ෂා ශාසනය ලිහිල් කොට ගන්නාහු වෙද් ද; **ඔක්කමනෙ**-පඤ්චනීවර ණයන් පිරීමෙහි; **පුබ්බඞ්ගමා**-පෙරදූරි වෙද් ද; **පවිවෙකෙ**-උපධි විවෙක සඞ්ඛ්‍යාත නිර්‍වාණයෙහි; **නික්ඛිත්‍තධුරා**- හරණ ලද වියරී ඇත්තාහු වෙද් ද; **අප්පත්‍තස්ස**- නො පැමිණි ගුණවිශෙෂයාගේ; **පත්‍තියා**-පැමිණීම පිණිස ද; **අනධිගතස්ස**-නො ලත් ගුණ විශෙෂයාගේ; **අධිගමාය**- ලැබීම පිණිස ද; **අසච්ඡිකතස්ස**- ප්‍රත්‍යක්‍ෂ

ආපජ්ජති. සාපි හොති බාහුලිකා සාථලිකා ඔක්කමනෙ පුබ්බඞ්ගමා පවිවෙකෙ නික්ඛිත්තධුරා න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා, අනධිගතස්ස අධිගමාය, අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. අයං වුච්චති භික්ඛවෙ අනග්ගවතී පරිසා.

කතමා ච භික්ඛවෙ අග්ගවතී පරිසා? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං ථෙරා භික්ඛූ න බාහුලිකා හොන්ති න සාථලිකා, ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා, විරියං ආරභන්ති අප්පත්තස්ස පත්තියා, අනධිගතස්ස අධිගමාය, අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. තෙසං පච්ඡිමා ජනතා දිට්ඨානුගතිං ආපජ්ජති. සාපි හොති න බාහුලිකා න සාථලිකා, ඔක්කමනෙ නික්ඛිත්තධුරා පවිවෙකෙ පුබ්බඞ්ගමා, විරියං ආරභති අප්පත්තස්ස පත්තියා, අනධිගතස්ස අධිගමාය, අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. අයං වුච්චති භික්ඛවෙ අග්ගවතී පරිසා. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං අග්ගවතී පරිසාති.

නො කරනලද ගුණ විශෙෂයාගේ; **සච්ඡිකිරියාය**-ප්‍රත්‍යක්‍ෂ කිරීම පිණිස ද; **විරියං**-කායික මානසික වීර්‍ය්‍යය; **න ආරභන්ති**-ආරම්භ නො කෙරෙද් ද; **තෙසං**- ඒ ස්ථවිර මහණුන්ගේ; **පච්ඡිමා ජනතා**- සද්ධිවිහාරික අන්තෙවාසික සඞ්ඛ්‍යාත පශ්චිම ජනතා තොමෝ; **දිට්ඨානුගතිං**- දුටු දේ අනු ව පිළිපැදීමට; **ආපජ්ජති**- පැමිණේ; **සා + අපි**- ඒ පශ්චිම ජනතා තොමෝ ද; **බාහුලිකා හොති**-ප්‍රත්‍යය බාහුල්‍යය පිණිස පිළිපන්නේ වේ; —පෙ— **අයං**-මෝ තොමෝ; **අනග්ගවති පරිසා**- අග්‍ර පුද්ගලයන් නැති පිරිස යයි; **වුච්චති**- කියනු ලැබේ.

— පෙ — **ථෙරා භික්ඛූ**-ස්ථවිර භික්‍ෂූහු; **න බාහුලිකා හොන්ති**- ප්‍රත්‍යය බාහුල්‍යය පිණිස නො පිළිපන්නාහු වෙද් ද; **න සාථලිකා**- ශික්‍ෂාශාසනය ලිහිල්කොට නො ගන්නාහු වෙද් ද; **ඔක්කමනෙ**- පඤ්චනීවරණයන් පිරිමෙහි; **නික්ඛිත්තධුරා**- හරණ ලද වීර්‍ය්‍ය ඇත්තාහු වෙද් ද; **පවිවෙකෙ**- උපධිවිවෙක සඞ්ඛ්‍යාත නිර්වාණයෙහි; **පුබ්බඞ්ගමා**- පෙරදූරි වෙත් ද; **අප්පත්තස්ස**- නො පැමිණි ගුණවිශෙෂයාගේ; **පත්තියා**-පැමිණීම පිණිස ද—පෙ—

සංලක්‍ෂ්‍යය:-

පච්ඡිමා ජනතා-මෙහි ජනතා යනු "ජන" ශබ්දයා කෙරෙන් සමූහාර්ථයෙහි "තා" ප්‍රත්‍යය විමෙන් නිපන් තද්ධිත පදයෙකි. 'තා' ප්‍රත්‍යයාන්තයෝ ස්ත්‍රීලිඞ්ගයෙහි ම වන හෙයින් 'ජනතා' යනු ද ස්ත්‍රීලිංගික ය.

4. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ? අරියා ච පරිසා අනරියා ච පරිසා. කතමා ච භික්ඛවෙ අනරියා පරිසා? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ ඉදං දුක්ඛන්ති යථාභූතං නප්පජානන්ති, අයං දුක්ඛසමුදයොති යථාභූතං නප්පජානන්ති, අයං දුක්ඛනිරොධොති යථාභූතං නප්පජානන්ති, අයං දුක්ඛනිරොධගාමිනීපටිපදාති යථාභූතං නප්පජානන්ති. අයං වුච්චති භික්ඛවෙ අනරියා පරිසා.

කතමා ච භික්ඛවෙ අරියා පරිසා? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ ඉදං දුක්ඛන්ති යථාභූතං පජානන්ති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානන්ති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානන්ති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානන්ති. අයං වුච්චති භික්ඛවෙ අරියා පරිසා. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං අරියා පරිසාති.

5. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ? පරිසකසටො ච පරිසමණ්ඩො ච. කතමො ච භික්ඛවෙ පරිසකසටො? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ ඡන්දාගතිං ගච්ඡන්ති, දොසාගතිං ගච්ඡන්ති, මොහාගතිං ගච්ඡන්ති, භයාගතිං ගච්ඡන්ති. අයං වුච්චති භික්ඛවෙ පරිසකසටො.

---

4. -පෙ- **අරියා ච පරිසා**- ආර්‍ය්‍යශ්‍රාවක පිරිස ද; **අනරියා ච පරිසා**- පෘථග්ජනපිරිස ද යන දෙක යි. -පෙ- **ඉධ**- මේ ශාසන යෙහි; **යස්සං පරිසායං**- යම් පිරිසෙක්හි; **භික්ඛූ**- භික්‍ෂූහු; **ඉදං**- මේ ත්‍රෛභූමක පඤ්චස්කන්ධය; **දුක්ඛං + ඉති**- දුක්ඛසත්‍යය යි; **යථාභූතං**- තත්වූ පරිද්දෙන්; **න + පජානන්ති**- නො දනිද් ද; **අයං**- මේ තෘෂ්ණා තොමෝ; **දුක්ඛසමුදයො + ඉති**- දුක්ඛසමුදය සත්‍යය යයි; **යථාභූතං**- තත්වූ පරිද්දෙන්; **න + පජානන්ති**- නො දනිද් ද; **අයං**- මේ මුල කී සත්‍යයන් දෙදෙනාගේ අත්‍යන්තා ක්‍ෂය තෙම; **දුක්ඛනිරොධො + ඉති**- දුක්ඛනිරොධසත්‍යය යි; -පෙ- **අයං**- මේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගිකමාර්ගය තෙම; **දුක්ඛනිරොධගාමිනිපටිපදා + ඉති**- දුක්ඛනිරොධගාමිනී ප්‍රතිපදාසත්‍යය යි; -පෙ- **අයං**- මෝ තොමෝ; **අනරියා පරිසා**-පෘථග්ජනපිරිස යයි; **වුච්චති**- කියනුලැබේ. -පෙ-

5. -පෙ-**පරිසකසටො ච**-කසළපිරිස ද හෙවත් හිස්පිරිස ද; **පරිසමණ්ඩො ච**- ප්‍රසන්නපිරිස ද හෙවත් සාරපිරිස ද; —පෙ— **භික්ඛූ**- භික්‍ෂූහු; **ඡන්දාගතිං ගච්ඡන්ති**- ඡන්දයෙන් අගතියට යෙද් ද හෙවත් ඡන්දයෙන් නොකටයුතු කෙරෙද් ද; **දොසාගතිං**

කතමො ච භික්ඛවෙ පරිසමණ්ඩො? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ න ඡන්දාගතිං ගච්ඡන්ති, න දොසාගතිං ගච්ඡන්ති, න මොහාගතිං ගච්ඡන්ති, න භයාගතිං ගච්ඡන්ති. අයං වුච්චති භික්ඛවෙ පරිසමණ්ඩො. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං පරිසමණ්ඩොති.

6. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ? උක්කාචිතවිනීතා පරිසා නො පටිපුච්ඡාවිනීතා, පටිපුච්ඡාවිනීතා පරිසා නො උක්කාචිතවිනීතා. කතමා ච භික්ඛවෙ උක්කාචිතවිනීතා පරිසා නො පටිපුච්ඡාවිනීතා? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ යෙ තෙ සුත්තන්තා තථාගතභාසිතා ගම්භීරා ගම්භීරත්ථා ලොකුත්තරා සුඤ්ඤතාපටිසඤ්ඤුත්තා, තෙසු භඤ්ඤමානෙසු න සුස්සූසන්ති න සොතං ඔදහන්ති න අඤ්ඤාචිත්තං උපට්ඨපෙන්ති, න ච තෙ ධම්මෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤන්ති. යෙ පන තෙ සුත්තන්තා කවිකතා කාවෙය්‍යා චිත්තක්ඛරා චිත්තබ්‍යඤ්ජනා බාහිරකා සාවකභාසිතා, තෙසු භඤ්ඤමානෙසු සුස්සූසන්ති සොතං ඔදහන්ති අඤ්ඤාචිත්තං උපට්ඨපෙන්ති, තෙ ච

ගච්ඡන්ති- ද්වෙෂයෙන් අගතියට යෙද් ද හෙවත් ද්වෙෂයෙන් නොකටයුතු කෙරෙද් ද; **මොහාගතිං ගච්ඡන්ති**- මොහයෙන් අගතියට යෙද් ද හෙවත් මොහයෙන් නොකටයුතු කෙරෙද් ද; **භයාගතිං ගච්ඡන්ති**- බියෙන් අගතියට යෙද් ද හෙවත් බියෙන් නොකටයුතු කෙරෙද් ද; —පෙ— **අයං**- මේ තොමෝ; **පරිසකසටො**- කසළපිරිස ය හෙවත් හිස්පිරිස ය යි; **වුච්චති**- කියනු ලැබේ. -පෙ- **න ඡන්දාගතිං ගච්ඡන්ති**- ඡන්දයෙන් අගතියට නොයෙද් ද හෙවත් ඡන්දයෙන් නොකටයුතු නො කෙරෙද් ද; —පෙ—

6. -පෙ- **නො පටිපුච්ඡාවිනීතා**-පිළිවිස නො හික්මුණා වූ; **උක්කාචිතවිනීතා පරිසා**- දූර්විනීත වූ පිරිස ද; **නො උක්කාචිතවිනීතා**- දූර්විනීත නො වූ; **පටිපුච්ඡාවිනීතා පරිසා**- පිළිවිස හික්මුණා වූ පිරිස ද යන දෙක යි.-පෙ-**භික්ඛූ**- භික්ෂූහු; **තථාගතභාසිතා**- බුද්ධභාෂිත වූ; **ගම්භීරා**- පෙළවසයෙන් ගැඹුරු වූ; **ගම්භීරත්ථා**- අර්ථවශයෙන් ගැඹුරු වූ; **ලොකුත්තරා**- ලොකොත්තරාර්ථ ප්‍රකාශක වූ; **සුඤ්ඤතාපටිසං+යුත්තා**- සත්ත්වශූන්‍යතා ධර්මමාත්‍රයක් ම ප්‍රකාශකරන්නා වූ; **යෙ තෙ සුත්තන්තා**- යම් ඒ සූත්‍රාන්තකෙනෙක් ඇද් ද; **තෙසු**- ඒ සූත්‍රාන්තයන්; **භඤ්ඤමානෙසු**- කියනුලබන කල්හි; **න සුස්සූසන්ති**- අසනු කැමති නො වෙද් ද; **න සොතං ඔදහන්ති**- කන් යොමු නො කෙරෙද් ද;

ධම්මෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤන්ති. තෙ තං ධම්මං පරියාපුණිත්වා න චෙව අඤ්ඤමඤ්ඤං පටිපුච්ඡන්ති න පටිවිචරන්ති:-ඉදං කථං ඉමස්ස ක්වත්ථොති? තෙ අවිවටඤ්චෙව න විවරන්ති, අනුත්තානීකතඤ්ච න උත්තානී කරොන්ති, අනෙකවිහිතෙසු ච කඞ්ඛාඨානියෙසු ධම්මෙසු කඞ්ඛං න පටිවිනොදෙන්ති. අයං වුච්චති භික්ඛවෙ උක්කාචිතවිනීතා පරිසා නො පටිපුච්ඡාවිනීතා.

කතමා ච භික්ඛවෙ පටිපුච්ඡා විනීතා පරිසා නො උක්කාචිත විනීතා? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ යෙ තෙ සුත්තන්තා කවිකතා කාවෙය්‍යා චිත්තක්ඛරා චිත්තබ්‍යඤ්ජනා බාහිරකා සාවක

අඤ්ඤාවිත්තං- දැනගතයුතු ය යන සිතක්; **න උපට්ඨපෙන්ති**- නො එළවද් ද; **තෙ ධම්මෙ**- ඒ ධර්මයන්; **උග්ගහෙතබ්බං**- උගත යුතු ය යි; **පරියාපුණිතබ්බං**- පුහුණුකටයුතු ය යි; **න ච මඤ්ඤන්ති**- නො සිතද් ද; **කවිකතා**- බාහිර කවීන් විසින් කරනලද; **කාවෙය්‍යා**- කවීන් පිළිබඳ වූ; **චිත්තක්ඛරා**- විසිතුරු ස්වරාක්ෂර ඇති; **චිත්තබ්‍යඤ්ජනා**- විසිතුරු ව්‍යඤ්ජනාක්ෂර ඇති; **බාහිරකා**- ශාසනයෙන් පිටත්හි වූ; **සාවකභාසිතා**- බාහිරකශ්‍රාවකයන් විසින් කියනලද; **යෙ පන තෙ සුත්තන්තා**- යම් ඒ සූත්‍රාන්ත කෙනෙක් ඇද් ද; **තෙසු**- ඒ සූත්‍රාන්තයන්; **භඤ්ඤමානෙසු**- කියනු ලබන කල්හි; **සුස්සූසන්ති**- අසනු කැමති වෙද් ද; **සොතං ඔදහන්ති**- කන් යොමු කෙරෙද් ද; **අඤ්ඤාවිත්තං**- දැනගතයුතු ය යන සිත; **උපට්ඨපෙන්ති**- එළවද් ද; **තෙ ච ධම්මෙ**- ඒ ධර්මයන් ද; **උග්ගහෙතබ්බං**- උගතයුතු ය යි; **පරියාපුණිතබ්බං**- පුහුණුකට යුතු යයි; **මඤ්ඤන්ති**- සිතද් ද; **තෙ**- ඔහුතුමූ; **තං ධම්මං**- ඒ ධර්මය; **පරියාපුණිත්වා**- පුහුණුකොට; **ඉදං**- මේ ව්‍යඤ්ජනය; **කථං**- කෙසේ ද? **ඉමස්ස**- මේ භාෂිතයාගේ; **අත්ථො කො+ඉති**- අර්ථය කවරේදැ යි; **අඤ්ඤමඤ්ඤං**- ඔවුනොවුන්; **න ච+එව පටිපුච්ඡන්ති**- නො පිළිවිසිද් ද; **න ච+එව පටිවිචරන්ති**- පිළිවිසීම පිණිස නො හැසිරෙද් ද; **තෙ**- ඔහුතුමූ; **අවිවටං+ච+එව**- ප්‍රතිච්ඡන්න වූ අර්ථය ද; **න විවරන්ති**- ප්‍රකාශ නොකෙරෙත්; **අනුත්තානීකතං+ච**- ගැඹුරු අර්ථය ද; **න උත්තානීකරොන්ති**- නො ගැඹුරු නො කෙරෙත් හෙවත් ප්‍රකට නො කෙරෙත්; **අනෙකවිහිතෙසු ච**- අනෙකවිධ වූ; **කඞ්ඛාඨානියෙසු**- සැකයට කාරණා වූ; **ධම්මෙසු**- ධර්මයන්හි; **කඞ්ඛං**- සැකය; **න පටිවිනොදෙන්ති**- දුරු නො කෙරෙද් ද; -පෙ- **අයං**-මෝ තොමෝ; -පෙ-

භාසිතා තෙසු භඤ්ඤමානෙසු න සුස්සූසන්ති න සොතං ඔදහන්ති න අඤ්ඤාචිත්තං උපට්ඨපෙන්ති, න ච තෙ ධම්මෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤන්ති. යෙ පන තෙ සුත්තන්තා තථාගත භාසිතා ගම්භීරා ගම්භීරත්ථා ලොකුත්තරා සුඤ්ඤතාපටිසඤ්ඤුත්තා, තෙසු භඤ්ඤමානෙසු සුස්සූසන්ති සොතං ඔදහන්ති අඤ්ඤාචිත්තං උපට්ඨපෙන්ති, තෙ ච ධම්මෙ උග්ගහෙතබ්බං පරියාපුණිතබ්බං මඤ්ඤන්ති. තෙ තං ධම්මං පරියාපුණිත්වා අඤ්ඤමඤ්ඤං පටිපුච්ඡන්ති පටිවිචරන්ති:- ඉදං කථං ඉමස්ස ක්වත්ථොති? තෙ අවිවටඤ්චෙව විවරන්ති අනුත්තානීකතඤ්ච උත්තානීකරොන්ති, අනෙකවිහිතෙසු ච කඞ්ඛාඨානියෙසු ධම්මෙසු කඞ්ඛං පටිවිනොදෙන්ති. අයං වුච්චති භික්ඛවෙ පටිපුච්ඡාවිනීතා පරිසා නො උක්කාචිතවිනීතා. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං පටිපුච්ඡාවිනීතා පරිසා නො උක්කාචිතවිනීතාති.

7. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ? ආමිසගරු[1] පරිසා නො සද්ධම්මගරු[1], සද්ධම්මගරු[1] පරිසා නො ආමිසගරු.[1] කතමා ච භික්ඛවෙ ආමිසගරු පරිසා නො සද්ධම්මගරු? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ ගිහීනං ඔදාතවසනානං සම්මුඛා අඤ්ඤමඤ්ඤස්ස වණ්ණං භාසන්ති:- අසුකො භික්ඛු උභතොභාගවිමුත්තො අසුකො පඤ්ඤාවිමුත්තො අසුකො කායසක්ඛි අසුකො දිට්ඨිප්පත්තො[2] අසුකො සද්ධාවිමුත්තො අසුකො ධම්මානුසාරි

සෙසු අරුත් මුලින් කී සෙයින් දතයුතු සි.

7. -පෙ- **නො සද්ධම්මගරු**- සද්ධර්මය ගරු නො කරන්නා වූ; **ආමිසගරු පරිසා**- ප්‍රත්‍යය ගරු කරන්නා වූ පිරිස ද; **නො ආමිසගරු**- ප්‍රත්‍යය ගරු නො කරන්නා වූ; **සද්ධම්මගරු පරිසා**- සද්ධර්මය ගරු කරන්නා වූ පිරිස ද යන දෙක යි. -පෙ- **භික්ඛූ**- භික්ෂූහු; **ඔදාතවසනානං**- සුදුපිළී හඳනා වූ; **ගිහීනං**- ගිහින්ගේ; **සම්මුඛා**- ඉදිරියෙහි; **අඤ්ඤමඤ්ඤස්ස**- ඔවුනොවුන්ගේ; **වණ්ණං භාසන්ති**- ගුණ කියත් ද; (කෙසේ ද යත්?) **අසුකො භික්ඛු**- අසවල් මහණ තෙම; **උභතොභාගවිමුත්තො**-වික්ඛම්භන විමුක්ති සමුච්ඡෙදවිමුක්ති යන උභයභාගයෙන් විමුක්ත වූ රහත් පුද්ගලයෙක; **අසුකො**- අසවල් මහණ තෙම; **පඤ්ඤාවිමුත්තො**- විදර්ශනාප්‍රඥාවෙන් යුක්ත වූ ශුෂ්කවිදර්ශක රහත්පුද්ගලයෙක; **අසුකො**- අසවල් මහණ තෙම; **කායසක්ඛි**- (කයින් ධ්‍යානස්පර්ශ

---

1. ගරු-ස්‍යා. 2. දිඨ්ඨපත්තො-සී.

අසුකො සද්ධානුසාරී අසුකො සීලවා කල්‍යාණධම්මො අසුකො දුස්සීලො පාපධම්මොති. තෙ තෙන ලාභං ලභන්ති, තෙ තං ලාභං ගථිතා[1] මුච්ඡිතා අජ්ඣොපන්නා අනාදීනවදස්සාවිනො අනිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්ති. අයං වුච්චති භික්ඛවෙ ආමිසගරු පරිසා නො සද්ධම්මගරු.

කතමා ච භික්ඛවෙ සද්ධම්මගරු පරිසා නො ආමිසගරු? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ ගිහීනං ඔදාතවසනානං සම්මුඛා න අඤ්ඤමඤ්ඤස්ස වණ්ණං භාසන්ති:- අසුකො භික්ඛු උභතොභාගවිමුත්තො අසුකො පඤ්ඤාවිමුත්තො අසුකො කායසක්ඛී අසුකො දිට්ඨිප්පත්තො අසුකො සද්ධාවිමුත්තො අසුකො ධම්මානුසාරී අසුකො සද්ධානුසාරී අසුකො සීලවා කල්‍යාණධම්මො අසුකො දුස්සීලො පාපධම්මොති. තෙ ලාභම්පි ලභිත්වා අගථිතා අමුච්ඡිතා අනජ්ඣොපන්නා ආදීනවදස්සාවිනො නිස්සරණපඤ්ඤා පරිභුඤ්ජන්ති. අයං වුච්චති භික්ඛවෙ සද්ධම්මගරු පරිසා නො ආමිසගරු. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං සද්ධම්මගරු පරිසා නො ආමිසගරූති.

කොට පසුව නිර්වාණය ප්‍රත්‍යක්ෂ කළා වූ සොවාන්ඵලාදි සතැනෙක්හි සිටි) සමථයානික ආර්‍ය්‍යපුද්ගලයෙක; **අසුකො**- අසවල් මහණ තෙම; **දිට්ඨිප්පත්තො**- (සෝවාන්ඵලාදි සතැනෙක්හි සිටි) ශුෂ්කවිදර්ශක ආර්‍ය්‍යපුද්ගලයෙක;-පෙ-**සද්ධාවිමුත්තො**-(සෝවාන් ඵලාදි සතැනෙක සිටි) ශ්‍රද්ධාබහුල ශුෂ්කවිදර්ශක ආර්‍ය්‍යපුද්ගලයෙක;-පෙ-**ධම්මානුසාරී**-සමථයානික ප්‍රඥාබහුල සෝවාන්මාර්ගස්ථ ආර්‍ය්‍යපුද්ගලයෙක;-පෙ- **සද්ධානුසාරී**- ශුෂ්කවිදර්ශක ශ්‍රද්ධාබහුල සෝවාන්මාර්ගස්ථ ආර්‍ය්‍යපුද්ගලයෙක;-පෙ-**සීලවා**-සිල් ඇත්තෙක; **කල්‍යාණධම්මො**- යහපත් ස්වභාව ඇත්තෙක;-පෙ- **දුස්සීලො**- සිල් නැත්තෙක; **පාපධම්මො+ඉති**- ලාමක ස්වභාව ඇත්තෙකැයි කියා සි. **තෙ**- ඒ භික්ෂූහු; **තෙන**- එය කරණ කොට ගෙන; **ලාභං**- ප්‍රත්‍යය ලාභය; **ලභන්ති**- ලබත්. **තෙ**- ඒ භික්ෂූහු; **තං ලාභං**- ඒ ප්‍රත්‍යය ලාභය; **ගථිතා**- තෘෂ්ණාවෙන් බැඳුණාහු; **මුච්ඡිතා**- තෘෂ්ණාවෙන් මුසපත් වූවාහු; **අජ්ඣොපන්නා**- ගිල අවසන් කොට ගත්තාහු; **අනාදීනවදස්සාවිනො**- නො පස්විසා වැළදීමෙහි අයුණු නො දක්නාහු; **අනිස්සරණපඤ්ඤා**- ඡන්දරාගය දුරුකරන ප්‍රඥව නැත්තාහු; **පරිභුඤ්ජන්ති**- පරිභොග කෙරෙත්. -පෙ- **අයං**- මේ තොමෝ; **නො සද්ධම්මගරු**- සද්ධර්මය ගරු නො කරන්නා වූ;-පෙ-

---

1. ලභිත්වා ගථිතා-ස්‍යා.

8. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ? විසමා ච පරිසා සමා ච පරිසා. කතමා ච භික්ඛවෙ විසමා පරිසා? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං අධම්මකම්මානි පවත්තන්ති ධම්මකම්මානි නප්පවත්තන්ති, අවිනයකම්මානි පවත්තන්ති විනයකම්මානි නප්පවත්තන්ති, අධම්මකම්මානි දිප්පන්ති ධම්මකම්මානි න දිප්පන්ති, අවිනයකම්මානි දිප්පන්ති විනයකම්මානි න දිප්පන්ති. අයං වුච්චති භික්ඛවෙ විසමා පරිසා. විසමත්තා භික්ඛවෙ පරිසාය අධම්මකම්මානි පවත්තන්ති ධම්මකම්මානි නප්පවත්තන්ති, අවිනයකම්මානි පවත්තන්ති විනයකම්මානි නප්පවත්තන්ති, අධම්මකම්මානි දිප්පන්ති ධම්මකම්මානි න දිප්පන්ති, අවිනයකම්මානි දිප්පන්ති විනයකම්මානි න දිප්පන්ති

කතමා ච භික්ඛවෙ සමා පරිසා? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං ධම්මකම්මානි පවත්තන්ති අධම්මකම්මානි නප්පවත්තන්ති, විනයකම්මානි පවත්තන්ති අවිනයකම්මානි නප්පවත්තන්ති, ධම්මකම්මානි දිප්පන්ති අධම්මකම්මානි න දිප්පන්ති, විනයකම්මානි දිප්පන්ති අවිනයකම්මානි න දිප්පන්ති. අයං වුච්චති භික්ඛවෙ සමා පරිසා. සමත්තා භික්ඛවෙ පරිසාය ධම්මකම්මානි පවත්තන්ති අධම්මකම්මානි නප්පවත්තන්ති, විනයකම්මානි පවත්තන්ති අවිනයකම්මානි නප්පවත්තන්ති, ධම්මකම්මානි දිප්පන්ති අධම්මකම්මානි න දිප්පන්ති, විනයකම්මානි දිප්පන්ති අවිනයකම්මානි න දිප්පන්ති. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං සමා පරිසාති.

9. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ? අධම්මිකා ච පරිසා ධම්මිකා ච පරිසා. -පෙ- ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං ධම්මිකා පරිසාති.

---

8. -පෙ-**විසමා ච පරිසා**-විසම වූ පිරිස ද; **සමා ච පරිසා**-සම වූ පිරිස ද යන දෙක යි. -පෙ- **අධම්මකම්මානි**- අධර්මකර්මයෝ; **පවත්තන්ති**- පවතිද් ද; **ධම්මකම්මානි**- ධර්මකර්මයෝ; **න+පවත්තන්ති**- නො පවතිද් ද; **අවිනයකම්මානි**- අවිනයකර්මයෝ; **පවත්තන්ති**- පවතිද් ද; **විනයකම්මානි**- විනයකර්මයෝ; -පෙ- **අධම්මකම්මානි**- අධර්මකර්මයෝ; **දිප්පන්ති**- දිලෙද් ද; -පෙ- **න දිප්පන්ති**-නො දිලෙද් ද; -පෙ-**පරිසාය**-පිරිසගේ; **විසමත්තා**-විෂම හෙයින්; **අධම්මකම්මානි**- අධර්මකර්මයෝ; **පවත්තන්ති**- පවතිත්. -පෙ-

9. මෙහි අරුත් ඉහත සූත්‍රයෙහි කී නියායෙන් දතයතු යි.

10. ද්වෙමා භික්ඛවෙ පරිසා. කතමා ද්වෙ? අධම්මවාදිනී ච පරිසා ධම්මවාදිනී ච පරිසා. කතමා ච භික්ඛවෙ අධම්මවාදිනී පරිසා? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ අධිකරණං ආදියන්ති ධම්මිකං වා අධම්මිකං වා. තෙ තං අධිකරණං ආදියිත්වා න චෙව අඤ්ඤමඤ්ඤං සඤ්ඤාපෙන්ති න ච සඤ්ඤත්තිං උපගච්ඡන්ති, න ච නිජ්ඣාපෙන්ති න ච නිජ්ඣත්තිං උපගච්ඡන්ති. තෙ අසඤ්ඤත්තිබලා අනිජ්ඣත්තිබලා අප්පටිනිස්සග්ගමන්තිනො තමෙව අධිකරණං ථාමසා පරාමස්ස අභිනිවිස්ස වොහරන්ති:- ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. අයං වුච්චති භික්ඛවෙ අධම්මවාදිනී පරිසා.

කතමා ච භික්ඛවෙ ධම්මවාදිනී පරිසා? ඉධ භික්ඛවෙ යස්සං පරිසායං භික්ඛූ අධිකරණං ආදියන්ති ධම්මිකං වා අධම්මිකං වා. තෙ තං අධිකරණං ආදියිත්වා අඤ්ඤමඤ්ඤං සඤ්ඤාපෙන්ති චෙව සඤ්ඤත්තිඤ්ච උපගච්ඡන්ති, නිජ්ඣාපෙන්ති චෙව නිජ්ඣත්තිඤ්ච උපගච්ඡන්ති. තෙ සඤ්ඤත්තිබලා නිජ්ඣත්තිබලා පටිනිස්සග්ගමන්තිනො න තමෙව අධිකරණං ථාමසා පරාමස්ස අභිනිවිස්ස වොහරන්ති:- ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති. අයං වුච්චති භික්ඛවෙ ධම්මවාදිනී පරිසා. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ පරිසා. එතදග්ගං භික්ඛවෙ ඉමාසං ද්වින්නං පරිසානං යදිදං ධම්මවාදිනී පරිසාති.

පරිසාවග්ගො පඤ්චමො.

---

10. -පෙ- **අධම්මවාදිනී ච පරිසා**- අධර්මවාදී පිරිස ද; **ධම්මවාදිනී ච පරිසා**- ධර්මවාදී පිරිස ද යන දෙක යි. -පෙ- **භික්ඛූ**- භික්ෂූහු; **ධම්මිකං වා**-ධාර්මික වූ හෝ; **අධම්මිකං වා**-අධාර්මික වූ හෝ; **අධිකරණං**- අධිකරණයක්; **ආදියන්ති**- ගනිද් ද; **තෙ**- ඔහු තුමූ; **තං අධිකරණං**- ඒ අධිකරණය; **ආදියිත්වා**- ගෙන; **අඤ්ඤමඤ්ඤං**- ඔවුනොවුන්ට; **න ච + එව සඤ්ඤාපෙන්ති**-නො දන්වද් ද; **සඤ්ඤත්තිං**- දැන්වීමට; **න ච උපගච්ඡන්ති**- නො එළඹෙද් ද; **න ච නිජ්ඣාපෙන්ති**- නො දක්වද් ද; **නිජ්ඣත්තිං**- දැක්වීමට; **න ච උපගච්ඡන්ති**- නො එළඹෙද් ද; **තෙ**- ඔහුතුමූ; **අසඤ්ඤත්තිබලා**- නො දැන්වීම බල කොට ඇත්තාහු; **අනිජ්ඣත්තිබලා**- නො දැක්වීම බල කොට ඇත්තාහු; **අප්පටිනිස්සග්ගමන්තිනො**- අත්නොහරින මන්ත්‍රණ ඇත්තාහු; **තං + එව අධිකරණං**- ඒ අධිකරණය ම; **ථාමසා**- දෘෂ්ටිශක්තියෙන්; **පරාමස්ස**-

තස්සුද්දානං:-

> උට්ඨානා වග්ගා අග්ගවතී අරියා කසටො ච පඤ්චමො
> උක්කාචිත ආමිසඤ්චෙව විසමා අධම්මා ධම්මියෙන චාති.

පඨමො පණ්ණාසකො සමත්තො.

2-2-1

1 ද්වෙමෙ භික්ඛවෙ පුග්ගලා ලොකෙ උප්පජ්ජමානා උප්ප ජ්ජන්ති බහුජනහිතාය බහුජනසුඛාය බහුනොජනස්ස අත්ථාය, හිතාය සුඛාය දෙවමනුස්සානං. කතමෙ ද්වෙ? තථාගතො ච අරහං සම්මාසම්බුද්ධො රාජා ච චක්කවත්ති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පුග්ගලා ලොකෙ උප්පජ්ජමානා උප්පජ්ජන්ති බහුජනහිතාය

වැලඳගෙන; **අභිනිවිස්ස**- එහි ප්‍රවෙශ ව; **ඉදං + එව**- මේ අපගේ වචනය ම; **සච්චං**- සැබව; **අඤ්ඤං**- සෙස්සවුන්ගේ වචනය; **මොඝං + ඉති**- තුච්ඡ යයි; **වොහරන්ති**- කියද් ද; —පෙ— **අයං**- මෝ තොමෝ; **අධම්මවාදිනී පරිසා**-අධර්මවාදී පිරිස යයි; **වුච්චති**- කියනුලැබේ. —පෙ—

පස්වෙනි පරිසාවගීය යි.

උට්ඨානා- උට්ඨානසූත්‍රය ද; **වග්ගා**- වග්ගසූත්‍රය ද; **අග්ගවතී**- අග්ගවතීසූත්‍රය ද; **අරියා**- අරියසූත්‍රය ද; **පඤ්චමො**- පස් වැනි වූ; **කසටො ච**- කසටසූත්‍රය ද; **උක්කාචිත ආමිසං+ච+එව**- උක්කාචිත සූත්‍රය හා ආමිස සූත්‍රය ද; **විසමා**- විසම සූත්‍රය ද; **අධම්මා**- අධම්ම සූත්‍රය ද; **ධම්මියෙන ච**- ධම්මිය සූත්‍රය සමග වගීය වේ.

ප්‍රථම පණ්ණාසකය සමාප්ත යි.

2-2-1

1 -පෙ- **ලොකෙ**- සත්වලොකයෙහි; **උප්පජ්ජමානො**- උප දනා වූ; **ඉමෙ ද්වෙ පුග්ගලා**- මේ පුද්ගලයෝ දෙදෙන; **බහුජන හිතාය**-බොහෝ දෙනාට හිත පිණිස ද; **බහුජනසුඛාය**- බොහෝ දෙනාට සැප පිණිස ද; **බහුනො ජනස්ස**- බොහෝ දෙනාහට; **අත්ථාය**-වැඩ පිණිස ද; **දෙවමනුස්සානං**-දෙවිමිනිසුන්ට; **හිතාය**-

බහුජනසුඛාය බහුනො ජනස්ස අත්ථාය, හිතාය සුඛාය දෙව මනුස්සානන්ති —

2 ද්වෙමෙ භික්ඛවෙ පුග්ගලා ලොකෙ උප්පජ්ජමානා උප්පජ්ජන්ති අච්ඡරියමනුස්සා. කතමෙ ද්වෙ? තථාගතො ච අරහං සම්මාසම්බුද්ධො රාජා ච චක්කවත්ති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පුග්ගලා ලොකෙ උප්පජ්ජමානා උප්පජ්ජන්ති අච්ඡරිය මනුස්සාති —

3 ද්වින්නං භික්ඛවෙ පුග්ගලානං කාලකිරියා බහුනො ජනස්ස අනුතප්පා හොති. කතමෙසං ද්වින්නං? තථාගතස්ස ච අරහතො සම්මාසම්බුද්ධස්ස රඤ්ඤො ච චක්කවත්තිස්ස. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං පුග්ගලානං කාලකිරියා බහුනො ජනස්ස අනුතප්පා හොතීති —

4 ද්වෙමෙ භික්ඛවෙ ථූපාරහා. කතමෙ ද්වෙ? තථාගතො ච අරහං සම්මාසම්බුද්ධො රාජා ච චක්කවත්ති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ථූපාරහාති —

5 ද්වෙමෙ භික්ඛවෙ බුද්ධා. කතමෙ ද්වෙ? තථාගතො ච අරහං සම්මාසම්බුද්ධො පච්චෙකබුද්ධො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ බුද්ධාති —

හිත පිණිස ද; **සුඛාය**-සැප පිණිස ද; **උප්පජ්ජන්ති**-උපදිත්;-පෙ- **අරහං**-අභීත් වූ; **සම්මාසම්බුද්ධො**-සම්‍යක්සම්බුද්ධ වූ; **තථාගතො ච**-තථාගත තෙමේ ද; **රාජා ච චක්කවත්ති**- සක්විතිරජ තෙමේ ද (යන දෙදෙන යි);-පෙ-

2 —පෙ— **අච්ඡරියමනුස්සා**- ආශ්චර්‍ය්‍ය මනුෂ්‍යයෝ ච; **උප්පජ්ජන්ති**-උපදිත් -පෙ-.

3 -පෙ-**ද්වින්නං පුග්ගලානං**- පුද්ගලයන් දෙදෙනකුන්ගේ; **කාලකිරියා**- කාලක්‍රියා තොමෝ; **බහුනො ජනස්ස**- බොහෝ ජනයාහට; **අනුතප්පා හොති**- සන්තාප කරන්නී වේ;—පෙ— **අරහතො**- අභීත් වූ; **සම්මාසම්බුද්ධස්ස**- සම්‍යක්සම්බුද්ධ වූ; **තථාගතස්ස ච**- තථාගතයන් වහන්සේගේ ද; **රඤ්ඤො ච චක්කවත්තිස්ස**-සක්විති රජහුගේ ද (යන දෙදෙනාගේ ය);—පෙ—

4 -පෙ-**ථූපාරහා**-චෛත්‍යයට සුදුසු පුද්ගලයෝ; **ඉමෙ** මෙ-මොහු දෙදෙනෙක් වෙත්.-පෙ-

5 -පෙ- **පච්චෙකබුද්ධො ච**- පසේබුදුරජතෙමේ ද යන -පෙ-.

6 ද්වෙමෙ භික්ඛවෙ අසනියා ඵලන්තියා න සන්තසන්ති. කතමෙ ද්වෙ? භික්ඛු ච ඛීණාසවො හත්ථාජානීයො ච. ඉමෙ ඛො, භික්ඛවෙ ද්වෙ අසනියා ඵලන්තියා න සන්තසන්තීති-

7 ද්වෙමෙ භික්ඛවෙ අසනියා ඵලන්තියා න සන්තසන්ති. කතමෙ ද්වෙ? භික්ඛු ච ඛීණාසවො අස්සාජානීයො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ අසනියා ඵලන්තියා න සන්තසන්තීති-

8 ද්වෙමෙ භික්ඛවෙ අසනියා ඵලන්තියා න සන්තසන්ති. කතමෙ ද්වෙ? භික්ඛු ච ඛීණාසවො සීහො ච මිගරාජා. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ අසනියා ඵලන්තියා න සන්තසන්තීති-

9 ද්වෙමෙ භික්ඛවෙ අත්ථවසෙ සම්පස්සමානා කිම්පුරිසා මානුසිං වාචං න භාසන්ති. කතමෙ ද්වෙ? මා ච මුසා භණිම්හා. මා ච පරං අභූතෙන අබ්භාචික්ඛිම්හාති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ අත්ථවසෙ සම්පස්සමානා කිම්පුරිසා මානුසිං වාචං න භාසන්තීති-

10 ද්වින්නං භික්ඛවෙ ධම්මානං අතිත්තො අප්පටිවානො මාතුගාමො කාලං කරොති. කතමෙසං ද්වින්නං? මෙථුනධම්ම

---

6 -පෙ- **ඉමෙ** මෙ- මොහු දෙදෙන; **අසනියා ඵලන්තියා**- හෙණ ගුගුරන කල්හි; **න සන්තසන්ති**- බිය නො වෙත්; -පෙ- **ඛීණාසවො භික්ඛු** ච-රහත් මහණ තෙමේ ද; **හත්ථාජානියො** ච- උතුම් හස්ති තෙමේ ද (යන දෙදෙන යි); -පෙ- **ඉමෙ ඛො** මෙ- මොහු දෙදෙන වනාහි; **අසනියා ඵලන්තියා**- හෙණ ගුගුරන කල්හි; **න සන්තසන්ති+ඉති**-බිය නො වෙත් යයි වදාළසේක.

7—8 මෙහි අරුත් ඉහත කී නයින් දතයුතු යි.

සංලක්ෂ්‍යය:-

න සන්තසන්ති- මෙහි ක්ෂීණාශ්‍රව භික්ෂු තෙමේ තමාගේ සත්කාය දෘෂ්ටිය ප්‍රහීණ වූ බැවින් හෙණහඬට බිය නො වෙයි. ආජානීය හස්තිතෙමේ ද අශ්ව තෙමේ ද මෘගරාජ වූ සිංහ තෙමේ ද යන මොහු සත්කාය දෘෂ්ටියගේ බලවත් බැවින් හෙණහඬට බිය නො වෙත්.

9 -පෙ- **ඉමෙ** මෙ **අත්ථවසෙ**-මේ ආනිසංස දෙක; **සම්පස්සමානා**-දක්නා වූ; **කිම්පුරිසා**-කින්නරයෝ; **මානුසිං වාචං**-මිනිස් තෙපුල්; **න භාසන්ති**-නො කියත් -පෙ- **මුසා**-බොරු බස්; **මා ච භණිම්හා**-නො කියමු; **පරං**-අන්‍යයාහට; **අභූතෙන**-බොරුවෙන්; **මා ච අබ්භාචික්ඛිම්හා+ඉති**- නිඳා නො කෙරෙමු යන අනුසස් දෙක යි.

10 -පෙ- **මාතුගාමො**-ස්ත්‍රීතොමෝ; **ද්වින්නං ධම්මානං**-මේ මතු කියන දෙකාරණයන් සම්බන්ධ ව; **අතිත්තො**- තෘප්ත නො

සමාපත්තියා ච විජායනස්ස ච. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ධම්මානං අතිත්තො අප්පටිවානො මාතුගාමො කාලං කරොතීති.

11 අසන්තසන්නිවාසං ච වො භික්ඛවෙ දෙසෙස්සාමි, සන්තසන්නිවාසඤ්ච. තං සුණාථ —පෙ—.

කථඤ්ච භික්ඛවෙ අසන්තසන්නිවාසො හොති? කථඤ්ච අසන්තො සන්නිවසන්ති? ඉධ භික්ඛවෙ ථෙරස්ස භික්ඛුනො එවං හොති:- ථෙරොපි මං න වදෙය්‍ය මජ්ඣිමොපි මං න වදෙය්‍ය නවොපි මං න වදෙය්‍ය, ථෙරම්පහං න වදෙය්‍යං මජ්ඣිමම්පහං න වදෙය්‍යං නවම්පහං න වදෙය්‍යං. ථෙරො චෙපි මං වදෙය්‍ය අහිතානුකම්පී මං වදෙය්‍ය නො හිතානුකම්පී, නොති නං වදෙය්‍යං විහෙසෙය්‍යම්පි නං පස්සම්පිස්ස න පටිකරෙය්‍යං. මජ්ඣිමො චෙපි මං වදෙය්‍ය—නවො චෙපි මං වදෙය්‍ය අහිතානුකම්පී මං වදෙය්‍ය නො හිතානුකම්පී, නොති නං වදෙය්‍යං විහෙසෙය්‍යම්පි නං පස්සම්පිස්ස න පටිකරෙය්‍යං.

වූයේ; **අප්පටිවානො**- නො කලකිරුණේ; **කාලං කරොති**- කළුරිය කෙරෙයි;-පෙ- **මෙථුනධම්මසමාපත්තියා ච**- මෛථුන්දම් සම වැදීම සම්බන්ධව ද; **විජායනස්ස ච**- ප්‍රසූතිය සම්බන්ධ ව ද යන දෙකාරණයන් පිළිබඳ වේ.

11 -පෙ-**වො**-තොපට; **අසන්තසන්නිවාසං ච**-අසත්පුරුෂයන්ගේ එක් ව විසීම ද; **සන්තසන්නිවාසං ච**- සත්පුරුෂයන්ගේ එක් ව විසීම ද; **දෙසෙස්සාමි**-දෙශනා කරන්නෙමි; **තං**-ඒ දෙශනාව; **සුණාථ**-ශ්‍රවණය කරව්;-පෙ-. **අසන්තසන්නිවාසො**-අසත්පුරුෂයන්ගේ එක් ව විසීම; **කථං+ච හොති**- කෙසේ වේ ද; **අසන්තො**- අසත්පුරුෂයෝ තුමූ; **කථං+ච**- කෙසේ; **සන්නිවසන්ති**-එක් ව වෙසෙද් ද; -පෙ- **ඉධ**-මේ ශාසනයෙහි; **ථෙරස්ස භික්ඛුනො**-සථවිර මහණහට; **එවං හොති**- මෙබඳු සිතෙක් වේ; **ථෙරො+අපි**- සථවිර මහණ තෙමේ ද; **මං**- මට; **න වදෙය්‍ය**-අවවාද නො කෙරේවා; **මජ්ඣිමො+අපි**-මධ්‍යම මහණ තෙමේ ද; **මං**-මට; **න වදෙය්‍ය**-අවවාද නො කෙරේවා; **නවො + අපි**-නවක මහණ තෙමේ ද; **මං**- මට; **න වදෙය්‍ය**- අවවාද නො කෙරේවා; **අහං**-මම; **ථෙරං+අපි**-සථවිර මහණහට ද; **න වදෙය්‍යං**- අවවාද නො කියමි; **අහං**- මම; **මජ්ඣිමං+අපි**- මධ්‍යම මහණහට ද; **න වදෙය්‍යං**-අවවාද නො කියමි; **අහං**-මම; **නවං+අපි**-නවක මහණහට ද; **න වදෙය්‍යං**-අවවාද නො කියමි. **චෙ**-ඉදින්; **ථෙරො+අපි** සථවිර භික්ෂුවක් තමුදු; **මං**- මට; **වදෙය්‍ය**- අවවාද කියා නම්;

මජ්ඣිමස්සපි භික්ඛුනො එවං හොති: —පෙ—. නවස්සපි භික්ඛුනො එවං හොති: - ථෙරෙපි මං න වදෙය්‍ය මජ්ඣිමොපි මං න වදෙය්‍ය නවොපි මං න වදෙය්‍ය, ථෙරම්පහං න වදෙය්‍යං මජ්ඣිමම්පහං න වදෙය්‍යං නවම්පහං න වදෙය්‍යං. ථෙරො චෙපි මං වදෙය්‍ය අහිතානුකම්පී මං වදෙය්‍ය නො හිතානුකම්පී, නොති නං වදෙය්‍යං විහෙසෙය්‍යම්පි නං පස්සම්පිස්ස න පටිකරෙය්‍යං. මජ්ඣිමො චෙපි මං වදෙය්‍ය–නවො චෙපි මං වදෙය්‍ය අහිතානුකම්පී මං වදෙය්‍ය නො හිතානුකම්පී, නොති නං වදෙය්‍යං විහෙසෙය්‍යම්පි නං පස්සම්පිස්ස න පටිකරෙය්‍යං. එවං ඛො භික්ඛවෙ අසන්තසන්නිවාසො හොති, එවං ච අසන්තො සන්නිවසන්ති.

කථඤ්ච භික්ඛවෙ සන්තසන්නිවාසො හොති? කථඤ්ච සන්තො සන්නිවසන්ති? ඉධ භික්ඛවෙ ථෙරස්ස භික්ඛුනො එවං හොති:- ථෙරෙපි මං වදෙය්‍ය මජ්ඣිමොපි මං වදෙය්‍ය නවොපි මං වදෙය්‍ය, ථෙරම්පහං වදෙය්‍යං මජ්ඣිමම්පහං වදෙය්‍යං නවම්පහං වදෙය්‍යං. ථෙරො චෙපි මං වදෙය්‍ය හිතානුකම්පී මං වදෙය්‍ය නො අහිතානුකම්පී සාධූති, නං වදෙය්‍යං න නං විහෙසෙය්‍යං පස්සම්පිස්ස පටිකරෙය්‍යං. මජ්ඣිමො චෙපි මං වදෙය්‍ය—නවො චෙපි මං වදෙය්‍ය හිතානුකම්පී මං වදෙය්‍ය නො අහිතානුකම්පී සාධූති නං වදෙය්‍යං න නං විහෙසෙය්‍යං පස්සම්පිස්ස පටිකරෙය්‍යං.

මං–මට; **අහිතානුකම්පී**–හිතානුකම්පා නැති ව; **වදෙය්‍ය**– කියන්නේ ය; **හිතානුකම්පී**–හිතානුකම්පා ඇති ව; **නො වදෙය්‍ය**-නො කියන්නේ ය; **නං**– ඒ අවවාදය; **නො+ඉති**– නො පිළිපදිමැයි; **වදෙය්‍යං**– කියන්නෙමි; **නං**– ඔහු; **විහෙසෙය්‍යං + අපි**– (වචන නො පිළිපැදීමෙන්) වෙහෙස ද කරමි; **අස්ස**– ඔහුගේ වචනය; **පස්සං + අපි**– සත්‍ය ය යි දක්නේ නමුදු; **න පටිකරෙය්‍යං**– නො පිළිපදිමි; **මජ්ඣිමස්ස + අපි භික්ඛුනො**– මධ්‍යම මහණහට ද; **එවං හොති**-මෙබඳු සිතෙක් වේ.–පෙ–. **එවං ඛො**-මෙසේ වනාහි; **අසන්තසන්නිවාසො හොති**- අසත්පුරුෂයන්ගේ එක් ව විසීම වේ. **අසන්තො**– අසත්පුරුෂයෝ; **එවං ච**– මෙසේ ම; **සන්නිවසන්ති**–එක් ව වෙසෙත්.

–පෙ– **සන්තසන්නිවාසො**– සත්පුරුෂයන්ගේ එක් ව විසීම; **කථං + ච හොති**– කෙසේ වේ ද?; **සන්තො**–සත්පුරුෂයෝ තුමූ; **කථං+ච**– කෙසේ නම්; **සන්නිවසන්ති**- එක් ව වෙසෙද් ද; –පෙ– **ථෙරො +අපි**–ස්ථවිර මහණ තෙමේ ද; **මං**– මට; **වදෙය්‍ය**– අවවාද

මජ්ඣිමස්සපි භික්ඛුනො එවං හොති-පෙ-නවස්සපි භික්ඛුනො එවං හොති:-ථෙරොපි මං වදෙය්‍ය මජ්ඣිමොපි මං වදෙය්‍ය නවොපි මං වදෙය්‍ය, ථෙරම්පහං වදෙය්‍යං මජ්ඣිමම්පහං වදෙය්‍යං නවම්පහං වදෙය්‍යං. ථෙරො චෙපි මං වදෙය්‍ය හිතානුකම්පී මං වදෙය්‍ය නො අහිතානුකම්පී, සාධූති තං වදෙය්‍යං න තං විහෙසෙය්‍යං පස්සම්පිස්ස පටිකරෙය්‍යං. මජ්ඣිමො චෙපි මං වදෙය්‍ය- නවො චෙපි මං වදෙය්‍ය හිතානුකම්පී මං වදෙය්‍ය නො අහිතානුකම්පී, සාධූති තං වදෙය්‍යං න තං විහෙසෙය්‍යං පස්සම්පිස්ස පටිකරෙය්‍යං. එවං ඛො භික්ඛවෙ සන්තසන්තිවාසො හොති, එවං ච සන්තො සන්තිවසන්තීති.......

12 යස්මිං භික්ඛවෙ අධිකරණෙ උභතො වචීසංසාරො දිට්ඨිපළාසො චෙතසො ආඝාතො අප්පච්චයො අනභිරද්ධි අජ්ඣත්තං අවූපසන්තං හොති තසෙමතං භික්ඛවෙ අධිකරණෙ පාටිකඞ්ඛං දීඝත්තාය ඛරත්තාය වාළත්තාය සංවත්තිස්සති, භික්ඛූ ච න ඵාසුං විහරිස්සන්ති......

යස්මිඤ්ච ඛො භික්ඛවෙ අධිකරණෙ උභතො වචීසංසාරො දිට්ඨිපළාසො චෙතසො ආඝාතො අප්පච්චයො අනභිරද්ධි

කෙරේවා; -පෙ- තං- ඔහට; සාධු + ඉති- මැනව තොප කීසේ යහපතැ යි; වදෙය්‍යං-කියන්නෙමි; තං- ඔහු; න විහෙසෙය්‍යං- (වචන පිළිපැදීමෙන්) වෙහෙස ද නො කරමි. -පෙ-.

12 -පෙ-**යස්මිං අධිකරණෙ**-විවාදාදි යම් අධිකරණයෙක්හි; **උභතො**-දෙපක්‍ෂයෙහි; **වචීසංසාරො**- ආක්‍රොශ ප්‍රත්‍යාක්‍රොශ වශයෙන් පවත්නා (පරුෂ) තෙපුල් ද; **දිට්ඨිපළාසො**- දෘෂ්ටිය නිසා උපදනා යුගග්‍රාහ ලක්‍ෂණ පළාසය ද; **චෙතසො**-සිත පිළිබඳ වූ; **ආඝාතො**-කෝපය ද; **අප්පච්චයො**- නො සතුටු ආකාරය ද; **අනභිරද්ධි**- සිත් නො ඇලීම ද; **අජ්ඣත්තං**- තමා කෙරෙහි; **අවූපසන්තං හොති**- මනා ව නොසන්හිඳුණේ වේ ද;-පෙ-**තස්මිං අධිකරණෙ**-ඒ අධිකරණයෙහි; **දීඝත්තාය**-දීර්‍ඝකාලයක් පවත්නා බව පිණිස ද; **ඛරත්තාය**- රළු වචන පවත්නා බව පිණිස ද; **වාළත්තාය**- පාණිප්‍රහරණාදි වශයෙන් සාහසික බව පිණිස ද; **සංවත්තිස්සති**-පවත්නේ ය; **භික්ඛූ ච**-භික්‍ෂූහු ද; **ඵාසුං**- සැපසේ; **න විහරිස්සන්ති (ඉති)**- වාසය නො කරන්නාහු ය යන; **එතං**- මේ ආදීනවය; **පාටිකඞ්ඛං**-කැමතිවිය යුත්තේ ය හෙවත් අවශ්‍යයෙන් වන්නේ ය යි වදාළසේක.

අජ්ඣත්තං සුවූපසන්තං හොති තසෙමතං භික්ඛවෙ අධිකරණෙ පාටිකඞ්ඛං න දීඝත්තාය ඛරත්තාය වාළත්තාය සංවත්තිස්සති, භික්ඛූ ච ඵාසුං විහරිස්සන්තීති ...

පුග්ගලවග්ගො පඨමො

2-2-2

1 ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ? ගිහිසුඛඤ්ච පබ්බජ්ජාසුඛඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං පබ්බජ්ජාසුඛන්ති ...

2 ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ? කාමසුඛඤ්ච නෙක්ඛම්මසුඛඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං නෙක්ඛම්මසුඛන්ති ...

3 ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ? උපධිසුඛඤ්ච නිරුපධිසුඛඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං නිරුපධිසුඛන්ති ...

-පෙ- **සු + උපසන්තං**- මනා ව සන්හිඳුණේ වේ ද; -පෙ- **විහරිස්සන්ති+ඉති**-වාසය කරන්නාහුය යන; -පෙ-.

පළමුවෙනි පුද්ගලවර්ග සි.

2-2-2

1 -පෙ- **සුඛානි**-සැපයෝ; **ඉමානි** වෙ-මොහු දෙදෙනෙක් වෙත්;-පෙ-**ගිහිසුඛං+ච**- (කාමසම්පත්තිය මූලික වූ) ගිහි සැපය; **පබ්බජ්ජාසුඛං** ච- (ප්‍රව්‍රජ්‍යාව මූලික වූ) පැවිදි සැපය ද යන දෙක යි.-පෙ-**ඉමානි ඛො** මෙ- මොහු දෙදෙන වනාහි; **සුඛානි**- සැපයෝ වෙත් —පෙ—**ඉමෙසං ද්වින්නං සුඛානං**--මේ සැපයන් දෙදෙනා අතුරෙන්; **යදිදං**- යම් මේ; **පබ්බජ්ජාසුඛං**- ප්‍රව්‍රජ්‍යා මූලික සැපයෙක් ඇද් ද; **එතං**-මේ තෙම; **අග්ගං + ඉති**- අග්‍ර වේ යයි වදාළසේක.

2 -පෙ- **කාමසුඛ+ච**-කාමයන් අරභයා උපදනා සැපය ද; **නෙක්ඛම්මසුඛං + ච**- ප්‍රව්‍රජ්‍යාව අරභයා උපදනා සැපය ද (යන දෙක යි);-පෙ-.

3 —පෙ—**උපධිසුඛං+ච**- ත්‍රෛභූමික සැපය ද; **නිරුපධිසුඛං + ච**-ලොකොත්තර සැපය ද; (යන දෙක යි).-පෙ-.

4 ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ? සාසවඤ්ච සුඛං අනාසවඤ්ච සුඛං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං අනාසවං සුඛන්ති –

5 ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ? සාමිසඤ්ච සුඛං නිරාමිසඤ්ච සුඛං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං නිරාමිසං සුඛන්ති –

6 ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ? අරියසුඛඤ්ච අනරියසුඛඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං අරියසුඛන්ති –

7 ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ? කායිකඤ්ච සුඛං චෙතසිකඤ්ච සුඛං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං චෙතසිකං සුඛන්ති –

8 ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ? සප්පීතිකඤ්ච සුඛං නිප්පීතිකඤ්ච සුඛං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං නිප්පීතිකං සුඛන්ති –

---

4 –පෙ– **සාසවං සුඛං+ච**- ආශ්‍රවයන්ට ප්‍රත්‍යය වූ වෘත සැපය ද; **අනාසවං සුඛං+ච**– ආශ්‍රවයන්ට ප්‍රත්‍යය නො වූ විවෘත සැපය ද (යන දෙක යි). –පෙ–.

5 –පෙ– **සාමිසං සුඛං+ච**- කෙලෙස් සහිත වූ වෘතගාමී සැපය ද; **නිරාමිසං සුඛං+ච**– කෙලෙස් රහිත වූ විවෘතගාමී සැපය ද (යන දෙක යි).–පෙ–.

6 –පෙ–**අරියසුඛං+ච**–ආර්‍ය්‍යයන් පිළිබඳ සැපය ද; **අනරිය සුඛං+ච**–පෘථග්ජනයන් පිළිබඳ සැපය ද (යන දෙක යි). –පෙ–.

7 –පෙ– **කායිකං සුඛං+ච**– කායවිඥානය සහජාත වූ සැපය ද; **චෙතසිකං සුඛං+ච**– මනොද්වාරික සැපය ද (යන දෙක යි). –පෙ–.

8 –පෙ– **සප්පීතිකං සුඛං+ච**– (ප්‍රථම ද්විතීයධ්‍යාන දෙකෙහි) ප්‍රීතිසහගත සැපය ද; **නිප්පීතිකං සුඛං+ච**–(තෘතීය චතුර්ථධ්‍යාන දෙකෙහි) ප්‍රීතිසහගත නො වූ සැපය ද (යන දෙක යි).—පෙ—.

9 ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ? සාතසුඛඤ්ච උපෙක්ඛා සුඛඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං උපෙක්ඛා සුඛන්ති—

10 ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ? සමාධි සුඛඤ්ච අසමාධිසුඛඤ්ච. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං සමාධි සුඛන්ති—

11 ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ? සප්පීතිකා රම්මණඤ්ච සුඛං නිප්පීතිකාරම්මණඤ්ච සුඛං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං නිප්පීතිකාරම්මණං සුඛන්ති—

12 ද්වෙමානි භික්ඛවෙ සුඛානි, කතමානි ද්වෙ? සාතාරම්ම ණඤ්ච සුඛං උපෙක්ඛාරම්මණඤ්ච සුඛං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං උපෙක්ඛාරම්මණං සුඛන්ති—

13 ද්වෙමානි භික්ඛවෙ සුඛානි. කතමානි ද්වෙ? රූපාරම්ම ණඤ්ච සුඛං අරූපාරම්මණඤ්ච සුඛං. ඉමානි ඛො භික්ඛවෙ ද්වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං අරූපාරම්මණං සුඛන්ති—

සුඛවග්ගො දුතියො

---

9 -පෙ-**සාතසුඛං**+ච- ප්‍රථම ද්විතීය තෘතීයධ්‍යාන සැපය ද; **උපෙක්ඛාසුඛං**+ච-චතුර්ථධ්‍යාන සැපය ද (යන දෙක යි.) -පෙ-.

10 -පෙ-**සමාධිසුඛං**+ච-අපිණාවට හෝ උපචාරයට පැමිණි යහුගේ සැපය ද; **අසමාධිසුඛං**+ච- ඒ දෙකට නො පැමිණිය හුගේ සැපය ද (යන දෙක යි.) -පෙ-.

11 -පෙ- **සප්පීතිකාරම්මණං සුඛං**+ච- ප්‍රීති සහිත ධ්‍යාන යන් අරමුණුකොට උපදනා සැපය ද; **නිප්පීතිකාරම්මණං සුඛං**+ච-ප්‍රීති රහිත ධ්‍යානයන් අරමුණුකොට උපදනා සැපය ද (යන දෙක යි.)-පෙ-.

12 -පෙ-**සාතාරම්මණං සුඛං**+ච- පළමු තුන් ධ්‍යානයන් අරමුණුකොට උපදනා සැපය ද; **උපෙක්ඛාරම්මණං සුඛං**+ච-චතුර්ථධ්‍යානය අරමුණුකොට උපදනා සැපය ද (යන දෙක යි.) -පෙ-.

2-2-3.

1. සනිමිත්තා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා නො අනිමිත්තා. තස්සෙව නිමිත්තස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්තීති-

2. සනිදානා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා නො අනිදානා. තස්සෙව නිදානස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්තීති-

3. සහෙතුකා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා නො අහෙතුකා. තස්සෙව හෙතුස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්තීති-

4. සසඞ්ඛාරා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා නො අසඞ්ඛාරා. තෙසංයෙව සඞ්ඛාරානං පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්තීති-

---

13 -පෙ- **රූපාරම්මණං සුඛං+ච-** රූපධ්‍යානයන් අරමුණුකොට උපදනා සැපය ද; **අරූපාරම්මණං සුඛං+ච-** අරූපධ්‍යානයන් අරමුණුකොට උපදනා සැපය ද (යන දෙක යි.)-පෙ-.

දෙවෙනි සුඛවග්ග යි.

2-2-3

1. -පෙ- **පාපකා-** ලාමක වූ; **අකුසලා ධම්මා-** අකුශල ධර්මයෝ; **සනිමිත්තා-** සකාරණ ව; **උප්පජ්ජන්ති-** උපදිත්; **අනිමිත්තා-**අකාරණ ව; **නො-**නො උපදිත්; **තස්ස+එව නිමිත්තස්ස-** ඒ කාරණයාගේ ම; **පහානා-** ප්‍රහාණයෙන්; **එවං-** මෙසේ; **පාපකා-** ලාමක වූ; **තෙ අකුසලා ධම්මා-** ඒ අකුශලධර්මයෝ; **න හොන්ති+ඉති-** නො වෙත් යයි වදාළසේක.

2. -පෙ- **සනිදානා-**නිදාන සහිත ව; **උප්පජ්ජන්ති-** උපදිත්; **අනිදානා-**නිදාන රහිත ව; **නො-** නො උපදිත්. -පෙ-

3. -පෙ- **සහෙතුකා-** හෙතු සහිත ව; **උප්පජ්ජන්ති-** උපදිත්; **අහෙතුකා-** හෙතු රහිත ව; **නො-** නො උපදිත්. -පෙ-.

4. -පෙ- **ස සඞ්ඛාරා-** සංස්කාර සහිත ව; **උප්පජ්ජන්ති-** උපදිත්; **අසඞ්ඛාරා-** සංස්කාර රහිත ව; -පෙ-

5. සප්පච්චයා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා නො අප්පච්චයා. තස්සෙව පච්චයස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්තීති.

6. සරූපා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා නො අරූපා. තස්සෙව රූපස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්තීති.

7. සවෙදනා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා නො අවෙදනා. තස්සායෙව වෙදනාය පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්තීති.

8. සසඤ්ඤා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා නො අසඤ්ඤා. තස්සායෙව සඤ්ඤාය පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්තීති.

9. සවිඤ්ඤාණා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා නො අවිඤ්ඤාණා. තස්සෙව විඤ්ඤාණස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්තීති.

10. සඞ්ඛතාරම්මණා භික්ඛවෙ උප්පජ්ජන්ති පාපකා අකුසලා ධම්මා නො අසඞ්ඛතාරම්මණා. තස්සෙව සඞ්ඛතස්ස පහානා එවං තෙ පාපකා අකුසලා ධම්මා න හොන්තීති.

නිමිත්තවග්ගො තතියො.

---

5. -පෙ- **සප්පච්චයා**- ප්‍රත්‍යය සහිත ව; -පෙ- **අප්පච්චයා**- ප්‍රත්‍යය රහිත ව; -පෙ-

6. -පෙ- **සරූපා**- රූප සහිත ව; -පෙ- **අරූපා**- රූප රහිත ව; -පෙ-

සංලක්ෂ්‍යය:-

නිමිත්ත-නිදාන-සඞ්ඛාර-පච්චය-රූප යන මොහු සමාසාන්ත අ ඇති නාමපදයෝ ය. එබැවින් සනිදානාදි සියලු තන්හි සකාරණ ව යන අර්ථය ද අනිදානාදි සියලුතන්හි අකාරණ ව යන අර්ථය ද යොදා ගතයුතු යි.

7. -පෙ- **සවෙදනා**- වේදනා සහිත ව; -පෙ- **අවෙදනා**- වේදනා රහිත ව; -පෙ-

8. -පෙ- **සසඤ්ඤා**- සංඥා සහිත ව; -පෙ- **අසඤ්ඤා**- සංඥා රහිත ව; -පෙ-

9. -පෙ-**සවිඤ්ඤාණා**- විඥාන සහිත ව;-පෙ- **අවිඤ්ඤාණා**- විඥාන රහිත ව; -පෙ-

2-2-4.

1. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ? චෙතොවිමුත්ති ච පඤ්ඤාවිමුත්ති ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති ...

2. ද්වෙ මෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ? පග්ගාහො ච අවික්ඛෙපො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති ...

3. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ? නාමඤ්ච රූපඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති ...

4. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ? විජ්ජා ච විමුත්ති ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති ...

---

10. —පෙ— **සඞ්ඛතාරම්මණා**- ප්‍රත්‍යයසමුත්පන්නධර්මයන් අරමුණු කොට; -පෙ- **අසඞ්ඛතාරම්මණා**- නිර්වාණය අරමුණු කොට; **නො**- නො උපදිත්; **තස්ස+එව සඞ්ඛතස්ස**- ඒ ප්‍රත්‍යය සමුත්පන්න ධර්මයාගේ ම; -පෙ-

තුන්වෙනි නිමිත්තවර්ගය යි.

2-2-4

1. -පෙ- **ධම්මා**- ධර්මයෝ; **ඉමෙ ඛෙ**- මොහු දෙදෙනෙක් වෙත්; -පෙ- **චෙතොවිමුත්ති ච**- අර්හත්ඵල සමාධිය ද; **පඤ්ඤා විමුත්ති ච**- අර්හත්ඵල ප්‍රඥව ද (යන දෙක යි). -පෙ-

සංලක්ෂ්‍යය:-

චෙතොවිමුත්තිං, පඤ්ඤාවිමුත්තිං- මෙහි අර්හත්ඵලය හා සම්ප්‍රයුක්ත වන සමාධිය රාගයෙන් මිදුණු හෙයින් චෙතොවිමුත්ති නමි. අර්හත් ඵලය හා සම්ප්‍රයුක්ත වන ප්‍රඥ තොමෝ අවිද්‍යාවෙන් මිදුණු හෙයින් පඤ්ඤා විමුත්ති නමි.

2. -පෙ-**පග්ගාහො ච**-වීර්‍ය්‍යය ද; **අවික්ඛෙපො ච**-චිත්තෛකාග්‍රතාව ද; -පෙ-

3. -පෙ- **නාමං+ච**- සතර අරූපස්කන්ධය ද; **රූපං+ච** රූප ස්කන්ධය ද; -පෙ-

සංලක්ෂ්‍යය:-

නාමඤ්ච, රූපඤ්ච- මෙහි වෙදනා, සංඥා, සංස්කාර, විඥාන යන අරූපස්කන්ධ සතර "නාම" නම් වේ. භූතරූප, පසාදරූප, ගොචරරූප, භාවරූප, හදයරූප, ජීවිතෙන්ද්‍රියරූප, ආහාරරූප යන අටළොස් වැදෑරුම් නිෂ්පන්න රූපය හා පරිච්ඡෙදරූප, විකාරරූප, ලක්ෂණරූප යන අනිෂ්පන්න රූප දශය ද රූපස්කන්ධය නම් වේ.

5. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ? භවදිට්ඨි ච විභව දිට්ඨි ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

6. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ? අහිරිකඤ්ච අනොත්තප්පඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

7. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා, කතමෙ ද්වෙ? හිරි ච ඔත්තප්පඤ්ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

8. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ? දොවචස්සතා ච පාපමිත්තතා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

9. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ? සොවචස්සතා ච කල්‍යාණමිත්තතා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

10. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ? ධාතුකුසලතා ච මනසිකාරකුසලතා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

11. ද්වෙමෙ භික්ඛවෙ ධම්මා. කතමෙ ද්වෙ? ආපත්තිකුසලතා ච ආපත්තිවුට්ඨානකුසලතා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ ධම්මාති.

ධම්මවග්ගො චතුත්ථො.

---

4. -පෙ- **විජ්ජා ච**- ඵලප්‍රඥාව ද; **විමුත්ති ච**- ඵලසම්ප්‍රයුක්ත සෙසු ධර්මයෝ ද; -පෙ-

5. -පෙ- **භවදිට්ඨි ච**- ශාශ්වත දෘෂ්ටිය ද; **විභවදිට්ඨි ච**- උච්ඡේද දෘෂ්ටිය ද; -පෙ-

6. -පෙ- **අහිරිකං + ච**- පාපයෙහි ලජ්ජා නැති බව ද; **අනොත්තප්පං + ච**- පාපයෙහි භය නැති බව ද; -පෙ-

7. **හිරි ච**- පාපයෙහි ලජ්ජා ඇති බව ද; **ඔත්තප්පං + ච**- පාපයෙහි භය ඇති බව ද; -පෙ-

8. -පෙ- **දොවචස්සතා ච**- දුර්වච බව ද හෙවත් අකීකරු බව ද; **පාපමිත්තතා ච**- පාපමිත්‍රයන් ඇති බව ද; -පෙ-

9. -පෙ- **සොවචස්සතා ච**- සුවච බව ද; **කල්‍යාණමිත්තතා ච**- යහපත් මිත්‍රයන් ඇති බව ද; -පෙ-

10. -පෙ- **ධාතුකුසලතා ච**- අටළොස්ධාතූන් දැනීමෙහි දක්ෂබව ද; **මනසිකාරකුසලතා ච**- ඒ අටළොස් ධාතූන්ගේ අනිත්‍යාදි ලක්ෂණත්‍රය මෙනෙහිකිරීමෙහි දක්ෂබව ද; -පෙ-

2-2-5

1. ද්වෙමෙ භික්ඛවෙ බාලා. කතමෙ ද්වෙ? යො ච අනාගතං භාරං වහති යො ච ආගතං භාරං න වහති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ බාලාති.

2. ද්වෙමෙ භික්ඛවෙ පණ්ඩිතා. කතමෙ ද්වෙ? යො ච ආගතං භාරං වහති යො ච අනාගතං භාරං න වහති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පණ්ඩිතාති.

3. ද්වෙමෙ භික්ඛවෙ බාලා. කතමෙ ද්වෙ? යො ච අකප්පියෙ කප්පියසඤ්ඤී යො ච කප්පියෙ අකප්පියසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ බාලාති.

4. ද්වෙමෙ භික්ඛවෙ පණ්ඩිතා, කතමෙ ද්වෙ? යො ච අකප්පියෙ අකප්පියසඤ්ඤී යො ච කප්පියෙ කප්පියසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පණ්ඩිතාති.

---

11. -පෙ- **ආපත්තිකුසලතා** ච- පස්වැදෑරුම් වූ ද සත්වැදෑරුම් වූ ද ආපත්තිස්කන්ධයන් දැනීමෙහි දක්‍ෂ බව ද; **ආපත්තිවුට්ඨානකුසලතා** ච- ඇවතින් නැඟී සිටීමෙහි දක්‍ෂ බව ද; -පෙ-

සංලක්‍ෂ්‍යය:-

ආපත්තිකුසලතා 38 වෙනි පිටේ සංලක්‍ෂ්‍යය බලනු.

සතරවෙනි ධම්මවග්ගය යි.

2-2-5

1. -පෙ- **බාලා**- බාලයෝ; **ඉමෙ** මෙ- මොහු දෙදෙනෙක් වෙත්: -පෙ- **සො ච**- යමෙක් තෙම; **අනාගතං භාරං**- තමාහට නො පැමිණි භාරය; **වහති**- උසුලා ද; **සො ච**- යමෙක් තෙම; **ආගතං භාරං**- තමාහට පැමිණි භාරය; **න වහති**- නො උසුලා ද; -පෙ- **බාලා+ඉති**-බාලයෝ වෙත් යයි වදාළසේක.

2. -පෙ- **ආගතං භාරං**- තමාහට පැමිණි භාරය; **වහති**- උසුලා ද; **සො ච**- යමෙක් තෙම; **අනාගතං භාරං**- තමාහට නො පැමිණි භාරය; **න වහති**- නො උසුලා ද; -පෙ-

3. -පෙ- **අකප්පියෙ**- නො කැප වූ සිංහමාංසාදියෙහි; **කප්පියසඤ්ඤී**- කැපය යන සංඥා ඇත්තේ ද; **කප්පියෙ**-කැප වූ කුමහිලමාංසාදියෙහි; **අකප්පියසඤ්ඤී**- අකැපය යන සංඥා ඇත්තේ ද; -පෙ-

4. මෙහි අරුත් ඉහත සඳහන් සූත්‍රයට කී නියායෙන් දතයුතුයි.

5. ද්වෙමෙ භික්ඛවෙ බාලා. කතමෙ ද්වෙ? යො ච අනාපත්තියා ආපත්තිසඤ්ඤී යො ච ආපත්තියා අනාපත්තිසඤ්ඤී ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ බාලාති…

6. ද්වෙමෙ භික්ඛවෙ පණ්ඩිතා. කතමෙ ද්වෙ? යො ච අනාපත්තියා අනාපත්තිසඤ්ඤී යො ච ආපත්තියා ආපත්තිසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පණ්ඩිතාති…

7. ද්වෙමෙ භික්ඛවෙ බාලා. කතමෙ ද්වෙ? යො ච අධම්මෙ ධම්මසඤ්ඤී යො ච ධම්මෙ අධම්මසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ බාලාති…

8. ද්වෙමෙ භික්ඛවෙ පණ්ඩිතා. කතමෙ ද්වෙ? යො ච අධම්මෙ අධම්මසඤ්ඤී යො ච ධම්මෙ ධම්මසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පණ්ඩිතාති…

9. ද්වෙමෙ භික්ඛවෙ බාලා. කතමෙ ද්වෙ? යො ච අවිනයෙ විනයසඤ්ඤී යො ච විනයෙ අවිනයසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ බාලාති…

10. ද්වෙමෙ භික්ඛවෙ පණ්ඩිතා. කතමෙ ද්වෙ? යො ච අවිනයෙ අවිනයසඤ්ඤී යො ච විනයෙ විනයසඤ්ඤී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පණ්ඩිතාති…

---

5. –පෙ– **අනාපත්තියා**- (පිළිවිස කිරීම් ආදි) අනාපත්තියෙහි; **ආපත්තිසඤ්ඤී**–ඇවතැ යි සංඥා ඇත්තේ ද; **ආපත්තියා**– (නො පිළිවිස කිරීම් ආදි) ආපත්තියෙහි; **අනාපත්තිසඤ්ඤී**–අනාපත්තිය යන සංඥා ඇත්තේ ද; –පෙ–

6. මෙහි අරුත් 5 වෙනි සූත්‍රයට කී නියායෙන් දතයුතු යි.

7. –පෙ– **අධම්මෙ**– අධර්මයෙහි; **ධම්මසඤ්ඤී**– ධර්මය යන සංඥා ඇත්තේ ද; **ධම්මෙ**– ධර්මයෙහි; **අධම්මසඤ්ඤී**– අධර්මය යන සංඥා ඇත්තේ ද; –පෙ–

8. මෙහි අරුත් 7 වෙනි සූත්‍රයට කී අයුරින් දතයුතු යි.

9. –පෙ– **අවිනයෙ**– අවිනයෙහි; **විනයසඤ්ඤී**– විනය යන සංඥා ඇත්තේ ද; **විනයෙ**– විනයෙහි; **අවිනයසඤ්ඤී**– අවිනය යන සංඥා ඇත්තේ ද –පෙ–

10. මෙහි අරුත් 9 වෙනි සූත්‍රයට කී නයින් දතයුතු යි.

11. ද්වින්නං භික්ඛවෙ ආසවා වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං? යො ච න කුක්කුච්චායිතබ්බං කුක්කුච්චායති යො ච කුක්කුච්චායිතබ්බං න කුක්කුච්චායති. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා වඩ්ඪන්තීති—

12. ද්වින්නං භික්ඛවෙ ආසවා න වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං? යො ච න කුක්කුච්චායිතබ්බං න කුක්කුච්චායති යො ච කුක්කුච්චායිතබ්බං කුක්කුච්චායති. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා න වඩ්ඪන්තීති—

13. ද්වින්නං භික්ඛවෙ ආසවා වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං? යො ච අකප්පියෙ කප්පියසඤ්ඤී යො ච කප්පියෙ අකප්පියසඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා වඩ්ඪන්තීති—

14. ද්වින්නං භික්ඛවෙ ආසවා න වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං? යො ච අකප්පියෙ අකප්පියසඤ්ඤී යො ච කප්පියෙ කප්පියසඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා න වඩ්ඪන්තීති—

15. ද්වින්නං භික්ඛවෙ ආසවා වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං? යො ච අනාපත්තියා ආපත්තිසඤ්ඤී යො ච ආපත්තියා අනාපත්තිසඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා වඩ්ඪන්තීති—

16. ද්වින්නං භික්ඛවෙ ආසවා න වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං? යො ච අනාපත්තියා අනාපත්තිසඤ්ඤී යො ච ආපත්තියා ආපත්තිසඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා න වඩ්ඪන්තීති—

---

11. -පෙ- **ද්වින්නං**- දෙදෙනකුන්ට; **ආසවා**- ක්ලෙශයෝ; **වඩ්ඪන්ති**- වැඩෙත්; -පෙ- **යො ච**- යමෙක් තෙම; **න කුක්කුච්චායිතබ්බං**- (සඞ්ඝිකපරිභොග අවිචාරණාදි) කුකුස් නො කටයුත් තෙහි; **කුක්කුච්චායති**- කුකුස් කෙරේ ද; **යො ච**- යමෙක් තෙම; **කුක්කුච්චායිතබ්බං**- (සඞ්ඝික පරිභොග විචාරණාදි) කුකුස් කට යුත්තෙහි; **න කුක්කුච්චායති**- කුකුස් නො කෙරේ ද; -පෙ- **ඉමෙසං ඛො ද්වින්නං**- මේ දෙදෙනාහට; **ආසවා**- ක්ලෙශයෝ; **වඩ්ඪන්ති+ඉති**- වැඩෙත් යයි වදාළසේක.

12. මෙහි අරුත් 11 වෙනි සූත්‍රයට කී නයින් දතයුතු යි.

13, 14, 15, 16 මේ සූත්‍රවල අරුත් මෙම වර්ගයේ 3, 4, 5, 6 යන සූත්‍රවලට කී නයින් දතයුතු යි.

17. ද්වීතානං භික්ඛවෙ ආසවා වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං? යො ච අධම්මෙ ධම්මසඤ්ඤී යො ච ධම්මෙ අධම්මසඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා වඩ්ඪන්තීති.

18. ද්වින්නං භික්ඛවෙ ආසවා න වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං? යො ච අධම්මෙ අධම්මසඤ්ඤී යො ච ධම්මෙ ධම්ම සඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා න වඩ්ඪන්තීති.

19. ද්වින්නං භික්ඛවෙ ආසවා වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං? යො ච අවිනයෙ විනයසඤ්ඤී යො ච විනයෙ අවිනයසඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා වඩ්ඪන්තීති.

20. ද්වින්නං භික්ඛවෙ ආසවා න වඩ්ඪන්ති. කතමෙසං ද්වින්නං? යො ච අවිනයෙ අවිනයසඤ්ඤී යො ච විනයෙ විනය සඤ්ඤී. ඉමෙසං ඛො භික්ඛවෙ ද්වින්නං ආසවා න වඩ්ඪන්තීති.

බාලවග්ගො පඤ්චමො.

දුතියො පණ්ණාසකො සමත්තො.

2-3-1

1. ද්වෙමා භික්ඛවෙ ආසා දුප්පජහා. කතමා ද්වෙ? ලාභාසා ච ජීවිතාසා ච. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ ආසා දුප්පජහාති.

2. ද්වෙමෙ භික්ඛවෙ පුග්ගලා දුල්ලභා ලොකස්මිං. කතමෙ ද්වෙ? යො ච පුබ්බකාරී යො ච කතඤ්ඤූ කතවෙදී. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පුග්ගලා දුල්ලභා ලොකස්මින්ති.

17, 18, 19, 20 මේ සූත්‍රවල අරුත් මෙම වර්ගයේ 7, 8, 9, 10 යන සූත්‍රවලට කී නයින් දතයුතු යි.

පස්වෙනි බාලවර්ගය යි.

දෙවෙනි පණ්ණාසකය සමාප්ත යි.

2-3-1

1. -පෙ- **ඉමා** මෙ **ආසා**- මේ තෘෂ්ණාවෝ දෙදෙන; **දුප්පජහා**- දුකසේ දුරුකටයුත්තාහු ය; -පෙ- **ලාභාසා** ච- ලාභ යෙහි ආසාව ද; **ජීවිතාසා** ච- ජීවිතයෙහි ආසාව ද (යන දෙක යි). -පෙ-

2. -පෙ- **ලොකස්මිං**- ලොකයෙහි; **ඉමෙ** මෙ **පුග්ගලා**- මේ පුද්ගලයෝ දෙදෙන; **දුල්ලභා**- දුර්ලභ වෙත්. -පෙ- **යො ච**-

3. ද්වෙමෙ භික්ඛවෙ පුග්ගලා දුල්ලභා ලොකස්මිං. කතමෙ ද්වෙ? තිත්තො ච තප්පෙතා ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පුග්ගලා දුල්ලභා ලොකස්මින්ති.

4. ද්වෙමෙ භික්ඛවෙ පුග්ගලා දුත්තප්පයා. කතමෙ ද්වෙ? යො ච ලද්ධං ලද්ධං නික්ඛිපති යො ච ලද්ධං ලද්ධං විස්සජ්ජෙති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පුග්ගලා දුත්තප්පයාති.

5. ද්වෙමෙ භික්ඛවෙ පුග්ගලා සුතප්පයා. කතමෙ ද්වෙ? යො ච ලද්ධං ලද්ධං න නික්ඛිපති යො ච ලද්ධං ලද්ධං න විස්සජ්ජෙති. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පුග්ගලා සුතප්පයාති.

6. ද්වෙමෙ භික්ඛවෙ පච්චයා රාගස්ස උප්පාදාය. කතමෙ ද්වෙ? සුභනිමිත්තඤ්ච අයොනිසො ච මනසිකාරො. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පච්චයා රාගස්ස උප්පාදායාති.

7 ද්වෙමෙ භික්ඛවෙ පච්චයා දොසස්ස උප්පාදාය. කතමෙ ද්වෙ? පටිඝනිමිත්තඤ්ච අයොනිසො ච මනසිකාරො. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පච්චයා දොසස්ස උප්පාදායාති.

යමෙක් තෙම; **පුබ්බකාරී**- පළමුව උපකාර කෙරේ ද; **යො ච**- යමෙක් තෙම; **කතඤ්ඤූ**- කළ උපකාරය දන්නේ වේ ද; **කත වෙදී**- කළ උපකාරය ප්‍රකට ව දන්නේ වේ ද (යන දෙදෙන යි). -පෙ-

3. -පෙ- **තිත්තො** ච- නිර්‍වාණධර්මයෙන් තෘප්ත වූ ප්‍රත්‍යෙක බුද්ධ ක්ෂීණාශ්‍රව පුද්ගල තෙමේ ද; **තප්පෙතා** ච- නිර්‍වාණධර්මයෙන් අනුන් ද තෘප්තකරවන්නා වූ සම්‍යක්සම්බුද්ධ තෙමේ ද; -පෙ-

4. -පෙ- **දුත්තප්පයා**- දායකයා විසින් සිවුපසයෙන් පිනවිය නො හැක්කාහු ය. -පෙ- **යො** ච-යමෙක් තෙම; **ලද්ධං ලද්ධං**-ලද ලද දෙය; **නික්ඛිපති**-සඟවා තබා ද; -පෙ- **ලද්ධං ලද්ධං**- ලද ලද දෙය; **විස්සජ්ජෙති**- අනුන්ට දේ ද; -පෙ-

5. -පෙ- **සුතප්පයා**- සිවුපසයෙන් සැපසේ පිනවිය හැක්කාහු ය. -පෙ- **න නික්ඛිපති**- සඟවා නො තබා ද; -පෙ- **න විස්සජ්ජෙති**- සියල්ල අනුන්ට නො දේ ද; -පෙ-

6 -පෙ- **රාගස්ස**- රාගයාගේ; **උප්පාදාය**; ඉපදීම පිණිස; **ඉමෙ** මෙ-මොහු දෙදෙන; **පච්චයා**- ප්‍රත්‍යයෝ හෙවත් කාරණයෝ වෙත්. -පෙ- **සුභනිමිත්තං + ච**- ඉෂ්ටාරම්මණය ද; **අයොනිසො මනසිකාරො** ච-නුනුවණින් මෙනෙහි කිරීම ද(යන දෙක යි). -පෙ-.

8 ද්වෙමෙ භික්ඛවෙ පච්චයා මිච්ඡාදිට්ඨියා උප්පාදය. කතමෙ ද්වෙ? පරතො ච ඝොසො අයොනිසො මනසිකාරො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පච්චයා මිච්ඡාදිට්ඨියා උප්පාදායාති–

9 ද්වෙමෙ භික්ඛවෙ පච්චයා සම්මාදිට්ඨියා උප්පාදය. කතමෙ ද්වෙ? පරතො ච ඝොසො යොනිසො මනසිකාරො ච. ඉමෙ ඛො භික්ඛවෙ ද්වෙ පච්චයා සම්මාදිට්ඨියා උප්පාදායාති–

10 ද්වෙමා භික්ඛවෙ ආපත්තියො. කතමා ද්වෙ? ලහුකා ච ආපත්ති ගරුකා ච ආපත්ති. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ ආපත්තියොති–

11 ද්වෙමා භික්ඛවෙ ආපත්තියො. කතමා ද්වෙ? දුට්ඨුල්ලා ච ආපත්ති අදුට්ඨුල්ලා ච ආපත්ති. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ ආපත්තියොති–

12 ද්වෙමා භික්ඛවෙ ආපත්තියො. කතමා ද්වෙ? සාවසෙසා ච ආපත්ති අනවසෙසා ච ආපත්ති. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ ආපත්තියොති–

ආසාවග්ගො පඨමො

---

7 –පෙ– **දෙසස්ස**– ද්වෙෂයාගේ; **උප්පාදය**– ඉපදීම පිණිස; –පෙ– **පටිඝනිමිත්තං** ච–අනිෂ්ටාරම්මණය ද; **අයොනිසො මනසිකාරො** ච–නුනුවණින් මෙනෙහි කිරීම ද (යන දෙක යි). –පෙ–.

8 –පෙ– **මිච්ඡාදිට්ඨියා**–මිථ්‍යාදෘෂ්ටියගේ; **උප්පාදය**–ඉපදීම පිණිස; –පෙ– **පරතො ච ඝොසො**– අනුන් කෙරෙන් අසද්ධර්මය ඇසීම ද; –පෙ–.

9 –පෙ–**සම්මාදිට්ඨියා**–සම්‍යක් දෘෂ්ටියගේ; **උප්පාදය**– ඉපදීම පිණිස; –පෙ– **පරතො** ච **ඝොසො**– අනුන් කෙරෙන් සද්ධර්මය ඇසීම ද; **යොනිසො** මන**සිකාරො** ච–නුවණින් මෙනෙහි කිරීම ද –පෙ–.

10 –පෙ–**ඉමා** වෙ–මොහු දෙදෙන; **ආපත්තියො**–ආපත්තීහු වෙත්. –පෙ– **ලහුකා ච ආපත්ති**– (පාචිත්‍යාදි පඤ්චාපත්තිසඞ්ඛ්‍යාත) ලඝු වූ ඇවත ද; **ගරුකා ච ආපත්ති**-පාරාජිකාදි ගරු වූ ඇවත ද –පෙ–. (38 පිටේ සංලක්‍ෂ්‍යය බලනු.)

11 –පෙ– **දුට්ඨුල්ලා** ච **ආපත්ති**– (පාරාජිකාදි දෙයාපත්ති සඞ්ඛ සඞ්ඛ්‍යාත වූ) දුට්ඨුල්ල ඇවත ද; **අදුට්ඨුල්ලා ච ආපත්ති**– පාචිත්‍යාදි අදුට්ඨුල්ල ඇවත ද –පෙ–.

2–3–2

1 **සද්ධො** භික්ඛවෙ භික්ඛු එවං සම්මා ආයාචමානො **ආයා** චෙය්‍ය:–තාදිසො හොමි යාදිසා සාරිපුත්තමොග්ගල්ලානාති. **එසා** භික්ඛවෙ තුලා එතං පමාණං මම සාවකානං භික්ඛූනං **යදිදං** සාරිපුත්තමොග්ගල්ලානාති.

2 සද්ධා භික්ඛවෙ භික්ඛුනී **එ**වං සම්මා ආයාචමානා ආයා චෙය්‍ය:– තාදිසා හොමි යාදිසා ඛෙමා ච භික්ඛුනී උප්පලවණ්ණා චාති. එසා භික්ඛවෙ තුලා එතං පමාණං මම සාවිකානං භික්ඛුනීනං යදිදං ඛෙමා ච භික්ඛුනී උප්පලවණ්ණා චාති.

---

12 –පෙ– **සාවසෙසා** ච **ආපත්ති**– (සඞ්ඝාදිශෙෂාදි ෂට් ආපත්ති සඞ්ඛ්‍යාත) සාවශෙෂ ඇවත ද; **අනවසෙසා** ච **ආපත්ති**-පාරාජිකා ඇවත ද (යන දෙක යි). –පෙ–.

පළමුවෙනි ආසා වර්ගය යි.

2–3–2

1 –පෙ– **සද්ධො**– සැදැහැති; **භික්ඛු**– මහණතෙම; **සම්මා**– මනාකොට; **ආයාචමානො**– ප්‍රාර්ථනා කරන්නේ; **සාරිපුත්ත මොග්ගල්ලානා**-සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේ; **යාදිසා**– යම්බඳු වෙද් ද; **තාදිසො හොමි+ඉති**– එබඳු වෙමැයි; **එවං**– මෙසේ; **ආයාචෙය්‍ය**– ප්‍රාර්ථනා කරන්නේ ය; –පෙ– **යදිදං**- යම් මේ; **සාරිපුත්තමොග්ගල්ලානා**– සැරියුත් මුගලන් දෙදෙනෙක් ඇද් ද; **එසා**–මෝ තොමෝ; මම **සාවකානං**– මාගේ ශ්‍රාවක වූ; **භික්ඛූනං**- භික්ෂූන්ට; **තුලා**– තුලාව වේ; **එතං පමාණං+ඉති**– මෙය ප්‍රමාණය වේ යයි වදාළසේක.

තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො ඤාතකො භික්ඛු බහුජනහිතාය පටිපන්නො හොති, බහුජනසුඛාය, බහුනො ජනස්ස අත්ථාය, හිතාය සුඛාය දෙවමනුස්සානං. කතමෙහි තීහි? අනුලොමිකෙ කායකම්මෙ සමාදපෙති, අනුලොමිකෙ වචීකම්මෙ සමාදපෙති, අනුලොමිකෙසු ධම්මෙසු සමාදපෙති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො ඤාතකො භික්ඛු බහුජන හිතාය පටිපන්නො හොති, බහුජනසුඛාය, බහුනො ජනස්ස අත්ථාය, හිතාය සුඛාය දෙවමනුස්සානන්ති.

2 තීණිමානි භික්ඛවෙ රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස යාවජීවං සාරණීයානි[1] භවන්ති. කතමානි තීණි? යස්මිං භික්ඛවෙ පදෙසෙ රාජා ඛත්තියො මුද්ධාවසිත්තො ජාතො හොති, ඉදං

3-1-2

1 -පෙ- **තීහි ධම්මෙහි**- තුන්කාරණයෙකින්; **සමන්නාගතො**- යුක්ත වූ; **ඤාතකො භික්ඛු**- ප්‍රසිද්ධ වූ මහණතෙම; **බහුජන+අහිතාය**- බොහෝදෙනාට අහිත පිණිස ද; **බහුජන+අසුඛාය**- බොහෝදෙනාට නො සැප පිණිස ද; **බහුනො ජනස්ස**- බොහෝ දෙනාහට; **අනත්ථාය**-අනර්‍ථ පිණිස ද; **දෙවමනුස්සානං**- දෙවිමිනිසුන්ට; **අහිතාය** -අහිත පිණිස ද; **දුක්ඛාය** -දුක් පිණිස ද; **පටිපන්නො හොති**- පිළිපන්නේ වේ; -පෙ- **අනනුලොමිකෙ**- ශාසනයට විරුද්ධ වූ; **කායකම්මෙ**-(දිසානමස්කාර භූතබලි ආදිය කළයුතුය යි) කායකර්මයෙහි; **සමාදපෙති**- සමාදන් කරවා ද; -පෙ-; **වචීකම්මෙ**- (වලඤ්ජ මුසාවාදාදි වශයෙන්) වාක්කර්මයෙහි; **සමාදපෙති**-සමාදන් කරවා ද; -පෙ- **ධම්මෙසු**- (කර්මස්ථාන විසංවාදනාදි වශයෙන්) ධර්මයන්හි -පෙ-.

-පෙ- **අනුලොමිකෙ**- ශාසනයට විරුද්ධ නො වූ; **කායකම්මෙ**-කායකර්මයෙහි; **සමාදපෙති**-සමාදන් කරවා ද;-පෙ-.

---

1. සරණීයානි. ස්‍යාම.

භික්ඛවෙ පඨමං රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස යාවජීවං සාරණීයං හොති. පුන ච පරං භික්ඛවෙ යස්මිං පදෙසෙ රාජා ඛත්තියො මුද්ධාවසිත්තො අභිසිත්තො හොති, ඉදං භික්ඛවෙ දුතියං රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස යාවජීවං සාරාණීයං හොති. පුන ච පරං භික්ඛවෙ යස්මිං පදෙසෙ රාජා ඛත්තියො මුද්ධාවසිත්තො සඞ්ගාමං අභිවිජිනිත්වා විජිතසඞ්ගාමො තමෙව සඞ්ගාමසීසං අජ්ඣාවසති, ඉදං භික්ඛවෙ තතියං රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස යාවජීවං සාරාණීයං හොති. ඉමානි ඛො භික්ඛවෙ තීණි රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස යාවජීවං සාරාණීයානි භවන්ති.

---

2 -පෙ- **මුද්ධාවසිත්තස්ස**-මුදුනෙහි කරන ලද අභිෂෙක ඇති (හෙවත් රාජ්‍යයෙහි අභිෂෙක කරන ලද); **ඛත්තියස්ස රඤ්ඤො**-ක්‍ෂත්‍රිය රජු විසින්; **ඉමානි තීණි**-මේ තුන් ස්ථානයෝ; **යාවජීවං**- ජීවිතාන්තය දක්වා; **සාරාණීයානි භවන්ති**- සිහිකටයුතුවෙත්; **කතමානි තීණි?**- කවර තුන්ස්ථානයක් ද; යත්? -පෙ- **මුද්ධාවසිත්තො**-මුදුනෙහි කරන ලද අභිෂෙක ඇති; **ඛත්තියො රාජා**- ක්‍ෂත්‍රිය රජතෙම; **යස්මිං පදෙසෙ**- යම් පෙදෙසෙක්හි; **ජාතො හොති**- උපන්නේ වේ ද; -පෙ- **මුද්ධාවසිත්තස්ස**-මුදුනෙහි කරන ලද අභිෂෙක ඇති (හෙවත් රාජ්‍යයෙහි අභිෂෙක කරන ලද); **ඛත්තියස්ස රඤ්ඤො**- ක්‍ෂත්‍රිය රජු විසින්; **ඉදං පඨමං**- මේ පළමුවන ස්ථානය; **යාවජීවං**- ජීවිතාන්තය දක්වා; **සාරාණීයං හොති**-සිහිකටයුතු වේ; -පෙ- **පුන ච පරං**- නැවත ද; -පෙ- **යස්මිං පදෙසෙ**-යම් පෙදෙසෙක්හි; **අභිසිත්තො හොති**- අභිෂෙක කරන ලද්දේ වේ ද; -පෙ-; **ඉදං දුතියං**-මේ දෙවන ස්ථානය; **යාවජීවං**- ජීවිතාන්තය දක්වා; **සාරාණීයං හොති**- සිහිකටයුතු වේ; -පෙ-; **සඞ්ගාමං**- යුද්ධයක්; **අභිවිජිනිත්වා**-දිනා (හෙවත් ශත්‍රුමර්දනය කොට); **විජිතසඞ්ගාමො**-දිනන ලද සංග්‍රාම ඇත්තේ; **තං+එව සඞ්ගාමසීසං**- ඒ යුද්ධභූමියෙහි ම; **අජ්ඣාවසති**- වෙසේ ද; -පෙ-; **ඉදං තතියං**-මේ තුන්වන ස්ථානය; -පෙ-; **සාරාණීයං හොති**- සිහිකටයුතු වේ; -පෙ-.

සංලක්‍ෂ්‍යයි:-

සාරාණීයං-මෙය **සර**-චින්තායං යන ධාතු කෙරෙන් **අනීය** ප්‍රත්‍යය වැ සිඩ වූ කිතකපදයෙකි. **සරණීයං** ඕ. සියම් පොත්හි එන පාඨය ම මැනවැ යි හැඟේ. විමසියයුතු. **ඛත්තියස්ස රඤ්ඤො** යනුවෙන් එහි කත්‍රීෂත්ඨී විභක්තියෙන් සිටී. එබැවින් "කත්‍රි ෂෂ්ඨී"යයි කියනු ලැබේ. ප්‍රථම භාගයෙහි 88 වෙනි පිටේ සංලක්‍ෂ්‍යය බලනු. මෙබඳු අන්තැන් ද විමසනු.

එවමෙව ඛො භික්ඛවෙ තීණිමානි භික්ඛුස්ස යාවජීවං සාරණීයානි භවන්ති. කතමානි තීණි? යස්මිං භික්ඛවෙ පදෙසෙ භික්ඛු කෙසමස්සුං ඔහාරෙත්වා කාසායානි වත්ථානි අච්ඡාදෙත්වා අගාරස්මා අනගාරියං පබ්බජිතො හොති; ඉදං භික්ඛවෙ පඨමං භික්ඛුස්ස යාවජීවං සාරණීයං හොති. පුන ච පරං භික්ඛවෙ යස්මිං පදෙසෙ භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, අයං දුක්ඛසමුදයොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධොති යථාභූතං පජානාති, අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පජානාති; ඉදං භික්ඛවෙ දුතියං භික්ඛුස්ස යාවජීවං සාරණීයං හොති. පුන ච පරං භික්ඛවෙ යස්මිං පදෙසෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා

සංලක්ෂ්‍යය:-

සඞ්ගාමසීසං අජ්ඣාවසති:-අධි+ආ යන උපසර්ග පූර්ව වූ **වස**- නිවාසෙ යන ධාතුවෙන් වතිමාන **ති** ප්‍රත්‍යය වැ **අජ්ඣාවසති** යනු සිද්ධ යි. එහෙයින් **සඞ්ගාමසීස** ශබ්දයා කෙරෙන් සප්තම්‍යර්ථයෙහි විභක්ති ගැනීම් ... 139 පිටේ සංලක්ෂ්‍යය බලනු.

-පෙ-**එවං+එව ඛො**- එපරිද්දෙන් ම; **භික්ඛුස්ස**- භික්ෂුව විසින්; **ඉමානි තීණි**-මේ තුන්ස්ථානයෝ; **යාවජීවං**-ජීවිතාන්තය දක්වා; **සාරණීයානි භවන්ති**-සිහිකටයුතු වෙත්; -පෙ-; **භික්ඛු**-මහණතෙම; **යස්මිං පදෙසෙ**- යම් පෙදෙසෙක්හි; **කෙසමස්සුං ඔහාරෙත්වා**-හිසකේ දැලිරවුළු කපා හැර; **කාසායානි වත්ථානි**-කසාවත්; **අච්ඡාදෙත්වා**- හැඳ පෙරව; **අගාරස්මා**- ගිහිගෙයින් නික්ම; **අනගාරියං**-(අගාරයට හිත නො වන හෙයින් අනගාරිය නම් වූ) පැවිද්දට; **පබ්බජිතො හොති**-පැමිණියේ වේ ද; -පෙ-; **භික්ඛුස්ස**- භික්ෂුව විසින්; **ඉදං පඨමං**- මේ පළමු වන ස්ථානය; **යාවජීවං**- ජීවිතාන්තය දක්වා; **සාරණීයං හොති**- සිහිකටයුතු වේ; -පෙ-; **ඉදං**-මේ ස්කන්ධපඤ්චකය; **දුක්ඛං+ඉති**-දුක්ඛ සත්‍යය යයි; **යථාභූතං**-තත් වූ පරිද්දෙන්; **පජානාති**-දනී ද; **අයං**-මේ ත්‍රිවිධ තෘෂ්ණාතොමෝ; **දුක්ඛසමුදයො+ඉති**-දුක්ඛසමුදය සත්‍යය යයි; -පෙ-; **අයං**- මේ දුක්ඛසමුදය දෙදෙනාගේ අප්‍රවෘත්තිය; **දුක්ඛනිරොධො ඉති**-දුක්ඛනිරොධ සත්‍යය යයි; -පෙ-; **අයං**- මේ ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්‍ගය; **දුක්ඛනිරොධගාමිනී පටිපදා+ඉති**-දුක්ඛ නිරොධයට පමුණුවන ප්‍රතිපදාර්‍ය්‍යසත්‍යය යයි; -පෙ-; **භික්ඛු**-මහණතෙම; **ආසවානං ඛයා**- ආශ්‍රවයන්ගේ ක්ෂය කිරීමෙන්; **අනාසවං**-ආශ්‍රව ලෙශයකුදු නැත්තා වූ; **චෙතොවිමුත්තිං**- අර්හත් ඵල සමාධිය ද; **පඤ්ඤාවිමුත්තිං**- අර්හත් ඵල ප්‍රඥාව ද; **දිට්ඨෙව**

සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති; ඉදං භික්ඛවෙ තතියං භික්ඛුස්ස යාවජීවං සාරණීයං හොති. ඉමානි ඛො භික්ඛවෙ තීණි භික්ඛුස්ස යාවජීවං සාරණීයානි භවන්තීති.

3 තයොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ තයො? නිරාසො ආසංසො විගතාසො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො නිරාසො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො නීචෙ කුලෙ පච්චාජාතො හොති:-චණ්ඩාලකුලෙ වා නෙසාදකුලෙ වා වෙණකුලෙ වා රථකාරකුලෙ වා පුක්කුසකුලෙ වා දලිද්දෙ අප්පන්නපානභොජනෙ කසිරවුත්තිකෙ යත්ථ කසිරෙන ඝාසච්ඡාදෙ ලබ්භති, සො ච හොති දුබ්බණ්ණො

ධම්මෙ- ඉහාත්මයෙහි ම; **සයං**- තෙමේ; **අභිඤ්ඤා**- විශිෂ්ට ඥානයෙන් දැන; **සච්ඡිකත්වා**- ප්‍රත්‍යක්ෂ කොට; **උපසම්පජ්ජ**-පැමිණ; **විහරති**- වාසය කෙරේ ද; -පෙ-.

සංලක්ෂ්‍යය:-

අභිඤ්ඤා සච්ඡිකත්වා:-අභිඤ්ඤා යනු **අභි** පූර්ව **"ඤා"** අවබොධනෙ යන ධාතුවෙන් ස්ත්‍රී අර්ථයෙහි 'අ' ප්‍රත්‍යය හා 'ආ' ප්‍රත්‍යය වීමෙන් සිද්ධ වූ කිතකපදයෙකි. **අභිඤ්ඤාය සච්ඡිකත්වා** යි කියයුතු තැන වාක්‍ය සුඛොච්චාරණය පිණිස "ය" කාරය ලොප්වී **අභිඤ්ඤා සච්ඡිකත්වා** යි සිද්ධ වී තිබේ.

3 -පෙ- **ඉමෙ තයො පුග්ගලා**- මේ තුන්පුද්ගල කෙනෙක්; **ලොකස්මිං**- සත්වලොකයෙහි; **සන්තො සංවිජ්ජමානා**- විද්‍යමාන වෙත්; **කතමෙ තයො**- කවර තුන්දෙනෙක් ද යත්? **නිරාසො**- ප්‍රාර්ථනා නැති පුද්ගලයෙක; **ආසංසො**-ප්‍රාර්ථනා ඇති පුද්ගලයෙක; **විගතාසො**-පහ වූ ප්‍රාර්ථනා ඇති පුද්ගලයෙක;(යන තුන්දෙනයි);

-පෙ- **නිරාසො පුග්ගලො**- ප්‍රාර්ථනා නැති පුද්ගලතෙම; **කතමො ච?**-කවරේ ද? -පෙ- **ඉධ**- මේ ලොකයෙහි; **එකච්චො පුග්ගලො**- ඇතැම් පුද්ගලයෙක්තෙම; **දලිද්දෙ**- දිළිඳු වූ; **අප්ප + අන්න-පාන-භොජනෙ**- ස්වල්ප වූ ආහාරපාන භොජන ඇති; **කසිරවුත්තිකෙ**- දුක්ඛජීවිකා ඇති; **යත්ථ**- යම්බඳු කුලයෙක්හි; **කසිරෙන**-දුක සේ; **ඝාසච්ඡාදෙ**-කෑම් හැඳීම්; **ලබ්භති**-ලැබේ ද; (එබඳු දරිද්‍ර වූ); **චණ්ඩාලකුලෙ වා**- සැඬොල් කුලයෙක හෝ; **නෙසාදකුලෙ වා**- වැදි කුලයෙක හෝ; **වෙණකුලෙ වා**- කුළුපොතු කුලයෙක හෝ; **රථකාරකුලෙ වා**- සම්කරු කුලයෙක හෝ; **පුක්කුසකුලෙ වා**- බඹුරු කුලයෙක හෝ; **නීචෙ කුලෙ**- මෙබඳු නීචකුලයෙක්හි; **පච්චාජාතො හොති**- උපන්නේ වේ ද;

දුද්දසිකො ඔකොටිමකො බව්හාබාධො කාණො වා කුණී වා ඛඤ්ජො වා පක්ඛහතො වා, න ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස. සො සුණාති:- ඉත්ථන්නාමො කිර ඛත්තියො ඛත්තියෙහි ඛත්තියාභිසෙකෙන අභිසිත්තොති. තස්ස න එවං හොති:- කුදාස්සු නාම මමම්පි ඛත්තියා ඛත්තියාභිසෙකෙන අභිසිඤ්චිස්සන්තීති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො නිරාසො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො ආසංසො? ඉධ භික්ඛවෙ රඤ්ඤො ඛත්තියස්ස මුද්ධාවසිත්තස්ස ජෙට්ඨො පුත්තො හොති ආභිසෙකො අනභිසිත්තො මචලප්පත්තො. සො සුණාති:-

---

සො ච-ඒ දුගී කුලගීන පුද්ගලතෙමේත්; **දුබ්බණ්ණො හොති**- අයහපත් ශරීරවර්ණ ඇතිවේ ද; **දුද්දසිකො**- (වැදූ මවට පවා) අමනාප දකුම් ඇති වේ ද; **ඔකොටිමකො**- කුරු වූ ශරීර ඇති වේ ද; **බහු+ආබාධො**-බොහෝ රෙග ඇති වේ ද; **කාණො වා**- එක් ඇසක් හෝ දෑසම හෝ කණ වේද; **කුණී වා**-එක් අතක් හෝ දෑතම හෝ වක් වේ ද; **ඛඤ්ජො වා**-එක්පයක් හෝ දෙපයම හෝ කොර වේ ද; **පක්ඛහතො වා**-නැසුණා වූ පක්ෂයක් ඇති පිලෙක් හෝ වේ ද; **අන්නස්ස**-ආහාර ද; **පානස්ස**- පානවගී ද; **වත්ථස්ස**- වස්ත්‍ර ද; **යානස්ස**-යාන වාහන ද; **මාලා-ගන්ධ-විලෙපනස්ස**- මල් ගඳවිලවුන් ද; **සෙය්‍යා**- හෝනා හිඳිනා ඇඳ පුටු හා; **ආවසථ**- ලගිනා ගෙය ද; **පදීපෙය්‍යස්ස**- ප්‍රදීප උපකරණ ද; **න ලාභී**-නො ලබන්නේ වේ ද; **සො**- හෙතෙම; **ඉත්ථන්නාමො ඛත්තියො**- මෙනම් ක්ෂත්‍රියතෙම; **ඛත්තියෙහි**- සෙසු ක්ෂත්‍රිය රජුන් විසින්; **ඛත්තියාභිසෙකෙන**-රාජ්‍යාභිෂෙකයෙන්; **අභිසිත්තො කිර ඉති**- අභිෂෙක කරන ලද්දේ යයි; **සුණාති**-අසයි; **තස්ස**- ඔහට; **එවං න හොති**-මෙබඳු ප්‍රාර්ථනාවෙක් නො වේ; (කොබඳු ප්‍රාර්ථනාවෙක් ද යත්) **කුදාස්සු නාම**- කවර කලෙක නම්; **මමං+අපි**- මා ද; **ඛත්තියා**- ක්ෂත්‍රියයෝ; **ඛත්තියාභිසෙකෙන**- රාජාභිෂෙකයෙන්; **අභිසිඤ්චිස්සන්ති + ඉති**-අභිෂෙක කරන්නාහු ද යන ප්‍රාර්ථනාවයි; -පෙ-; **අයං පුග්ගලො**- මේ පුද්ගලතෙම; **නිරාසො**- ප්‍රාර්ථනා නැති පුද්ගලයා යයි; **වුච්චති**- කියනු ලැබේ; -පෙ-.

සංලක්ෂ්‍යය:-

න ලාභී අන්නස්ස- අන්නස්ස යනු කර්මාර්ථයෙහි ෂෂ්ඨී විභක්ති යි. **ලාභී** යන කෘදන්ත ශබ්ද යොගය ඇති හෙයිනි. **පානස්ස, වත්ථස්ස**- යනාදිය ද මෙසේ යි. 71 වෙනි පිටුවේ සංලක්ෂ්‍යය බලනු.

ඉත්ථන්නාමො කිර ඛත්තියො ඛත්තියෙහි ඛත්තියාභිසෙකෙන අභිසිත්තොති. තස්ස එවං හොති:-කුදස්සු නාම මමම්පි ඛත්තියා ඛත්තියාභිසෙකෙන අභිසිඤ්චිස්සන්තීති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො ආසංසො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො විගතාසො? ඉධ භික්ඛවෙ රාජා හොති ඛත්තියො මුද්ධාවසිත්තො, සො සුණාති:-ඉත්ථන්නාමො කිර ඛත්තියො ඛත්තියෙහි ඛත්තියාභිසෙකෙන අභිසිත්තොති. තස්ස න එවං හොති:- කුදස්සු නාම මමම්පි ඛත්තියා ඛත්තියාභිසෙකෙන අභිසිඤ්චිස්සන්තීති. තං කිස්ස හෙතු? යා හිස්ස භික්ඛවෙ පුබ්බෙ අනභිසිත්තස්ස අභිසෙකාසා සාස්ස පටිප්පස්සද්ධා. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො විගතාසො. ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං.

ආසංසො පුග්ගලො-ප්‍රාර්ථනා ඇති පුද්ගලතෙම; **කතමො ච**-කවරේ ද?-පෙ-; **ඉධ**-මේ ලොකයෙහි; **මුද්ධාවසිත්තස්ස**-මුදුනෙහි සාරන ලද අභිෂෙක ඇති; **ඛත්තියස්ස රඤ්ඤො**-ක්‍ෂත්‍රිය රජක්හුගේ; **ආභිසෙකො**- අභිෂෙකයට සුදුසු වූ; **අනභිසිත්තො**- අභිෂෙක නො කරන ලද්දා වූ; **අචලප්පත්තො**- නිශ්චල භාවයට පැමිණියා වූ (හෙවත් සුදුසු වයසින් හා රාජ්‍යානුශාසනයෙහි දක්‍ෂතායෙන් යුක්ත වූ); **ජෙට්ඨො පුත්තො හොති**- දෙටුපුත් කුමරුවෙක් වේ ද; **සො**- ඒ රාජකුමාරතෙම; **ඉත්ථන්නාමො ඛත්තියො**- මෙනම් ක්‍ෂත්‍රියතෙම; **ඛත්තියෙහි**-සෙසු ක්‍ෂත්‍රිය රජුන් විසින්; **ඛත්තියාභිසෙකෙන**- රාජාභිසෙකයෙන්; **අභිසිත්තො කිර ඉති**- අභිෂෙක කරන ලද්දේ යයි; **සුණාති**- අසයි; **තස්ස**- ඔහට; **එවං හොති**- මෙබඳු ප්‍රාර්ථනාවක් වේ; (කෙබඳු ප්‍රාර්ථනාවක් ද යත්); **කුදස්සු නාම**-කවර කලෙක නම්; **මමං+අපි**-මා ද; -පෙ-.

විගතාසො පුග්ගලො-පහ වූ ආශා ඇති පුද්ගලතෙම; **කතමො ච**-කවරේ ද?-පෙ-; **ඉධ**-මේ ලොකයෙහි; **මුද්ධාවසිත්තො**-මුදුනෙහි සාරන ලද අභිෂෙක ඇති; **ඛත්තියො රාජා හොති**-ක්‍ෂත්‍රියරජෙක් වේද;-පෙ-;**තං කිස්ස හෙතු?**-ඊට හේතු කවරේ ද? -පෙ-; **පුබ්බෙ**-පෙර; **අනභිසිත්තස්ස**-අභිෂෙක නො කරන ලද්දා වූ; **අස්ස**-ඒ රජහට; **යා අභිසෙක+ආසා**-යම් අභිෂෙක ප්‍රාර්ථනාවක් වී ද; **සා**-ඕතොමෝ; **හි**-යම්හෙයකින්; **පටිප්පස්සද්ධා**-සංසිඳුණී ද (එහෙයිනි); -පෙ-; **අයං පුග්ගලො**- මේ පුද්ගලතෙම; **විගතාසො**-පහ වූ ආශා ඇති පුද්ගලතෙමේ යයි; **වුච්චති**-කියනු ලැබේ; -පෙ-.

එවමෙව ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා භික්ඛුසු. කතමෙ තයො? නිරාසො, ආසංසො, විගතාසො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො නිරාසො? ඉධ භික්ඛවෙ එකච්චො පුග්ගලො දුස්සීලො හොති පාපධම්මො අසුචිසංකස්සරසමාචාරො පටිච්ඡන්නකම්මන්තො අස්සමණො සමණපටිඤ්ඤො අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරිපටිඤ්ඤො අන්තොපූති අවස්සුතො කසම්බුජාතො. සො සුණාති:-ඉත්ථන්නාමො කිර භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති. තස්ස න එවං හොති:-කුදස්සු නාම අහම්පි ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාමීති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො නිරාසො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො ආසංසො? ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති කල්‍යාණධම්මො. සො සුණාති:-ඉත්ථන්නාමො කිර භික්ඛු ආසවානං ඛයා -පෙ- උපසම්පජ්ජ විහරතීති. තස්ස එවං හොති:-කුදස්සු නාම අහම්පි ආසවානං ඛයා අනාසවං චෙතො

එවං + එව ඛො-එපරිද්දෙන් ම; **භික්ඛුසු**-භික්ෂූන් කෙරෙහි; **තයො පුග්ගලා**-තුන් පුද්ගල කෙනෙක්; **සන්තො සංවිජ්ජමානා**-විද්‍යමාන වෙත්;· -පෙ-.

ඉධ- මේ ශාසනයෙහි; **එකච්චො පුග්ගලො**- ඇතම් පුද්ගල යෙක් තෙම; **පාපධම්මො**-ලාමක සවභාව ඇති; අසුචි-අපවිත්‍ර කාය කර්මාදියෙන් යුක්ත වූ; **සංකස්සරසමාචාරො**-සැකයෙන් සිහිකට යුතු පැවතුම් ඇති; **පටිච්ඡන්නකම්මන්තො**-සැඟවියයුතු පව්කම් ඇති; **අස්සමණො**-ශ්‍රමණයෙක් නො වූ යේ ම; **සමණපටිඤ්ඤො**-ශ්‍රමණයෙමි යි ප්‍රතිඥ ඇත්තා වූ; **අබ්‍රහ්මචාරි**-බ්‍රහ්මචාරි නො වූයේ ම; **බ්‍රහ්මචාරිපටිඤ්ඤො**- බ්‍රහ්මචාරියෙමි යන ප්‍රතිඥ ඇත්තා වූ; **අන්තොපූති**-(ඇතුළත පව්කම් ඇති හෙයින්) ඇතුළත අසාර වූ; **අවස්සුතො**-රාගාදි කෙලශයෙන් තෙත්වූ; **කසම්බුජාතො**-හටගත් රාගාදි කසළ ඇත්තා වූ; **දුස්සීලො හොති**- දුශ්ශීලයෙක් වේ ද; **සො**-ඒ දුශ්ශීල මහණ තෙම; **ඉත්ථන්නාමො භික්ඛු**-මෙනම් මහණ තෙම;**ආසවානං ඛයා**-අශ්‍රවයන් ක්‍ෂයකිරීමෙන්; **අනාසවං**-ආශ්‍රව ලෙශයකුදු නැත්තා වූ; **චෙතොවිමුත්තිං**- අර්හත්ඵල සමාධිය ද; **පඤ්ඤාවිමුත්තිං**-අර්හත්ඵල ප්‍රඥව ද; **දිට්ඨ+එව ධම්මෙ**-ඉහාත්ම භාවයෙහි ම; **සයං**- තෙමේ; **අභිඤ්ඤා**- විශිෂ්ට ඥනයෙන් දැන; **සච්ඡිකත්වා**- ප්‍රත්‍යක්‍ෂ කොට; **උපසම්පජ්ජ**- පැමිණ; විහරති කිර

විමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාමීති. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො ආසංසො.

කතමො ච භික්ඛවෙ පුග්ගලො විගතාසො.? ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති ඛීණාසවො. සො සුණාති:-ඉත්ථන්නාමො කිර භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරතීති. තස්ස න එවං හොති:- කුදාස්සු නාම අහම්පි ආසවානං ඛයා-පෙ-සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරිස්සාමීති. තං කිස්ස හෙතු? යා හිස්ස භික්ඛවෙ පුබ්බෙ අවිමුත්තස්ස විමුත්තාසා සාස්ස පටිප්පස්සද්ධා. අයං වුච්චති භික්ඛවෙ පුග්ගලො විගතාසො. ඉමෙ ඛො භික්ඛවෙ තයො පුග්ගලා සන්තො සංවිජ්ජමානා භික්ඛූසූති

ඉති-වාසය කෙරේ යයි; **සුණාති**- අසයි; **තස්ස**- ඒ මහණහට; **එවං න හොති**- මෙබඳු සිතෙක් නො වේ; (කෙබඳු සිතෙක් ද යත්?); **කුදාස්සු නාම**-කවර කලෙක නම්; **අහං+අපි**-මම ද;-පෙ-; **විහරිස්සාමි + ඉති**- වාසය කෙරෙම් ද යන සිත යි; -පෙ-.

සංලක්ෂ්‍යය:-

සඞ්කස්සරසමාචාරො:- සඞ්කාභිසරිතබ්බො සමාචාරො යස්ස- යනු විග්‍රහ යි. කිසිවකු කිසියම් නො සරුප් ක්‍රියාවක් කරන ලදැයි අසා හෝ දැක හෝ "මේ නම් අසවලා විසින් කළා වනැ"යි ලෝකයා සැක කරති. එසේ සැකකිරීමට හේතුව ඔහුගේ එබඳු පැවතුම් ඇති බැවිනි මෙබඳු පැවතුම් ඇත්තේ **සංකස්සරසමාචාර** නමි. අන්‍යයන් කිහිපදෙනකු එක් ව කථා කරනවා දැක "මොවුහු මා ගැන ම කථාකෙරෙති"යි-සැක ඇතිකරන්නේ ද **සඞ්කස්සරසමාචාර** නම් වේ.

ඉධ-මේ ශාසනයෙහි; **භික්ඛු**- මහණතෙම; **සීලවා හොති**- සිල්වත් වේ ද; **කල්‍යාණධම්මො**-යහපත් සවභාව ඇත්තේ වේ ද; -පෙ-.

ඉධ-මේ ශාසනයෙහි; **භික්ඛු**- මහණතෙම; **ඛීණාසවො**-ක්ෂය කරන ලද ආශ්‍රව ඇති; **අරහං හොති**-අර්හත් පුද්ගලයෙක් වේ ද; **සො**-ඒ රහත්තෙම; -පෙ-; **භික්ඛවෙ**-මහණෙනි; **පුබ්බෙ**-පෙර; **අවිමුත්තස්ස**-කෙලෙසුන් කෙරෙන් නො මිදුණා වූ; **අස්ස**-ඔහට; **යා විමුත්ති+ආසා**-අර්හත්ඵල විමුක්තිය පිළිබඳ යම් ආශාවක් වී ද; **අස්ස**- ඔහට; **සා**- ඒ ආශාතොමෝ; **හි**- යම්හෙයකින්; **පටිප්පස්සද්ධා**-සංසිඳුණී ද; (එහෙයිනි); -පෙ-.

4. යොපි සො භික්ඛවෙ රාජා චක්කවත්ති ධම්මිකො ධම්මරාජා, සොපි න අරාජකං චක්කං වත්තෙතීති. එවං වුත්තෙ අඤ්ඤතරො භික්ඛු භගවන්තං එතදවොචː– කො පන භන්තෙ රඤ්ඤො චක්කවත්තිස්ස ධම්මිකස්ස ධම්මරඤ්ඤො රාජාති? ධම්මො භික්ඛූති භගවා අවොච.

ඉධ භික්ඛු රාජා චක්කවත්ති ධම්මිකො ධම්මරාජා ධම්මං යෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහති අන්තොජනස්මිං. පුන ච පරං භික්ඛු රාජා චක්කවත්ති ධම්මිකො ධම්මරාජා ධම්මං යෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහති ඛත්තියෙසු, අනුයුත්තෙසු, බලකායස්මිං, බ්‍රාහ්මණගහපතිකෙසු, නෙගමජානපදෙසු, සමණබ්‍රාහ්මණෙසු, මිගපක්ඛීසු සචෙ සො භික්ඛු රාජා චක්කවත්ති ධම්මිකො ධම්මරාජා ධම්මංයෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණ

---

4. -පෙ- **ධම්මිකො**– දැහැමි වූ; **ධම්මරාජා**- දස සක්විතිවත් දහමින් රජ වූ; **සො+අපි සො චක්කවත්ති රාජා**–යම් ඒ සක්විති රජෙක් ඇද් ද; **සො+අපි**–හෙතෙමේ ද; **අරාජකං**–අතික් නිඃශ්‍රය රජකු නැති; **චක්කං**–ආඥාචක්‍රය; **න වත්තෙති + ඉති**– නො පවත් වන්නේ යයි (වදාළසේක);

එවං වුත්තෙ– මෙසේ වදාළ කල්හි; **අඤ්ඤතරො භික්ඛු**- අනුසඤ්ඤ කුශල වූ එක්තරා මහණෙක් තෙම; **භගවන්තං**–භාග්‍යවතුන් වහන්සේට; **එතං** මේ කාරණය; **අවොච**– සැලකෙළේ ය; **භන්තෙ**– වහන්ස; **ධම්මිකස්ස**– දැහැමි වූ; **ධම්මරඤ්ඤො**–දස සක්විතිවත් සංඛ්‍යාත ධර්මයෙන් ම රජ වූ; **චක්කවත්තිස්ස රඤ්ඤො**- සක්විතිරජහට; **රාජා**– අතික් නිඃශ්‍රය රජෙක් වූයේ; **කො පන + ඉති**– කවරෙක් දැයි විචාළේ ය; **භික්ඛු**– මහණ; **ධම්මො + ඉති**– දසකුශල ධර්මය යි; **භගවා**–භාග්‍යවත්තෙම; **අවොච**–වදාළසේක.

භික්ඛු– මහණ; **ඉධ**– මේ ලෝකයෙහි; **ධම්මිකො**–දැහැමි වූ; –පෙ–; **ධම්මං + එව නිස්සාය**– දසකුශල කර්මපථ ධර්මය ම ඇසුරුකොට; **ධම්මං**– ධර්මයට; **සක්කරොන්තො**– සත්කාර කරන්නේ; **ධම්මං**– ධර්මයට; **ගරුකරොන්තො**–ගරුකරන්නේ;

ගුත්තිං සංවිදහිත්වා අන්තොජනස්මිං, ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා ඛත්තියෙසු, අනුයුත්තෙසු, බලකායස්මිං, බ්‍රාහ්මණගහපතිකෙසු, නෙගමජානපදෙසු, සමණබ්‍රාහ්මණෙසු, මිගපක්ඛීසු ධම්මෙනෙව චක්කං වත්තෙති. තං හොති චක්කං අප්පතිවත්තියං කෙනචි මනුස්සභූතෙන පච්චත්ථිකෙන පාණිනා.

එවමෙව ඛො භික්ඛු තථාගතො අරහං සම්මාසම්බුද්ධො ධම්මිකො ධම්මරජා ධම්මංයෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහති කායකම්මස්මිං:- එවරූපං කායකම්මං සෙවිතබ්බං, එවරූපං කායකම්මං න සෙවිතබ්බන්ති. පුන ච පරං භික්ඛු තථාගතො අරහං සම්මාසම්බුද්ධො ධම්මිකො ධම්මරාජා ධම්මංයෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො

ධම්මං- ධර්මයට; **අපචායමානො**- පුදන්නේ; **ධම්මද්ධජො**- ධර්මය ධ්වජය කොට ඇත්තේ; **ධම්මකෙතු**- ධර්මය කේතු කොට ඇත්තේ; **ධම්මාධිපතෙය්‍යො**- ධර්මය අධිපති කොට ඇත්තේ; **අන්තොජනස්මිං**- පරිවාරජනයා කෙරෙහි; **ධම්මිකං**- දැහැමි වූ; **රක්ඛාවරණගුත්තිං**- ආරක්‍ෂාවරණ ගෝපනය; **සංවිදහති**- සංවිධාන කෙරෙයි; **භික්ඛු**- මහණ; **පුන ච පරං**- නැවත ද, **ධම්මිකො**-දැහැමි වූ; -පෙ-; **අනුයුත්තෙසු**- (තමාට) අනුකූල ව යෙදුණා වූ; **ඛත්තියෙසු**- ක්‍ෂත්‍රියයන් කෙරෙහි ද; **බලකායස්මිං**- සේනාසමූහයා කෙරෙහි ද; **බ්‍රාහ්මණගහපතිකෙසු**-බමුණන් හා ගොවීන් කෙරෙහි ද; **නෙගමජානපදෙසු**- නියම්ගම් දනව්වැස්සන් කෙරෙහි ද; **සමණබ්‍රාහ්මණෙසු**-මහණ බමුණන් කෙරෙහි ද; **මිගපක්ඛීසු**- මෘග පක්‍ෂීන් කෙරෙහි ද; **ධම්මිකං**- දැහැමි වූ; **රක්ඛාවරණගුත්තිං**- ආරක්‍ෂාවරණ ගෝපනය; **සංවිදහති**- සංවිධාන කෙරෙයි, **භික්ඛු**- මහණ; **ධම්මිකො**- දැහැමි වූ; -පෙ-; **සො ඛො සො චක්කවත්තිරාජා**-ඒ මේ සක්විති රජතෙම; -පෙ- **අන්තොජනස්මිං**- පුත්‍රදාරා සඞ්ඛ්‍යාත ඇතුළු ජනයා කෙරෙහි; **ධම්මිකං**-දැහැමි වූ; **රක්ඛාවරණගුත්තිං**- ආරක්‍ෂාවරණ ගෝපනය; **සංවිදහිත්වා**- සංවිධාන කොට; -පෙ-; **මිගපක්ඛීසු**- මෘග පක්‍ෂීන් කෙරෙහි ද; **ධම්මිකං**- දැහැමි වූ; **රක්ඛාවරණගුත්තිං**- ආරක්‍ෂාවරණ ගෝපනය; **සංවිදහිත්වා**-සංවිධාන කොට; **ධම්මෙන+එව**- දසකුශලකර්මපථ සඞ්ඛ්‍යාත ධර්මයෙන් ම; **චක්කං**- ආඥාචක්‍රය; **පවත්තෙති**-පවත්වන්නේ ය; -**තං චක්කං**-ඒ ආඥාචක්‍රය; **මනුස්සභූතෙන**-මනුෂ්‍ය වූ; **පච්චත්ථිකෙන**-පසමිතුරු වූ; **කෙනචි**

ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහති වචීකම්මස්මිං:- එවරූපං වචීකම්මං සෙවිතබ්බං, එවරූපං වචීකම්මං න සෙවිතබ්බන්ති. -පෙ-. මනොකම්මස්මිං:- එවරූපං මනොකම්මං සෙවිතබ්බං, එවරූපං මනොකම්මං න සෙවිතබ්බන්ති.

පාණිනා-කිසියම් සත්වයකු විසිනුදු; **අ+පතිවත්තියං හොති**-ප්‍රතිවිරුද්ධ ව පැවැත්විය නො හැකි වේ.

සංලක්ෂ්‍යය:—

1. ධම්මිකො-ධම්මො අස්ස අත්ථීති "ධම්මිකො"යි යු හෙයින් ධම්මිකො යනු "ධම්ම" ශබ්දයා කෙරෙන් පර ව අස්ත්‍යර්ථයෙහි "ඉක" ප්‍රත්‍යය වීමෙන් සිද්ධ වූ තද්ධිත පදයෙකි. හෙ ද වාච්‍ය ලිඞ්ග වන බැවින් "ධම්මිකො රාජා, ධම්මිකා ගුත්ති, ධම්මිකං පාලනං"යනාදි විසින් ලිඞ්ගත්‍රයයෙහි ම යෙදේ.

2. ධම්මරාජා-දස සක්විතිවත් පිරිමෙන් රජවූයේ නු යි 'ධම්මරාජ' නම්. චක්‍රවර්තිරාජ්‍යය ප්‍රාර්ථනා කරන රජකු විසින් දස සක්විතිවත්දම් පිරිය යුත්තේ ය. 1. දශකුශලකර්මපථ ධර්මසමාදන් වූ පරිවාර ජනයනට 2. අභිෂික්ත ක්ෂත්‍රියයනට. 3. අනභිෂික්ත ක්ෂත්‍රියයනට. 4. බලකායයට. 5. බමුණන්ට හා ගොවීන්ට. 6. නියම්ගම්වාසීන්ට හා ජනපදවාසීන්ට. 7. ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට. 8. මෘගයන්ට හා පක්ෂීන්ට රක්ෂාවරණගුප්ති සංවිධාන කිරීම ය. 9. අධර්මයෙන් කරන සියලු දෙය වැළැක්වීම ය. 10. ධනනැත්තන්ගට ධනය දීමය, යන මොනු දස සක්විතිවත් නම් වෙයි. මෙකී දසසක්විතිදම් පුරන ක්ෂත්‍රියතෙමේ මුළු පෘථිවියට අධිපති සක්විති රජෙක් වන්නේ ය.

3. රක්ඛාවරණගුත්තිං- රක්ඛා ච ආවරණං ච ගුත්ති ච **රක්ඛාවරණගුත්ති**-ද්වන්ද්ව (චාර්ථ)සමාස යි. අන්‍යයන් කෙරෙහි මෛත්‍රී කරුණාදිය ඇතිකර ගැනීම **රක්ඛා** නම්. නිවාසන පාරුපනාදි දීමය **ආවරණ** නම්. සොරසතුරු ආදි උපද්‍රවයෙන් වැළකීම "ගුත්ති" නම්.

භික්ඛු-මහණ; **එවං+එව ඛො**-එපරිද්දෙන් ම; **අරහං**-අර්හත් වූ; **සම්මාසම්බුද්ධො**-සම්‍යක්සම්බුද්ධ වූ; **ධම්මිකො**-(නවලොවුතුරු දහම් වශයෙන්)දැහැමි වූ; **ධම්මරාජා**-නවලොවුතුරා දහමින් ජනරඤ්ජනය කරන්නා වූ; **තථාගතො**-තථාගතතෙම; **ධම්මං+එව නිස්සාය**-නවලොවුතුරා ධර්මය ම ඇසුරුකොට; -පෙ-; **එවරූපං**-මෙබඳු වූ; **කායකම්මං**-(ත්‍රිවිධ කායදුශ්චරිත සංඛ්‍යාත)කායකර්මය; **න සෙවිතබ්බං**- සේවනය නො කටයුතු ය; **එවරූපං**-මෙබඳු වූ; **කායකම්මං**- (ත්‍රිවිධ කායසුචරිත සංඛ්‍යාත) කායකර්මය; **සෙවිතබ්බං+ඉති**-සේවනය කටයුතු යයි; **කායකම්මස්මිං**-කායකර්මයෙහි; **ධම්මිකං**-දැහැමි වූ; **රක්ඛාවරණගුත්තිං**-ආරක්ෂාවරණ ගොපනය; **සංවිදහති**- සංවිධාන කෙරෙයි; -පෙ-; **එවරූපං**- මෙබඳු වූ;

ස ඛො සො භික්ඛු තථාගතො අරහං සම්මාසම්බුද්ධො ධම්මිකො ධම්මරාජා ධම්මං යෙව නිස්සාය ධම්මං සක්කරොන්තො ධම්මං ගරුකරොන්තො ධම්මං අපචායමානො ධම්මද්ධජො ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යො ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා කායකම්මස්මිං, ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා වචීකම්මස්මිං, ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා මනොකම්මස්මිං ධම්මෙනෙව අනුත්තරං ධම්මචක්කං පවත්තෙති; තං හොති චක්කං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුනා වා කෙනචි වා ලොකස්මින්ති —

5. එකං සමයං භගවා බාරාණසියං විහරති ඉසිපතනෙ මිගදායෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි: භික්ඛවොති. භදන්තෙති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:-

---

වචීකම්මං-(චතුර්විධ වාක්දුශ්චරිත සඞ්ඛ්‍යාත) වාක්කර්මය; **න සෙවිතබ්බං**- සේවනය නො කටයුතු ය; **එවරූපං**- මෙබඳු වූ; **වචීකම්මං**-(චතුර්විධ වාක්සුචරිත සඞ්ඛ්‍යාත) වාක්කර්මය; **සෙවිතබ්බං + ඉති**- සේවනය කටයුතු යයි; **වචීකම්මස්මිං**- වාක්කර්මයෙහි; **ධම්මිකං**- දැහැමි වූ; -පෙ-; **එවරූපං**- මෙබඳු වූ; **මනොකම්මං**- (ත්‍රිවිධ මනොදුශ්චරිත සඞ්ඛ්‍යාත) මනඃකර්මය; **න සෙවිතබ්බං**-සේවනය නො කටයුතු ය; -පෙ-; **මනොකම්මං**-(ත්‍රිවිධ මනොසුචරිත සඞ්ඛ්‍යාත) මනඃකර්මය; **සෙවිතබ්බං+ඉති**- සේවනය කටයුතු යයි; **මනොකම්මස්මිං**- මනඃකර්මයෙහි -පෙ- **සංවිදහිත්වා**- සංවිධානකොට; **ධම්මෙන+එව**- නවලොවුතුරා දහමින් ම; **අනුත්තරං**- නිරුත්තර වූ; **ධම්මචක්කං**- ධර්මචක්‍රය; **පවත්තෙති**- පවත්වනසේක; **තං චක්කං**- ඒ ධර්මචක්‍රය; **සමණෙන වා**-ශ්‍රමණයකු විසින් හෝ; **බ්‍රාහ්මණෙන වා**-බ්‍රාහ්මණයකු විසින් හෝ; **දෙවෙන වා**-දෙවියකු විසින් හෝ; **මාරෙන වා**-මාරයකු විසින් හෝ; **බ්‍රහ්මුනා වා**- බ්‍රහ්මයකු විසින් හෝ; **ලොකස්මිං**- ලොකයෙහි; **කෙනචි වා**- කිසිවකු විසින් හෝ; **අප්පතිවත්තියං හොති**-ප්‍රතිපක්ෂ ව පැවැත්විය නො හැකි වේ.

5. **එකං සමයං**- එක්සමයෙක්හි; **භගවා**- භාග්‍යවත්තෙම: **බාරාණසියං**- බරණැස්නුවර සමීපයෙහි; **මිගදායෙ**- (මෘගයන්ට අභයදානය දුන් හෙයින්) මිගදාය නම් වූ; **ඉසිපතනෙ**-ඉසිපතනාරාමයෙහි; **විහරති**-වැඩවසනසේක; -පෙ-.

සංලක්ෂ්‍යය: -

එකං සමයං-ප්‍රථම කාණ්ඩයෙහි 2 වෙනි පිටේ සංලක්ෂ්‍යය බලනු.

භූතපුබ්බං භික්ඛවෙ රාජා අහොසි පචෙතනො නාම. අථ ඛො භික්ඛවෙ රාජා පචෙතනො රථකාරං ආමන්තෙසි:- ඉතො මෙ සම්ම රථකාර ඡන්නං මාසානං අච්චයෙන සංගාමො භවිස්සති, සක්කසි මෙ සම්ම රථකාර නවං චක්කයුගං කාතුන්ති? සක්කොමි දෙවාති ඛො භික්ඛවෙ රථකාරො රඤ්ඤො පචෙතනස්ස පච්චස්සොසි. අථ ඛො භික්ඛවෙ රථකාරො ඡහි මාසෙහි ඡාරත්තූනෙහි එකං චක්කං නිට්ඨාපෙසි.

අථ ඛො භික්ඛවෙ රාජා පචෙතනො රථකාරං ආමන්තෙසි:- ඉතො මෙ සම්ම රථකාර ඡන්නං දිවසානං අච්චයෙන සංගාමො භවිස්සති, නිට්ඨිතං තෙ නවං චක්ක යුගන්ති? ඉමෙහි ඛො දෙව ඡහි මාසෙහි ඡාරත්තූනෙහි එකං චක්කං නිට්ඨිතන්ති. සක්කසි පන මෙ සම්ම රථකාර ඉමෙහි ඡහි දිවසෙහි දුතියං චක්කං නිට්ඨා

භික්ඛවෙ- මහණෙනි; **භූතපුබ්බං**- පෙර වූ දෙයක් කියමි; **පචෙතනො නාම**-ප්‍රචෙතන නම් වූ; **රාජා අහොසි**-රජෙක් වූයේ ය; -පෙ-; **අථ ඛො**-ඉක්බිත්තෙන්; **පචෙතනො රාජා**-ප්‍රචෙතන රජතෙම; **රථකාරං**-රියවඩුවා; **ආමන්තෙසි**-කැඳවූයේ ය; **සම්ම රථකාර**- යහළු රියවඩුව; **ඉතො**- මෙයින්; **ඡන්නං මාසානං අච්චයෙන**- සමසක්හුගේ ඇවෑමෙන්; **මෙ**- මට; **සංගාමො භවිස්සති**-යුද්ධයෙක් වන්නේ ය; **සම්ම රථකාර**- යහළු රියවඩුව; **මෙ**- මට; **නවං චක්කයුගං**- අලුත් චක්‍ර යුග්මයක්; **කාතුං**- කරන්ට; **සක්කසි + ඉති**- හැක්කෙහි දැයි (විචාළේ ය); -පෙ-; **රථකාරො**-රියවඩුතෙම; **දෙව**-දෙවයන්වහන්ස; **සක්කොමි+ඉති ඛො**-හැක්කෙමි යි කියා; **පචෙතනස්ස රඤ්ඤො**-ප්‍රචෙතන රජහට; **පති + අස්සොසි**- පිළිවදන් දුන්නේ ය; -පෙ-; **රථකාරො**-රියවඩුතෙම; **ඡාරත්ති + ඌනෙහි**-සරැයක් අඩු වූ; **ඡහි මාසෙහි**-සමසකින්: **එකං චක්කං**-එක්චක්‍රයක්; **නිට්ඨාපෙසි**- නිමවූයේ ය;

සංලක්ෂණ:—

භූතපුබ්බං-පුබ්බෙ භූතං- පෙර වූ, යන අර්ථයෙහි "පුබ්බ" ශබ්දය හා "භූත" ශබ්දය තත්පුරුෂ සමාස ව "පුබ්බභූත" යයි කිය යුතු තන්හි පද විපර්‍යාසයෙන් "භූතපුබ්බ" කියා වේ. "රාජදන්ත" ශබ්දය මෙනි.

-පෙ-**සම්ම රථකාර**-යහළු රියවඩුව; **ඉතො**-මෙයින්; **ඡන්නං දිවසානං අච්චයෙන**- සදවසක්හුගේ ඇවෑමෙන්; **මෙ**- මට; **සංගාමො භවිස්සති**-යුද්ධයෙක් වන්නේ ය; **තෙ**- තා විසින්; **නවං චක්කයුගං**-අලුත් චක්‍ර යුග්මයතෙම; **නිට්ඨිතං + ඉති**- නිම වන ලද්දැයි (විචාළේ ය).

පෙතුන්ති? සක්කොමි දෙවාති ඛො භික්ඛවෙ රථකාරො රඤ්ඤො පචෙතනස්ස පච්චස්සොසි.

අථ ඛො භික්ඛවෙ රථකාරො ඡහි දිවසෙහි දුතියං චක්කං නිට්ඨාපෙත්වා නවං චක්කයුගං ආදාය යෙන රාජා පචෙතනො තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා රාජානං පචෙතනං එතදවොච:— ඉදන්තෙ දෙව නවං චක්කයුගං නිට්ඨිතන්ති. යඤ්ච තෙ ඉදං සම්ම රථකාර චක්කං ඡහි මාසෙහි නිට්ඨිතං ඡාරත්තූනෙහි යඤ්ච තෙ ඉදං චක්කං ඡහි දිවසෙහි නිට්ඨිතං ඉමෙසං කිං නානාකරණං? නෙසං[1] කිඤ්චි නානාකරණං පස්සාමීති. අත්ථෙසං දෙව නානාකරණං, පස්සතු දෙවො නානාකරණන්ති.

දෙව–දෙවයන් වහන්ස; **ඡාරත්ති + ඌනෙහි**– සරයක් අඩු වූ; **ඉමෙහි ඛො ඡහි මාසෙහි**– මේ සමසින්; **එකං චක්කං**– එක් චක්‍රයක්; **නිට්ඨිතං + ඉති**– නිමවන ලදැයි සැලකෙළේ ය. **සම්ම රථකාර**– යහළු රියවඩුව; **ඉමෙහි ඡහි දිවසෙහි**– මේ සදවසින්; **මෙ**–මාගේ; **දුතියං චක්කං**-දෙවෙනි චක්‍රය; **නිට්ඨාපෙතුං**– නිම වන්ට; **සක්ඛිසි පන ඉති**– හැක්කෙහි දැයි විචාළේ ය; -පෙ-; **රථකාරො**-රියවඩුතෙම; **දෙව** - දෙවයන් වහන්ස; **සක්කොමි + ඉති ඛො**–හැක්කෙමි යි කියා; **පචෙතනස්ස රඤ්ඤො**– ප්‍රචෙතන රජහට; **පති + අස්සොසි**–පිළිවදන් දුන්නේ ය.

-පෙ-; **රථකාරො**- රියවඩුතෙම; **ඡහි දිවසෙහි**- සදවසින්; **දුතියං චක්කං**- දෙවෙනි චක්‍රය; **නිට්ඨාපෙත්වා**- නිමවා; **නවං චක්කයුගං**- අලුත් චක්‍රයුග්මය; **ආදාය**- ගෙන; **පචෙතනො රාජා**–ප්‍රචෙතන රජතෙම; **යෙන**–යම් තැනෙක්හි ද;-පෙ-;**දෙව**-දෙවයන් වහන්ස; **තෙ**–ඔබවහන්සේගේ; **ඉදං නවං චක්කයුගං**–මේ අලුත් චක්‍රයුග්මය; **නිට්ඨිතං + ඉති**–නිමවන ලද්දේ යයි සැල කෙළේ ය; **සම්ම රථකාර**–යහළු රියවඩුව; **තෙ**–තා විසින්, **යං + ච ඉදං චක්කං**–යම් මේ චක්‍රයක්; **ඡාරත්ති + ඌනෙහි**-සරයක් අඩු වූ; **ඡහි මාසෙහි**–සමසකින්; **නිට්ඨිතං**–නිමවන ලද්දේ ද; **තෙ**–තා විසින්;**යං+ච ඉදං චක්කං**–යම් මේ චක්‍රයක්; **ඡහි දිවසෙහි**–සදවස කින්; **නිට්ඨිතං**– නිමවන ලද්දේ ද; **ඉමෙසං**–මේ චක්‍රයන් දෙදෙනාගේ; **නානාකරණං**–නානාභාවය හෙවත් වෙනස; **කිං**– කවරේ ද? **එසං**–මොවුන්ගේ; **කිඤ්චි නානාකරණං**– කිසි වෙනසක්; **න පස්සාමි+ඉති**– නො දකිමැයි කීයේ ය; **දෙව**– දෙවයන් වහන්ස;

---

1 නාහං—සීහළ.

අථ ඛො භික්ඛවෙ රථකාරො යං තං චක්කං ඡහි දිවසෙහි නිට්ඨිතං තං පවත්තෙසි. තං පවත්තිතං සමානං යාවතිකා අභිසඞ්ඛාරස්ස ගති තාවතිකං ගන්ත්වා චිඞ්ගුලායිත්වා භූමියං පපති. යං පන තං චක්කං ඡහි මාසෙහි නිට්ඨිතං ඡාරත්තූනෙහි තං පවත්තෙසි. තං පවත්තිතං සමානං යාවතිකා අභිසඞ්ඛාරස්ස ගති තාවතිකං ගන්ත්වා අක්ඛාහතං මඤ්ඤෙ අට්ඨාසි.

කො නු ඛො සම්ම රථකාර හෙතු කො පච්චයො යමිදං චක්කං ඡහි දිවසෙහි නිට්ඨිතං තං පවත්තිතං සමානං යාවතිකා අභිසඞ්ඛාරස්ස ගති තාවතිකං ගන්ත්වා චිඞ්ගුලායිත්වා භූමියං පපති? කො පන සම්ම රථකාර හෙතු කො පච්චයො යමිදං චක්කං ඡහි

එසං-මොවුන්දෙදෙනාගේ; **නානාකරණං**-වෙනසෙක්; **අත්ථි+එව**- ඇත් ම ය; **දෙව**-දෙවයන් වහන්සේ; **නානාකරණං**- වෙනස; **පස්සතු+ඉති**-දක්නාසේක්ව යි සැලකෙළේ ය; -පෙ- **රථකාරො**- රියවඩුතෙම; **ඡහි දිවසෙහි**- සදවසකින්; **නිට්ඨිතං**- නිමවන ලද; **යං තං චක්කං**- යම් ඒ චක්‍රයක් ඇද් ද; **තං**- එය; **පවත්තෙසි**- ප්‍රවර්තනය කෙළේ ය හෙවත් පෙරළා හැරියේ ය; **තං**- ඒ චක්‍රය; **පවත්තිතං සමානං**- ප්‍රවර්තනය කරන ලද්දේ හෙවත් පෙරළා හරින ලද්දේ; **අභිසඞ්ඛාරස්ස** - ප්‍රයෝගයාගේ; **ගති** - ගති තොමෝ; **යාවතිකා**-යම්තාක් ද; **තාවතිකං ගන්ත්වා**-ඒ තාක් ගොස්; **චිඞ්ගුලායිත්වා** - කරකැවී; **භූමියං පපති**- බිම වැටුණේ ය; **ඡහි මාසෙහි**- සමසකින්; **නිට්ඨිතං**- නිමවන ලද; **යං පන තං චක්කං**-යම් ඒ චක්‍රයෙක් ඇද්ද; **තං**- එය; **පවත්තෙසි**- ප්‍රවර්තනය කෙළේ ය හෙවත් පෙරළා හැරියේ ය; **තං**-ඒ චක්‍රය; **පවත්තිතං සමානං**-ප්‍රවර්තනය කරන ලද්දේ හෙවත් පෙරළා හරින ලද්දේ; -පෙ- **අක්ඛාහතං මඤ්ඤෙ**- අකුරෙහි ගසන ලද්දක් මෙන්; **අට්ඨාසි**-සිටියේ ය.

සංලක්ෂ්‍යය:-

1. **අභිසඞ්ඛාරස්ස ගති**- මෙහි රෝදය කරකවා පෙරළා හැරීම "අභිසඞ්ඛාර" නම්. ප්‍රයෝග යනු ද එම අර්ථ යි. "ගති" නම් ගමන යි.

2. **"අක්ඛාහතං මඤ්ඤෙ"** අක්ඛෙ ආහතං=අක්ඛාහතං සප්තමී තත්පුරුෂ සමාස යි. **"මඤ්ඤෙ"** යනු නිපාත යි. අලවංගුයෙහි සංවිධාල රෝදය නො පෙරළී සොළින් තබෙත්නාක් මෙන් යනු භාව යි.

සම්ම රථකාර-යහළු රියවඩුව; **ඡහි දිවසෙහි**- සදවසකින්; **නිට්ඨිතං**- නිමවන ලද; **යං+ඉදං චක්කං**-යම් ඒ චක්‍රයෙක් ඇද්ද; -පෙ- **භූමියං පපති**-බිම වැටුණේ ද; **කො නු ඛො හෙතු?**-ඊට හේතු කවරේ ද?; **කො පච්චයො?**-ඊට ප්‍රත්‍යය කවරේ ද?; **සම්ම**

මාසෙහි නිට්ඨිතං ඡාරත්තූනෙහි තං පවත්තිතං සමානං යාවතිකා අභිසඞ්ඛාරස්ස ගති තාවතිකං ගන්ත්වා අක්ඛාහතං මඤ්ඤෙ අට්ඨාසීති?.

යමිදං දෙව චක්කං ඡහි දිවසෙහි නිට්ඨිතං තස්ස නෙමිපි සවඞ්කා සදොසා සකසාවා, අරාපි සවඞ්කා සදොසා සකසාවා, නාභිපි සවඞ්කා සදොසා සකසාවා. තං නෙමියාපි සවඞ්කත්තා සදොසත්තා සකසාවත්තා, අරානම්පි සවඞ්කත්තා සදොසත්තා සකසාවත්තා, නාභියාපි සවඞ්කත්තා සදොසත්තා සකසාවත්තා, පවත්තිතං සමානං යාවතිකා අභිසඞ්ඛාරස්ස ගති තාවතිකං ගන්ත්වා චිඞ්ගුලායිත්වා භූමියං පපති. යං පන තං දෙව චක්කං ඡහි මාසෙහි නිට්ඨිතං ඡාරත්තූනෙහි තස්ස නෙමිපි අවඞ්කා අදොසා අකසාවා, අරාපි අවඞ්කා අදොසා අකසාවා, නාභිපි අවඞ්කා අදොසා අකසාවා. තං නෙමියාපි අවඞ්කත්තා අදොසත්තා අකසාවත්තා, අරානම්පි අවඞ්කත්තා අදොසත්තා අකසාවත්තා, නාභියාපි අවඞ්කත්තා අදොසත්තා අකසාවත්තා, පවත්තිතං සමානං යාවතිකා අභිසඞ්ඛාරස්ස ගති තාවතිකං ගන්ත්වා අක්ඛාහතං මඤ්ඤෙ අට්ඨාසීති.

රථකාර-යහළු රියවඩුව; **ඡාරත්ති+ඌනෙහි**-සරැයක් අඩු වූ; **ඡහි මාසෙහි**-සමසකින්; **නිට්ඨිතං**- නිමවන ලද; -පෙ-; **අක්ඛාහතං මඤ්ඤෙ**-අකුරෙහි ගසන ලද්දක් මෙන්;**අට්ඨාසි**-සිටියේ ද; **කො පන හෙතු**- ඊට හෙතු කවරේ ද? **කො පච්චයො+ඉති**- ප්‍රත්‍යය කවරේ දැයි විචාළේ ය.

දෙව - දෙවයන් වහන්ස; **ඡහි දිවසෙහි** - සදවසකින්; **නිට්ඨිතං** - නිමියා වූ; **යං ඉදං චක්කං** - යම් මේ චක්‍රයෙක් ඇද්ද; **තස්ස**-ඒ චක්‍රයාගේ; **නෙමි+අපි**-නිම්වළල්ල ද; **සවඞ්කා**-ඇද සහිත ය; **සදොසා**-ගැට සහිත ය; **සකසාවා**-දිරූ කොවුල හා එල සහිත ය; **අරා+අපි**-දැවිහු ද; **සවංකා**-ඇද සහිත ය;-පෙ-;**නාභි+අපි**-රථනාභිය ද;-පෙ-; **තං**-ඒ චක්‍රයතෙම; **නෙමියා+අපි**-නිම් වළල්ල ද; **සවඞ්කත්තා**-ඇද සහිත හෙයින්; **සදොසත්තා**-ගැට සහිත හෙයින්;**සකසාවත්තා**-දිරූ කොවුල හා එල සහිත හෙයින්; **අරානං+අපි** - දැවි ද; -පෙ-; **නාභියා+අපි** - රථනාභිය ද; -පෙ-; **සකසාවත්තා** - දිරූ කොවුල හා එල සහිත හෙයින්; **පවත්තිතං සමානං**-ප්‍රවර්තනය කරනලද්දේ හෙවත් පෙරළාහරින ලද්දේ -පෙ- **පපති**-වැටුණේ ය. **දෙව**-දෙවයන්වහන්ස; **ඡාරත්ති+ඌනෙහි**-සරැයක් අඩු වූ; **ඡහි මාසෙහි**-සමසකින්; **නිට්ඨිතං**-නිමවනලද; **යං පන තං චක්කං**-යම් ඒ චක්‍රයෙක්

සියා ඛො පන භික්ඛවෙ තුම්හාකං එවමස්ස:- අඤ්ඤො නූන තෙන සමයෙන සො රථකාරො අහොසීති. න ඛො පනෙතං භික්ඛවෙ එවං දට්ඨබ්බං. අහං තෙන සමයෙන සො රථකාරො අහොසිං. තදා පනාහං භික්ඛවෙ කුසලො දාරුවඞ්කානං දාරුදොසානං දාරුකසාවානං. එතරහි ඛො පනාහං භික්ඛවෙ අරහං සම්මාසම්බුද්ධො කුසලො කායවඞ්කානං කායදොසානං කායකසාවානං, කුසලො වචීවඞ්කානං වචීදොසානං වචීකසාවානං, කුසලො මනොවඞ්කානං මනොදොසානං මනොකසාවානං.

යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා කායවඞ්කො අප්පහීනො කායදොසො කායකසාවො, වචීවඞ්කො අප්පහීනො

ඇද් ද; **තස්ස**-ඒ චක්‍රයාගේ; **නෙමි + අපි**-නිම්වළල්ල ද; **අවඞ්කා**-ඇද නැත්තී ය; **අදොසා**-ගැට නැත්තී ය; **අකසාවා**-දිරූකොවුල හා එලය නැත්තී ය. -පෙ- **තං**-ඒ චක්‍රයතෙම; **නෙමියා + අපි**-නිම්වළල්ල ද; **අවඞ්කත්තා**-ඇද නැති හෙයින්; **අදොසත්තා**-ගැට නැති හෙයින්; **අකසාවත්තා** + දිරූකොවුල හා එල නැති හෙයින්; -පෙ-

භික්ඛවෙ-මහණෙනි; **සියා ඛො පන**-ඉදින් වනාහි; **තුම්හාකං**-තොපට; **එවං + අස්ස**-මෙබඳු සිතෙක් වේ ද? (කෙබඳු සිතෙක් ද යත්) **තෙන සමයෙන**-එසමයෙහි; **අඤ්ඤො නූන**-මා හැර අනිකෙක්; **සො රථකාරෙ අහොසි + ඉති**-ඒ රිය වඩු වූයේ දෝ හෝ? යන සිත යි; -පෙ- **එතං**-මේ කාරණය; **එවං**-මෙසේ; **න ඛො පන දට්ඨබ්බං**-නො දතයුතු යි; **අහං**-මම; **තෙන සමයෙන**-එසමයෙහි; **සො රථකාරො අහොසිං**-ඒ රියවඩු වීමි; -පෙ- **තදා පන**- එකල්හි වනාහි; **අහං**-මම; **දාරුවඞ්කානං** - දැවවංකයන් සම්බන්ධ ව ද; **දාරුදොසානං** - දැව දොෂයන් සම්බන්ධ ව ද; **දාරුකසාවානං**-දාරුකසාවන් සම්බන්ධ ව ද; **කුසලො**-දක්ෂ වීමි. -පෙ- **අරහං**-අභිත් වූ; **සම්මාසම්බුද්ධො**-සම්‍යක්සම්බුද්ධ වූ; අහං-මම; **එතරහි ඛො පන**-දැන් වනාහි; **කායවඞ්කානං**-කායවංකයන් සම්බන්ධ ව ද; **කායදොසානං**-කාය දොෂයන් සම්බන්ධ ව ද; **කායකසාවානං**-කායකසාවන් සම්බන්ධ ව ද; **කුසලො**-දක්ෂ වෙමි. **වචීවඞ්කානං**-වචීවංකයන් සම්බන්ධ ව ද;

සංලක්ෂ්‍යය:-

"අහං තෙන සමයෙන සො රථකාරෙ අහොසිං" "මෙහි අහොසිං" යනු උත්තමපුරුෂ එකවචන ක්‍රියා යි. "අහං" යනු එහි උක්ත කර්තෘ යි. "**සො රථකාරෙ**" යනු උක්ත කර්තෘහට විශෙෂණ වුව ද අන්‍යකාරකයෙන් සිටි. මෙබඳු :සෙසු තැන් ද විමසනු.

වචීදොසො වචීකසාවො, මනොවඞ්කො අප්පහීනො මනොදොසො මනොකසාවො, එවං පපතිතා තෙ භික්ඛවෙ ඉමස්මා ධම්මවිනයා සෙය්‍යථාපි තං චක්කං ඡහි දිවසෙහි නිට්ඨිතං. යස්ස කස්සචි භික්ඛවෙ භික්ඛුස්ස වා භික්ඛුනියා වා කායවඞ්කො පහීනො කායදොසො කායකසාවො, වචීවඞ්කො පහීනො වචීදොසො වචීකසාවො, මනොවඞ්කො පහීනො මනොදොසො මනොකසාවො; එවං පතිට්ඨිතා තෙ භික්ඛවෙ ඉමස්මිං ධම්මවිනයෙ සෙය්‍යථාපි තං චක්කං ඡහි මාසෙහි නිට්ඨිතං ඡාරත්තූනෙහි. තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං:- කායවඞ්කං පජහිස්සාම කායදොසං කායකසාවං, වචීවඞ්කා පජහිස්සාම වචීදොසං වචීකසාවං, මනොවඞ්කං පජහිස්සාම මනොදොසං මනොකසාවන්ති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බන්ති.

-පෙ- **යස්ස කස්සචි**-යම්කිසි; **භික්ඛුස්ස වා**-මහණක්හුගේ හෝ; **භික්ඛුනියා වා**-මෙහෙණකගේ හෝ; **කායවඞ්කො**-කායවංකය ද; **කායදොසො**-කායදෝෂය ද; **කායකසාවො**-කායකසාවය ද; **අ+පහීනො**-ප්‍රහීණ නො වූයේ ද; -පෙ- **තෙ**-ඔව්හුතුමූ; **ඉමස්මා ධම්මවිනයා**-මේ ශාසනයෙන්; **එවං**-මෙසේ; **පපතිතා**-පතිත වූවාහු ය. (කෙසේ ද යත්?) **ඡහි දිවසෙහි** - සදවසකින්; **නිට්ඨිතං**-නිමවනලද; **තං චක්කං**-ඒ චක්‍රය; **සෙය්‍යථාපි**-යම්සේ ද (එමෙනි); -පෙ- **කායවඞ්කො**-කායවංකය; **පහීනො**-ප්‍රහීණ වූයේ ද; -පෙ- **තෙ**-ඔව්හුතුමූ; **ඉමස්මිං ධම්මවිනයෙ**-මේ ශාසනයෙහි; **එවං**-මෙසේ; **පතිට්ඨිතා**-පිහිටියාහු වෙත්. (කෙසේ ද?) **ඡාරත්ති+ඌනෙහි**-සරුයක් අඩු වූ; **ඡහි මාසෙහි**-සමසකින්; **නිට්ඨිතං** - නිමවනලද; **තං චක්කං**-ඒ චක්‍රය; **සෙය්‍යථාපි**-යම්සේ ද; (එමෙනි); -පෙ- **තස්මා** - එහෙයින්; **ඉහ** - මෙහි; (නොහොත් **තිහ** යනු නිපාත මාත්‍ර යි.) **එවං** - මෙසේ; **සික්ඛිතබ්බං**-හික්මියයුතු යි; (කෙසේද?) **කායවඞ්කං**-කායවංකය ද; **පජහිස්සාම**-දුරුකරන්නෙමු; -පෙ- **මනොකසාවං**-මනොකසාවය ද; **පජහිස්සාම+ඉති** - දුරුකරන්නෙමු කියා යි; **භික්ඛවෙ**-මහණෙනි; **වො**-තොප විසින්; **එවං හි**-මෙසෙසින් ම; **සික්ඛිතබ්බං+ඉති**-හික්මිය යුතු යයි වදාළසේක.

සංලක්ෂ්‍යය:-

“කායවඞ්කො වචීවඞ්කො මනොවඞ්කො” ප්‍රාණඝාතාදි ත්‍රිවිධ කායදුශ්චරිතය **කායවඞ්කා** නම් වේ. මෘෂාවාදාදි චතුර්විධ වාග් දුශ්චරිතය **වචීවඞ්කා** නම් වේ. අභිධ්‍යාදි ත්‍රිවිධ මනොදුශ්චරිතය **මනොවඞ්කා** නම් වේ. එහි ප්‍රාණඝාත අදත්තාදාන කාමමිථ්‍යාචාර මුසාවාද

6. තීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අපණ්ණකතං පටිපදං[1] පටිපන්නො හොති, යොනි චස්ස ආරද්ධා හොති ආසවානං ඛයාය. කතමෙහි තීහි? ඉධ භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති, භොජනෙ මත්තඤ්ඤූ හොති, ජාගරියං අනුයුත්තො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙතං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා—ඝානෙන ගන්ධං ඝායිත්වා—ජිව්හාය රසං සායිත්වා—

පිසුණාවාච මිච්ඡාදිට්ඨි යන මේ සය සොවාන් මාර්ගයෙන් ද, පරුෂවචන ව්‍යාපාද යන දෙක අනාගාමී මාර්ගයෙන් ද, අභිජ්ඣා සම්ඵප්පලාප දෙක අර්හත්මාර්ගයෙන් ද ප්‍රහීණවෙත්.

6. -පෙ- තීහි ධම්මෙහි-තුන්කාරණයෙකින්; **සමන්නාගතො**-යුක්ත වූ; **භික්ඛු**- මහණතෙම; **අපණ්ණකතං පටිපදං**-අවිරුද්ධ ප්‍රතිපදාවට හෙවත් ධර්මානුකූල ප්‍රතිපදාවට; **පටිපන්නො හොති**-පිළිපන්නේ වේ; **ආසවානං ඛයාය**-ආශ්‍රවක්ෂය පිණිස; **අස්ස**-ඔහුගේ; **යොනි ච**-ප්‍රඥා සඞ්ඛ්‍යාත කාරණය ද; **ආරද්ධා හොති**-පරිපූර්ණ වූයේ වේ. -පෙ- **ඉධ**-මේ ශාසනයෙහි; **භික්ඛු**-මහණ තෙම; **ඉන්ද්‍රියෙසු**-මනඃෂෂ්ඨ (=සිත සවැනි වූ) ඉන්ද්‍රියයන් කෙරෙහි; **ගුත්තද්වාරො හොති**-වසනලද දොරඇති වේ ද; **භොජනෙ**-වැළඳීමෙහි; **මත්තඤ්ඤූ හොති**-(ප්‍රතිග්‍රහණ පරිභොග ප්‍රත්‍යවෙක්ෂණ වශයෙන්) පමණ දන්නේ වේ ද; **ජාගරියං**-නො නිදීමෙහි; **අනුයුත්තො හොති**-යෙදුණේ වේ ද; (යන මේ තුනෙනි)

-පෙ- **කථං+ච**-කෙසේ නම්; **ඉන්ද්‍රියෙසු**-මනඃෂෂ්ඨ ඉන්ද්‍රියයන් කෙරෙහි; **ගුත්තද්වාරො හොති**-වසනලද දොර ඇති වේ ද; -පෙ- **ඉධ**-මේ ශාසනයෙහි; **භික්ඛු**-මහණතෙම; **චක්ඛුනා**-චක්ෂුර්විඥානයෙන්; **රූපං දිස්වා**-රූපාලම්බනයක් දැක; **න නිමිත්ත+ගාහී හොති**-නිමිත්තග්‍රහණය නො කරන්නේ වේ ද; **න+අනුබ්‍යඤ්ජන+ගාහී** - ක්ෂුද්‍ර ලක්ෂණ ග්‍රහණය නො

1. අප්පණ්ණකපටිපදං-ස්‍යාම.

කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා—මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී, යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං මනින්ද්‍රියෙ සංවරං ආපජ්ජති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරො හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු භොජනෙ මත්තඤ්ඤූ හොති? ඉධ

කරන්නේ වේ ද; **යතො + අධිකරණං**-යමක් හේතුකොට ගෙන; **චක්ඛු + ඉන්ද්‍රියං**-චක්ෂුරින්ද්‍රිය; **අසංවුතං**-සිහි නැමති දොරින් නො පියා; **විහරන්තං**-වාසයකරන්නා වූ; **එනං**-මොහු; **අභිජ්ඣා**-විෂමලොභය ද; **දොමනස්සා**-දෞර්මනස්‍යය ද යන; **පාපකා**-ලාමක වූ; **අකුසලා ධම්මා**-අකුශලධර්මයෝ; **අන්වාස්සවෙය්‍යුං**-වටලාගතිද් ද; **තස්ස**-ඒ චක්ෂුරින්ද්‍රියය; **සංවරාය**-සිහි නැමති දොරින් වැසීම පිණිස; **පටිපජ්ජති**-පිළිපදී ද; **චක්ඛු + ඉන්ද්‍රියං**-චක්ෂුරින්ද්‍රියය; **රක්ඛති**-රක්ෂා කෙරේ ද; **චක්ඛු + ඉන්ද්‍රියෙ**-චක්ෂුරින්ද්‍රියයෙහි; **සංවරං**-සංවරයට **ආපජ්ජති**-පැමිණේ ද. **සොතෙන**-ශ්‍රොත්‍රවිඥානයෙන්; **සද්දං සුත්වා** - ශබ්දයක් ශ්‍රවණය කොට; -පෙ- **ඝානෙන**-ඝ්‍රාණවිඥානයෙන්; **ගන්ධං ඝායිත්වා**-ගන්ධයක් ආඝ්‍රාණය කොට; -පෙ- **ජිව්හාය**- ජිහ්වා විඥානයෙන් **රසං සායිත්වා**-රසාස්වාදයක් කොට;-පෙ-**කායෙන**-කායවිඥානයෙන්; **ඵොට්ඨබ්බං ඵුසිත්වා**-ස්ප්‍රෂ්ටව්‍යයක් වැළඳගෙන; -පෙ- **මනසා**-මනොවිඥානයෙන්; **ධම්මං**-වෙදනාදි ධර්මයක්; **විඤ්ඤාය**-දැන; -පෙ-

සංලක්ෂ්‍යය:-

1. **"න නිමිත්තග්ගාහී නානුබ්‍යඤ්ජනග්ගාහී"** නිමිත්තං ගණ්හාතීති නිමිත්තග්ගාහී. රූපාරම්මණයක් දැක ස්ත්‍රියක, පුරුෂයෙක සහපත් ලක්ෂණ රූපයෙක යනාදීන් නිමිති ගන්නේ නිමිත්තග්ගාහී නම්. දුටුමාත්‍රයක් කොට ස්ත්‍රීපුරුෂාදි වශයෙන් නො සිතන්නේ න නිමිත්තග්ගාහී නම්. නානුබ්‍යඤ්ජනග්ගාහී යනු ද මෙසේ මැයි. **"අනුබ්‍යඤ්ජන"** නම් හස්තපාද මුඛ කන් නාසා දන්තාදි කුඩා කුඩා අවයව යි.

2. **"යත්වාධිකරණං"** මෙහි අධිකරණ ශබ්දය කාරණාර්ථ යි, **"යතො+අධිකරණං"** යම් හේතුවකින් යනු අර්ථ යි. ඉන්ද්‍රිය අසංවර සඞ්ඛ්‍යාත හෙතුවෙන් යනු භාව යි. "අභිජ්ඣාදොමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං' යන්න හා සම්බන්ධකොට අර්ථ දතයුතු යි.

-පෙ- **කථං + ච**-කෙසේ නම්; **භොජනෙ**-වැළඳීමෙහි; **මත්තඤ්ඤූ හොති**-පමණ දන්නේ වේ ද; -පෙ- **යොනිසො**-

භික්ඛවෙ භික්ඛු පටිසඞ්ඛා යොනිසො ආහාරං ආහාරෙති නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය, යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය. ඉති පුරාණඤ්ච වෙදනං පටිහඞ්ඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසුවිහාරො චාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු භොජනෙ මත්තඤ්ඤූ හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු ජාගරියං අනුයුත්තො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති පාදෙ පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨාන

නුවණින්; **පටිසඞ්ඛාය**-ප්‍රත්‍යවෙක්ෂා කොට; **ආහාරං**-ආහාරය, **ආහාරෙති**-වළඳයි; (කෙසේ දය ත්?) **නෙව දවාය**-(මේ ආහාර පරිභොගය තෙම) ක්‍රීඩා පිණිස ද නො වේ. **න මදාය**-බල මද පුරුෂ මද පිණිස ද නො වේ. **න මණ්ඩනාය**-උනුතැන් පිරීම පිණිස ද නො වේ. **න විභූසනාය**-සැරසීම පිණිස ද නො වේ. **යාවදෙව**-යම්තාක් (මේ ආහාරය වැළඳීම;) **ඉමස්ස කායස්ස**-මේ ශරීරයාගේ; **ඨිතියා**-පැවැත්ම පිණිස ද; **යාපනාය**-දිවි යැපීම පිණිස ද; **විහිංසා + උපරතියා**-(නො වැළඳීමෙන් වන) ක්‍ෂුධා දුඃඛය වැළැක්ම පිණිස ද; **බ්‍රහ්මචරිය+ අනුග්ගහාය**-බ්‍රහ්මචරියාවට අනුග්‍රහ පිණිස ද වේ. **ඉති**-මෙසේ මේ වැළඳීමෙන්; **පුරාණං + ච වෙදනං**-ආහාර නො ගැන්මෙන් වූ පුරාණ වෙදනාව ද; **පටිහඞ්ඛාමි**-නසමි; **නවං + ච වෙදනං**-(පමණ නො දත වැළඳීමෙන් වන) අලුත් වෙදනාව ද; **න උප්පාදෙස්සාමි**-නො උපදවන්නෙමි; **මෙ**-මාගේ; **යාත්‍රා ච**-(මේ ආහාරපරිභොගය කාරණකොටගෙන) දිවි පැවැත්ම ද; **අනවජ්ජතා ච**-නිරවද්‍යබව ද; **ඵාසුවිහාරො ච**-සැපවිහරණය ද; **භවිස්සති ඉති**-වන්නේ ය කියා යි.

-පෙ- **කථං+ච** - කෙසේ නම්; **ජාගරියං**-නො නිදීමෙහි; **අනුයුත්තො හොති**-යෙදුණේ වේ ද?; -පෙ- **දිවසං**-දිවාභාග යෙහි; **චඞ්කමෙන** - සක්මනින් ද; **නිසජ්ජාය** - හිඳීමෙන් ද; **ආවරණීයෙහි ධම්මෙහි**-නීවරණ ධර්මයන් කෙරෙන්; **චිත්තං**-සිත; **පරිසොධෙති**-පිරිසුදු කෙරෙයි; **රත්තියා**-රාත්‍රිය පිළිබඳ වූ; **පඨමං යාමං**-ප්‍රථමයාමයෙහි; -පෙ-

සඤ්ඤං මනසි කරිත්වා, රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ජාගරියං අනුයුත්තො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අපණ්ණකතං පටිපදං[1] පටිපන්නො හොති, යොනි චස්ස අරද්ධා හොති ආසවානං ඛයායාති.

7. තයොමෙ භික්ඛවෙ ධම්මා අත්තව්‍යාබාධායපි සංවත්තන්ති, පරව්‍යාබාධායපි සංවත්තන්ති, උභයව්‍යාබාධායපි සංවත්තන්ති.

රත්තියා-රාත්‍රියපිළිබඳ වූ; **මජ්ඣිමං යාමං**-මධ්‍යම යාමයෙහි; **දක්ඛිණෙන පස්සෙන**-දකුණැලයෙන්; **පාදෙ**-දකුණුපා මතුයෙහි; **පාදං**-වාම පාදය; **අති+ආධාය**-මදක් ඉක්මවා තබා; **සතො** - සිහිඇත්තේ; **සම්පජානො**-නුවණැත්තේ; **උට්ඨාන සඤ්ඤං**-නැඟී සිටින සඳුව; **මනසි කරිත්වා**-මෙනෙහි කොට; **සීහසෙය්‍යං**-සිහසෙය්‍යාව; **කප්පෙති**-කරන්නේ වේ ද; -පෙ- **පච්ඡිමං යාමං** - පශ්චිමයාමයෙහි; **පති+උට්ඨාය**-නැඟිට; -පෙ- **ආසවානං ඛයාය**-ආශ්‍රවක්‍ෂය පිණිස; **අස්ස**-ඔහුගේ; **යොනි ච**-ප්‍රඥසඞ්ඛ්‍යාත කාරණය ද; **ආරද්ධා හොති+ඉති**-පරිපූර්ණ වූයේ ය යි වදළසේක.

සංලක්‍ෂ්‍යය:-

1. "**අපණ්ණකතං පටිපදං**" "න පණ්ණකං අපණ්ණකං, අපණ්ණකස්ස භාවො අපණ්ණකතා" ශාසනයට අවිරුද්ධ වූ ප්‍රතිපදව හෙවත් ධර්මයට අනුකූල වූ පිළිවෙත නොහොත් නො වරදින ඒකාන්ත ප්‍රතිපදව **අපණ්ණක පටිපදා** නමි. එය වනාහි "චක්‍ෂුරාදි ඉන්ද්‍රියයන් කෙරෙහි වසනලද වාරඇතිබව ය. භොජනයෙහි පමණ දන්නාබව ය, නො නිදීම ය" යන මෙකී පිළිවෙත්හි යෙදීමෙන් පිරියයුත්තේ ය. යම්කිසි කෙනෙක් මෙකී අපණ්ණක ප්‍රතිපදව සම්පූර්ණ කෙරෙත් නම් ඔවුහු සියලු සැපතින් වැඩෙත්. එසේ නො පුරත් නම් සියලු සැපතින් පිරිහෙත්.

2. "**යොනි ච+අස්ස**" "යොනි" ශබ්දය ඛන්ධකොට්ඨාස කාරණ පස්සාවමග්ග යන මෙකී අර්ථයන්හි වැටෙන්නේ නමුදු මෙහි කාරණයෙහි වැටෙන බව දතයුතු. 3. "**මජ්ඣිමං යාමං**" යනාදී තන්හි අත්‍යන්ත සංයොග ද්විතීයා යි. (2 වෙනි පිටේ සංලක්‍ෂ්‍යය බලනු.)

7. -පෙ- **අත්තව්‍යාබාධාය+අපි** - තමහට දුක්පිණිස ද; **සංවත්තන්ති**-පවතිත්; **පරව්‍යාබාධාය+අපි**-අනුන්ට දුක්පිණිස ද;

---

1. අපණ්ණකපටිපදං-ස්‍යාම.

කතමෙ තයො? කායදුච්චරිතං, වචීදුච්චරිතං, මනොදුච්චරිතං. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා අත්තව්‍යාබාධායපි සංවත්තන්ති, පරව්‍යාබාධායපි සංවත්තන්ති, උභයව්‍යාබාධායපි සංවත්තන්ති.

තයොමෙ භික්ඛවෙ ධම්මා නෙව අත්තව්‍යාබාධායපි සංවත්තන්ති, න පරව්‍යාබාධායපි සංවත්තන්ති, න උභයව්‍යාබාධායපි සංවත්තන්ති. කතමෙ තයො? කායසුචරිතං, වචීසුචරිතං, මනොසුචරිතං. ඉමෙ ඛො භික්ඛවෙ තයො ධම්මා නෙව අත්තව්‍යාබාධායපි සංවත්තන්ති, -පෙ- න උභයව්‍යාබාධායපි සංවත්තන්තීති.

8. සචෙ ඛො භික්ඛවෙ අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං පුච්ඡෙය්‍යුං :- දෙවලොකූපපත්තියා ආවුසො සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සථාති.[1] තත්‍ර තුම්හෙ භික්ඛවෙ එවං පුට්ඨා අට්ටියෙය්‍යාථ හරායෙය්‍යාථ ජිගුච්ඡෙය්‍යාථාති? එවං භන්තෙ. ඉති කිර තුම්හෙ භික්ඛවෙ දිබ්බෙන ආයුනා අට්ටියථ හරායථ ජිගුච්ඡථ; දිබ්බෙන වණ්ණෙන -පෙ- දිබ්බෙන සුඛෙන -පෙ- දිබ්බෙන යසෙන -පෙ- දිබ්බෙන ආධිපතෙය්‍යෙන අට්ටියථ

-පෙ- **උභයව්‍යාබාධාය + අපි**- දෙපක්ෂයට ම දුක්පිණිස ද; -පෙ-

-පෙ- **අත්තව්‍යාබාධාය+අපි**- තමහට දුක්පිණිස ද; **න+එව සංවත්තන්ති**- නො ම පවතිත්; -පෙ-

8. -පෙ- **සචෙ ඛො**- ඉදින් වනාහි; **අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා**- අන්‍යතීර්ථක පරිව්‍රාජකයෝ; **ආවුසො**- ඇවැත්නි; **දෙවලොක+උපපත්තියා**- දෙව්ලොව ඉපදීම පිණිස; **සමණෙ ගොතමෙ**- ශ්‍රමණභවත් ගෞතමයන් කෙරෙහි; **බ්‍රහ්මචරියං වුස්සථ + ඉති**- බඹසරවස් පුරන්නහු දැයි; **එවං පුච්ඡෙය්‍යුං**- මෙසේ විචාරත් නම්; -පෙ- **තුම්හෙ**- තෙපි; **එවං පුට්ඨා**- මෙසේ විචාරනලද්දහු; **අට්ටියෙය්‍යාථ නනු?**- පීඩිතවන්නාහු ද? **හරායෙය්‍යාථ නනු?**- ලජ්ජාවන්නහු ද? **ජිගුච්ඡෙය්‍යාථ නනු+ඉති**- පිළිකුල් කරන්නාහු දැයි විචාළසේක. **එවං භන්තෙ**- එසේ ය වහන්සැයි සැලකළාහු ය; -පෙ- **ඉති කිර**- මෙසේ වනාහි; **තුම්හෙ**- තෙපි; **දිබ්බෙන ආයුනා**- දිව්‍ය වූ ආයුෂයෙන්; **අට්ටියථ**- පීඩිතවන්නාහු නම්; **හරායථ**- ලජ්ජාවන්නාහු නම්; **ජිගුච්ඡථ**- පිළිකුල් වන්නහු නම්; **දිබ්බෙන වණ්ණෙන**- දිව්‍ය වූ වර්ණයෙන් ද;

---

1 සමණෙ ගොතමෙ බ්‍රහ්මචරියං වුස්සතීති. ස්‍යා: ඉං:

හරායථ ජිගුච්ඡථ පගෙව ඛො පන භික්ඛවෙ තුම්හෙහි කායදුච්චරිතෙන අට්ටියිතබ්බං හරායිතබ්බං ජිගුච්ඡිතබ්බං, වචීදුච්චරිතෙන -පෙ- මනොදුච්චරිතෙන අට්ටියිතබ්බං හරායිතබ්බං ජිගුච්ඡිතබ්බන්ති.

9. තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො පාපණිකො අභබ්බො අනධිගතං වා භොගං අධිගන්තුං අධිගතං වා භොගං ඵාතිකාතුං. කතමෙහි තීහි? ඉධ භික්ඛවෙ පාපණිකො පුබ්බණ්හසමයං න සක්කච්චං කම්මන්තං අධිට්ඨාති, මජ්ඣන්තිකං සමයං න සක්කච්චං කම්මන්තං අධිට්ඨාති, සායන්හසමයං න සක්කච්චං කම්මන්තං අධිට්ඨාති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි අඞ්ගෙහි සමන්නාගතො පාපණිකො අභබ්බො අනධිගතං වා භොගං අධිගන්තුං අධිගතං වා භොගං ඵාතිකාතුං.

එවමෙව ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො අනධිගතං වා කුසලං ධම්මං අධිගන්තුං අධිගතං වා කුසලං ධම්මං ඵාතිකාතුං. කතමෙහි තීහි? ඉධ භික්ඛවෙ භික්ඛු

-පෙ- **දිබ්බෙන සුඛෙන**- දිව්‍ය වූ සැපයෙන් ද; -පෙ- **දිබ්බෙන යසෙන**-දිව්‍ය වූ යසසින් ද; **දිබ්බෙන ආධිපතෙය්‍යෙන**- දිව්‍ය වූ ආධිපත්‍යයෙන් ද; **අට්ටියථ**- පීඩිතවන්නාහු නම්; -පෙ- **තුම්හෙහි** - තොපවිසින්; **පගෙව ඛො පන** - පළමුකොට ම; **කායදුච්චරිතෙන**- කායදුශ්චරිතයෙන්; **අට්ටියිතබ්බං** - පීඩිතවිය යුතු යි. **හරායිතබ්බං**- ලජ්ජා වියයුතු යි; **ජිගුච්ඡිතබ්බං + ඉති**- පිළිකුල්වියයුතු යයි වදාළසේක.

9. -පෙ- **තීහි අඞ්ගෙහි**- තුන්කාරණයෙකින්; **සමන්නාගතො**-යුක්ත වූ; **පාපණිකො**-සල්පිල් වෙළඳතෙම; **අනධිගතං භොගං**- නො ලත් භොගයක්; **අධිගන්තුං වා**- ලබන්ට හෝ; **අධිගතං භොගං**- ලද්ද වූ භොගයක්; **ඵාතිකාතුං වා**- වඩිනය කරන්ට හෝ; **අභබ්බො** - යොග්‍ය නො වේ; -පෙ- **ඉධ**- මේ ලොකයෙහි; **පාපණිකො** - සල්පිල් වෙළඳතෙම; **පුබ්බණ්හසමයං**- පෙරවරු වේලෙහි; **සක්කච්චං**- සකස්කොට; **කම්මන්තං** - කර්මාන්තයෙහි; **න අධිට්ඨාති**- නො පිහිටා ද; **මජ්ඣන්තිකං සමයං**- මධ්‍යාහ්න කාලයෙහි; -පෙ- **සායන්හ සමයං**- සවස්වේලෙහි; -පෙ-

-පෙ- **එවං + එව ඛො**-එපරිද්දෙන් ම; **තීහි ධම්මෙහි**- තුන්කාරණයෙකින්; **සමන්නාගතො** - යුක්ත වූ **භික්ඛු** - මහණ තෙම; **අනධිගතං** - නො ලද්ද වූ; **කුසලං ධම්මං** - කුශල ධර්මයක්; **අධිගන්තුං වා** - ලබන්ට හෝ; **අධිගතං** - ලද්ද වූ;

පුබ්බණ්හසමයං න සක්කච්චං සමාධිනිමිත්තං අධිට්ඨාති, මජ්ඣන්තිකං සමයං න සක්කච්චං සමාධිනිමිත්තං අධිට්ඨාති, සායණ්හසමයං න සක්කච්චං සමාධිනිමිත්තං අධිට්ඨාති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො අනධිගතං වා කුසලං ධම්මං අධිගන්තුං අධිගතං වා කුසලං ධම්මං ඵාතිකාතුං.

තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො පාපණිකො භබ්බො අනධිගතං වා භොගං අධිගන්තුං අධිගතං වා භොගං ඵාතිකාතුං. කතමෙහි තීහි? ඉධ භික්ඛවෙ පාපණිකො පුබ්බණ්හසමයං සක්කච්චං කම්මන්තං අධිට්ඨාති, මජ්ඣන්තිකං සමයං -පෙ- සායණ්හසමයං සක්කච්චං කම්මන්තං අධිට්ඨාති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි අඞ්ගෙහි සමන්නාගතො පාපණිකො භබ්බො අනධිගතං වා භොගං අධිගන්තුං අධිගතං වා භොගං ඵාතිකාතුං.

එවමෙව ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අනධිගතං වා කුසලං ධම්මං අධිගන්තුං අධිගතං වා කුසලං ධම්මං ඵාතිකාතුං. කතමෙහි තීහි? ඉධ භික්ඛවෙ භික්ඛු පුබ්බණ්හසමයං සක්කච්චං සමාධිනිමිත්තං අධිට්ඨාති, මජ්ඣන්තිකං සමයං -පෙ- සායණ්හසමයං සක්කච්චං සමාධිනිමිත්තං අධිට්ඨාති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු භබ්බො අනධිගතං වා කුසලං ධම්මං අධිගන්තුං අධිගතං වා කුසලං ධම්මං ඵාතිකාතුන්ති.

කුසලං ධම්මං - කුශලධර්මයක්; **ඵාතිකාතුං වා** - වර්ධනය කරන්ට හෝ; **අභබ්බො** - අයොග්‍ය වේ; -පෙ- **භික්ඛු** - මහණ තෙම; **පුබ්බණ්හසමයං** - පෙරවරු වේලෙහි; **සක්කච්චං** - සකස් කොට; **සමාධිනිමිත්තං** - සමාධිනිමිත්තයෙහි; හෙවත් සමාපත්තියෙහි; **න අධිට්ඨාති** - නොපිහිටා ද; -පෙ-

-පෙ- **අනධිගතං භොගං** - නො ලත් භොගයක්; **අධිගන්තුං වා** - ලබන්ට හෝ; **අධිගතං** - ලැබූ භොගයක්; **ඵාතිකාතුං වා** - වර්ධනය කරන්ට හෝ; **භබ්බො** - යොග්‍ය වේ. -පෙ- **සක්කච්චං** - සකස්කොට; **කම්මන්තං** - කර්මාන්තයෙහි; **අධිට්ඨාති** - පිහිටා ද;

10. **තීහි භික්ඛවෙ අඞ්ගෙහි සමන්නාගතො පාපණිකො න චිරස්සෙව මහන්තත්තං වෙපුල්ලත්තං පාපුණාති භොගෙසු. කතමෙහි තීහි? ඉධ භික්ඛවෙ පාපණිකො චක්ඛුමා ච හොති විධුරො ච නිස්සයසම්පන්නො ච.**

කථඤ්ච භික්ඛවෙ පාපණිකො චක්ඛුමා හොති? ඉධ භික්ඛවෙ පාපණිකො පණියං ජානාති :- ඉදං පණියං එවං කීතං එවං වික්කයමානං එත්තකං මූලං භවිස්සති එත්තකො උදයොති. එවං ඛො භික්ඛවෙ පාපණිකො චක්ඛුමා හොති.

සංලක්ෂ්‍යය:-

1. **"සාමඤ්ඤං අධිට්ඨාති"** 139 වෙනි පිටුවේ සංලක්ෂ්‍යය බලනු.

2. **"පුබ්බණ්හසමයං, මජ්ඣන්හිකං සමයං, සායන්හසමයං"** මෙහි අත්‍යන්ත සංයොගාර්‍ථයෙහි විතීයා විභක්ති යි. ඇතම් වෛයාකරණ කෙනෙක් මෙහි සප්තම්‍යර්‍ථයෙහි විතීයා විභක්ති යයි කියත්. **'පුබ්බො ච සො අහො ච'** යී විශෙෂණ සමාසකොට **'අහ'** ශබ්දයහට අන්භාදෙශ කොට නැවත **'පුබ්බණ්හො සමයං'** යී තත්පුරුෂ සමාස වැ පුබ්බන්හ සමයං කියා සිඩවී තිබේ. අනික් දෙපදය ද මේ නයින් දතයුතු යි.

10 -පෙ- **පාපණිකො**-සල්පිල්වෙළඳතෙම; **න චිරස්ස + එව**- නොබෝ කලකින් ම; **භොගෙසු**-භොගයන්හි; **මහන්තත්තං**- මහත් බවට ද; **වෙපුල්ලත්තං**-විපුල බවට ද; **පාපුණාති**-පැමිණේ -පෙ- **ඉධ**- මේ ලෝකයෙහි; **පාපණිකො**- සල්පිල් වෙළඳ තෙම; **චක්ඛුමා ච හොති**-නුවණැස් ඇත්තේ වේ ද; **විධුරො ච**- ඥානසම්ප්‍රයුක්ත වියඨියෙන් යුක්ත වේ ද; **නිස්සයසම්පන්නො ච**- පිහිට ඇත්තේ වේ ද; (යන තුනෙනි)

-පෙ- **පාපණිකො**-සල්පිල්වෙළඳතෙම; **කථං + ච**-කෙසේ නම්; **චක්ඛුමා හොති**-නුවණැස් ඇත්තේ වේ ද; -පෙ- **ඉධ**-මේ ලෝකයෙහි; **පාපණිකො**- සල්පිල්වෙළඳතෙම; **ඉදං පණියං**- මේ විකිණියයුතු භාණ්ඩය; **එවං කීතං**-මෙසේ මිලදී ගන්නා ලද්දේ; **එවං වික්කයමානං**- මෙසේ විකුණනු ලබන්නේ; **එත්තකං මූලං භවිස්සති**-මෙතෙක් මිල වන්නේ ය; **උදයො**- ලාභය (හෙවත් පොලිය); **එත්තකො ඉති**-මෙ පමණ වන්නේ යයි; **පණියං ජානාති**-විකිණියයුතු භාණ්ඩය දන්නේ ද; -පෙ- **එවං ඛො**- මෙසේ වනාහි; **පාපණිකො**- සල්පිල් වෙළඳතෙම; **චක්ඛුමා හොති**-නුවණැස් ඇත්තේ වේ;

කථඤ්ච භික්ඛවෙ පාපණිකො විධුරො හොති? ඉධ භික්ඛවෙ පාපණිකො කුසලො හොති පණියං කෙතුඤ්ච වික්කෙතුඤ්ච. එවං ඛො භික්ඛවෙ පාපණිකො විධුරො හොති.

කථඤ්ච භික්ඛවෙ පාපණිකො නිස්සයසම්පන්නො හොති? ඉධ භික්ඛවෙ පාපණිකො,[1] යෙ තෙ ගහපතී වා ගහපතිපුත්තා වා අඩ්ඪා මහද්ධනා මහාභොගා තෙ නං එවං ජානන්ති:– අයං ඛො භවං පාපණිකො චක්ඛුමා ච විධුරො ච, පටිබලො පුත්තදාරඤ්ච පොසෙතුං අම්හාකඤ්ච කාලෙන කාලං අනුප්පදාතුන්ති තෙ නං භොගෙහි නිපතන්ති:– ඉතො සම්ම පාපණික භොගෙ හරිත්වා[2] පුත්තදාරඤ්ච පොසෙහි, අම්හාකඤ්ච කාලෙන කාලං

–පෙ– **පාපණිකො**–සල්පිල්වෙළඳතෙම; **පණියං**–විකිණිය යුතු භාණ්ඩය; **කෙතුං**+ච–මිලදී ගන්ට ද; **වික්කෙතුං**+ච–විකුණන්ට ද; **කුසලො හොති**–දක්ෂ වේ ද; –පෙ– **එවං ඛො**–මෙසේ වනාහි; **පාපණිකො**– සල්පිල්වෙළඳතෙම; **විධුරො හොති**– ඥානසම්ප්‍රයුක්ත වීර්‍ය්‍යයෙන් යුක්ත වේ.

–පෙ– **කථං**+ච–කෙසේ නම්; **නිස්සයසම්පන්නො හොති?**– පිහිට ඇත්තේ වේ ද?

–පෙ– **පාපණිකො**– සල්පිල් වෙළෙඳෙක් වේ ද; **අඩ්ඪා**– ආඪ්‍ය වූ හෙවත් නිධාන්ගත බොහෝ ධනය ඇති; **මහද්ධනා** – පරිභොග වශයෙන් මහත්ධන ඇති; **මහාභොගා**–උපභොග පරිභොග භාණ්ඩ වශයෙන් මහත් භොග ඇති; **යෙ තෙ ගහපති වා**– යම් ගෘහපති කෙනෙක් හෝ **ගහපතිපුත්තා වා**– ගෘහපති පුත්‍රකෙනෙක් හෝ වෙද් ද; **තෙ**– ඔව්හු තුමූ; **නං**– ඒ වෙළඳහු; **එවං ජානන්ති** – මෙසේ දනිත්. (කෙසේ ද?) **අයං ඛො භවං පාපණිකො**– මේ පින්වත් වෙළඳතෙම; **චක්ඛුමා** ච–නුවණැස් ඇත්තේ ද වේ. **විධුරො** ච– විශිෂ්ටවීර්‍ය්‍ය ඇත්තේ ද වේ. **පුත්තදාරං පොසෙතුං**+ච– අඹුදරුවන් පොෂණය කරන්ට ද; **අම්හාකං** – අපට; **කාලෙන කාලං**– කලින් කල; **අනුප්පදාතුං**+ච– ගත් ධනයෙහි පොලිය දෙන්ට ද; **පටිබලො ඉති**– සමර්ථය කියා යි. **තෙ**– ඒ ධනවත්හු; **නං**– ඔහු; **භොගෙහි**– වස්තුවෙන්; **නිපතන්ති**– පවරත්; (කෙසේ ද?) **සම්ම පාපණික**–යහළු වෙළඳ; **ඉතො**– මෙයින්; **භොගෙ**– භොගයන්; **හරිත්වා** – ගෙනගොස්; **පුත්තදාරං**+ච – අඹුදරුවන් ද;

1. පාපණිකං සන්ධි. 2. කාරිත්වා; ඉං:

අනුප්පදෙහිති. එවං ඛො භික්ඛවෙ පාපණිකො තිස්සය සම්පන්නො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ තීහි අඞ්ගෙහි සමන්නාගතො පාපණිකො න චිරස්සෙව මහන්තත්තං වෙපුල්ලත්තං පාපුණාති භොගෙසු.

එවමෙව ඛො භික්ඛවෙ තීහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු න චිරස්සෙව මහන්තත්තං වෙපුල්ලත්තං පාපුණාති ධම්මෙසු[1]. කතමෙහි තීහි? ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුමා ච හොති විධුරො ච නිස්සයසම්පන්නො ච.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු චක්ඛුමා හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ඉදං දුක්ඛන්ති යථාභූතං පජානාති, -පෙ- අයං දුක්ඛනිරොධගාමිනිපටිපදාති යථාභූතං පජානාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු චක්ඛුමා හොති.

කථඤ්ච භික්ඛවෙ භික්ඛු විධුරො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ආරද්ධවිරියො විහරති අකුසලානං ධම්මානං පහානාය කුසලානං ධම්මානං උපසම්පදාය[2] ථාමවා දළ්හපරක්කමො අනික්ඛිත්තධුරො කුසලෙසු ධම්මෙසු. එවං ඛො භික්ඛවෙ භික්ඛු විධුරො හොති.

පොසෙති-පොෂණය කරව; **අම්හාකං + ච**- අපට ද; **කාලෙන කාලං** - කලින් කල; **අනුප්පදෙති + ඉති** - පොලිය දෙව යි කියායි. -පෙ-

-පෙ- **යාවතතියං අපි ඛො**- තුන්යලක් දක්වාත්; -පෙ- **අාතන්දෙන**- අානන්‍දයන් විසින්; **සහධම්මිකං**- කාරණ සහිත වම; **පඤ්හං පුට්ඨො**- පැනයක් පුළුවුත්තා ලද්දේ; **සංසාදෙති**- යටපත් කෙරෙයි; **නො විස්සජ්ජෙති**- නො විසඳයි; **අහං**- මම; **පරිමොචෙය්‍යං**-(මොවුන් දෙදෙන)මුදන්නෙම් නම්; **යන්නූන + ඉති**- යෙහෙක යන සිත යි.

-පෙ- **අජ්ජ**- අද; **රාජන්තෙපුරෙ**- රාජාන්තඃ පුරයෙහි; **රාජපරිසායං**- රජ පිරිසෙහි; **සන්නිසින්නානං**- සමගි ව හුන්නා වූ; **සන්නිපතිතානං**- රැස් ව හුන්නා වූ ජනයන් අතුරෙහි; **කා නු අන්තරා කථා**- කවර නම් අතුරු කථාවක්; **උදපාදි + ඉති**- පහළවී දැයි විචාළසේක.

-පෙ- **අජ්ජ**- අද; -පෙ- **අයං ඛො අන්තරාකථා**- මේ අතුරු කථාවක් තොමෝ;- **උදපාදි**- පහළවිය; (කෙබඳු කථාවෙක් ද යත්?) **පුබ්බෙ + සුදං**- පෙර වනාහි; **භික්ඛූ**- භික්ෂූහු; **අප්පතරා ච + එව අහෙසුං**- ඉතා සවල්ප දෙනෙක් ම වූවාහු ය; **බහුතරා ච**- ඉතා බොහොදෙනෙක්; **උත්තරිමනුස්සධම්මා**- (දශකුශල කර්මපථ සඞ්ඛ්‍යාත) මනුෂ්‍ය ධර්මයෙන් මත්තෙහි වූ; **ඉද්ධිපාටිහාරියං**- ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යය; **දස්සෙසුං**- දැක්වූවාහු ය; **එතරහි ඛො**- දැන් වනාහි; **භික්ඛූ**- භික්ෂූහු; **බහුතරා ච + එව**- ඉතා බොහෝ දෙනෙක් ම වෙත්; **අප්පතරා ච**- ඉතා සවල්ප දෙනෙක් ම; -පෙ- **දස්සෙන්ති + ඉති**- දක්වත් යන කථාව යි.

තීණි ඛො ඉමානි බ්‍රාහ්මණ පාටිහාරියානි. කතමානි තීණි? ඉද්ධිපාටිහාරියං, ආදෙසනාපාටිහාරියං, අනුසාසනීපාටිහාරියං.

කතමං ච බ්‍රහ්මණ ඉද්ධිපාටිහාරියං? ඉධ බ්‍රහ්මණ එකච්චො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති: එකොපි හුත්වා බහුධා හොති බහුධාපි හුත්වා එකො හොති, ආවිභාවං තිරොභාවං, තිරොකුඩ්ඩං තිරොපාකාරං තිරොපබ්බතං අසජ්ජමානො ගච්ඡති සෙය්‍යථාපි ආකාසෙ, පඨවියාපි උම්මුජ්ජනිමුජ්ජං කරොති. සෙය්‍යථාපි උදකෙ, උදකෙපි අභිජ්ජමානෙ[1] ගච්ඡති සෙය්‍යථාපි පඨවියං,[2] ආකාසෙපි පල්ලඞ්කෙන කමති සෙය්‍යථාපි පක්ඛී[3] සකුණො, ඉමෙපි චන්දිමසුරියෙ එවං මහිද්ධිකෙ එවං මහානුභාවෙ පාණිනා පරිමසති පරිමජ්ජති, යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. ඉදං වුච්චති බ්‍රාහ්මණ ඉද්ධිපාටිහාරියං.

-පෙ- **පාටිහාරියානි**- ප්‍රාතිහාර්‍ය්‍යයෝ; **ඉමානි ඛො තීණි**- මොහු තුන්දෙනෙක් වෙත්. -පෙ- **ඉද්ධිපාටිහාරියං**- ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍ය ය; **ආදෙසනාපාටිහාරියං**- ආදෙශනා ප්‍රාතිහාර්‍ය්‍ය ය; **අනුසාසනීපාටිහාරියං**- අනුශාසනී ප්‍රාතිහාර්‍ය්‍ය ය (යන තුන යි.)

-පෙ- **ඉධ**-මේ ලොකයෙහි; **එකච්චො**- ඇතමෙක්; **අනෙකවිහිතං**- අනෙකප්‍රකාර වූ; **ඉද්ධිවිධං**- ඍද්ධිප්‍රභෙද ය; **පච්චනුභොති**- චලක්‍ෂ්‍යතය කෙරේ (හෙවත් ලබයි.) (කෙසේ ද යත්?) **එකො+අපි හුත්වා**- එක් පුද්ගලයෙක් ව ද; **බහුධා හොති**-බොහෝ ප්‍රකාර වේ; **බහුධා+අපි හුත්වා**- බොහෝ ප්‍රකාර ව ද; **එකො හොති**- එකෙක් ද වේ; **ආවිභාවං**- ප්‍රකාශ බව ද කෙරේ; **තිරොභාවං**- මුවහ බව ද කෙරේ; **තිරොකුඩ්ඩං**- බිත්ති යෙන් මුවහ තැනට ද; **තිරොපාකාරං**- පවුරෙන් මුවහ වූ තැනට ද; **තිරොපබ්බතං**- පර්‍වතයෙන් මුවහ වූ තැනට ද; **සෙය්‍යථාපි ආකාසෙ**- අහසෙහි මෙන්; **අසජ්ජමානො+එව**- නො ලැගෙමින් ම; **ගච්ඡති**- යෙයි. **සෙය්‍යථාපි උදකෙ**- ජලයෙහි මෙන්; **පඨවියා+අපි**- පෘථිවියෙහි ද; **උම්මුජ්ජනිමුජ්ජං කරොති**- උම්මුජ්ජනිමුජ්ජනය කෙරෙයි (හෙවත් මතුවීම ගැලීම කෙරෙයි.) **සෙය්‍යථාපි පඨවියං**- පොළොවෙහි මෙන්; **අභිජ්ජමානෙ**- නො බිඳෙන්නා වූ; **උදකෙ+අපි**- ජලයෙහි ද, **ගච්ඡති**- යෙයි; **සෙය්‍යථාපි පක්ඛී සකුණො**- පියාපත් ඇති ලිහිණියකු මෙන්; **ආකාසෙ+අපි**- අහසෙහි ද; **පල්ලඞ්කෙන**- පර්‍ය්‍යඞ්කයෙන්; **කමති**- යෙයි; **එවං මහිද්ධිකෙ**- මේසා මහත් ඍද්ධි ඇති; **එවං**

---

1. අභෙජ්ජමානො-ඇතම්. 2, පඨවියා-ස්‍යා. 3. පක්ඛි-ස්‍යා.

කතමං ච බ්‍රාහ්මණ ආදෙසනාපාටිහාරියං? ඉධ බ්‍රාහ්මණ එකච්චො නිමිත්තෙන ආදිසති : එවම්පි තෙ මනො ඉත්ථම්පි තෙ මනො ඉතිපි තෙ චිත්තන්ති. සො බහුඤ්චෙපි ආදිසති තථෙව තං හොති නො අඤ්ඤථා. ඉධ පන බ්‍රාහ්මණ එකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, අපි ච ඛො මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති- එවම්පි තෙ මනො ඉත්ථම්පි තෙ මනො ඉතිපි තෙ චිත්තන්ති. සො බහුං චෙපි ආදිසති තථෙව තං හොති නො අඤ්ඤථා. ඉධ පන බ්‍රාහ්මණ එකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, නපි මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති, අපි ච ඛො විතක්කයතො විචාරයතො විතක්කවිප්ඵාර[1] සද්දං සුත්වා ආදිසති :- එවම්පි තෙ මනො ඉත්ථම්පි තෙ මනො

මහානුභාවෙ- මේසා මහත් ආනුභාව ඇති; **ඉමෙ චන්දිම සූරියෙ+අපි-** මේ සඳ හිරු දෙදෙන ද; **පාණිනා-** අත්ලෙන්; **පරිමසති-** පරාමර්ශන කෙරෙයි; **පරිමජ්ජති-** පිරිමදී; **යාව බ්‍රහ්ම ලොකා + අපි-** බඹලොව දක්වාත්; **කායෙන-** නිර්මිත කයින්; **වසං වත්තෙති-** තමා වසයෙහි පවත්වයි. -පෙ-

සංලක්ෂ්‍යය :-

"තිරොකුඩ්ඩං, තිරොපාකාරං, තිරොපබ්බතං,"
කුඩ්ඩස්ස පරභාගො තිරොකුඩ්ඩං, පාකාරස්ස පරභාගො තිරොපාකාරං යී අසංඛ්‍ය සමාස විසින් තිරොකුඩ්ඩ, තිරොපාකාර ශබ්දයන් කෙරෙන් පර විභක් තිත්ට 'අං' ආදෙශ වීමෙන් තිරොකුඩ්ඩං යී ද තිරොපාකාරං යී ද සිද්ධ යි. **'තිරොපබ්බතං'** යනු ද මෙසේ මැ යි.

-පෙ- **ඉධ-** මේ ලොකයෙහි; **එකච්චො-** ඇතමෙක්; **තෙ මනො-** තාගේ සිත; **එවං + අපි-** මෙසේ ද වෙයි; **ඉත්ථම්පි තෙ මනො-** යනු ද පර්යාය වචන යි. **තෙ චිත්තං-** තාගේ සිත; **ඉතිපි + ඉති-** මෙසේත් වෙයි කියා; **නිමිත්තෙන-** නිමිති කරණ කොට ගෙන; **ආදිසති-** කියයි. **සො-** හෙතෙම; **චෙ-** ඉදින්; **බහුං + අපි-** බොහෝකොට ද; **ආදිසති-** කියා ද; **තං-** එය; **තථා+එව හොති-**එසේ ම වේ. **නො අඤ්ඤථා-**අන් පරිද්දෙකින් නො වේ. -පෙ- **නිමිත්තෙන-** නිමිති කරණකොටගෙන; **න හෙව ඛො ආදිසති-**නො ම කියයි. **අපි ච ඛො-**එතෙකුදු වුවත්; **මනුස්සානං වා-** මිනිසුන්ගේ හෝ; **අමනුස්සානං වා-** (යක්ෂපිශාචාදි) අමනුෂ්‍යයන්ගේ හෝ; **දෙවතානං වා-** (චාතුම්මහාරාජිකාදි) දෙවියන්ගේ හෝ; **සද්දං සුත්වා-** ශබ්දය අසා; **තෙ මනො-** තාගේ

1, විතක්කවිචාර-ස්‍යා

ඉතිපි තෙ චිත්තන්ති. සො බහුං චෙපි ආදිසති තථෙව තං හොති නො අඤ්ඤථා. ඉධ පන බ්‍රාහ්මණ එකච්චො නහෙව ඛො නිමිත්තෙන ආදිසති, නපි මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති, නපි විතක්කයතො විචාරයතො විතක්කවිප්ඵාර[1] සද්දං සුත්වා ආදිසති, අපි ච ඛො අවිතක්කං අවිචාරං සමාධිං සමාපන්නස්ස චෙතසා චෙතො පරිච්ච පජානාති: යථා ඉමස්ස හොතො මනොසඞ්ඛාරා පණිහිතා ඉමස්ස චිත්තස්ස අනන්තරා අමුන්නාම විතක්කං විතක්කෙස්සතීති. සො බහුං චෙපි ආදිසති තථෙව තං හොති නො අඤ්ඤථා. ඉදං වුච්චති බ්‍රාහ්මණ ආදෙසනා පාටිහාරියං.

සිත; -පෙ- **ඉතිපි + ඉති-** මෙසේත් වේ යයි කියා; **ආදිසති-** කියයි. -පෙ- **මනුස්සානං වා-** මිනිසුන්ගේ හෝ; -පෙ- **නපි ආදිසති-** නො ම කියයි. **අපි ච ඛො-** එතෙකුදු වුවත්; **විතක්කයතො-** විතර්කණය කරන්නහුගේ; **විචාරයතො-** අරමුණෙහි සිත හසුරුවන්නහුගේ; **විතක්කවිප්ඵාරසද්දං-** විතර්කය පැතිරීමෙන් වූ ශබ්දය; **සුත්වා-** අසා; **තෙ මනො-** තාගේ සිත; -පෙ- **විතක්කයතො-** විතර්කණය කරන්නහුගේ; -පෙ- **නපි ආදිසති-** නො ම කියයි. -පෙ- **අවිතක්කං-** විතර්ක රහිත වූ; **අවිචාරං-** විචාර රහිත වූ; **සමාධිං සමාපන්නස්ස-** සමවතට සම වන්නහුගේ; **චෙතො-** සිත; **චෙතසා-** තමාගේ සිතින්; **පරිච්ච-** පිරිසිඳ; **පජානාති-** දනී; (කෙසේ ද?) **ඉමස්ස හොතො-** මේ පින්වත්හුගේ; **මනොසංඛාරා-** චිත්තසංස්කාරයෝ; **යථා පණිහිතා-** යම්සේ පිහිටියාහු ද; (**තථා-** ඒ අයුරින්;) **ඉමස්ස චිත්තස්ස-** මේ සිතට; **අනන්තරා-** අනතුරු ව; **අමුං+නාම විතක්කං-** මෙනම් විතර්කයක්; **විතක්කෙස්සති+ඉති-** විතර්කණය කරන්නේ ය කියා යි. **සො-** හෙතෙම; **චෙ-** ඉදින්; **බහුං + අපි-** බොහෝකොට ද; **ආදිසති-** කියා ද; -පෙ-

සංලක්ෂ්‍යය:-

"නිමිත්තෙන ආදිසති" ආගත නිමිත්තකින් හෝ ගත නිමිත්තකින් හෝ ඕත නිමිත්තකින් හෝ මෙනම් දෙයක් වන්නේ යයි ප්‍රකාශ කිරීම නිමිති බලා කීම නම් වේ. ශේ මෙසේ දතයුතු: එක් රජෙක් මුතු තුනක් මිට මොලවාගෙන ආචාරිනි මගේ අතෙහි කුමක්දැයි පෙරවි බමුණාගෙන් විචාළේ ය. එවිට පෙරවි බමුණු තෙම ඔබිනොබ නිමිති බලන්නේ එකොණෙහි සිකතලකු විසින් අල්වා ගැනීමට වෑයම් කළ මැස්සෙක් ඔහුගෙන් මිදුණු බව දැක මුතු ය යි කී ය. යළි රජතෙම කොතෙක් මුතු දැයි ඇසී ය. එකොණෙහි කුකුළකු තුන්යලක් හැඬලූ හඬ අසා ඒ නිමිතිකොටගෙන මුතු තුනෙකැයි කී ය. මේ ආගත නිමිත්තෙන් කීම යි. අනෙක් නිමිති ද මේ නයින් ම දතයුතු.

---

1 විතක්කවිචාර-ස්‍යා.

කතමං ච බ්‍රාහ්මණ අනුසාසනීපාටිහාරියං? ඉධ බ්‍රාහ්මණ එකච්චො එවමනුසාසති :- එවං විතක්කෙථ මා එවං විතක්කයිත්ථ, එවං මනසි කරොථ මා එවං මනසාකත්ථ, ඉදං පජහථ ඉදං උපසම්පජ්ජ විහරථාති. ඉදං වුච්චති බ්‍රාහ්මණ අනුසාසනී පාටිහාරියං. ඉමානි ඛො බ්‍රාහ්මණ තීණි පාටිහාරියානි.

ඉමෙසං තෙ බ්‍රාහ්මණ තිණ්ණං පාටිහාරියානං කතමං පාටිහාරියං ඛමති අභික්කන්තතරං ච පණීතතරං චාති?

තත්‍ර භො ගොතම යදිදං පාටිහාරියං ඉධෙකච්චො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති :-පෙ- යාවබ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙතීති. ඉදං භො ගොතම පාටිහාරියං යොව[1] තං කරොති සොව තං පටිසංවෙදෙති, යොව[1] තං කරොති තස්ස මෙව[2] තං හොති. ඉදං මෙ භො ගොතම පාටිහාරියං මායාසහධම්මරූපං විය ඛායති.

-පෙ- එවං- මෙසේ; අනුසාසති- අනුශාසනා කෙරෙයි. (කෙසේ ද?) එවං- මෙසේ; විතක්කෙථ- (නෛෂ්ක්‍රම්‍යාදිය) විතර්කණය කරව්; එවං- මෙසේ; මා විතක්කයිත්ථ- (කාමවිතර්කාදිය) විතර්කණය නො කරව්; එවං- මෙසේ; මනසි කරොථ- (අනිත්‍යසංඥාදිය) මෙනෙහි කරව්.-පෙ-මා මනසි+අකත්ථ-(නිත්‍යසංඥාදිය) මෙනෙහි නො කරව්; ඉදං-මේ පඤ්චකාමගුණික රාගය; පජහථ- දුරුකරව්; ඉදං- මේ සතරමාගී ඵලයට; උපසම්පජ්ජ- පැමිණ; විහරථ + ඉති- වාසයකරව් යයි කියා යි. -පෙ-

බ්‍රාහ්මණ-බ්‍රාහ්මණය; තෙ- තට; ඉමෙසං තිණ්ණං පාටිහාරියානං-මේ ත්‍රිවිධ ප්‍රාතිහාර්‍ය්‍යයන් අතුරෙන්; කතමං පාටිහාරියං- කවර නම් ප්‍රාතිහාර්‍ය්‍යයෙක්; අභික්කන්තතරං ච- අතිශයින් යහපත් යයි කියා ද; පණීතතරං ච- අතිශයින් ප්‍රණීත යයි කියා ද; ඛමති + ඉති- රුචිවේ දැයි විචාළසේක.

-පෙ- තත්‍ර- ඒ තුන් ප්‍රාතිහාර්‍ය්‍යයන් අතුරෙහි; ඉධ- මේ ලොකයෙහි; එකච්චො- ඇතමෙක්; -පෙ- වසං වත්තෙති+ ඉති- තමා වසයෙහි පවත්වයි යන; යදිදං පාටිහාරියං- යම් මේ ප්‍රාතිහාර්‍ය්‍යයෙක් ඇද්ද; -පෙ- ඉදං පාටිහාරියං- මේ ප්‍රාතිහාර්‍ය්‍යය; සො+එව- යමෙක් තෙමේ ම; තං- එය; කරොති- කෙරේද; සො+එව-හෙතෙමේ ම; තං- එය; පටිසංවෙදෙති-විඳිනේය; යො+එව-යමෙක් තෙමේ ම; තං-එය; කරොති- කෙරේද; තං-එය; තස්ස + එව හොති- ඔහට ම වේ. -පෙ- මෙ- මට;

---

1. යො ච-ස්‍යා. 2. තස්සෙව-ස්‍යා.

යම්පිදං භො ගොතම පාටිහාරියං ඉධෙකච්චො නිමිත්තෙන ආදිසති : එවම්පි තෙ මනො ඉත්ථම්පි තෙ මනො ඉතිපි තෙ චිත්තන්ති. සො බහුං චෙපි ආදිසති තථෙව තං හොති නො අඤ්ඤථා. ඉධ පන භො ගොතම එකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, අපි ච ඛො මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති : එවම්පි තෙ මනො ඉත්ථම්පි තෙ මනො ඉතිපි තෙ චිත්තන්ති. සො බහුං චෙපි ආදිසති තථෙව තං හොති නො අඤ්ඤථා. ඉධ පන භො ගොතම් එකච්චො න හෙව ඛො නිමිත්තෙන ආදිසති, නපි මනුස්සානං වා අමනුස්සානං වා දෙවතානං වා සද්දං සුත්වා ආදිසති, අපි ච ඛො විතක්කයතො විචාරයතො විතක්කවිප්ඵාර[1] සද්දං සුත්වා ආදිසති. -පෙ- නාපි විතක්කයතො විචාරයතො විතක්කවිප්ඵාරසද්දං[1] සුත්වා ආදිසති, අපි ච ඛො අවිතක්කං අවිචාරං සමාධිං සමාපන්නස්ස චෙතසා චෙතො පරිච්ච පජානාති : යථා ඉමස්ස භොතො මනොසඞ්ඛාරා පණිහිතා ඉමස්ස චිත්තස්ස අනන්තරා අමුන්නාම විතක්කං විතක්කෙස්සතීති. සො බහුං චෙපි ආදිසති තථෙව තං හොති නො අඤ්ඤථාති. ඉදම්පි භො ගොතම පාටිහාරියං යොච[2] තං කරොති සොච තං පටිසංවෙදෙති, යොච[2] තං කරොති තස්සෙව[3] තං හොති. ඉදම්පි භො ගොතම පාටිහාරියං මායාසහධම්මරූපං විය ඛායති.

ඉදං පාටිහාරියං–මේ ප්‍රාතිහාර්‍ය්‍යය; **මායාසහධම්මරූපං විය**–ඉන්ද්‍රජාලයක් මෙන්; **ඛායති**– වැටහෙයි.

සංලක්ෂ්‍යය:-

"මායාසහධම්මරූපං විය ඛායති" බමුණු තෙම චින්තාමණී විද්‍යාව මෙනෙහි කොට ඍද්ධිප්‍රාතිහාර්‍ය්‍යය හා ආදේශනා ප්‍රාතිහාර්‍ය්‍යය, මායාකාර යකු ජලයෙන් තෙල් ද තෙලින් ජලය ද දක්වමින් නානාවිධ රූපයන් පෙන්වන්නාක් මෙන් යි ඉන්ද්‍රජාලයක් වැනි කොට කිය. චින්තාමණී විද්‍යාව වනාහි පරසිත් දතහැකි විද්‍යාවකි. සුදුසු ස්ථාන කාලවේලාදිය බලා ගන්ධාරී විද්‍යාව මෙන් ම මන්ත්‍ර ජපකර සිද්ධ ලැබ පරසිත් දන්නා ශක්තිය ලබාගත හැක්කේ ය. එසේ ම නිමිති මගින් හෝ කී වචනයෙහි අකුරු අනු ව හෝ පරසිත් දතහැකි ය. මේ ශාස්ත්‍රය **"චින්තාමණී විජ්ජා, මාණිකා විජ්ජා"** යන නමින් හඳුන්වනු ලැබේ.

-පෙ- **ඉධ**- මේ ලෝකයෙහි; **එකච්චො**- ඇතමෙක්; -පෙ- **නො අඤ්ඤථා+ඉති**- අන් පරිද්දකින් නො වේ යන; **යං+අපි ඉදං පාටිහාරියං**- යම් මේ ප්‍රාතිහාර්‍ය්‍යයෙක් ඇද්ද; =පෙ- **ඉදං+අපි පාටිහාරියං**- මේ ප්‍රාතිහාර්‍ය්‍යය ද; **යොච**- යමෙක් තෙමේ ම; **තං**- එය; **කරොති**- කෙරේ ද; -පෙ-

---

1 විතක්කවිචාර-ස්‍යා. 2 යො ච-ස්‍යා. 3 තස්ස චෙව-ස්‍යා.

යං ච ඛො ඉදං භො ගොතම පාටිහාරියං ඉධෙකච්චො, එව මනුසාසති : එවං විතක්කෙථ මා එවං විතක්කයිත්ථ, එවං මනසි කරොථ මා එවං මනසාකත්ථ, ඉදං පජහථ ඉදං උපසම්පජ්ජ විහරථාති. ඉදං මෙ භො ගොතම පාටිහාරියං ඛමති ඉමෙසං තිණ්ණං පාටිහාරියානං අභික්කන්තතරං ච පණීතතරං ච.

අච්ඡරියං භො ගොතම අබ්භුතං භො ගොතම යාව සුභාසිත මිදං[1] භොතා ගොතමෙන, ඉමෙහි ච මයං තීහි පාටිහාරියෙහි සමන්නාගතං භවන්තං ගොතමං ධාරෙම. භවං හි ගොතමො අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොති : -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙති. භවං හි ගොතමො අවිතක්කං අවිචාරං සමාධිං සමාපන්නස්ස චෙතසා චෙතො පරිච්ච පජානාති : යථා ඉමස්ස භොතො මනොසඞ්ඛාරා පණිහිතා ඉමස්ස චිත්තස්ස අනන්තරා අමුන්නාම විතක්කං විතක්කෙස්සතීති. භවං හි ගොතමො එවමනුසාසති : එවං විතක්කෙථ මා එවං විතක්කයිත්ථ, එවං මනසි කරොථ මා එවං මනසාකත්ථ, ඉදං පජහථ ඉදං උපසම්පජ්ජ විහරථාති.

-පෙ- **භො ගොතම**- භවත් ගෞතමයන් වහන්ස; **ඉධ**- මේ ලොකයෙහි; -පෙ- **එවං**- මෙසේ; **විතක්කෙථ**- විතර්කණය කරව්; -පෙ- **උපසම්පජ්ජ**- පැමිණ **විහරථ + ඉති**- වාසය කරව් යයි; **එවං**- මෙසේ; **අනුසාසති**- අනුශාසනා කෙරේ යන; **යං ච ඛො ඉදං පාටිහාරියං**- යම් මේ ප්‍රාතිහාර්‍ය්‍යයෙක් ඇද් ද; -පෙ- **ඉදං පාටිහාරියං**- මේ ප්‍රාතිහාර්‍ය්‍යය; **ඉමෙසං තිණ්ණං පාටිහාරියානං** - මේ ත්‍රිවිධ ප්‍රාතිහාර්‍ය්‍යයන් අතුරෙන්; **අභික්කන්තතරං ච**- අතිශයින් යහපත් යයි ද; **පණීතතරං ච**- අතිශයින් ප්‍රණීත යයි ද; **මෙ**- මට; **ඛමති**- රුචි වේ.

-පෙ- **අච්ඡරියං**- ආශ්චර්‍ය්‍යයෙක; -පෙ- **අබ්භුතං**- පෙර නො වූ දෙයෙක; **භොතා ගොතමෙන**- භවත් ගෞතමයන් විසින්; **ඉදං**- මෙය; **යාවසුභාසිතං**- අතිශයින් යහපත් කොට වදාරන ලද්දේ ය. **භවන්තං ගොතමං**-භවත් ගෞතමයන් වහන්සේ; **ඉමෙහි ච තීහි පාටිහාරියෙහි**- මේ තුන් පෙළහරින්; **සමන්නාගතො**- යුක්තවනසේකැයි; **මයං**- අපි; **ධාරෙම**- දරමු. -පෙ- **අනුසාසති + ඉති**- අනුශාසනා කරනසේකැයි සැලකෙළේ ය.

---

1 සුභාසිතං විදං-සත්‍යං.

අද්ධා ඛො ත්‍යායං බ්‍රාහ්මණ ආසජ්ජ උපනීය වාචා භාසිතා. අපි ච ත්‍යාහං ව්‍යාකරිස්සාමි:- අහං හි බ්‍රාහ්මණ අනෙකවිහිතං ඉද්ධිවිධං පච්චනුභොමි: -පෙ- යාව බ්‍රහ්මලොකාපි කායෙන වසං වත්තෙමි. අහං හි බ්‍රාහ්මණ අවිතක්කං අවිචාරං සමාධිං සමාපන්නස්ස චෙතසා චෙතො පරිච්ච පජානාමි: යථා ඉමස්ස භොතො මනොසඞ්ඛාරා පණිහිතා ඉමස්ස චිත්තස්ස අනන්තරා අමුන්නාම විතක්කං විතක්කෙස්සතීති. අහං හි බ්‍රාහ්මණ එවමනුසාසාමි: එවං විතක්කෙථ මා එවං විතක්කයිත්ථ, එවං මනසිකරොථ මා එවං මනසාකත්ථ, ඉදං පජහථ ඉදං උපසම්පජ්ජ විහරථාති.

අත්ථි පන භො ගොතම අඤ්ඤො එකභික්ඛුපි යො ඉමෙහි තීහි පාටිහාරියෙහි සමන්නාගතො අඤ්ඤත්‍ර භොතා ගොතමෙනාති? න ඛො බ්‍රාහ්මණ එකඤ්ඤෙව සතං න ද්වෙ සතානි න තීණි සතානි න චත්තාරි සතානි න පඤ්චසතානි, අථ ඛො භියොව යෙ භික්ඛූ ඉමෙහි තීහි පාටිහාරියෙහි සමන්නාගතාති. කහං පන භො ගොතම එතරහි තෙ භික්ඛූ විහරන්තීති? ඉමස්මිං යෙව ඛො බ්‍රාහ්මණ භික්ඛුසඞ්ඝෙති. අභික්කන්තං භො ගොතම අභික්කන්තං භො ගොතම -පෙ- උපාසකං මං භවං ගොතමො ධාරෙතු අජ්ජතග්ගෙ පාණුපෙතං සරණං ගතන්ති.

බ්‍රාහ්මණවග්ගො පඨමො.

බ්‍රාහ්මණ- බ්‍රාහ්මණය; **අද්ධා ඛො**- ඒකාන්තයෙන් ම; **තෙ**-තා විසින්; **උපනීය**- මාගේ ගුණයන්ට ළංකොට; **අසජ්ජ**-මාගේ ගුණයන් සටා; **අයං වාචා**- මේ වාක් තොමෝ; **භාසිතා**-කියන ලද්දී ය. **අපි ච**- එතෙකුදු වුවත්; **අහං**- මම; **තෙ**- තට; **ව්‍යාකරිස්සාමි**- ප්‍රකාශ කරන්නෙමි. -පෙ- **අහං හි**- මම වනාහි; **අනෙකවිහිතං**- අනෙකවිධ වූ; **ඉද්ධිවිධං**- ඍද්ධිවිධ ඥනය; **පච්චනුභොමි**- වලඳාජනය කරමි. -පෙ-

භොතා ගොතමෙන- භවත් ගෞතමයන් වහන්සේ; **අඤ්ඤත්‍ර**- හැර; **ඉමෙහි තීහි පාටිහාරියෙහි**- මේ ත්‍රිවිධ ප්‍රාතිහාර්‍ය්‍යයෙන්; **සමන්නාගතො**- යුක්ත වූ; **යො අඤ්ඤො එකභික්ඛු+අපි**- යම් අනික් එක භික්ෂුවකුදු; **අත්ථිපන+ඉති**- ඇත්තේ දැයි (විචාලේ ය.)-පෙ- **එකං+එව සතං**- එක්සියයෙක් ද; **න ඛො**-නො වෙත්. **ද්වෙ සතානි**- දෙසියයෙක් ද, **න**- නො වෙත්; **තීණි සතානි**- තුන්සියයෙක් ද; **න**- නො වෙත්; **චත්තාරි සතානි**- සාරසියයෙක් ද; **න**- නො වෙත්; **පඤ්ච සතානි**-

3-2-2.

තීණිමානි භික්ඛවෙ තිත්ථායතනානි යානි පණ්ඩිතෙහි සමනුයුඤ්ජියමානානි සමනුගාහියමානානි සමනුභාසියමානානි පරම්පි ගන්ත්වා අකිරියාය සණ්ඨහන්ති. කතමානි තීණි? සන්ති භික්ඛවෙ එකෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං පුබ්බෙකතහෙතූති. සන්ති භික්ඛවෙ එකෙ සමණ බ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො: යං කිඤ්චායං පුරිස පුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං ඉස්සරනිම්මානහෙතූති. සන්ති භික්ඛවෙ එකෙ සමණ බ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො: යං කිඤ්චායං පුරිස පුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා සබ්බං තං අහෙතු අප්පච්චයාති.

පන්සියයෙක් ද; **න-** නො වෙත්; -පෙ- **අථ ඛො-** වැළිදු; **යෙ භික්ඛූ-** යම් ඒ භික්ෂු කෙනෙක්; **ඉමෙහි තීහි පාටිහාරියෙහි-** මේ ත්‍රිවිධ ප්‍රාතිහාර්‍ය්‍යයෙන්; **සමන්නාගතා-** යුක්තවූවාහු ද; **භිය්‍යො + එව-** (තෙ-ඔවුහු) බොහෝ වෙත් ම යයි; -පෙ- **එතරහි-** දැන්; **තෙ භික්ඛූ-** ඒ භික්ෂූහු; **කහං පන-** කොහි වනාහි; **විහරන්ති+ ඉති-** වාසය කෙරෙත් දැයි; (විචාළේ ය.) -පෙ- **ඉමස්මිං+එව ඛො භික්ඛුසඞ්ඝෙ+ඉති-** මේ භික්ෂු සඞ්ඝයා අතුරෙහි ම යයි; (වදාළසේක.) -පෙ-

සංලක්ෂ්‍යය:-

'අඤ්ඤදත්ථු භොතා ගොතමෙන' 247 වෙනි පිටේ සංලක්ෂ්‍යය බලනු.

පළමුවන බ්‍රාහ්මණ වර්ග්ග යි.

3-2-2.

1. -පෙ- **පණ්ඩිතෙහි-** පණ්ඩිතයන් විසින්; **සමනුයුඤ්ජියමානානි-** (මේ කිනම් දෘෂ්ටිහු දැ යි) පිළිවිසිනු ලබන්නා වූ; **සමනුගාහියමානානි-** (කුමක් හෙතු කොට ගෙන මේ දෘෂ්ටිහු උපන්නාහු දැයි මෙසේ) මනා ව කාරණා ගන්වනු ලබන්නා වූ; **සමනුභාසියමානානි-** (මේ ලාමක දෘෂ්ටිය හරිව් යයි මෙසේ) මනා ව අනුශාසනා කරනු ලබන්නා වූ; **යානි-** (තිත්ථායතනානි) යම් තීර්ථායතන කෙනෙක්; **පරං+අපි ගන්ත්වා-** ආචාර්‍ය්‍ය පරම්පරා ලබ්ධිපරම්පරා ආත්මභාව පරම්පරා දක්වා ගොස්; **අකිරියාය-** අක්‍රියා මාත්‍රයෙක්හි; **සණ්ඨහන්ති-** සිටිද් ද (එසේ වූ);

තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං පුබ්බෙකතහෙතූති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි :– සච්චං කිර තුම්හෙ ආයස්මන්තො එවං වාදිනො එවං දිට්ඨිනො : යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං පුබ්බෙකතහෙතූති? තෙ ච මෙ එවං පුට්ඨා ආමොති පටිජානන්ති, ත්‍යාහං එවං වදාමි : තෙන හායස්මන්තො පාණාතිපාතිනො භවිස්සන්ති පුබ්බෙකතහෙතු, අදින්නාදායිනො භවිස්සන්ති පුබ්බෙකතහෙතු, අබ්‍රහ්මචාරිනො භවිස්සන්ති පුබ්බෙකතහෙතු, මුසාවාදිනො භවිස්සන්ති පුබ්බෙකතහෙතු, පිසුණාවාචා භවිස්සන්ති පුබ්බෙකතහෙතු, ඵරුසාවාචා භවිස්සන්ති පුබ්බෙකත

තානි තිත්ථායතනානි– ඒ තීර්ථායතනයෝ හෙවත් දෙසැට දෘෂ්ටීන්ගේ උත්පත්තිස්ථානයෝ; **ඉමානි තීණි**– මොහු තුන් දෙනෙක් වෙත්; –පෙ– **අයං පුරිසපුග්ගලො**– මේ පුරුෂ පුද්ගල තෙම; **යං කිංචි සුඛං වා**– යම්කිසි සැපයක් හෝ; **යං කිංචි දුක්ඛං වා**– යම්කිසි දුකක් හෝ; **යං කිංචි අදුක්ඛමසුඛං වා**– යම්කිසි උපෙක්ෂාවක් හෝ; **පටිසංවෙදෙති**– විඳිනේ ද; **තං සබ්බං**– ඒ සියල්ල; **පුබ්බෙකතහෙතු+ඉති**– පෙර කළ කර්ම හෙතුවෙන් යයි; **එවං වාදිනො**– මෙබඳු වාද ඇත්තා වූ; **එවං දිට්ඨිනො**– මෙබඳු දෘෂ්ටි ඇත්තා වූ; **එකෙ සමණබ්‍රාහ්මණා**– ඇතම් මහණ බමුණු කෙනෙක්; **සන්ති**– ඇත්තාහු ය; –පෙ– **ඉස්සරනිම්මානහෙතු + ඉති**– ඊශ්වරනිර්මාණ හෙතුවෙන් යයි; –පෙ– **අහෙතු අප්පච්චයා + ඉති**– හෙතු ප්‍රත්‍යය රහිත ව යයි; –පෙ–.

සංලක්ෂ්‍යය :–

තිත්ථායතනානි– මෙහි තීර්ථ ය, තීර්ථකර ය, තීර්ථක ය, තීර්ථකශ්‍රාවක ය යි සතරෙක් වෙති. එහි දෙසැට මිථ්‍යාදෘෂ්ටිය "තීර්ථ" නම් වේ. ඒ දෘෂ්ටි උපදවන්නෝ "තීර්ථකර" නම් වෙත්. ඒ දෘෂ්ටි රුචි කරන්නෝ "තීර්ථක" නම් වෙත්. ඔවුන්ගේ ප්‍රත්‍යයදායකයෝ "තීර්ථකශ්‍රාවක" නම් වෙත්. මෙහි 'ආයතන' ශබ්දය "අස්සානං කම්බොජො ආයතනං" යනාදි තන්හි මෙන් උත්පත්තිස්ථානාර්ථයෙහි පවති.

–පෙ– **තත්‍ර**– ඒ තීර්ථායතනයන් අතුරෙහි; **අයං පුරිසපුග්ගලො**–මේ පුරුෂ පුද්ගල තෙම; –පෙ– **එවං දිට්ඨිනො**-මෙබඳු දෘෂ්ටි ඇත්තා වූ; **යෙ තෙ සමණබ්‍රාහ්මණා**– යම් ඒ මහණ බමුණු කෙනෙක් ඇද් ද: **අහං**– මම; **තෙ**– ඔවුන් කරා; **උපසඞ්කමිත්වා**– එළඹ; **ආයස්මන්තො**– ආයුෂ්මත්නි; **තුම්හෙ**–තෙපි; **අයං පුරිස**

හෙතු, සම්ඵප්පලාපිනො භවිස්සන්ති පුබ්බෙකතහෙතු, අභිජ්ඣාලුනො භවිස්සන්ති පුබ්බෙකතහෙතු, ව්‍යාපන්නචිත්තා භවිස්සන්ති පුබ්බෙකතහෙතු, මිච්ඡාදිට්ඨිකා භවිස්සන්ති පුබ්බෙකතහෙතු. පුබ්බෙ කතං ඛො පන භික්ඛවෙ සාරතො පච්චාගච්ඡතං න හොති ඡන්දො වා වායාමො වා: ඉදං වා කරණීයං ඉදං වා අකරණීයන්ති. ඉති කරණීයාකරණීයෙ ඛො පන සච්චතො ථෙතතො අනුපලබ්භියමානෙ මුට්ඨස්සතීනං අනාරක්ඛානං විහරතං න හොති පච්චත්තං සහධම්මිකො සමණවාදො. අයං ඛො මෙ භික්ඛවෙ තෙසු සමණබ්‍රාහ්මණෙසු එවංවාදිසු එවංදිට්ඨිසු පඨමො සහධම්මිකො නිග්ගහො හොති.

පුග්ගලො- මේ පුරුෂ පුද්ගලතෙම; -පෙ- එවංදිට්ඨිනො+ඉති- මෙබඳු දෘෂ්ටි ඇත්තාහුය යනු; සච්චං කිර- සැබෑ ද යි; එවං වදාමි- මෙසේ කියමි; චෙ- ඉදින්; මෙ- මා විසින්; එවං පුට්ඨා- මෙසේ පුළුවුත්නාලද්දු වූ; තෙ- ඔහු තුමූ; ආම + ඉති- එසේ ය යි; පටිජානන්ති- පිළිත දෙද් ද; අහං- මම; තෙ- ඔවුන්ට; එවං වදාමි- මෙසේ කියමි. (කෙසේ ද?) ආයස්මන්තො- ආයුෂ්මත්නි; තෙන හි- එසේවී නම්; පුබ්බෙකතහෙතු- පෙර කළ කර්‍ම හෙතුවෙන්; පාණාතිපාතිනො භවිස්සන්ති- පණිවා කරන්නාහු වෙත්; පුබ්බෙකතහෙතු- පෙර කළ කර්‍ම හෙතුවෙන්; අදින්නාදායිනො භවිස්සන්ති- නුදුන් දෙය පැහැර ගන්නාහු වෙත්. -පෙ- අබ්‍රහ්මචාරිනො භවිස්සන්ති- අබ්‍රම්සරහු වෙත්. -පෙ- මුසාවාදිනො භවිස්සන්ති- මුසවා කියන්නාහු වෙත්. -පෙ- පිසුණාවාචා භවිස්සන්ති- පිසුණු බස් කියන්නාහු වෙත්. -පෙ- ඵරුසාවාචා භවිස්සන්ති- රළු තෙපුල් කියන්නාහු වෙත්. -පෙ- සම්ඵප්පලාපිනො භවිස්සන්ති- නිසරු තෙපුල් කියන්නාහු වෙත්. -පෙ- අභිජ්ඣාලුනො භවිස්සන්ති- විෂම ලොභ බහුල වූවාහු වෙත්. -පෙ- ව්‍යාපන්නචිත්තා භවිස්සන්ති- ව්‍යාපාද සිත් ඇත්තාහු වෙත්. -පෙ- මිච්ඡාදිට්ඨිකා භවිස්සන්ති- මිථ්‍යාදෘෂ්ටික වෙත් ය (කියා යි.) -පෙ- පුබ්බෙකතං ඛො පන- පෙර කළ කර්‍මය වනාහි; සාරතො- සාර වශයෙන්; පච්චාගච්ඡතං- අදහා ගන්නවුන්ට; ඉදං- මෙය; කරණීයං වා- කටයුතු යයි කියා හෝ; -පෙ- අකරණීයං වා + ඉති- නො කටයුතු යයි කියා හෝ; ඡන්දො වා- කත්තුකාමතා ඡන්දයෙක් හෝ; වායාමො වා- ව්‍යායාමයෙක් හෝ; න හොති- නො වේ; ඉති- මෙසේ; කරණීයාකරණීයෙ ඛො පන-කටයුතු නො කටයුතු දෙය වනාහි; සච්චතො- සත්‍ය වශයෙන්; ථෙතතො- ස්ථිර වශයෙන්; අනුපලබ්භියමානෙ-

තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං ඉස්සරනිම්මානහෙතූති ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි :- සච්චං කිර තුම්හෙ ආයස්මන්තො එවං වාදිනො එවං දිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං ඉස්සරනිම්මානහෙතූති? තෙ ච මෙ එවං පුට්ඨා, ආමොති පටිජානන්ති, ත්‍යාහං එවං වදාමි: තෙන හායස්මන්තො පාණාතිපාතිනො භවිස්සන්ති ඉස්සරනිම්මානහෙතු, -පෙ- මිච්ඡාදිට්ඨිකා භවිස්සන්ති ඉස්සරනිම්මානහෙතු. ඉස්සරනිම්මානං ඛො පන භික්ඛවෙ සාරතො පච්චාගච්ඡතං න හොති ඡන්දො වා වායාමො වා: ඉදං වා කරණීයං ඉදං වා අකරණීයන්ති. ඉති කරණීයාකරණීයෙ ඛො පන සච්චතො ථෙතතො අනුපලබ්භියමානෙ මුට්ඨස්සතීනං අනාරක්ඛානං විහරතං න හොති පච්චත්තං සහධම්මිකො සමණවාදො. අයං ඛො මෙ භික්ඛවෙ තෙසු සමණබ්‍රාහ්මණෙසු එවං වාදිසු එවං දිට්ඨිසු දුතියො සහධම්මිකො නිග්ගහො හොති.

තත්‍ර භික්ඛවෙ යෙ තෙ සමණබ්‍රාහ්මණා එවං වාදිනො එවං දිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං අහෙතු අප්පච්චයාති. ත්‍යාහං උපසඞ්කමිත්වා එවං වදාමි :- සච්චං කිර තුම්හෙ ආයස්මන්තො එවං වාදිනො එවං දිට්ඨිනො: යං කිඤ්චායං පුරිසපුග්ගලො පටිසංවෙදෙති සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා, සබ්බං තං අහෙතු අප්පච්චයාති? තෙ ච මෙ එවං පුට්ඨා ආමොති පටිජානන්ති, ත්‍යාහං එවං වදාමි :- තෙන හායස්මන්තො පාණාතිපාතිනො භවිස්සන්ති අහෙතු අප්පච්චයා, -පෙ- මිච්ඡාදිට්ඨිකා භවිස්සන්ති අහෙතු අප්පච්චයා. අහෙතුං ඛො පන භික්ඛවෙ

නො ලැබෙන කල්හි; **මුට්ඨස්සතීනං**-සිහිමුළා ව; **අනාරක්ඛානං**- සදොර නිරාරක්ෂක ව; **විහරතං**- වාසය කරන්නවුන්ට; **පච්චත්තං**- තම තමා කෙරෙහි; **සහධම්මිකො**- කාරණ සහිත වූ; **සමණවාදො**- අපි ශ්‍රමණයෙමු යන වාදය; **න හොති**- නො වේ. -පෙ- **එවං වාදිසු**- මෙබඳු වාද ඇත්තා වූ: **එවං දිට්ඨිසු**- මෙබඳු දෘෂ්ටි ඇත්තා වූ; **තෙසු සමණබ්‍රාහ්මණෙසු**- ඒ මහණ බමුණන් කෙරෙහි; **මෙ**- මාගේ; **සහධම්මිකො**-සකාරණ වූ; **අයං ඛො**-මෙය වනාහි; **පඨමො නිග්ගහො**-පළමුවන නිග්‍රහය; **හොති**- වේ. -පෙ-

සාරතො පච්චාගච්ඡතං න හොති ඡන්දෝ වා වායාමො වා : ඉදං වා කරණීයං ඉදං වා අකරණීයන්ති. ඉති කරණීයාකරණීයෙ ඛො පන සච්චතො ථෙතතො අනුපලබ්භියමානෙ මුට්ඨස්සතීනං අනාරක්ඛානං විහරතං න හොති පච්චත්තං සහධම්මිකො සමණ වාදෙ. අයං ඛො මෙ භික්ඛවෙ තෙසු සමණබ්‍රාහ්මණෙසු එවං වාදිසු එවංදිට්ඨිසු තතියො සහධම්මිකො නිග්ගහො හොති.

ඉමානි ඛො භික්ඛවෙ තීණි තිත්ථායතනානි යානි තානි පණ්ඩිතෙහි සමනුයුඤ්ජියමානානි සමනුගාහියමානානි සමනු භාසියමානානි පරම්පි ගන්ත්වා අකිරියාය සණ්ඨහන්ති.

අයං ඛො පන භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි.

කතමො ච භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි?

ඉමා ඡ ධාතුයොති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහි. ඉමානි ඡ ඵස්සායතනානීති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසඞ්කිලිට්ඨො අනුප

-පෙ- **විඤ්ඤූහි**- ප්‍රාඥ වූ; **සමණෙහි**- ශ්‍රමණයන් විසින් ද; **බ්‍රාහ්මණෙහි**- බ්‍රාහ්මණයන් විසින් ද; **අනිග්ගහිතො**- නිග්‍රහ නො කරන ලද්ද වූ; **අසඞ්කිලිට්ඨො**- නිකෙලෙශි වූ හෙවත් පිරිසුදු වූ;

-පෙ- **අනුපවජ්ජො**- උපවාදයෙන් මිදුණා වූ; **අප්පතිකුට්ඨො**- ප්‍රතිබාහනය නො කරන ලද්ද වූ හෙවත් පිළිකුල් නො කරන ලද්ද වූ; **අයං ඛො පන ධම්මො**- මේ ධර්‍මය වනාහි; **මයා**- මා විසින්; **දෙසිතො**- දෙසන ලද්දේ ය; -පෙ-

විඤ්ඤූහි- ප්‍රාඥ වූ; **සමණෙහි**- ශ්‍රමණයන් විසින් ද; **බ්‍රාහ්මණෙහි**-බ්‍රාහ්මණයන් විසින් ද; **අනිග්ගහිතො**- නිග්‍රහ නො කරන ලද්ද වූ; -පෙ-**මයා**- මා විසින්; **දෙසිතො**- දෙසන ලද; **ධම්මො**- ධර්‍මය තෙම; **කතමො ච**- කවරේ ද?

වජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහමණෙහි විඤ්ඤූහි. ඉමෙ අට්ඨාරස මනොපවිචාරාති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහමණෙහි විඤ්ඤූහි. ඉමානි චත්තාරි අරියසච්චානීති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො -පෙ- සමණෙහි බ්‍රාහමණෙහි විඤ්ඤූහි.

ඉමා ඡ ධාතුයොති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහමණෙහි විඤ්ඤූහීති, ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං? ඡයිමා භික්ඛවෙ ධාතුයො :- පඨවී ධාතු ආපොධාතු තෙජොධාතු වායොධාතු ආකාසධාතු විඤ්ඤාණ ධාතු. ඉමා ඡ ධාතුයොති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහමණෙහි විඤ්ඤූහීති, ඉති යන්තං වුත්තං ඉද මෙතං පටිච්ච වුත්තං.

ඉමානි ඡ ඵස්සායතනානීති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහමණෙහි විඤ්ඤූහීති, ඉති ඛො පනෙතං වුත්තං.

-පෙ- **විඤ්ඤූහි**- ප්‍රාඥ වූ; -පෙ- **ඉමා ඡ ධාතුයො+ඉති**- මේ ධාතු සදෙනෙකැයි; **ධම්මො**- ධර්මය තෙම; **මයා**- මා විසින්; **දෙසිතො**- දෙසන ලද්දේ ය; -පෙ- **ඉමානි ඡ ඵස්සායතනානි+ ඉති**- මේ ස්පර්ශායතනයෝ සදෙනෙකැයි; -පෙ- **ඉමෙ අට්ඨාරස**- මේ අටළොස්දෙන; **මනොපවිචාරා+ඉති**- මනොපවිචාර ධර්මයෝ ය හෙවත් සිත හැසිරෙන අටළොස් තැනෙකැ යි; -පෙ- **ඉමානි චත්තාරි**- මේ සතරදෙන; **අරියසච්චානි+ඉති**- ආර්‍ය්‍යසත්‍යයෝ යයි; -පෙ-

සංලක්‍ෂ්‍යය:-

"අනිග්ගහිතො, අසඞ්කිලිට්ඨො" න නිග්ගහිතො, න සඞ්කිලිට්ඨො යන තන්හි "අත්‍යන්තාසස තප්පුරිසෙ" යන සූත්‍රයෙන් නකාරයට අකාරදෙශවීමෙන් සිඩ වූ විශෙෂණ සමාස යි.

-පෙ- **ඉමා ඡ ධාතුයො + ඉති**- මේ ධාතු සදෙනෙකැ යි; **මයා**- මා විසින්; **ධම්මො**- ධර්මය තෙම; **දෙසිතො + ඉති**- දෙසනලද්දේ යයි; **ඉති + ඛො පන**- මෙසේ වනාහි; **එතං**- මේ පූර්‍ව වචන යෙක්; **වුත්තං**- කියනලදි; **එතං**- මෙය; **කිං ච පටිච්ච**- කුමක් සඳහා; **වුත්තං**- කියන ලද්දේ ද; -පෙ- **ධාතුයො**- ධාතුහු; **ඉමා ඡ**- මොහු සදෙනෙක් වෙත්. (කවර සදෙනෙක් ද යත්?) **පඨවී ධාතු**- (සථබ්ධ ලක්‍ෂණ වූ) පෘථිවී ධාතුව ය; **ආපොධාතු**-

කිඤ්චේතං පටිච්ච වුත්තං? ඡයිමානි භික්ඛවෙ ඵස්සායතනානි :- චක්ඛුං ඵස්සායතනං, සොතං ඵස්සායතනං, ඝාණං ඵස්සායතනං, ජිව්හා ඵස්සායතනං, කායො ඵස්සායතනං, මනො ඵස්සායතනං. ඉමානි ඡ ඵස්සායතනානීති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති, ඉති යන්තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

ඉමෙ අට්ඨාරස මනොපවිචාරාති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පති කුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති, ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චේතං පටිච්ච වුත්තං? චක්ඛුනා රූපං දිස්වා සොම නස්සට්ඨානියං රූපං උපවිචරති, දොමනස්සට්ඨානීයං රූපං උප විචරති, උපෙක්ඛාට්ඨානියං රූපං උපවිචරති. සොතෙන සද්දං සුත්වා -පෙ- ඝාණෙන ගන්ධං ඝායිත්වා -පෙ- ජිව්හාය රසං සායිත්වා -පෙ- කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා -පෙ- මනසා ධම්මං විඤ්ඤාය සොමනස්සට්ඨානීයං ධම්මං උපවිචරති, දොම

(ආබන්ධන ලක්ෂණ වූ) ආපොධාතුව ය; **තෙජොධාතු**- (පරිපාචන ලක්ෂණ වූ) තෙජොධාතුව ය; **වායොධාතු**- (විත්ථම්භන ලක්ෂණ වූ) වායොධාතුව ය; **ආකාසධාතු**- (අසම්පුට්ඨ ලක්ෂණ වූ) ආකාශධාතුව ය; **විඤ්ඤාණධාතු**- (විජානන ලක්ෂණ වූ) විඥාන ධාතුව ය; (යන සදෙන යි) -පෙ- **ධම්මො**- ධර්මය තෙම; **දෙසිතො + ඉති**- දෙසන ලද්දේ යයි; **ඉති**- මෙසේ; **යං තං**- යම් ඒ පූර්වවචනයක්; **වුත්තං**- කියන ලද්දේ ද **එතං**- මේ පූර්ව වච නය; **ඉදං පටිච්ච**- මේ සඳහා; **වුත්තං**- කියනලදි.

-පෙ- **ඵස්සායතනානි**- ස්පර්ශායතනයෝ; **ඉමානි ඡ**- මොහු සදෙනෙක් වෙත්. (කවර සදෙනෙක් ද යත්?) **චක්ඛුං**- ඇස; **ඵස්සායතනං**- ස්පර්ශායතනයෙක; (හෙවත් ස්පර්ශයන්ට උත්පත්ති ස්ථානයෙක) **සොතං**- කන; **ඵස්සායතනං**- ස්පර්ශායතනයෙක; (හෙවත් ස්පර්ශයන්ට උත්පත්ති ස්ථානයෙක); -පෙ-

-පෙ- **චක්ඛුනා**- චක්ෂුර්විඥානයෙන්; **රූපං දිස්වා**- රූපා ලම්බනයක් දැක; **සොමනස්සට්ඨානියං**- සෞම්නස්‍යට හෙතු වූ; **රූපං**- රූපයෙහි; **උපවිචරති**- සිත හැසිරෙයි; **දොමනස්සට්ඨා නියං**- දෞර්මනස්‍යට හෙතු වූ; -පෙ- **උපෙක්ඛාට්ඨානියං**- උපෙක්ෂා වට හෙතු වූ; -පෙ- **සොතෙන**- ශ්‍රොත්‍ර විඥානයෙන්; **සද්දං**

නස්සට්ඨානීයං ධම්මං උපවිචරති, උපෙක්ඛාට්ඨානියං ධම්මං උපවිචරති. ඉමෙ අට්ඨාරස මනොපවිචාරාති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහීතො අසංකිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහිති, ඉති යං තං වුත්තං ඉදමෙතං පටිච්ච වුත්තං.

ඉමානි චත්තාරි අරියසච්චානීති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහීතො අසංකිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති, ඉති ඛො පනෙතං වුත්තං. කිඤ්චෙතං පටිච්ච වුත්තං? ඡන්නං භික්ඛවෙ ධාතූනං උපාදාය ගබ්භස්සාවක්කන්ති හොති, ඔක්කන්තියා සති නාමරූපං- නාමරූපපච්චයා සළායතනං- සළායතනපච්චයා ඵස්සො- ඵස්සපච්චයා වෙදනා. වෙදියමානස්ස ඛො පනාහං භික්ඛවෙ ඉදං දුක්ඛන්ති පඤ්ඤපෙමි, අයං දුක්ඛසමුදයොති පඤ්ඤපෙමි, අයං දුක්ඛනිරොධොති පඤ්ඤපෙමි, අයං දුක්ඛනිරොධගාමිනිපටිපදාති පඤ්ඤපෙමි.

සුත්වා- ශබ්දයක් අසා; -පෙ- **මනසා**- සිතින්; **ධම්මං**- (සූක්ෂ්ම රූප චිත්ත චෛතසික නිර්වාණ ප්‍රඥප්ති යන) ධර්මාලම්බනයක්; **විඤ්ඤාය**- දැන; **සොමනස්සට්ඨානියං**- සොම්නසට හෙතු වූ; **ධම්මං**- ධර්මයෙහි; **උපවිචරති**- සිත හැසිරෙයි; -පෙ-

සංලක්ෂ්‍යය:-

“**රූපං උපවිචරති**” මෙහි උප, වි, යන උපසර්ගයන් පූර්වකොට “චර” ගතිභක්ඛණෙ යන ධාතූහුගේ යොගය හෙයින් **රූපං** යනු සප්තම්‍යර්ථයෙහි විතීයා විභක්ති යි.

-පෙ- **ඡන්නං ධාතූනං උපාදාය**- සවැදෑරුම් ධාතූන් නිසා; **ගබ්භස්ස**- ගර්භයාගේ; **අවක්කන්ති හොති**- පැමිණීම වේ; (හෙවත් ගර්භොත්පත්තිය වේ). **ඔක්කන්තියා සති**- ගර්භාවක්‍රාන්තිය ඇති කල්හි (හෙවත් පිළිසිඳ ගැන්ම ඇති කල්හි); **නාමරූපං**- නාමරූප දෙක වේ. **නාමරූපපච්චයා**- නාමරූප ප්‍රත්‍යයෙන්; **සළායතනං**- (චක්ෂුරාදි) ෂඩ්විධ ආධ්‍යාත්මිකායතනය වේ. **සළායතනපච්චයා**- ෂඩායතන ප්‍රත්‍යයෙන්; **ඵස්සො**- ස්පර්ශය වේ. **ඵස්සපච්චයා**- ස්පර්ශප්‍රත්‍යයෙන්; **වෙදනා**- ත්‍රිවිධ වූ වේදනාව වේ. -පෙ- **අහං**- මම; **වෙදියමානස්ස ඛො පන**- විඳිනු ලබන්නාහට වනාහි; **ඉදං දුක්ඛං + ඉති**- මේ දුක්ඛසත්‍යය යි; **පඤ්ඤපෙමි**- පනවමි; **අයං**- මේ තෘෂ්ණා තොමෝ; *දුක්ඛසමු

කතමඤ්ච භික්ඛවෙ දුක්ඛං අරියසච්චං? ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා ව්‍යාධිපි දුක්ඛො මරණම්පි දුක්ඛං සොකපරිදෙවදුක්ඛදෙමනස්සුපායාසාපි දුක්ඛා යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා. ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛං අරියසච්චං.

දයො + ඉති– දුඃඛසමුදය සත්‍යය යි; –පෙ– අයං– මේ මූල කී සත්‍ය දෙදෙනාගේ අත්‍යන්ත නිරොධය; දුක්ඛනිරොධො + ඉති– දුඃඛනිරොධ සත්‍යය යි; –පෙ– අයං– මේ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය; –පෙ–

සංලක්ෂ්‍යය:–

"ගබ්භස්සාවක්කන්ති හොති" චක්ඛුරාදි සවැදෑරුම් ධාතූන් නිසා ගර්භොත්පත්තිය වේ. ගර්භ නම් නිරය ගබ්භ ය, තිරච්ඡාන යොනි ගබ්භ ය, පෙත්තිවිසය ගබ්භ ය, මනුස්ස ගබ්භ ය, දෙවගබ්භය යි නානාවිධ වෙත්. ඔවුනතුරෙන් මෙතැන්හි මනුස්සගබ්භය අභිප්‍රෙත යි. එහි මවු පිය දෙදෙනාගේ සමවාය ය, මවු තොමෝ ඍතු ඇත්තියක් වීම ය, ගන්ධබ්බයෙක් එළඹ සිටීම ය යන මේ කාරණාත්‍රයයාගේ එක්වීමෙන් මනුෂ්‍යගර්භොත්පත්තිය වන්නේ ය. මෙහි මවු පිය දෙදෙනාගේ සමවාය යනුවෙන් ශුක්ලයාගේ සම්භවය ද, මවු තොමෝ ඍතු ඇත්තියක් වීම ය යනුවෙන් ශොනිතයාගේ සම්භවය ද දක්වන ලදි. ගන්ධබ්බ යන නාමයෙන් ප්‍රතිසන්ධිය කරා කර්ම බලයෙන් පැමිණෙන සත්ව තෙම අභිප්‍රෙත යි. මෙහි ගන්තබ්බ යී කියයුතු තැන 'ත'කාරයට ධකාර වීමෙන් ගන්ධබ්බ යී සිද්ධ වී තිබේ. නොහොත් ගන්ධබ්බ නම් නෘත්‍ය ශාලාවල රඟුම් දක්වන්නෝ ය. ඔවුන් මෙන් ඒ ඒ භවයන්හි උත්පත්ති වශයෙන් නොයෙක් වෙස් ගන්නා බැවින් ප්‍රතිසන්ධිය කරා එළඹෙන සත්ව තෙමේ ද ගන්ධබ්බ නාමයෙන් දක්වන ලදි. හෙතෙම මවු පියන්ගේ සමවායක්ෂණයෙහි හෝ එයින් පසු ව සද්දවසක් ඇතුළතදී හෝ මාතෘ කුක්ෂියෙහි ප්‍රතිසන්ධිග්‍රහණය කරන්නේ ය.

–පෙ– ජාති + අපි– ජාති තොමෝ ද; දුක්ඛා– දුක්වන්නී ය; ජරා + අපි– ජරා තොමෝ ද; දුක්ඛා– දුක්වන්නී ය; ව්‍යාධි+ අපි– ව්‍යාධිය ද; දුක්ඛො– දුක්වන්නේ ය. මරණං + අපි– මරණය ද; –පෙ– සොකා– ශොක කිරීම ය; පරිදෙව– විලාප කීම ය; දුක්ඛ– කායික දුඃඛ ය; දෙමනස්ස– මානසික දුඃඛ ය; උපායාසා + අපි– බලවත් ආයාස ය යන මොහු ද; –පෙ– යං + අපි + ඉච්ඡං– යම් කැමති දෙයක් හෝ; න ලභති– නො ලබා ද; තං + අපි– එය ද; –පෙ– සංඛිත්තෙන– සංක්ෂෙපයෙන්; පඤ්ච+උපාදානක්ඛන්ධා– උපාදාන ස්කන්ධයෝ පස්දෙන; –පෙ–

කතමඤ්ච භික්ඛවෙ දුක්ඛසමුදයං අරියසච්චං? අවිජ්ජාපච්චයා සඞ්ඛාරා, සඞ්ඛාරපච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණපච්චයා නාමරූපං, නාමරූපපච්චයා සළායතනං, සළායතනපච්චයා ඵස්සො, ඵස්සපච්චයා වෙදනා, වෙදනාපච්චයා තණ්හා, තණ්හාපච්චයා උපාදානං, උපාදානපච්චයා භවො, භවපච්චයා ජාති, ජාතිපච්චයා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා සම්භවන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස සමුදයො හොති. ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛසමුදයං අරියසච්චං.

කතමඤ්ච භික්ඛවෙ දුක්ඛනිරොධං අරියසච්චං? අවිජ්ජාය ත්වෙව අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො, සඞ්ඛාරනිරොධා විඤ්ඤාණනිරොධො, විඤ්ඤාණනිරොධා නාමරූප

සංලක්ෂ්‍යය :-

"ඔක්කන්තියා සති නාමරූපං" විඤ්ඤාණපච්චයා නාමරූපං යි වදළ තැන වස්තුදසක, කායදසක, භාවදසක වශයෙන් දසක තුනෙක් ද, තුන් අරූපස්කන්ධයෝ දැයි තෙතිස් නාමරූප ධර්මකෙනෙක් ගන්නා ලදහ. මෙහි "ඔක්කන්තියා සති නාමරූපං" යි වදළ තැන විඥානස්කන්ධයත් සහිත සතර අරූපස්කන්ධයෝ ද වස්තු දසකාදී දසක තුන ද ගෙන ගර්භශෙය්‍යක සත්වයන්ගේ ප්‍රතිසන්ධික්ෂණයෙහි සූතිස් නාමරූප ධර්මකෙනෙක් ගන්නා ලදහ යි දතයුතු.

අවිජ්ජාපච්චයා– අවිද්‍යාප්‍රත්‍යයෙන්; **සඞ්ඛාරා**– ලෞකික කුශලාකුශල චේතනාවෝ වෙත්. **සඞ්ඛාරපච්චයා**– සංස්කාර ප්‍රත්‍යයෙන්; **විඤ්ඤාණං**– (ප්‍රතිසන්ධි වශයෙන් එකුන්විසි වැදෑරුම් වූ ද ප්‍රවෘත්ති වශයෙන් දෙතිස් වැදෑරුම් වූ ද) විපාක විඥානය වේ. **විඤ්ඤාණපච්චයා**– විඥාන ප්‍රත්‍යයෙන්; **නාමරූපං**– නාමරූප දෙක වේ. –පෙ– **වෙදනාපච්චයා**– වෙදනා ප්‍රත්‍යයෙන්; **තණ්හා**-(කාමතෘෂ්ණාදි වශයෙන් ත්‍රිවිධ වූ) තෘෂ්ණාව වේ. **තණ්හාපච්චයා**– තෘෂ්ණා ප්‍රත්‍යයෙන්; **උපාදානං**–(කාමූපාදානාදි වශයෙන් චතුර්විධ වූ) උපාදානය වේ. **උපාදානපච්චයා**– උපාදාන ප්‍රත්‍යයෙන්; **භවො**–(නවවිධ වූ) උත්පත්ති භවය වේ. **භවපච්චයා**– භව ප්‍රත්‍යයෙන්; **ජාති**– ස්කන්ධයන්ගේ පහළවීම වේ. **ජාතිපච්චයා**– ජාති ප්‍රත්‍යයෙන්; **ජරාමරණං**– ජරාමරණය ද; **සොකපරිදෙවදුක්ඛදොමනස්සුපායාසා**– ශොකපරිදෙව දුඃඛ දෞර්මනස්‍යෝපායාස යන මොහු; **සම්භවන්ති**– වෙත්. **එවං**– මේ යථොක්ත වූ ප්‍රත්‍යය පරම්පරා වශයෙන් ම; **කෙවලස්ස**– සියලු; **එතස්ස දුක්ඛක්ඛන්ධස්ස**– මේ වෘත්තදුඃඛ සමූහයාගේ; **සමුදයො හොති**– උත්පත්තිය වේ. –පෙ–

නිරොධො, නාමරූපනිරොධා සළායතනනිරොධො, සළායතන නිරොධා ඵස්සනිරොධො, ඵස්සනිරොධා වෙදනානිරොධො, වෙදනානිරොධා තණ්හානිරොධො, තණ්හානිරොධා උපාදාන නිරොධො, උපාදානනිරොධා භවනිරොධො, භවනිරොධා ජාති නිරොධො, ජාතිනිරොධා ජරාමරණං සොකපරිදෙවදුක්ඛදෙම නස්සුපායාසා නිරුජ්ඣන්ති. එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස නිරොධො හොති. ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛනිරොධං අරියසච්චං.

කතමඤ්ච භික්ඛවෙ දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්චං? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො: සෙය්‍යථිදං? සම්මා දිට්ඨි, සම්මාසඞ්කප්පො, සම්මාවාචා, සම්මාකම්මන්තො, සම්මා ආජීවො, සම්මාවායාමො, සම්මාසති, සම්මාසමාධි. ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛනිරොධගාමිනීපටිපදා අරියසච්චං. ඉමානි චත්තාරි අරියසච්චානීති භික්ඛවෙ මයා ධම්මො දෙසිතො අනිග්ගහිතො අසඞ්කිලිට්ඨො අනුපවජ්ජො අප්පතිකුට්ඨො සමණෙහි බ්‍රාහ්මණෙහි විඤ්ඤූහීති, ඉති යන්තං වුත්තං ඉද මෙතං පටිච්ච වුත්තන්ති.

2. තිණිමානි භික්ඛවෙ අමාතාපුත්තිකානි භයානීති අස්සුතවා පුථුජ්ජනො භාසති. කතමානි තීණි?

-පෙ- අවිජ්ජාය ත්වෙව- අවිද්‍යාවගේ ම; අසෙසවිරාග නිරොධා- නිරවශෙෂ විරාග හෙතුවෙන් හා නිරොධ හෙතුවෙන්; සඞ්ඛාරනිරොධො- සංස්කාරයන්ගේ නිරොධය වේ. සඞ්ඛාරනිරොධා- සංස්කාරයන්ගේ නිරොධ හෙතුවෙන්; විඤ්ඤාණනිරොධො- විපාක විඥානයාගේ නිරොධය වේ. විඤ්ඤාණනිරොධා- විපාක විඥානයාගේ නිරොධහෙතුවෙන්; නාමරූපනිරොධො-නාමරූප දෙදෙනාගේ නිරොධය වේ. -පෙ-

-පෙ- අයං අරියො අට්ඨඞ්ගිකො මග්ගො එව- මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය ම වේ. -පෙ-

සංලක්ෂ්‍යය:-

"අසෙසවිරාගනිරොධා සඞ්ඛාරනිරොධො" මෙහි අසෙස විරාග නිරොධා යනු අත්‍යයක්හුගේ සිඹියට කාරණ වූ හෙතුයෙහි පඤ්චමී විභක්ති යි. එලෙසින් ම මෙහි අර්ථ ද දක්වන ලදි.

2. -පෙ- ඉමානි තීණි- මොවුන් තුන්දෙන; අමාතාපුත්තිකානි භයානි+ඉති- අමාතාපුත්තික භය යයි (හෙවත් මාතෘ පුත්‍ර දෙදෙන ඔවුනොවුන් රැකගත නො හැක්කා වූ භය යයි;)

හොති ඛො සො භික්ඛවෙ සමයො යං මහාඅග්ගිඩාහො උට්ඨාති. මහාඅග්ගිඩාහෙ ඛො පන භික්ඛවෙ උට්ඨිතෙ තෙන ගාමාපි ඩය්හන්ති නිගමාපි ඩය්හන්ති නගරාපි ඩය්හන්ති, ගාමෙසුපි ඩය්හමානෙසු නිගමෙසුපි ඩය්හමානෙසු නගරෙසුපි ඩය්හමානෙසු තත්‍ථ මාතාපි පුත්තං න පටිලභති පුත්තොපි මාතරං න පටිලභති. ඉදං භික්ඛවෙ පඨමං අමාතාපුත්තිකං භයන්ති අස්සුතවා පුථුජ්ජනො භාසති.

පුන ච පරං භික්ඛවෙ හොති ඛො සො සමයො යං මහාමෙඝො උට්ඨාති. මහාමෙඝෙ ඛො පන භික්ඛවෙ උට්ඨිතෙ මහාඋදකවාහකො සඤ්ජායති. මහාඋදකවාහකෙ සඤ්ජාතෙ තෙන ගාමාපි වුය්හන්ති නිගමාපි වුය්හන්ති නගරාපි වුය්හන්ති, ගාමෙසුපි වුය්හමානෙසු නිගමෙසුපි වුය්හමානෙසු නගරෙසුපි වුය්හමානෙසු තත්‍ථ මාතාපි පුත්තං න පටිලභති පුත්තොපි මාතරං න පටිලභති. ඉදං භික්ඛවෙ දුතියං අමාතාපුත්තිකං භයන්ති අස්සුතවා පුථුජ්ජනො භාසති.

අස්සුතවා පුථුජ්ජනො– ආගම අධිගම විරහිත පෘථග්ජන තෙම; **භාසති**– කියයි. –පෙ–

යං– යම් කාලෙක්හි; **මහාඅග්ගිඩාහො**– මහත් ලැව්ගින් තෙක්; **උට්ඨාති**– නැගේ ද (හෙවත් හටගනී ද;) **සො සමයො**– එබඳු කාලයෙක් තෙම; **හොති ඛො**– වන්නේ ම ය. –පෙ– **මහාඅග්ගිඩාහෙ ඛො පන**– මහත් ලැව්ගින්න වනාහි; **වුට්ඨිතෙ**– නැගිකල්හි; **තෙන**– එයින්; **ගාමා + අපි**– ගම් ද; **ඩය්හන්ති**– දැවෙත්; **නිගමා + අපි**– නියම්ගම් ද; –පෙ– **නගරා + අපි**– නගර ද; –පෙ– **ගාමෙසු ඩය්හමානෙසු + අපි**– ගම් දැවෙන කල්හි ද; –පෙ– **තත්‍ථ**– එහි; **මාතා + අපි**– මව් තොමෝ ද; **පුත්තං**– පුත්‍රයා; **න පටිලභති**– රකින්ට නො ලැබෙයි; **පුත්තො + අපි**– පුත්‍ර තෙමේ ද; **මාතරං**– මව; **න පටිලභති**– රකින්ට නො ලැබෙයි; –පෙ– **ඉදං පඨමං**– මේ පළමුවන; **අමාතාපුත්තිකං**– මාතෘ පුත්‍ර දෙදෙන ඔවුනොවුන් රැකගත නො හැක්කා වූ; **භයං + ඉති**– භය යයි; **අස්සුතවා පුථුජ්ජනො**– අශ්‍රැතවත් පෘථග්ජන තෙම; **භාසති**– කියයි.

–පෙ– **යං**– යම් කාලෙක්හි; **මහාමෙඝො**– මහා මෙඝයෙක් තෙම; **උට්ඨාති**– නැගේ ද; **සො සමයො**– එබඳු කාලයෙක්; **හොති ඛො**– වන්නේ ම ය. –පෙ– **මහාමෙඝෙ ඛො පන**– මහා මෙඝය වනාහි; **උට්ඨිතෙ**– නැගිකල්හි; **මහාඋදක**

පුන ච පරං භික්ඛවේ හොති බො සො සමයො යං භයං හොති අටවිසංකොපො, චක්කසමාරූළ්හා ජානපදා පරියායන්ති. භයෙ බො පන භික්ඛවෙ සති අටවිසංකොපෙ චක්කසමාරූළ්හෙසු ජානපදෙසු පරියායන්තෙසු තත්ථ මාතාපි පුත්තං න පටිලභති පුත්තොපි මාතරං න පටිලභති. ඉදං භික්ඛවෙ තතියං අමාතාපුත්තිකං භයන්ති අස්සුතවා පුථුජ්ජනො භාසති. ඉමානි බො භික්ඛවෙ තීණි අමාතාපුත්තිකානි භයානීති අස්සුතවා පුථුජ්ජනො භාසති.

තානි බො පනිමානි භික්ඛවෙ තීණි සමාතාපුත්තිකානි යෙව භයානි අමාතාපුත්තිකානි භයානීති අස්සුතවා පුථුජ්ජනො භාසති. කතමානි තීණි?

හොති බො සො භික්ඛවෙ සමයො යං මහාඅග්ගිඩාහො උට්ඨාති. මහාඅග්ගිඩාහෙ බො පන භික්ඛවෙ උට්ඨිතෙ තෙන ගාමාපි -පෙ- නගරාපි ඩය්හන්ති. ගාමෙසුපි ඩය්හමානෙසු නිගමෙසුපි ඩය්හමානෙසු නගරෙසුපි ඩය්හමානෙසු හොති බො සො සමයො යං කදාචි කරහචි මාතාපි පුත්තං පටිලභති පුත්තොපි මාතරං පටිලභති. ඉදං භික්ඛවෙ පඨමං සමාතාපුත්තිකඤ්ඤෙව භයං අමාතාපුත්තිකං භයන්ති අස්සුතවා පුථුජ්ජනො භාසති.

පුන ච පරං භික්ඛවෙ හොති බො සො සමයො යං මහාමෙඝො උට්ඨාති. මහාමෙඝෙ බො පන භික්ඛවෙ උට්ඨිතෙ

වාහකො- මහත් වූ සැඩ වතුරෙක්; **සඤ්ජායති**- හටගනී; **මහාඋදකවාහකෙ**- මහත් වූ සැඩ වතුර; **සඤ්ජාතෙ**- හටගත් කල්හි; **තෙන**- එයින්; **ගාමා + අපි**- ගම් ද; **වුය්හන්ති**- ගෙන යනු ලැබෙත්. -පෙ- **ගාමෙසු**- ගම්; **වුය්හමානෙසු + අපි**- ගෙන යනු ලබන කල්හි ද; -පෙ-

-පෙ- **යං**- යම් කලෙක්හි; **අටවිසංකොපො**- වල් වසන සොරුන්ගේ කොපයෙන් වූ; **භයං හොති**- බියෙක් වේ ද; **චක්කසමාරූළ්හා**- ඊර්යාපථ චක්‍රාදියට නැංගා වූ; **ජානපදා**- ජනපද වාසීහු; **පරියායන්ති**- ඔබිනොබ යෙද් ද; **සො සමයො**- එබඳු කාලයෙක්; **හොති බො**- වන්නේ ම ය. -පෙ- **අටවිසංකොපෙ**- වල වසන සොරුන්ගේ කොපයෙන් වූ; **භයෙ බො පන සති**- බියක් ඇති කල්හි වනාහි; **චක්කසමාරූළ්හෙසු**- ඊර්යාපථ චක්‍රාදියට නැංගා වූ; **ජානපදෙසු**- ජනපද වාසීන්; **පරියායන්තෙසු**- ඔබිනොබ යන කල්හි; -පෙ-

මහාඋදකවාහකො සඤ්ජායති. මහාඋදකවාහකෙ සඤ්ජාතෙ තෙන ගාමාපි වුය්හන්ති නිගමාපි වුය්හන්ති නගරාපි වුය්හන්ති. ගාමෙසුපි වුය්හමානෙසු නිගමෙසුපි වුය්හමානෙසු නගරෙසුපි වුය්හමානෙසු හොති ඛො සො සමයො යං කදාචි කරහචි මාතාපි පුත්තං පටිලභති පුත්තොපි මාතරං පටිලභති. ඉදං ඛො පන භික්ඛවෙ දුතියං සමාතාපුත්තිකඤ්ඤෙව භයං අමාතාපුත්තිකං භයන්ති අස්සුතවා පුථුජ්ජනො භාසති.

පුන ච පරං භික්ඛවෙ හොති ඛො සො සමයො යං භයං හොති අටවිසඞ්කොපො. චක්කසමාරූළ්හා ජානපදා පරියායන්ති. භයෙ ඛො පන භික්ඛවෙ සති අටවිසඞ්කොපෙ චක්කසමාරූළ්හෙසු ජානපදෙසු පරියායන්තෙසු හොති ඛො සො සමයො යං කදාචි කරහචි මාතාපි පුත්තං පටිලභති පුත්තොපි මාතරං පටිලභති. ඉදං භික්ඛවෙ තතියං සමාතාපුත්තිකඤ්ඤෙව භයං අමාතාපුත්තිකං භයන්ති අස්සුතවා පුථුජ්ජනො භාසති.

-පෙ- **සමාතාපුත්තිකානි**- මාතෘ පුත්‍රයන් සහිත වූ; **තානි ඛො පන + ඉමානි තීණි**- ඒ මේ බියතුන වනාහි; **අමාතාපුත්තිකානි භයානි + ඉති**- අමාතා පුත්තික භය යයි; **අස්සුතවා පුථුජ්ජනො**- අශ්‍රැතවත් පෘථග්ජන තෙම; **භාසති**- කියයි.

-පෙ- **යං**- යම්හෙයකින්; **කදාචි කරහචි**- කිසියම් කලෙක්හි; **මාතා + අපි**- මවුතොමෝ ද; **පුත්තං**- පුත්‍රයා; **පටිලභති**- රැකීමට ලැබෙයි. -පෙ-

1 සංලක්ෂ්‍යය :-

"අටවිසඞ්කොපො" මෙහි අටවි යනුවෙන් වනයෙහි වාසය කරන්නා වූ සොරහු අභිප්‍රෙත යි. පල්සොරු යනු ද මොවුන්ට වහරනා නමෙකි. යම් කලෙක ඒ වනවාසී සොරහු ජනපදවලට පැමිණ බලාත්කාරයෙන් මනුෂ්‍යයන්ගේ සියලු වස්තූන් පැහැරගෙන ගම් නියම්ගම් රජදනව් විනාශ කෙරෙත් නම් ඒ අටවිසඞ්කොප නමි. **අටවියා සඞ්කොපො අටවිසඞ්කොපො** යනු **තත්පුරුෂ සමාස යි.**

2 සංලක්ෂ්‍යය :-

"චක්කසමාරූළ්හා" මෙහි චක්‍ර යනුවෙන් ඊර්ෂ්‍යාපථ චක්‍රය හා යාන චක්‍රය ද ගන්නා ලැබේ. අටවිසඞ්කොප භයාදිය පැමිණි කල්හි රථ වාහන ඇති මනුෂ්‍යයෝ තමන්සතු භාණ්ඩ ඒ රථවාහන වලින් රැගෙන ආරක්ෂා ස්ථාන කරා පලායෙත්. එසේ රථවාහන නැති මනුෂ්‍යයෝ තමන් සතු භාණ්ඩ කදින් හෝ හිසින් රැගෙන ක්ෂෙමස්ථාන කරා පලායෙත්. මෙසේ ඊර්ෂ්‍යාපථ චක්‍රයෙන් හෝ යානචක්‍රයෙන් පලායන බැවින් මිට "චක්කසමාරූළ්හ" යි කියනු ලැබේ.

ඉමානි ඛො භික්ඛවෙ තීණි සමාතාපුත්තිකානියෙව භයානි අමාතාපුත්තිකානි භයානීති අස්සුතවා පුථුජ්ජනො භාසති.

තීණිමානි භික්ඛවෙ අමාතාපුත්තිකානි භයානි. කතමානි තීණි? ජරාභයං, ව්‍යාධිභයං, මරණභයං.

න භික්ඛවෙ මාතා පුත්තං ජීරමානං එවං ලභති: අහං ජීරාමි, මා මෙ පුත්තො ජීරීති. පුත්තො වා පන මාතරං ජීරමානං න. එවං ලභති: අහං ජීරාමි මා මෙ මාතා ජීරීති.

න භික්ඛවෙ මාතා පුත්තං ව්‍යාධියමානං එවං ලභති: අහං ව්‍යාධියාමි, මා මෙ පුත්තො ව්‍යාධියීති. පුත්තො වා පන මාතරං ව්‍යාධියමානං න එවං ලභති: අහං ව්‍යාධියාමි, මා මෙ මාතා ව්‍යාධියීති.

න භික්ඛවෙ මාතා පුත්තං මිය්‍යමානං එවං ලභති: අහං මිය්‍යාමි, මා මෙ පුත්තො මීයීති. පුත්තො වා පන මාතරං මිය්‍යමානං න එවං ලභති: අහං මිය්‍යාමි, මා මෙ මාතා මීයීති. ඉමානි ඛො භික්ඛවෙ තීණි අමාතාපුත්තිකානි භයානි.

අත්‍ථි භික්ඛවෙ මග්ගො අත්‍ථි පටිපදා ඉමෙසඤ්ච තිණ්ණං සමාතාපුත්තිකානං භයානං ඉමෙසඤ්ච තිණ්ණං අමාතාපුත්තිකානං භයානං පහානාය සමතික්කමාය සංවත්තන්ති.

-පෙ- **ජරාභයං**- ජරාව නිසා උපදනා භය ය; **ව්‍යාධිභයං**- ව්‍යාධිය නිසා උපදනා භය ය; **මරණභයං**- මරණය නිසා උපදනා භය ය (යන තුන යි).

-පෙ- **මාතා**- මවුතොමෝ; **ජීරමානං**- දිරන්නා වූ; **පුත්තං**- පුත්‍රයා දූක; **එවං**- මෙබඳු ප්‍රාර්ථනාවක් කොට රැකගන්ට; **න පටිලභති**- නො ලැබෙයි. (කෙබඳු ප්‍රර්ථනාවෙක් ද යත්) **අහං**- මම; **ජීරාමි**- දිරමි; **මෙ පුත්තො**- මාගේ පුත්‍ර තෙම; **මා අජීරි + ඉති**- නො දිරුවා (යන ප්‍රාර්ථනාවෙනි); **පුත්තො වා පන**- පුත්‍ර තෙමේ හෝ; **ජීරමානං**- දිරන්නා වූ; **මාතරං**- මව දූක; **එවං**- මෙබඳු ප්‍රාර්ථනාවක් කොට රැකගන්ට; **න පටිලභති**- නො ලැබෙයි. -පෙ-

-පෙ- **මාතා**- මවු තොමෝ; **ව්‍යාධියමානං**- ව්‍යාධියෙන් පෙළෙන්නා වූ; **පුත්තං**- පුත්‍රයා දූක; -පෙ- **අහං**- මම; **ව්‍යාධියාමි**- ව්‍යාධියෙන් පෙළෙමි; -පෙ- **මා ව්‍යාධියි + ඉති**- ව්‍යාධියෙන් නො පෙළේවා (යන ප්‍රාර්ථනාවෙනි).

කතමො ච භික්ඛවෙ මග්ගො කතමා පටිපදා ඉමෙසඤ්ච තිණ්ණං සමාතාපුත්තිකානං භයානං ඉමෙසඤ්ච තිණ්ණං අමාතාපුත්තිකානං භයානං පහානාය සමතික්කමාය සංවත්තති? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො : සෙය්‍යථීදං? සම්මාදිට්ඨි, -පෙ- සම්මාසමාධි. අයං ඛො භික්ඛවෙ මග්ගො අයං පටිපදා ඉමෙසඤ්ච තිණ්ණං සමාතාපුත්තිකානං භයානං ඉමෙසඤ්ච තිණ්ණං අමාතාපුත්තිකානං භයානං පහානාය සමතික්කමාය සංවත්තතීති.

3. එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරමානො මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං යෙන වෙනාගපුරං නාම කොසලානං බ්‍රාහ්මණගාමො තදවසරි.

-පෙ- මිය්‍යමානං-මියයන්නා වූ; පුත්තං-පුත්‍රයා දක; -පෙ-

-පෙ- සමාතාපුත්තිකානං- සමාතාපුත්තික වූ; ඉමෙසං ච තිණ්ණං භයානං- මේ භය තුන්දෙනාගේ ද; අමාතාපුත්තිකානං- අමාතාපුත්තික වූ; -පෙ- පහානාය- ප්‍රහාණය පිණිස ද; සමතික්කමාය- ඉක්මවීම පිණිස ද; සංවත්තති- පවතී ද (එබඳු වූ); මග්ගො-මාර්ගයෙක් තෙම; අත්ථි- ඇත්තේ ය; පටිපදා- ප්‍රතිපදාවක් තොමෝ; අත්ථි- ඇත්තී ය.

-පෙ- සමාතාපුත්තිකානං- සමාතාපුත්තික වූ; -පෙ- සමතික්කමාය- ඉක්මවීම පිණිස ද; සංවත්තති- පවතී ද; (එබඳු වූ) මග්ගො- මාර්ගය තෙම; කතමො ච?-කවරේ ද? -පෙ- අරියො- ආර්‍ය්‍ය වූ; අට්ඨඞ්ගිකො- අඞ්ග අටක් ඇත්තා වූ; අයං+එව මග්ගො- මේ මාර්ගය ම වේ. -පෙ-

සංලක්‍ෂ්‍යය :-

සමාතාපුත්තිකානං- සහමාතාපුත්තෙන වත්තන්තෙ සත්තන්ති "සහස්ස සොඤ්ඤදෙසො" යන මුගලන් සූත්‍රයෙන් සහශබ්දයට සකාරාදෙශ වැ සමාස 'ක' ප්‍රත්‍යය වීමෙන් සිඛ වූ අන්‍යාර්‍ථ සමාස යි.

3. එකං සමයං- එක් සමයෙක්හි; භගවා- භාග්‍යවතුන් වහන්සේ; මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං- මහත් භික්ෂු සමූහයා සමග; කොසලෙසු- කොසොල් ජනපදයෙහි; චාරිකං චරමානො- සැරිසරු වඩනාසේක්; කොසලානං- කොසොල්ජනපද වාසීන්ගේ; වෙනාගපුරං නාම- වෙනාගපුර නම් වූ; බ්‍රාහ්මණ

අස්සොසුං ඛො වේනාගපුරිකා බ්‍රාහ්මණගහපතිකා:- සමණො ඛලු භො ගොතමො සක්‍යපුත්තො සක්‍යකුලා පබ්බජිතො වේනාගපුරං අනුප්පත්තො. තං ඛො පන භවන්තං ගොතමං එවං කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගතො; ඉතිපි සො භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණසම්පන්නො සුගතො ලොකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධො භගවා, සො ඉමං ලොකං සදෙවකං සමාරකං සබ්‍රහ්මකං සස්සමණබ්‍රාහ්මණිං පජං සදෙවමනුස්සං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවෙදෙති. සො ධම්මං

ගාමො- බමුණුගම; **යෙන**- යම් තැනෙක්හි ද; **තං**- එතනට; **අවසරි**- වැඩිසේක.

සංලක්ෂ්‍යය :-

"මහතා භික්ඛුසඞ්ඝෙන සද්ධිං" මෙහි "භික්ඛුසඞ්ඝෙන" යනු "සද්ධිං" යන නිපාතයාගේ යොගයෙහි තෘතීයා විභක්ති යි. මෙසේ ම සහ, අලං, කිං ආදි නිපාත ශබ්දයන් සමග ද තෘතීයා විභක්තිය යෙදේ, ඇතම්තැනක මෙකී නිපාතයන් නැත ද ඔවුන්ගේ අර්ථයෙහි ද තෘතීයා විභක්ති යෙදේ.

වේනාගපුරිකා- වේනාගපුරවැසි වූ; **බ්‍රාහ්මණගහපතිකා**- බමුණුගැහැවියෝ; **අස්සොසුං ඛො**- මෙබඳු ප්‍රවෘත්තියක් ඇසූවාහු ය; (කෙබඳු ප්‍රවෘත්තියෙක් ද යත්?) **සක්‍යපුත්තො**- ශාක්‍ය රාජ පුත්‍ර වූ; **සක්‍යකුලා**- ශාක්‍යකුලයෙන් නික්ම; **පබ්බජිතො**- පැවිදි වූ; **සමණො භො ගොතමො ඛලු**- ශ්‍රමණ භවත් ගෞතම තෙම වනාහි; **වේනාගපුරං**- අපගේ වේනාග පුරයට; **අනුප්පත්තො**- පැමිණිසේක. **තං භවන්තං ගොතමං ඛො පන**- ඒ භවත් ගොතමයන් වහන්සේගේ විෂයෙහි; **එවං**-මෙබඳු වූ; **කල්‍යාණො කිත්තිසද්දො**- යහපත් කීර්ති ශබ්දයෙක්; **අබ්භුග්ගතො**- ඉතා උස් ව පැනනැංගේ ය; (කෙසේ ද?) **සො භගවා**- ඒ භාග්‍යවත් තෙම; **ඉති+අපි**- මේ කාරණයෙනු දු; **අරහං**- (කෙලශක්ෂය කළ බැවින්) අර්හත් ය; **සම්මාසම්බුද්ධො**- තමා විසින් සර්වධර්මයන් මනාකොට දත්තේ ය; -පෙ- (මෙතැන් සිට අරුත් 343 පිටෙන් දතයුතු යි.) **සො**- ඒ භාග්‍යවත් තෙම; **සදෙවකං**- දෙවියන් සහිත වූ; **සමාරකං**- මරුන් සහිත වූ; **සබ්‍රහ්මකං**- බඹුන් සහිත වූ; **සස්සමණබ්‍රාහ්මණිං**- ශ්‍රමණ බ්‍රාහ්මණයන් සහිත වූ; **පජං**- සත්ව ප්‍රජාව ද; **සදෙවමනුස්සං**- දෙව්මිනිසුන් සහිත වූ; **ඉමං ලොකං**- මේ ලොකය ද; **සයං**- තෙමේ; **අභිඤ්ඤා**- විශිෂ්ට ඥානයෙන් දැන; **සච්ඡිකත්වා**-

දෙසෙති : ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්ථං සව්‍යඤ්ජනං, කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙති. සාධු ඛො පන තථාරූපානං අරහතං දස්සනං හොතීති.

අථ ඛො වෙනාගපුරිකා බ්‍රාහ්මණගහපතිකා යෙන භගවා තෙනුපසඞ්කමිංසු. උපසඞ්කමිත්වා අප්පෙකච්චෙ භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ භගවතා සද්ධිං සම්මොදිංසු, සම්මොදනීයං කථං සාරාණීයං වීතිසාරෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ යෙන භගවා තෙනඤ්ජලිං පනාමෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ නාමගොත්තං සාවෙත්වා එකමන්තං නිසීදිංසු. අප්පෙකච්චෙ තුණ්හිභූතා එකමන්තං නිසීදිංසු.

එකමන්තං නිසින්නො ඛො වෙනාගපුරිකො වච්ඡගොත්තො බ්‍රාහ්මණො භගවන්තං එතදවොච :- අච්ඡරියං භො ගොතම අබ්භුතං භො ගොතම, යාවඤ්චිදං භොතො ගොතමස්ස විප්පසන්නානි ඉන්ද්‍රියානි පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො, සෙය්‍යථාපි භො ගොතම සාරදං බදරපණ්ඩු[1] පරිසුද්ධං හොති පරියොදාතං, එවමෙව භොතො ගොතමස්ස විප්පසන්නානි ඉන්ද්‍රියානි පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. සෙය්‍යථාපි භො

ප්‍රත්‍යක්‍ෂකොට; **පවෙදෙති**- ප්‍රකාශ කෙරෙයි; **සො**- ඒ තථාගත තෙම; -පෙ- (මෙතැන් සිට අරුත් 255 පිටෙන් දතයුතු යි.) **තථාරූපානං**- එබඳු වූ; **අරහතං**- රහතුන්ගේ; **දස්සනං**- දැකීම; **සාධු ඛො පන හොති + ඉති**- යහපත් වන්නේ ය; (යන ප්‍රවෘත්ති යයි.)

-පෙ- **අප්පෙකච්චෙ**- ඇතම් කෙනෙක්; -පෙ- **අඤ්ජලිං පනාමෙත්වා**- ඇඳිලි බැඳ; -පෙ- **නාමගොත්තං**- නම්ගොත්; **සාවෙත්වා**- අස්වා; -පෙ- **තුණ්හිභූතා**- තුෂ්ණීම්භූත වැ; -පෙ-

-පෙ- **භො ගොතම**- භවත් ගෞතමයන් වහන්ස; **අච්ඡරියං**- ආශ්චර්‍ය්‍යයෙක; -පෙ- **අබ්භුතං**- පෙර නො වූ දෙයෙක; **භොතො ගොතමස්ස**- භවත් ගෞතමයන් වහන්සේගේ; **ඉන්ද්‍රියානි**-(චක්‍ෂුරාදි)ඉන්ද්‍රියයෝ; **යාවඤ්චිදං**-අතිශයින්; **විප්පසන්නානි**- ප්‍රසන්නයහ; **ඡවිවණ්ණො**- සිවිපැහැය; **පරිසුද්ධො**- පිරිසුදු ය; **පරියොදාතො**- වෙසෙසින් පිරිසුදු ය; -පෙ- **සෙය්‍යථාපි**-යම්සේ;

---

1. බදරපණ්ඩුං-සනා.

ගොතම තාලපක්කං සම්පති බන්ධනා මුත්තං පරිසුද්ධං හොති පරියොදාතං, එවමෙව භොතො ගොතමස්ස විප්පසන්නානි ඉන්ද්‍රියානි පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො. සෙය්‍යථාපි භො ගොතම නෙක්ඛං ජම්බොනදං දක්ඛකම්මාරපුත්තසුපරිකම්මකතං උක්කාමුඛෙ සුකුසල[1]සම්පහට්ඨං පණ්ඩුකම්බලෙ නික්ඛිත්තං භාසතෙ ච තපතෙ ච විරොචති ච, එවමෙව භොතො ගොතමස්ස විප්පසන්නානි ඉන්ද්‍රියානි පරිසුද්ධො ඡවිවණ්ණො පරියොදාතො.

යානි නූන තානි භො ගොතම උච්චාසයනමහාසයනානි– සෙය්‍යථීදං? ආසන්දි පල්ලඞ්කො ගොනකො චිත්තකා[2] පටිකා පටලිකා තූලිකා විකතිකා උද්දලොමි එකන්තලොමි කට්ඨිස්සං

සාරදං– සරත්කාලයෙහි හටගත්තා වූ; **බදරපණ්ඩු**- පැසී පඬු වන් වූ ඩෙබර ඵලය; **පරිසුද්ධං හොති**– පිරිසුදු වේ ද; **පරියොදාතං**– වෙසෙසින් පිරිසුදු වේ ද; **එවං+එව**– එපරිද්දෙන් ම; -පෙ- **සම්පති**– එකෙණෙහි; **බන්ධනා මුත්තං**– තුවටුවෙන් ගිලිහුණා වූ; **තාලපක්කං**– විලිකුන් තල්පලය; -පෙ- **එවං+එව**– එපරිද්දෙන් ම; -පෙ- **දක්ඛකම්මාරපුත්ත**– දක්‍ෂ කම්බුරු පුත්‍රයකු විසින්; **උක්කාමුඛෙ**– කෝවමුඛයෙහි; **සුපරිකම්මකතං**– මනා කොට පිරියම්කරන ලද; **සුකුසලසම්පහට්ඨං**– (ඝට්ටනපරිමජ්ජනාදි වශයෙන්) මනාකොට පිරිමදනා ලද; **පණ්ඩුකම්බලෙ**– පඬු වන් පලසෙක්හි හෙවත් රත්පලසෙක්හි; **නික්ඛිත්තං**– තබන ලද; **ජම්බොනදං**– ජාම්බොනද සුවර්ණය සම්බන්ධී වූ; **නෙක්ඛං**– නිෂ්කයෙක් හෙවත් පස්විසිකලන් ගුළිකාවක්; **භාසතෙ ච**– බබළා ද; **තපතෙ ච**–අඳුරු විදහා ද; **විරොචති ච**–බබළමින් සොභමාන වේ ද; **එවං + එව**– එපරිද්දෙන් ම; -පෙ-.

යානි තානි– යම් ඒ; **උච්චාසයනමහාසයනානි**– උසසුන් මහසුන් කෙනෙක් වෙද් ද; -පෙ- **ආසන්දි**- දික්හගලා පුටුව ය; **පල්ලඞ්කො**– පාදයන්හි වාලරූපයන් පිහිටුවා කළ පර්‍ය්‍යඞ්කය; **ගොනකො**– දික්ලොම් ඇති මහකොඳු පලස ය; **චිත්තකා**– වියමනෙන් විසිතුරු වූ එළලොම්මුවා ඇතිරි ය; **පටිකා**– සුදුඑළලොම්මුවා ඇතිරි ය; **පටලිකා**– එළලොම්මුවා ඝන පුප් ඇතිරි ය; **තූලිකා**– පුළුන්පිරූ ඇතිරි ය; **විකතිකා**– සිංහව්‍යාඝ්‍රාදි රූපයෙන් විසිතුරු එළලොම්මුවා ඇතිරි ය; **උද්දලොමි**– දෙපස දවළු ඇති එළලොම්මුවා ඇතිරි ය; **එකන්තලොමි**– එක්පස දවළු ඇති එළලොම්මුවා ඇතිරි ය;

---

1. සුපරිකම්මකතං කුසල-ස්‍යා. 2. චිත්තිකා-ස්‍යා.

කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවෙණී කාදලිමිගපවරපච්චත්ථරණං සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං, එවරූපානං නූන භවං ගොතමො උච්චාසයනමහාසයනානං නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභීති.

යානි ඛො පන තානි බ්‍රාහ්මණ උච්චාසයනමහාසයනානි– සෙය්‍යථීදං? ආසන්දි පල්ලඞ්කො ගොනකො චිත්තකා පටිකා පටලිකා තූලිකා විකතිකා උද්දලොමි එකන්තලොමි කට්ටිස්සං කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනප්පවෙණී කාදලිමිගපවරපච්චත්ථරණං සඋත්තරච්ඡදං උභතොලොහිතකූපධානං, දුල්ලභානි තානි පබ්බජිතානං ලද්ධානි ච න කප්පන්ති.

තීණි ඛො ඉමානි බ්‍රාහ්මණ උච්චාසයනමහාසයනානි යෙසාහං එතරහි නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභී. කතමානි තීණි? දිබ්බං උච්චාසයනමහාසයනං, බ්‍රහ්මං උච්චාසයනමහා

කට්ටිස්සං– රතින් ගෙත්තම්කොට තිහිරිහුයින් කළ ඇතිරි ය; **කොසෙය්‍යං**–රන්කම් කරන ලද කොසියහුයින් කරන ලද ඇතිරි ය; **කුත්තකං**– නළඟනන් සොළොස් දෙනකු සිට නැටියහැකි එළලොම්මුවා සුදු ඇතිරි ය; **හත්ථත්ථරං**– ඇතුන්පිට අතුරන ඇතිරි ය; **අස්සත්ථරං**– අසුන් පිට අතුරන ඇතිරි ය; **රථත්ථරං**– රථයෙහි අතුරන ඇතිරි ය; **අජිනප්පවෙණි**– අඳුන් දිවි සමින් කළ ඇතිරි ය; **කාදලිමිගපවරපච්චත්ථරණං**– කෙසල්මුව සමින් කළ උතුම් ඇතිරි ය; **සඋත්තරච්ඡදං**– මත්තෙහි උඩුවියන් සහිත වූ; **උභතො**– හිසට පයට; **ලොහිතකූපධානං**– රත්කන්වයින් ඇති සයනය යන මෙය යි; –පෙ– **එවරූපානං**– මෙබඳු වූ; **උච්චාසයනමහාසයනානං**– උසස් මහ අසුන්; **නූන**– එකාන්තයෙන්; **නිකාමලාභී**– කැමති කැමතිසේ ලබනසේක; **අකිච්ඡලාභී**– නිදුක්සේ ලබනසේක; **අකසිරලාභී නූන + ඉති**– විපුලසේ ලබනසේකැයි හඟිමියි සැලකෙළේ ය.

–පෙ– **යානි ඛො පන තානි**– යම් ඒ; **උච්චාසයනමහාසයනානි**– උසස් මහසුන් කෙනෙක් වෙද් ද; –පෙ– **තානි**– ඒ ආසනයෝ; **පබ්බජිතානං**– ප්‍රව්‍රජිතයන්ට; **දුල්ලභානි**–දුර්ලභ වෙත්; **ලද්ධානි ච**– ලැබුණාහු ද; **න කප්පන්ති**– කැප නො වෙත්.

–පෙ– **අහං**– මම; **එතරහි**– දැන් වනාහි; **යෙසං**– යම් උසස් මහ අසුන්; **නිකාමලාභී**– කැමති කැමතිසේ ලබන්නෙම් ද; **අකිච්ඡලාභී**– නිදුක්සේ ලබන්නෙම් ද; **අකසිරලාභී**– විපුලසේ

සයනං, අරියං උච්චාසයනමහාසයනං. ඉමානි ඛො බ්‍රාහ්මණ තීණි උච්චාසයනමහාසයනානි යෙසාහං එතරහි නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභීති.

කතමං පන තං භො ගොතම දිබ්බං උච්චාසයනමහාසයනං යස්ස භවං ගොතමො එතරහි නිකාමලාභී අකිච්ඡලාභී අකසිරලාභීති?.

ඉධාහං බ්‍රාහ්මණ යං ගාමං වා නිගමං වා උපනිස්සාය විහරාමි, සො පුබ්බණ්හසමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය තමෙව ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසාමි, සො පච්ඡාභත්තං පිණ්ඩපාතපටික්කන්තො වනන්තඤ්ඤෙව පවාරයාමි, සො යදෙව තත්ථ හොන්ති තිණානි වා පණ්ණානි වා තානි එකජ්ඣං සංහරිත්වා නිසීදාමි පල්ලඞ්කං ආභුජිත්වා උජුං කායං පණිධාය පරිමුඛං සතිං උපට්ඨපෙත්වා. සො විවිච්චෙව කාමෙහි විවිච්ච

ලබන්නෙම් ද (එබඳු වූ); **උච්චාසයනමහාසයනානි**- උසසුන් මහ අසුන්; **ඉමානි ඛො තීණි**- මොහු තුන්දෙනෙක් වෙත්; -පෙ- **දිබ්බං**- දිව්‍ය වූ; **උච්චාසයනමහාසයනං**- උසසුන් මහ අස්න ය; **බ්‍රහ්මං**- බ්‍රහ්ම වූ; -පෙ- **අරියං**- ආර්‍ය්‍ය වූ; -පෙ-.

භො ගොතම-භවත් ගෞතමයන් වහන්ස; **භවං ගොතමො**- භවත් ගෞතම තෙම; **එතරහි**- දැන්; **යස්ස**- යම් උසසුන් මහ අස්නක්; **නිකාමලාභී**- කැමති කැමතිසේ ලබනසේක් ද; -පෙ- **තං දිබ්බං උච්චාසයන මහාසයනං**- ඒ දිව්‍ය වූ උසසුන් මහ අස්න; **කතමං පන + ඉති**- කවරේ දැයි විචාළේ ය.

